හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම

එම්. කේ. නදීකා දමයන්ති
ආර්. එම්. එම්. එච්. කේ. රම්බොඩගෙදර

HARTI

තැ.පෙ. 1522 දු.අ. 94 11 2696981 විද්‍යුත් තැපැල් : library@harti.lk
කොළඹ. 94 11 2696437
ශ්‍රී ලංකාව. ෆැක්ස් 94112692423. වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-136-0

Rs. 425/-

හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම

එම්.කේ. නදීකා දමයන්ති

ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර

සිංහල පර්යේෂණ වාර්තා: අංක 51 2012 සැප්තැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත,

කොළඹ 7

24042

ප්‍රථම මුද්‍රණය: 2012 සැප්තැම්බර්

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
සියලුම හිමිකම් ඇවිරිණි

ISBN : 978-955-612-136-0

පෙරවදන

කෘෂිකාර්මික දිස්ත්‍රික්කයක් වන හම්බන්තොට, ඉඩම්වලින් අතිවිශාල ප්‍රමාණයක් රජයට අයත් හෝ රජය විසින් සංවර්ධනය සඳහා ජනතාව වෙත ලබා දෙනු ලැබූ ඒවා වේ. කෘෂිකර්මාන්තය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන ඉඩම්වල වටිනාකම, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන කටයුතුත් සමග සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. මේ සියලු කරුණු සමගින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සපයන ආයතන සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු වෙමින් පවතී. මේ වන විට, සේවා සැපයීම වඩාත් කාර්යක්ෂම සහ ජනතාවට සමීප කරවීමේ අරමුණින් විමධ්‍යගතකරණයේ සියලු භාවිතාවන් රජයේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අතර සේවා සැපයීමට අදාළ වන පරිපාලන විමධ්‍යගතකරණය හෙවත් විභේදනය, අර්ධ ස්වායත්ත ආයතනවලට බලතල පැවරීම සහ පළාත් සභා වෙත දේශපාලන බලතල පැවරීම යන විමධ්‍යගතකරණ භාවිතාවන් ත්‍රිත්වය ඔස්සේ දිස්ත්‍රික්කයේ ජනතාවට සේවාවන් සැපයීමේ දී නිලධාරීන් මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා මෙන් ම එම සේවය ලබා ගැනීමේ දී සේවාලාභීන් මුහුණ දෙන ගැටලු, දුෂ්කරතා මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කෙරේ. මෙම අධ්‍යයනයේදී රජයේ ඉඩම්වලට සම්බන්ධිත ගැටලු දහයක් ඔස්සේ තොරතුරු රැස් කිරීම සිදු කොට ඇති අතර එයට අමතර ව රජයේ ඉඩම්වලට සම්බන්ධිතව සේවා සැපයීමට සෘජුව සම්බන්ධ නො වන නමුත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් සෘජු වගකීම් උසුලන වනජීවී, වනසංරක්ෂණ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු මෙන් ම නාගරික සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන වැනි ආයතන රාශියකින් රජයේ ඉඩම් පාලනය සම්බන්ධයෙන් රැස්කළ තොරතුරු විශ්ලේෂණය කර ඉදිරිපත් කරනු ලබයි.

අධ්‍යයනය පෙන්වා දෙන අන්දමට සේවා සැපයීමේදී මෙන් ම ඉඩම් පාලනයේදී ද, ඉතා විශාල අඩුපාඩුවක් වන්නේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් ආයතන රාශියක් වගකීම් උසුලමින් ක්‍රියාත්මක වුවත්, සමස්තයක් ලෙස නිසි සහ විශ්වසනීය තොරතුරු පද්ධතියක් කිසිදු ආයතනයක නො වීමයි. එමෙන් ම, සේවා සැපයීම සම්බන්ධයෙන් ජනතාවට වගවන ආකාරයේ කිසිදු වැඩපිළිවෙලක් සේවා සැපයීමේ යාන්ත්‍රණය තුළ නොමැති අතර අන්තර් ආයතන සම්බන්ධතාවේ දුර්වලතා, සේවා සැපයීමේ යාන්ත්‍රණය තුළ පවතින නොයෙකුත් අඩු ලුහුඬුකම් සහ සේවාලාභීන්ගේ දුර්වලතා හේතුවෙන් සේවා සැපයීම ප්‍රමාදයකට ලක් වේ. සියල්ලේ ම අවසාන ප්‍රතිඵලය සේවාලාභීන් කුමන හෝ ආකාරයකින් පීඩාවකට හෝ දුෂ්කරතාවකට පත්වීම වේ.

මෙම අධ්‍යයන වාර්තාව තුළින් සේවා සැපයීමේ යාන්ත්‍රණය තුළ පවතින ගැටලු සහ දුර්වලතා විශ්ලේෂණය කරමින් වඩා යහපත් සේවා සැපයීමේ ක්‍රමවේදයක් වෙනුවෙන් කෙටිකාලීන සහ දිගු කාලීන යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇත. ඉඩම් විෂයයට සම්බන්ධ නිලධාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, විද්‍යාර්ථීන් මෙන් ම විෂයය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලු දෙනාට මෙම පර්යේෂණ වාර්තාව ක්ෂේත්‍රයේ පවතින සත්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පුළුල් දැනුමක් ලබා දෙනු ඇත.

නීතිඥ ලලිත් කාන්ත ජයසේකර
අධ්‍යක්ෂ

ප්‍රණාමය

අධ්‍යයනයේ අවශ්‍යතාව පෙන්වා දෙමින් අධ්‍යයනය සඳහා පසුබිම සකසා දුන් හම්බන්තොට හිටපු දිස්ත්‍රික් ලේකම් ආර්.එම්.ඩී.බී. මීගස්මුල්ල මහතාට සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් ඩබ්.ඒ. ධර්මසිරි මහතාට අපගේ ස්තුතිය හිමි වේ. අධ්‍යයනය සඳහා මනා සහයෝගයක් ලබාදුන් දකුණු පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් පී.බී.රුවන්පතිරණ මහතා, දෙබරවැව සහකාර ඉඩම් කොමසාරිස් සුනිල් අබේකෝන් මහතා සහ වලස්මුල්ල, තංගල්ල, සූරියවැව, හම්බන්තොට, අම්බලන්තොට, තිස්සමහාරාම, සහ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්, ග්‍රාම නිලධාරින් සහ ඉඩම් අංශයේ සේවා නියුක්ත සියළු ම නිලධාරීන්/නිලධාරිනියන්ටත් අපගේ ස්තුතිය පිරිනැමේ. අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු නො පැකිලව ලබාදුන් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් මහේෂ් රාජිත කරුණාරත්න මහතා, ජ්‍යෙෂ්ඨ මිණුම් අධිකාරි කේ.ඩබ්.ඒ. විජයවර්ධන මහතා, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් නදීෂ් සී. ප්‍රනාන්දු මහතා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංඛ්‍යාලේඛන අංශයේ නිලධාරීන්, තංගල්ල පොලිස් අධිකාරිතුමා සහ තොරතුරු ලබාදුන් සියළු ම පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරුන් සහ කාර්ය මණ්ඩලය, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන් සහ කාර්ය මණ්ඩලය, බිම් සවිය වැඩසටහනේ දෙබරවැව කාර්යාලයේ නිලධාරීන්, දකුණු සහ කතරගම වනජීවි කාර්යාලවලට අයත් නිලධාරීන්, නාගරික සංවර්ධන අධිකාරියේ සහ නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරින් සහ වන සංරක්ෂණ, ගොවිජන සේවා සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවල නිලධාරින්ගේ සහාය නො වන්නට මෙවන් වාර්තාවක් ඉදිරිපත් කරන්නට නො හැකිවනු නො අනුමාන ය. අපගේ ස්තුතිය ඒ සියළු නිලධාරීන්ට හිමි වේ. තමන්ගේ ජීවිතය සමග අත්‍යන්තයෙන් බැඳී පවතින ඉඩම් ගැටලු සහ තමන් මුහුණ පා ඇති දුෂ්කරතා සම්බන්ධයෙන් තොරතුරු නො වලහා ඉදිරිපත් කරමින් අධ්‍යයනය සාර්ථක කර ගැනීමට සහාය දුන් සියළු සේවාලාභීන්ට අපගේ අවංක ස්තුතිය පුද කෙරේ.

අධ්‍යයනය සඳහා අවශ්‍ය පරිපාලන සහාය ලබා දීමෙන් සහ වාර්තාවේ පළමු කෙටුම්පතෙ හි ගුණදොස් දැක්වීමෙන් සහාය වූ හෙ.කො.ගො.ප.පු ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය එල්.පී. රූපසේන මහතාටත්, වාර්තාවේ ගුණදොස් පෙන්වා දෙමින් එහි ගුණාත්මක තත්ත්වය නංවාලීමට දායක වූ බාහිර විමර්ශක ආචාර්ය රංජිත් ඩී. වනිගරත්න මහතාටත් අපගේ ස්තුතිය පිරිනැමේ. එමෙන් ම, මේ සියළු කාර්යයන් පිටුපස හිඳිමින් අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා සහාය ලබාදුන් ආයතනයේ අධ්‍යක්ෂ තිතිඟ ලලිත් කාන්ත ජයසේකර මහතාට අපගේ ස්තුතිය පිරිනැමේ.

රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීමට අදාළ අතිශය සංකීර්ණ විෂයය පථයක සිදු කළ මෙම අධ්‍යයනයේ දී මනා සංයමකින් සහ ඉවසීමකින් යුතු ව ක්ෂේත්‍ර තොරතුරු රැස්කිරීමේ කාර්යයේ නියැලුණු ආයතනයේ පර්යේෂණ නිලධාරින් වන අයි.පී.පී. විජේසිංහ, එම්.ඩී.පී. කුමාරතුංග, පී.ඒ.ජේ. චම්පිකා සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් වන එච්.ඒ.ඒ. හෙට්ටිආරච්චි, එස්.ඩී.පී. සුදර්ශනී සහ කේ.පී.කේ.අයි.යූ. ප්‍රනාන්දු මහත්ම මහත්මීන්ගේ දැඩි කැපවීම ස්තුති පූර්වකව සිහිපත් කරමු. එමෙන් ම, නියමිත කාලය තුළ ක්ෂේත්‍ර තොරතුරු රැස් කිරීම සඳහා ආයතනයේ ප්‍රවාහන ඒකකයේ කාර්ය මණ්ඩලයෙන් ලද මනා සහයෝගය අගය කරමු.

හෙ.කො.ගො.ප.පු. ආයතනයේ සංඛ්‍යාන සහ දත්ත සැකසුම් ඒකකයේ අංශ ප්‍රධාන එම්.ඩී.එල්. සෙනරත් මහතා සහ ක්‍රම විශ්ලේෂක සී.එන්. ප්‍රේමවර්ධන මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලය නො අලස්ව දත්ත විශ්ලේෂණ කටයුතු සිදු කර දීමෙන් දායක වූ අතර හෙ.කො.ගො.ප.පු. ආයතනයේ හිටපු පරිඝනක අකුරු සැකසුම්කරු මනෝජා තුෂාරි අබේවික්‍රම මහත්මිය තම පෞද්ගලික නිවාඩු පවා කැප කරමින් වාර්තාවේ ඇතැම් පරිච්ඡේද පරිඝනක ගත කිරීමේ කාර්යයෙන් දායක වූවා ය. භාෂා සංස්කරණ කටයුතු සිදු කළ මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර මහතාටත්, ප්‍රකාශන ඒකකයේ වැඩබලන ඒකක ප්‍රධානී සී.යූ. සේනානායක මහතාටත්, පිටකවර නිර්මාණය කළ උදේනි කරුණාරත්න මහත්මියටත්, වාර්තාව මුද්‍රණයෙන් එළි දැක්වීමට දායක වූ ප්‍රකාශන ඒකකයේ කාර්ය මණ්ඩලයටත් අපගේ ස්තුතිය පිරිනැමේ.

එම්.කේ. නදිකා දමයන්ති
ආර්.එම්.එම්.එච්.කේ. රම්බොඩගෙදර

සංක්ෂේපය

මෙම අධ්‍යයනයේ විශේෂිත අරමුණ වූයේ රජයේ ඉඩම් විෂයය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දේශපාලන බලතල විමධ්‍යගතකරණය, බලතල පැවරීම සහ පරිපාලන විමධ්‍යගතකරණය යන විමධ්‍යගතකරණ භාවිතාවන් තුළ රජයේ ඉඩම් සම්බන්ධ සේවා සැපයීම අපේක්ෂිත අන්දමින් ඉටු නො වීමටත්, ඉඩම් පාලනය අවුල් සහගත වීමටත් බලපා ඇති හේතු සාධක සහ ඒ තුළින් සේවාලාභීන් වෙත සිදුකරනු ලබන බලපෑමත් අධ්‍යයනය කර වඩා ක්‍රමවත් සහ යහපත් සේවා සැපයීමක් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට, අම්බලන්තොට, සූරියවැව, තංගල්ල, තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර සහ වලස්මුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිදු කළ මෙම අධ්‍යයනයට පළාත් සභා, මධ්‍ය ආණ්ඩුව මෙන් ම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් ඉඩම් සම්බන්ධ සේවා සපයන ප්‍රදේශ ඇතුළත් ව ඇති හෙයින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සැපයීමේ දී ක්‍රියාත්මක වන සියළු ම විමධ්‍යගතකරණ ආකාරයන් ඇතුළත් විය. තෝරා ගනු ලැබූ සේවා ඉල්ලීම් දහයක් ආවරණය වන පරිදි අධ්‍යයනය සිදු කෙරුණු අතර සේවාලාභීන් 486ක් සහ ග්‍රාම නිලධාරී, ජනපද නිලධාරී, ඉඩම් අංශයේ කළමනාකරණ/සංවර්ධන සහකාර සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු විවිධ කාණ්ඩවල නිලධාරීන් 185ක් ඇතුළත් වූ සමස්ත නියැදිය 671ක් විය. එයට අමතරව, සෘජුව ම ඉඩම් සම්බන්ධව සේවාවන් සැපයීමට දායක නො වන නමුත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් වගකීම් දරන වන ජීවී, පුරාවිද්‍යා, පොලිස්, ගොවිජන සේවා, නාගරික ආදී දෙපාර්තමේන්තු මෙන් ම නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගෙන් සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී.

සේවාලාභීන්ගේ ගැටලුවලින් 33% (161)ක් ඉඩම් බලපත්‍ර ලබා ගැනීම සහ අනවසර නියමානුකූල කිරීම සම්බන්ධයෙන් ද, 13%ක් ඉඩම් සඳහා දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් ද, තවත් 13%ක් ඉඩම් ආරවුල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් ද, 10%ක් ඉඩමක් රජයට පවරා ගැනීම වෙනුවෙන් වන්දි ඉල්ලීම සඳහා ද ඉදිරිපත්ව තිබිණි. සමස්ත ගැටලුවලින් 9%ක් ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම, 8%ක් පසු උරුමකරු නම් කිරීම සම්බන්ධ ගැටලු, 8%ක් ජයභූමි ඔප්පු යටතේ පවරා ඇති ඉඩම් සම්බන්ධයෙන් වන ගැටලු, 3%ක් දීමනා පත්‍ර සම්බන්ධයෙන් වන වෙනත් නීත්‍යානුකූල ගැටලු, 2%ක් දීර්ඝ කාලීන බදු යටතේ වන ගැටලු සහ 1%ක් රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු හෝ අනුමත මූල්‍ය ආයතන වෙත උකස් කිරීම සම්බන්ධයෙන් වන ගැටලු ද විය. මෙයට අමතර ව, 2010 සහ 2011 වසරවල දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානවලට ඉදිරිපත්ව ඇති සුළු පැමිණිලිවලින් 15%ට ආසන්න ප්‍රමාණයක් ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් වන පැමිණිලි වේ. ඉදිරිපත් වූ ගැටලුවලට අදාළ ඉඩම්වලින් 31%ක භුක්තිය සේවාලාභීන් සතු වූ අතර 18%ක් දෙමාපියන් සතුව ද, 22%ක් රජයේ අනවසර හෝ රක්ෂිත ද විය. එමෙන් ම, සේවාලාභීන්ගේ භුක්තියට යටත් ව පවතින (ගැටලුවලට අදාළ සහ අනෙකුත් ඉඩම්) සියළු ඉඩම්වලින් 30%ක් රජයේ අනවසර ඉඩම් විය.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දෙබරවැව සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දත්ත අනුව, එම කාර්යාලයේ සිට අදාළ ආයතන වෙත ඉදිරිපත්ව දීමනා පත්‍රයක් සේවාලාභියා වෙත නිකුත් කිරීමට සාමාන්‍යයෙන් වසර 2ක පමණ කාලයක් ගත

වේ. සමස්ත නිලධාරීන්ගෙන් 79%ක් අමතර රාජකාරි පැවරීම, අනෙකුත් ආයතනවල කාර්යය ප්‍රමාදය, සේවාලාභීන් විසින් අදාළ ලිපිලේඛන සහ නිසි තොරතුරු නො සැපයීම, තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කරගැනීමට කාලය ගතවීම, සේවා සැපයීමට අවශ්‍ය පහසුකම් නො තිබීම, තුන්වැනි උපලේඛනයේ සහ අවම බෙදුම් සීමාවේ පවතින ගැටලු ආදී නොයෙකුත් හේතු මත තමන් වෙතින් සැපයෙන සේවාවන් ප්‍රමාද වන බව අනාවරණය කළ හ. එමෙන් ම, නිලධාරීන්ගෙන් 70%ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ද, 84%ක් පළාත්/නියෝජ්‍ය පළාත්/ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවලින් ද සේවා සැපයීමේ ප්‍රමාදයක් වන බව සඳහන් කෙරිණි. සේවා සැපයීමේදී නිලධාරීන්ගේ නො සැලකිලිමත්භාවය හෝ අකාර්යක්ෂමතාව, ලියකියවිලි ඉදිරිපත් කිරීමේ දී සේවාලාභීන් වෙතින් සිදුවන ප්‍රමාදය, සේවා සැපයීමේ ක්‍රියාවලියේ දීර්ඝ සහ සංකීර්ණ ස්වභාවය, මැණුම් කටයුතුවල ප්‍රමාදය, රජයේ කාර්යාලවලින් තම ලිපිලේඛන අස්ථානගතවීම, තුන් වැනි උපලේඛනයේ සීමාවන් ආදී හේතු නිසා තමන් වෙත සැපයෙන සේවාව ප්‍රමාද වන බව සේවාලාභීහු අනාවරණය කළහ.

නියැදියෙ හි සේවාලාභීන් තම ගැටලු සම්බන්ධයෙන් නිලධාරීන් හමුවීමට ගිය වාර ගණන 1 සිට 300 දක්වා පරාසයක ද, වැයකළ කාලය මිනිත්තු 5 සිට මිනිස් දින 225ක් දක්වා වූ පරාසයක ද පැතිර පැවතිණි. සමස්තයක් ලෙස ගැටලුවක් වෙනුවෙන් සේවාලාභීන් වැයකර ඇති මුදලෙහි සාමාන්‍යය රුපියල් 13,939.85ක් වන නමුත් එය පසු උරුමකරු සම්බන්ධ ගැටලුවක දී රුපියල් 3,317.34 සිට ඉඩම් ආරවුල් නිරවුල් කිරීම සම්බන්ධ ගැටලුවක දී රුපියල් 32,931.87ක් දක්වා වූ පරාසයක පැතිර පැවතිණි.

පවතින ගැටලු අවම කර කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් සේවාලාභීන්හට ලබා දීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා අතර දිස්ත්‍රික්කයේ පවතින රජයේ ඉඩම් සම්බන්ධයෙන් කඩිනම් සමීක්ෂණයක් කොට දත්ත පද්ධතියක් ගොඩ නැගීම සහ එය මාසිකව යාවත්කාලීන කිරීම, මැණුම් ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා රජයේ අනුමත මිනින්දෝරු නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් සේවයට යොදවා ගැනීම, ඉඩම්වලට අදාළ ලිපිලේඛන ස්කෑන් කොට දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම, නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් සහ මධ්‍ය ආණ්ඩුවේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරියෙකු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට පැමිණ ලිපිගොනුවල අවශ්‍ය වැඩ කටයුතු නිමවා කොළඹට රැගෙන ඒම, තුන් වැනි උපලේඛනය සහ ගොඩ ඉඩම් සඳහා අවම අනු බෙදුමේ සීමාවන් වෙනස් කිරීම ආදී යෝජනාවන් ඉදිරිපත් කෙරේ.

පටුන

පෙරවදන		iii
ප්‍රණාමය		iv
සංක්ෂේපය		vi
පටුන		viii
වගු සටහන්		xiii
ප්‍රස්තාර		xv
සිද්ධි අධ්‍යයන		xv
පළමු වැනි පරිච්ඡේදය: හැඳින්වීම		**01**
1.1	පිවිසුම	01
1.2	පර්යේෂණ ගැටලුව	03
1.3	පර්යේෂණ අරමුණු	05
1.4	උපකල්පන	05
1.5	පර්යේෂණ ක්‍රමවේදය	06
1.5.1	දත්ත රැස් කිරීමේ ක්‍රම	06
1.5.2	අධ්‍යයන ප්‍රදේශය	08
1.5.3	දත්ත විශ්ලේෂණය	09
1.6	අධ්‍යයනයේ කාල රාමුව	09
1.7	අධ්‍යයනයේ සීමා	09
1.8	පරිච්ඡේද සැලැස්ම	10
දෙවන වැනි පරිච්ඡේදය: සාහිත්‍ය විමර්ශනය		**11**
2.1	හැඳින්වීම	11
2.2	රජයේ ඉඩම් සහ ඉඩම් සම්බන්ධිත ප්‍රතිපත්ති	11
2.2.1	රජයේ ඉඩම්	11
2.2.2	පැරණි ලංකාවේ ඉඩම් භුක්තිය සහ නීති	11
2.2.3	විදේශීය පාලනයන් යටතේ මෙරට ඉඩම් ප්‍රතිපත්තිය	13
2.2.4	නිදහසින් පසු ඉඩම් ප්‍රතිපත්ති	15
2.3	විමධ්‍යගතකරණ න්‍යාය සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව	18
2.3.1	විභේදනය සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව	19
2.3.2	බලතල පැවරීම සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව	20
2.3.3	දේශපාලන බලතල පැවරීම සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව	22
2.4	රැකියා තෘප්තිය සහ අභිප්‍රේරණ	24
2.4.1	අවශ්‍යතා ධූරාවලි න්‍යාය	25
2.4.2	එක්ස් සහ වයි න්‍යාය	26
2.4.3	අභිප්‍රේරණ ස්වස්ථතා න්‍යාය හෙවත් ද්වි සාධක න්‍යාය	27
2.4.4	අපේක්ෂා න්‍යාය	27

2.4.5	මැක්ලෙලන්ඩ්ගේ අවශ්‍යතා න්‍යාය	27
2.4.6	ඊ.ආර්.ජී.න්‍යාය	28
තෙ වැනි පරිච්ඡේදය: අධ්‍යයන ප්‍රදේශයේ සමාජ ආර්ථික පසුබිම		**29**
3.1	හැඳින්වීම	29
3.2	භූගෝලයීය පිහිටීම, ස්වභාවික සම්පත් සහ පරිපාලන ව්‍යුහය	29
3.2.1	අධ්‍යයන ප්‍රදේශයේ පරිපාලන ව්‍යුහය	30
3.2.2	ප්‍රදේශයේ භූමි ප්‍රමාණය සහ ඉඩම් පරිහරණ රටාව	31
3.3	අධ්‍යයන ප්‍රදේශයේ සමාජ ආර්ථික පසුබිම	33
3.3.1	අධ්‍යයන ප්‍රදේශයේ ජනගහන තොරතුරු	33
3.3.2	අධ්‍යාපන මට්ටම	36
3.3.3	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආර්ථික පසුබිම	37
3.3.4	දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම්	39
3.3.4.1	ජල හා ආලෝක ප්‍රභවයන්	39
3.3.4.2	මාර්ග පහසුකම්	39
3.4	සේවාලාභීන්ගේ සමාජ ආර්ථික පසුබිම	39
3.4.1	සේවාලාභීන්ගේ සමාජ පසුබිම	39
3.4.2	සේවාලාභීන්ගේ ඉඩම් භුක්තියේ ස්වභාවය	46
3.5	ඉඩම් සම්බන්ධ සේවා සපයන නිලධාරීන්ගේ පසුබිම	51
3.6	සාරාංශය	54
සිව් වැනි පරිච්ඡේදය: සේවක අභිප්‍රේරණ, පුහුණුවීම් සහ සේවාවේ තෘප්තිමත් භාවය		**55**
4.1	හැඳින්වීම	55
4.2	සේවාව සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය	55
4.2.1	සේවාව සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තෘප්තිමත්භාවයට/අතෘප්තිමත්භාවයට හේතු	56
4.2.1.1	තෘප්තිමත්භාවයට හේතු	56
4.2.1.2	අතෘප්තිමත්භාවයට හේතු	58
4.3	සේවා ඇගයීම	58
4.3.1	සේවා සැපයීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම	59
4.4	ඉඩම් විෂයය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ පුහුණුවීම්	61
4.4.1	නව නීති සංශෝධන පිළිබඳ දැනුවත්වීමේ මාර්ග	63
4.5	රාජකාරි ගැටලු නිරාකරණයේ දී ඉහළ නිලධාරීන්ගේ සහාය ලැබෙන ආකාරය	67
4.6	සේවා පහසුකම් පිළිබඳ නිලධාරීන්ගේ ඇගයීම සහ ඔවුන් මුහුණ දෙන ගැටලු	70

4.6.1	ග්‍රාම නිලධාරීන්ගේ ඇගයීම	70
4.6.2	ජනපද/ඉඩම් නිලධාරීන්ගේ ඇගයීම	72
4.6.3	කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගේ ඇගයීම	74
4.6.4	සේවා පහසුකම් සම්බන්ධයෙන් සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඇගයීම	75
4.6.5	නිලධාරීන් මුහුණ දෙන වෙනත් ගැටලු	75
4.7	සාරාංශය	76

පස් වැනි පරිච්ඡේදය: සේවා සැපයීමේ ප්‍රමාදය සහ ප්‍රමාදය මගහැරීමට ඉදිරිපත් වූ යෝජනා 78

5.1	හැඳින්වීම	78
5.2	සේවා ඉල්ලීම් සහ ගැටලු විසඳීමේ ප්‍රගතිය	78
5.2.1	සේවා ලබාදීම අවසන් අදියරට පැමිණීමට ගතවන කාලය	78
5.2.2	ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් වන සේවා ඉල්ලීම් ඉටු කිරීම	80
5.2.3	ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී වෙත ඉදිරිපත් කළ ගැටලු	84
5.2.4	ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ ගැටලු	87
5.2.5	පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ ගැටලු	89
5.2.6	මහවැලි සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ ගැටලු	89
5.2.7	පොලිස් ස්ථාන වෙත ඉදිරිපත්ව ඇති ගැටලු	89
5.2.8	වෙනත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ ගැටලු	90
5.3	ගැටලු විසඳීම ප්‍රමාදවීම සම්බන්ධයෙන් ප්‍රතිචාරීන්ගේ අදහස්	90
5.3.1	සේවාලාභීන්ගේ අදහස්	90
5.3.2	නිලධාරීන්ගේ අදහස්	92
5.4	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩකටයුතු ප්‍රමාදය	94
5.4.1	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රමාදය අවම කිරීමට ඉදිරිපත් කළ යෝජනා	97
5.5	පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ප්‍රමාද	98
5.6	පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ප්‍රමාදය වැළැක්වීමට කළ යෝජනා	100
5.7	සමස්තයක් ලෙස සේවාව කාර්යක්ෂම කිරීමට නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ යෝජනා	101
5.8	කාර්යක්ෂමතාව වර්ධනය සඳහා සේවාලාභීන් ඉදිරිපත් කළ යෝජනා	103
5.9	සාරාංශය	103

හය වැනි පරිච්ඡේදය: සේවා සැපයීමේ ක්‍රියාදාමය තුළින් සේවාලාභීන් වෙත සිදුකරන සමාජ ආර්ථික බලපෑම 105

6.1	හැඳින්වීම	105
6.2	සේවා සැපයීමේ දුෂ්කරතා නිසා සේවාලාභීන් මුහුණ දෙන දුෂ්කරතා	105
6.3	ඉඩම් සම්බන්ධ නීත්‍යානුකූල ගැටලු පැන නැඟීම හේතුවෙන් මතුවන සමාජ ආර්ථික ගැටලු	108
6.3.1	සමාජමය ගැටලු	108
6.4	සේවාලාභීන්ට මානසික වශයෙන් සිදුවන බලපෑම	112
6.5	යටිතල පහසුකම් ලබාගැනීමේ සහ ප්‍රවේශවීමේ අපහසුව	113
6.6	ආර්ථිකමය වශයෙන් අවාසි සහගත තත්ත්වයන් ඇතිවීම	115
6.6.1	සේවා ලබා ගැනීමේ දී වැයවන පිරිවැය	115
6.6.2	කෘෂි ආර්ථිකයට සිදු කරන බලපෑම	127
6.6.3	ණය ලබා ගැනීමට නො හැකිවීම/අපහසුතා ඇතිවීම	129
6.7	ඉඩම් සම්බන්ධ ආරවුල් පැන නැඟීම	131
6.8	ඉඩම්වලට වන්දි ලබා ගැනීම සම්බන්ධව ගැටලු පැන නැඟීම	134
6.9	සාරාංශය	136

හත් වැනි පරිච්ඡේදය: රජයේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනත් ආයතන තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන දුෂ්කරතා 137

7.1	හැඳින්වීම	137
7.2	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	137
7.3	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	139
7.4	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව	144
7.5	පොලිස් දෙපාර්තමේන්තුව	146
7.6	දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය	149
7.7	මිනින්දෝරු දෙපාර්තමේන්තුව	152
7.8	ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන (බිම් සවිය)	154
7.9	නාගරික සංවර්ධන අධිකාරිය	156
7.10	පළාත් පාලන ආයතන	158
7.11	සාරාංශය	160

අට වැනි පරිච්ඡේදය: සාරාංශ සහ යෝජනා 161

8.1	සාරාංශය	161
8.2	යෝජනා	167

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඇමුණුම 01: ඉටු නො කළ මැනුම් සංඛ්‍යාව (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් 178

ඉටු කිරීමට ඇති මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මැනුම් නියෝගයේ සඳහන් කැබලි සංඛ්‍යාව අනුව 179

ඇමුණුම 02: බිම් සවිය හිමිකම් සහතික පත්‍රය සහ නැවත මැන ඉදිරිපත් කළ පිඹුරු සටහන 180

ඇමුණුම 03: අවම වගවීමක් සඳහා යොදා ගත හැකි ආකෘති පත්‍රකාවෙ හි දළ ආකෘතිය 181

වගු හා ප්‍රස්තාර සටහන්

වගු සටහන්

1.1	නිලධාරීන්ගේ නියැදිය	06
1.2	සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගත් නිලධාරීන්	07
1.3	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව සේවාලාභීන්ගේ විසිරීම	09
3.1	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව පරිපාලන ව්‍යුහය - 2010	30
3.2	දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ රටාව - 2010	31
3.3	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ගෘහ ඒකක භූමි පරිභෝජනය - 2010	32
3.4	සංගණන වර්ෂ අනුව ශ්‍රී ලංකාවේ සහ දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය	33
3.5	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ජන හා නිවාස තොරතුරු - 2010	34
3.6	වයස් කාණ්ඩ සහ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව දිස්ත්‍රික්කයේ ජනගහනය - 2010	35
3.7	දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ අංශ මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය - 2010	36
3.8	අධ්‍යයන ප්‍රදේශය සහ ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සේවාලාභීන්ගේ විසිරීම	40
3.9	ස්ත්‍රී/පුරුෂ භාවය සහ වයස් කාණ්ඩ අනුව සේවාලාභීන්ගේ විසිරීම	40
3.10	විවාහක/අවිවාහකත්වය අනුව සේවාලාභීන්ගේ විසිරීම	41
3.11	නියැදියට අයත් සේවාලාභීන්ගේ ප්‍රාථමික ආදායම් මාර්ගය	45
3.12	නියැදියට අයත් සේවාලාභීන්ගේ ඉඩම් ගැටලුවේ ස්වභාවය	48
3.13	ඉඩම් අයිතියේ ස්වභාවය අනුව සේවාලාභීන්ගේ ඉඩම් භුක්තිය	50
3.14	රාජ්‍ය සේවයේ සේවා කාලය අනුව නියැදියට අයත් නිලධාරීන්	51
3.15	අදාළ වෘත්තියේ සේවා කාලය අනුව නිලධාරීන්ගේ විසිරීම	52
3.16	අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවා නියුක්ත කාලය අනුව නිලධාරීන්ගේ විසිරීම	53
3.17	අදාළ ග්‍රාම නිලධාරී වසමේ සේවා කාලය අනුව ග්‍රාම නිලධාරී/ නිලධාරිනියන්ගේ විසිරීම	53
4.1	සපයන සේවාව සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය	56
4.2	නිලධාරී කාණ්ඩ අනුව ඔවුන්ගේ තෘප්තිමත්භාවයට බලපෑ හේතු	57
4.3	සේවා සපයන ආයතන අනුව සේවා සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ සේවාලාභීන්ගේ ඇගයීම	60
4.4	එක් එක් නිලධාරී කාණ්ඩ වෙතින් ඉඩම් විෂයයට අදාළව සැපයෙන් සේවාව සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම	61
4.5	දැනුම වර්ධනය සඳහා ඉදිරිපත් කළ යෝජනා (ප්‍රතිශතයක් ලෙස)	62
4.6	ඉඩම් විෂයය සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා ඇති නිලධාරීන්	63
4.7	නව නීති පිළිබඳ නිලධාරීන්ගේ දැනුවත් වීමේ මාර්ග	65
4.8	නීති සංශෝධන පිළිබඳ දැනුවත් වීමට ගතවන කාලය (නිලධාරී කාණ්ඩ අනුව)	67
4.9	සේවා පහසුකම් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන්ගේ ඇගයීම	72

4.10 සේවා පහසුකම් සම්බන්ධයෙන් ජනපද නිලධාරීන්ගේ ඇගයීම 73
4.11 සේවා පහසුකම් සම්බන්ධයෙන් කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගේ ඇගයීම 74
5.1 එක ම නිලධාරියා වෙත සේවා ඉල්ලීම කිහිප වරක් ඉදිරිපත් කර ඇති කාල පරාසය 79
5.2 ග්‍රාම නිලධාරීන් වෙතින් සැපයෙන සේවාවට ගත වන කාලය 81
5.3 ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් වූ සේවා ඉල්ලීම් සහ ඒවායේ ප්‍රගතිය 83
5.4 ජනපද/ඉඩම් නිලධාරීන් වෙත ඉදිරිපත් වූ සේවා ඉල්ලීම් සහ ඒවායේ ප්‍රගතිය 85
5.5 ජනපද/ඉඩම් නිලධාරීන් වෙතින් සැපයෙන සේවාවට ගතවන කාලය 86
5.6 ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ සේවා ඉල්ලීම්වල ප්‍රගතිය 88
5.7 සේවා ප්‍රමාදයට බලපාන හේතු 93
5.8 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සේවා සැපයීම ප්‍රමාදවීමට හේතු 95
5.9 මැනුම් සඳහා වන ඉල්ලීම් සහ අදාල වසර අවසානයේ නිම කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව 96
5.10 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට නිලධාරීන් විසින් ඉදිරිපත් කළ යෝජනා 98
5.11 පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ කාර්ය ප්‍රමාදයට හේතු 99
5.12 පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ කාර්ය් ප්‍රමාදය වැළැක්වීමට ඉදිරිපත් කළ යෝජනා 101
5.13 සමස්තයක් ලෙස ඉඩම් විෂයයෙ හි සේවාවන් කාර්යක්ෂම කිරීමට නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ යෝජනා 107
6.1 ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ දුර්වලතා හේතුවෙන් සේවාලාභීන් මුහුණ පා ඇති අවාසි සහ ගැටලු සහගත තත්ත්වයන් 107
6.2 සේවාලාභීන් එක් එක් ඉඩම් ගැටලු විසඳා ගැනීම සඳහා නිලධාරීන් හමු වූ වාර ගණන 116
6.3 සේවාලාභීන් එක් එක් ඉඩම් ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් වැය කරන ලද උපරිම කාලය, අවම කාලය සහ වැය කරන ලද කාලයේ සාමාන්‍යය 118
6.4 සේවා ලබා ගැනීම වෙනුවෙන් සේවාලාභීන් වැය කළ කාලයෙ හි සාමාන්‍ය වෙළඳපොළ වටිනාකම (ගැටලුව අනුව) 120
6.5 ගැටලු අනුව සේවාලාභීන් වැය කර ඇති මුදලෙ හි සාමාන්‍යය 122
6.6 එක් එක් ගැටලුව වෙනුවෙන් සේවාලාභීන් වැය කළ මුළු මුදලෙ හි සාමාන්‍යය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව) 123
6.7 අධ්‍යයන ප්‍රදේශයේ ඉඩම් ආරවුල් බහුලව වාර්තා වන ප්‍රදේශ 132
7.1 හම්බන්තොට දිස්ත්‍රික්කයේ වන ජීවි රක්ෂිත 140
7.2 හම්බන්තොට කලාපයේ පුරාවිද්‍යා රක්ෂිත/වැදගත් ස්ථාන 145
7.3 පොලිස් ස්ථානවලට ලැබී ඇති සුළු පැමිණිලිවලින් ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් වන පැමිණිලි 146
7.4 2011 වර්ෂය තුළ ඉඩම් සම්බන්ධයෙන් හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සිදු කෙරුණු කාර්යයන් 151

7.5 මැනුම් සඳහා වන ඉල්ලීම් සහ අදාළ වසර අවසානයේ නිම කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව 153
7.6 හම්බන්තොට දිස්ත්‍රික්කයේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රකාශිත ප්‍රදේශ 157

ප්‍රස්තාර සටහන්

3.1 දිස්ත්‍රික්කයේ විවිධ ආර්ථික මට්ටම්වල ජනතාව අතර ආදායම බෙදී යන ආකාරය 37
3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව – 2010 (කොට්ඨාසයෙහි මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස) 38
3.3 අධ්‍යාපන මට්ටම අනුව සේවාලාභීන්ගේ විසිරීම 42
3.4 සේවාලාභීන්ගේ නිවාස ඒකකයන් හි ජල හා විදුලි පහසුකම් හිමිකම පිළිබඳ තත්ත්වය 43
3.5 ප්‍රජා සංවිධානවල නිලතල දරන සේවාලාභීන්ගේ විසරීම (නිලතල දරන මුළු සේවාලාභීන්ගේ ප්‍රතිශතයක් ලෙස) 44
3.6 නියුතු කාර්යය අනුව සේවාලාභීන්ගේ ව්‍යාප්තිය 45
3.7 සේවාලාභීන්ගේ ඉඩම් භුක්තියේ ස්වභාවය (ඉඩම් වර්ගය අනුව) 46
3.8 ඉඩම් හිමිකාරීත්වය අනුව සේවාලාභීන්ගේ ඉඩම් භුක්තිය 47
3.9 ඉඩම් කැබලිවල ප්‍රමාණය අනුව සේවාලාභීන්ගේ ඉඩම් භුක්තියේ ස්වභාවය 49
4.1 නිලධාරීන්ගේ තෘප්තිමත්භාවයට හේතු 57
4.2 ඉඩම් සම්බන්ධ සේවාව පිළිබඳ සේවාලාභීන්ගේ ඇගයීම 59
4.3 නීති සංශෝධන සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් වීමට ගත වන කාලය 66
6.1 ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ දුර්වලතා නිසා දුෂ්කරතාවලට මුහුණ දුන් සේවාලාභීන් (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන්) 106

සිද්ධි අධ්‍යයන

5.1 ඉඩමේ අයිතිය සනාථ කිරීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු 91
5.2 ඉඩම් කට්ටි අංකය වෙනස්වීම 92
6.1 ඉඩම් ආඥා පනතේ තුන්වන උපලේඛනයට අනුව ඉඩම් හිමිකාරීත්වය පවුලේ එක් සාමාජිකයෙකුට හිමිවීම හේතුවෙන් මතු වී ඇති සමාජ-ආර්ථික ගැටලු 109
6.2 ඉඩමේ නෛතික අයිතිය තහවුරු කර ගැනීමට නො හැකි වීම නිසා පීඩාවට පත් වූ සේවාලාභිනියක් 111
6.3 ජයභූමි ඔප්පු සහිත ඉඩම්වල හතර මායිම් වැරදි ලෙස සටහන් වීම 130
6.4 නොතාරිස් ඔප්පු මඟින් රජයේ ඉඩම් පැවරීමේ දී මතු වන ගැටලු 133
6.5 රජයේ සංවර්ධන ව්‍යාපාර නිසා ඉඩම්වලට සිදු වූ හානි සහ නිසි පරිදි වන්දි නො ලැබීම 135
7.1 විල්මැත්තාව අභය භූමිය ප්‍රකාශයට පත් කිරීමේ ගැටලු 142

7.2	බිම් සවිය යටතේ මතු වූ මායිම් ගැටලු	155
7.3	බිම් සවිය යටතේ මතු වූ මායිම් ගැටලු	155
7.4	බිම් සවිය යටතේ මතු වූ මායිම් ගැටලු	155

පළමු වැනි පරිච්ඡේදය

හැඳින්වීම

1.1 පිවිසුම

ඉඩම් යනු සංවර්ධන ක්‍රියාවලියේ දී ඉතා වැදගත් මූලික ප්‍රාග්ධනයක් වන්නා සේ ම ග්‍රාමීය මෙන් ම නාගරික ජනතාවගේ ද ප්‍රධාන වත්කමක් වේ. ඉතිහාසය පෙන්වා දෙන අන්දමට මෙරට ඉඩම්වල භාරකරු වශයෙන් රජු කටයුතු කළ බවත්, රජුට හෝ රට වෙනුවෙන් සිදු කරන ලද සේවාවන් වෙනුවෙන් ඇතැම් අවස්ථාවල දී රජු වෙතින් පිරිනැමුණු ගම්වර (ප්‍රවේණි ඉඩම්) හැරෙන්නට රජය සතු වූ ඉඩම් සමාජ වත්කම්/පොදු දේපල වශයෙන් සැලකුණ හෙයින් පොදු ජනතාවට එම ඉඩම් පරිහරණය කිරීමටත්, සංවර්ධනය කිරීමටත් හැකියාව ලැබී ඇත[1]. එවැනි ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් පැවති දුර්වලතා හැරෙන්නට ඉඩම් සම්බන්ධයෙන් මතු වූ නඩබල ගැටලු හෝ ඉඩම් නොමැති ජනගහනයක් තුළින් මතුවන ගැටලු 19 වන සියවසේ මැද භාගය වන තෙක් ශ්‍රී ලංකාවාසීන්ට අත්විඳින්නට නො ලැබිණි (Wijedasa, n.d: 34-35). 19 වන සියවසේ මැද භාගයේ බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙනු ලැබූ ඉඩම් ප්‍රතිපත්ති[2] හේතුවෙන් මෙරට ජනතාව භුක්ති විඳි ඉඩම් විශාල ප්‍රමාණයක් රජය සතු වූ අතර ශ්‍රී ලාංකිකයින් අතර ඉඩම් නොමැති පන්තියක් බිහි කරමින් රජය මෙරට විශාලතම ඉඩම් හිමියා බවට පත්විය. මෙම නීති පැනවීමෙන් වසර එකසිය පනහකට පමණ පසුව, 1987 ඉඩම් කොමිෂන් සභා වාර්තාවෙන් හෙළි කරන අන්දමට 1980 දශකය වන විට ද දිවයිනේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 82.3%ක් රජයේ අයිතිය යටතේ පැවතිණි (Sessional Paper III, 1990; 44).

1930 දශකයේ මැද භාගයේ සිට විරැකියාව, දරිද්‍රතාව සහ ඉඩම් අහිමිකමේ ගැටලුවට පිළියම් යොදමින් ග්‍රාමීය සංවර්ධනය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව ඉඩම් නොමැති ජනතාව අතර රජයේ ඉඩම් බෙදාදීමේ ප්‍රතිපත්තිය රජය විසින් ක්‍රියාවට නංවන ලදී. රජයේ ඉඩම් ආරක්ෂා කර ගැනීම, ඒවායින් ආදායම් ඉපැයීම සහ කෘෂි නිෂ්පාදන සහ ආර්ථිකය නංවාලීම මෙම ප්‍රතිපත්තියේ අනෙකුත් අරමුණු වූ අතර වරින් වර සිදු කරන ලද සංශෝධන සහිතව වර්තමානයේ පවා ක්‍රියාවට නැගෙන 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත (Land Development

1 'සිංහල නීතියේ මූලධර්මය අනුව මහජනයා ඉඩම්වල අයිතිකරුවන් වූ අතර රජුගේ නඩත්තුව සඳහා ඔවුන් තම ඉඩම්වල නිෂ්පාදනයෙන් දහයෙන් එකක් දීමට එකඟ වී තිබිණි. මෙය වැඩවසම් නෝර්මන් සිද්ධාන්තය වූ රජු භූමියේ මූලික අධිපතියාය යන සංකල්පයෙන් සම්පූර්ණයෙන් වෙනස් වූවකි................. සිංහල රජවරුන් පසු කලක දී ඉඩම් සම්බන්ධ අයිතිය මත යම් යම් හිමිකම් ඉදිරිපත් කළ බව සත්‍ය නමුත් ඉඩම්වල අයිතිකරුවන් මහජනයාය යන මූලික සිද්ධාන්තය රජු හා ඔහුගේ සියලු කාර්යයන්ට බලපාමින් ඉදිරියටත් පැවතගෙන එන ලදී.' (පෙරේරා, 1927) උපුටා ගැන්ම ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,1985:2.

2 1840 අංක 5 දරන ආඥා පනතින් මුඩු ඉඩම් හෝ පදිංචියක් නොමැති හෝ වගා නොකරන ලද ඉඩම් රජයට අයත් සේ ද, 1840 අංක 12 දරන ආඥා පනතින් වසර 30ක කාලයක් නොකඩවා භුක්තිය හෝ පදිංචිය ඔප්පු කළ නොහැකි ඉඩම් රජයට අයත් සේ ද, 1897 අංක දරන මුඩුබිම් ආඥා පනතින් ප්‍රතිවිරුද්ධ තත්ත්වයකින් ඔප්පු කළ නො හැකි සෑම අවස්ථාවක ම ඒ සියලු ඉඩම් රජය සතු වන සේ ද, 1887 ඉඩම් නැවත ලබා ගැනීමේ ආඥා පනත යටතේ පුද්ගලික ඉඩම් රජයට පවරා ගැනීමට හැකිවන සේ ද නීති පනවන ලදී (බොරලැස්ස, 2007: 44).

Ordinance) මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නීතිමය ප්‍රතිපාදන සපයන ප්‍රධාන මූලාශ්‍රය වේ. මෙයට අමතරව 1947 අංක 08 දරන රාජ සන්තක ඉඩම් ආඥා පනත (Crown Lands Ordinance), 1979 අංක 23 දරන මහවැලි අධිකාරිය පනත, 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය, 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ගැනීමේ පනත, 1979 ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත, 2000 ගොවිජන සංවර්ධන පනත ආදී පනත් ද, බස්නාහිර පළාතේ 2002 අංක 07 දරන බස්නාහිර පළාත් ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය ආදී පළාත් ප්‍රඥප්ති ද රජයේ ඉඩම් පාලනය සම්බන්ධ කටයුතුවලට දායක වේ.

මෙම අණපනත්වලට අදාළව රජයේ ඉඩම් සම්බන්ධ කටයුතුවලට මැදිහත් වන ආයතන රාශියක් පවතී. 1935 ඉඩම් සංවර්ධන ආඥා පනතින් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ඔස්සේ රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් යාන්ත්‍රණයක් ස්ථාපිත කොට බලතල පවරන ලද අතර ඒ යටතේ ග්‍රාමීය, ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ රජයේ ඉඩම් පරිපාලනය සහ ඒ සම්බන්ධිත සේවා සැපයීමේ කටයුතුවල දී විශාල කාර්යභාරයක් සහ වගකීමක් දිසාපතිවරයාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට පැවරිණි. ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව ඉඩම් කොමසාරිස්වරයාට රජයේ ඉඩම්වල භාරකරු වශයෙන් එයට අදාළ කටයුතු ඉටුකිරීමෙ හි මෙන් ම නිලධාරීන් වෙත කාර්යයන් පැවරීම සහ ඔවුන් අධීක්ෂණයේ ඉහළ මට්ටමේ වගකීමක්, බලයක් සහ අධිකාරිත්වයක් හිමිවිය. කෙසේ වුව ද, 1979 මහවැලි අධිකාරිය පිහිටුවා අදාළ ප්‍රදේශවල රජයේ ඉඩම් සම්බන්ධයෙන් ප්‍රාදේශීයව සහ දිස්ත්‍රික් මට්ටමේ කටයුතු කිරීමේ වගකීම සහ බලය එයට පැවරීමත්, 1987 දහතුන්වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභාවලට ඉඩම් රාජකාරි සම්බන්ධයෙන් වන යම් යම් පරිපාලන බලතල පැවරීමත් නිසා ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ සහ එම දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ බලතල යම් ප්‍රමාණයකට අඩු වී ඇත. එමෙන් ම නාගරික සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධන අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වැනි එක් එක් විශේෂිත අවශ්‍යතා සඳහා පිහිටුවන ලද අධිකාර හෝ ව්‍යවස්ථාපිත ආයතනවල කටයුතුවල දී ඔවුන් රජයේ ඉඩම් සම්බන්ධයෙන් කිසියම් භූමිකාවක් නිරූපනය කරන බැවින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් මැදිහත් වන ආයතන සංඛ්‍යාව වර්ධනය වී ඇත.

පළාත් සභා පිහිටුවීමට පෙර රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සැපයීම සහ ඉඩම් පරිපාලනය දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා යටතේ අතිරේක දිසාපතිවරයෙකුගේ මෙහෙයවීම මත ඒ සඳහා වූ වෙනම ම අංශයකින් සිදු කළ අතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් දිසාපතිවරයා විසින් ඉඩම් කොමසාරිස් වෙත වගකිව යුතුව පැවතිණි. පළාත් සභා පිහිටුවීමත් සමඟ මෙම ක්‍රමය වෙනසකට බඳුන් වූ අතර 1992දී ජනතාවට සමීප, කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් පිහිටුවන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රමයත් සමඟ එය තවදුරටත් වෙනස් විය. මේ අනුව, එතෙක් දිසාපතිවරයා සතු වූ ඉඩම් සම්බන්ධයෙන් වන බලතල සහ වගකීම් සියල්ලම පාහේ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරිණි. ප්‍රාදේශීය ලේකම්වරුන් අධීක්ෂණය කිරීමේ බලතල දිස්ත්‍රික් ලේකම් (දිසාපති) වෙත පැවතිය ද, 1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලය පැවරීමේ පනත අනුව ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලතල දිස්ත්‍රික් ලේකම් වෙත පැවරී නොමැත.

එයට අමතරව, රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සැපයීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, රජයේ මිණින්දෝරු දෙපාර්තමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය ආදී ආයතන සහ නිලධාරීන් රාශියක් මැදිහත්ව කටයුතු කරනු ලබයි. මෙහි දී එක් එක් ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නො පැවතීම සේවා සැපයීමේදී ගැටලුවක් බවට පත්ව තිබේ.

විශාලත්වය අනුව හම්බන්තොට දිස්ත්‍රික්කය දිවයිනේ පරිපාලන දිස්ත්‍රික්ක අතුරෙන් දොලොස් වැනි ස්ථානයේ පසු වේ. වර්ග කිලෝ මීටර 2,609ක් පුරා විසිරී ඇති අතර එය දිවයිනේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 3.98% ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි. දිස්ත්‍රික්කයේ ඉඩම්වලින් වැඩි භූමි ප්‍රමාණයක අයිතිය රජය යටතේ පවතින අතර තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර, සූරියවැව, හම්බන්තොට ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම්වලින් අතිබහුතරය රජයේ ඉඩම් ලෙස සැලකේ.

1.2 පර්යේෂණ ගැටලුව

නිදහසින් පසු යුගය සලකා බලන විට රජයේ විවිධ දෙපාර්තමේන්තු, ආයතන සහ අධිකාර/සංස්ථා රාශියක් රාජ්‍ය ඉඩම් පාලනය (governance of the State lands) මෙන් ම සේවා සැපයීම සම්බන්ධයෙන් මැදිහත් වනු දැකිය හැක. එබැවින් රාජ්‍ය ඉඩම් පාලනය සේ ම සේවා සැපයීම ද බෙහෙවින් සංකීර්ණ ස්වභාවයක් ගෙන ඇත (Sessional Paper III, 1990; 196-201). එමෙන් ම, නීති සහ අණ පනත් රාශියක් ඉඩම් පාලනය/කළමනාකරණය සම්බන්ධයෙන් බලාත්මක වීම හේතුවෙන් ඉහත කී තත්ත්වය තවදුරටත් සංකීර්ණ වී තිබේ. මෙම තත්ත්වය තුළ සේවා සැපයීමේ අකාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ සේවාවන් හි අඩු ගුණාත්මක තත්ත්වය ආදී ගැටලු ගණනාවකට සේවාලාභීහු මුහුණ දෙති.

1987 ඉඩම් කොමිෂන් සභාවේ වාර්තාවෙන් පෙන්වා දෙන අන්දමට පළාත් සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවා එම ආයතන ඉඩම් විෂයය සම්බන්ධයෙන් මැදිහත්වීම ඇරඹීමට පෙර වුව ද, රජයේ ඉඩම් සම්බන්ධයෙන් මැදිහත්වන ආයතන අතර සම්බන්ධීකරණ ප්‍රතිපත්තියක් නොවීමේ දුර්වලතාව ඉඩම් විෂයය සම්බන්ධයෙන් හඳුනාගෙන තිබුණි. කොමිෂන් සභා වාර්තාව පෙන්වා දෙන අන්දමට ඔවුන් ප්‍රශ්නාවලියක් ඇසුරින් තොරතුරු ලබාගත් ඉඩම් විෂයය සම්බන්ධයෙන් මැදිහත්වන කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් පවා සේවා සැපයීමේ යාන්ත්‍රණය/රජයේ ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් වන කළමනාකරණ යාන්ත්‍රණය සම්බන්ධයෙන් තෘප්තිමත් නො වේ.

එමෙන් ම, මෑතක සිදුකරන ලද ඇතැම් අධ්‍යයනයන්ගෙන් පළාත් සභා මෙන් ම රජය විසින් ද සිදුකරනු ලබන රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම සම්බන්ධයෙන් සේවා දායකයින් තෘප්තිමත් නො වන බව සනාථ කර ඇත. නිදසුන් වශයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදු කරනු ලැබූ 'දේශීය ආහාර වගා අංශය කෙරෙහි පළාත් සභා ක්‍රමයේ බලපෑම' මැයෙන් වූ අධ්‍යයන වාර්තාව හෙළි කරන

අන්දමට අධ්‍යයනය සඳහා තොරතුරු සැපයූ ප්‍රතිචාරින්ගෙන් 78.7% පළාත් සභා විසින් සිදු කරනු ලැබූ රජයේ ඉඩම් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් තෘප්තිමත් නොවූ හෝ දැඩි සේ අතෘප්තිමත් කාණ්ඩයන්ට අයත් වූහ[3] (දමයන්ති සහ නානායක්කාර, 2008: 111). එමෙන් ම, රජයේ ඉඩම් සම්බන්ධිත සේවා සැපයීම සම්බන්ධයෙන් සිදු කළ තවත් අධ්‍යයනයකට අනුව ප්‍රතිචාරින්ගෙන් 84%ක් පළාත් සභා මෙන් ම මධ්‍ය ආණ්ඩුවට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සපයනු ලබන ඉඩම් සම්බන්ධිත සේවාවන් පිළිබඳ තෘප්තිමත් නොවන බව පෙන්වා දී ඇත (Damayanthi, 2011; 107).

ඇතැම් පළාත් සභාවන් හි නිල සංඛ්‍යාලේඛනවලින් පෙන්නුම් කරන ආකාරයට සේවාලාභීන් විසින් ඔවුන් වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා ඒවා ඉටු කිරීම සමඟ සසඳා බැලීමේ දී තෘප්තිමත් ආකාරයේ සේවා සැපයීමක් සිදු කිරීමට ඔවුන් අපොහොසත් ය. උදාහරණ වශයෙන් 2006 වසරේ දී වයඹ පළාත් සභාව වෙත යොමු කෙරුණු 779ක් වූ ඉල්ලීම්වලින් විසඳුම් ලබා දී ඇත්තේ 65%ට පමණි. එමෙන් ම, 2005 සහ 2006 වර්ෂයන්හි දී දකුණු පළාත් සභාවට ඉදිරිපත් වූ අනවසර නියමානුකූල කිරීම් සම්බන්ධිත ඉල්ලීම් 14,123ක් අතුරින් ඉල්ලීම් 4,722 (33.4%)ක් විමර්ශනයට ලක් කොට තිබූ අතර ඉදිරිපත්ව තිබූ ඉඩම් ආරවුල් 1,786ක් අතුරින් 3,761ක් (47.5%) නිරාකරණය කර තිබුණි (දමයන්ති සහ නානායක්කාර, 2008: 112).

ඉහත දත්ත සහ තොරතුරුවලින් පෙන්නුම් කෙරෙන අන්දමට රජයේ ඉඩම් සම්බන්ධිත සේවාවන් සැපයීමට අදාළව ආයතන ගණනාවක් පැවතිය ද සේවාලාභීන් වෙත කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් සැපයීමට එම ආයතන අපොහොසත් ය. හම්බන්තොට දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් සලකා බලන කළ වර්තමාන රජයේ සංවර්ධන වැඩපිළිවෙලත් සමඟ එම දිස්ත්‍රික්කයට වැදගත් ස්ථානයක් හිමිව ඇති අතර "විසල් හම්බන්තොට" ව්‍යාපෘතියට අදාළ කටයුතු සමඟින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සපයන ආයතනවල කාර්යභාරය සහ වගකීම තවදුරටත් වර්ධනය වී ඇත. ඒ සමඟින් සාමාන්‍ය සේවා සැපයීම පිළිබඳ කටයුතු තවදුරටත් පමාවීම සිදුවිය හැක. කෙසේ වුව ද, කිහිප ආකාරයක විමධ්‍යගතකරණ භාවිතාවන් යොදා ගනිමින් ආයතන රාශියක මැදිහත්වීම තුළ සිදු කෙරෙන රජයේ ඉඩම් පාලනය පිළිබඳ කටයුතු අකාර්යක්ෂම සහ ඵලදායී නොවන්නේ මන්දැයි යන්න සහ එකී අකාර්යක්ෂම සහ ඵලදායී නොවන සේවාව තුළින් සේවාලාභීන් වෙත ඇති කරනු ලබන බලපෑම් පිළිබඳව ඉහත සඳහන් කළ අධ්‍යයනයන්ගෙන් පැහැදිලිව විමර්ශනය කොට නොමැත. මෙම අධ්‍යයනය තුළින් පහත සඳහන් පර්යේෂණ ගැටලු සඳහා පිළිතුරු සෙවීමට උත්සාහ කරන ලදී.

1. අකාර්යක්ෂම සහ අවුල් සහගත සේවා සැපයීමට බලපා ඇති හේතු සාධක කවරේ ද?
2. පවතින සේවා සැපයීමේ ක්‍රමය සේවා දායකයින් වෙත බලපාන්නේ කවර ආකාරයකට ද?
3. පවතින ක්‍රමය ක්‍රමානුකූල සහ කාර්යක්ෂම සේවා සැපයීමේ ක්‍රමයක් දක්වා පරිවර්තනය කළ හැක්කේ කෙසේ ද?

---

[3] දකුණ, ඌව සහ වයඹ පළාත් ආශ්‍රිතව සිදු කරනු ලැබූ අධ්‍යයනයේ නියැදිය 600කි.

1.3 පර්යේෂණ අරමුණු

ඉඩම් විෂයය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දේශපාලන බලතල විමධ්‍යගතකරණය (devolution), බලතල පැවරීම (delegation) සහ පරිපාලන විමධ්‍යගතකරණය (deconcentration) යන විමධ්‍යගතකරණ භාවිතාවන් තුළ රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම පිළිබඳව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ මූලික අරමුණ විය.

විශේෂිත අරමුණු වන්නේ,

1. රජයේ ඉඩම් පාලනය අවුල් සහගතවීමටත්, සේවා සැපයීම ප්‍රමාදවීමටත් බලපා ඇති හේතු සාධක හඳුනා ගැනීම
2. රජයේ ඉඩම් සම්බන්ධිත සේවා සැපයීමේ ක්‍රමය තුළ සේවාලාභීන් විසින් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම
3. සේවා සැපයීමෙ ක්‍රමය තුළින් සේවාලාභීන් වෙත ඇති කරනු ලබන සමාජ සහ ආර්ථික බලපෑම් හඳුනා ගැනීම
4. රජයේ ඉඩම් පාලනය සහ සේවා සැපයීම සම්බන්ධයෙන් වඩා යෝග්‍ය ක්‍රමයක් හඳුනා ගැනීම සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම
5. ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන් වෙත සොයා ගැනීම් ඉදිරිපත් කිරීම සහ ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම

1.4 උපකල්පන

පහත සඳහන් උපකල්පන අධ්‍යයනයේදී සොයා බැලීමට ලක්විය.

1. ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීම පමාවීම කෙරෙහි අදාළ ආයතන අතර පවතින සම්බන්ධීකරණ දුර්වලතා, එක් එක් ආයතනවල කටයුතු සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් නො පැවතීම සහ සන්නිවේදන දුර්වලතා බලපානු ලබයි.
2. නීතිමය ප්‍රතිපාදනවල පවතින දුර්වලතා, යල්පිනු බව සහ නීතිය සම්බන්ධයෙන් අදාළ නිලධාරින්ගේ අනවබෝධය/දැනුමේ හිඟකම නිසා ඉඩම් සම්බන්ධ ගැටලු විසඳීම ප්‍රමාද වේ.
3. සේවා සැපයීම සම්බන්ධයෙන් වගවීමක් නොමැතිවීම, අකාර්යක්ෂම සහ ගුණාත්මක තත්ත්වයෙන් අඩු සේවා සැපයීම කෙරෙහි දායක වේ.
4. පරිපාලන දුර්වලතා (නිෂේධනාත්මක නිලබලතාන්ත්‍රික සංස්කෘතිය, අඩු අත්දැකීම් සහ ප්‍රවීණත්වය ඉහළ මට්ටමක නො පැවතීම) සේවා සැපයීම අකාර්යක්ෂම කිරීමටත්, ඵලදායිතාව අඩු කිරීමටත් බලපානු ලබයි.
5. ඉඩම් සම්බන්ධිත සේවා සපයා ගැනීමේ දී සපුරාලිය යුතු කොන්දේසි සහ ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන ආදිය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ අඩු දැනුවත්භාවය සේවා සැපයීම පමාවීමට දායක වේ.

6. රජයෙන් ප්‍රදානය කරනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් ඉඩම්ලාභීන් වෙත හිමිවන නීතිමය හිමිකම ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීමට බලපානු ලබයි.

1.5 පර්යේෂණ ක්‍රමවේදය

1.5.1 දත්ත රැස්කිරීමේ ක්‍රම

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික යන දෙ අංශයේ ම දත්ත භාවිතා කෙරිණි. ප්‍රාථමික දත්ත රැස් කිරීම ක්‍රම කිහිපයක් ඔස්සේ සිදු කරන ලදී. රජයේ ඉඩම් සම්බන්ධ සේවා සැපයීමට අදාළ ගැටලු 10ක් ඔස්සේ ඉල්ලීම් ඉදිරිපත් කළ සේවාලාභීන් 486 සහ නිලධාරීන් 185 ඇතුළත් ව 671ක් ඇසුරින් ප්‍රශ්නාවලි මාර්ගයෙන් තොරතුරු සම්පාදනය කර ගන්නා ලදී. එම ගැටලු පහත සඳහන් පරිදි වේ.

1. අනවසර නියමානුකූල කිරීම/බලපත්‍ර ඉල්ලීම හෝ ඉඩම් නොමැති අය ලියාපදිංචිය
2. දීමනා පත්‍ර හෝ ප්‍රදාන පත්‍ර ඉල්ලීම
3. ඉඩම් ආරවුල් නිරවුල් කිරීම සඳහා වන ඉල්ලීම්
4. ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම හෝ වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම
5. පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/නමක් එක් කිරීම
6. ජයභූමි ඔප්පු යටතේ ලබා දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණ/මායිම්/අයිතිය පිළිබඳව ගැටලු
7. ප්‍රදාන පත්‍ර හෝ දීමනා පත්‍ර සම්බන්ධයෙන් වන වෙනත් නීත්‍යානුකූල ගැටලු (බිම් සවිය වැඩසටහන යටතේ මතුව ඇති ගැටළු ද ඇතුළත්ව)
8. දීර්ඝ කාලීන බද්ද යටතේ ඉඩම් ලබා ගැනීම
9. රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩමක්, බැංකු හෝ අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම
10. තමන් සතු ඉඩමක් රජයට පවරා ගැනීම වෙනුවෙන් වන්දි ඉල්ලීම.

සේවා සැපයීමට සම්බන්ධ වන ග්‍රාම නිලධාරීන්, ජනපද නිලධාරීන්, ඉඩම් නිලධාරීන්, කළමනාකාර සහකාරවරුන්/ වරියන්, සංවර්ධන සහකාරවරුන්/වරියන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන් මෙන් ම ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන් ද ඇතුළත් වන පරිදි නිලධාරීන්ගේ නියැදිය තෝරා ගන්නා ලදී. නිලධාරීන්ගේ නියැදිය පහත සඳහන් පරිදි වේ.

වගු 1.1: නිලධාරීන්ගේ නියැදිය

නිලධාරී කාණ්ඩය	සංඛ්‍යාව
ග්‍රාම නිලධාරී	143
ඉඩම් නිලධාරී/ජනපද නිලධාරී	12
සංවර්ධන/ කළමනාකරණ සහකාර	24
ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම්	5
මහවැලි කොට්ඨාස කළමනාකරු	1
එකතුව	185

මෙයට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් පාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් මැදිහත් වන ආයතනවල නිලධාරීන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා මඟින්

තොරතුරු සම්පාදනය කරගන්නා ලදී. එසේ සම්මුඛ සාකච්ඡා සිදු කරනු ලැබූ නිලධාරීන් පිළිබඳ විස්තර වගු 1.2න් ඉදිරිපත් කෙරේ.

වගු 1.2: සම්මුඛ සාකච්ඡා මඟින් තොරතුරු ලබාගත් නිලධාරීන්

ආයතනය	නිලධාරී
සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය-දෙබරවැව (මධ්‍ය ආණ්ඩුව)	සහකාර ඉඩම් කොමසාරිස්, කළමනාකරණ සහකාරවරුන්/වරියන්
දකුණු පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය	පළාත් ඉඩම් කොමසාරිස්, නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්/හම්බන්තොට, කළමනාකරණ සහකාරවරුන්/වරියන්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය (වලව විශේෂ බල ප්‍රදේශය)	නේවාසික ව්‍යාපාර කළමනාකරු, ඉඩම් අංශයේ නිලධාරීන්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ හම්බන්තොට	දිස්ත්‍රික් ලේකම් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම්
බිම් සවිය කාර්යාලය, තිස්සමහාරාම	විමර්ශන නිලධාරීන්
දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය/හම්බන්තොට	දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් සහ කාර්ය මණ්ඩලය
පොලිස් අධිකාරී කාර්යාලය, තංගල්ල	පොලිස් අධිකාරී
අධ්‍යයනය සිදු කළ ප්‍රදේශවල පොලිස් ස්ථාන	වලස්මුල්ල, අම්බලන්තොට, හම්බන්තොට, ලුණුගම්වෙහෙර, සූරියවැව, තිස්සමහාරාම, තංගල්ල පොලිස් ස්ථානාධිපතිවරුන් සහ සුළු පැමිණිලි අංශයේ නිලධාරීන්
දකුණු සහ ඌව පළාත් වනජීවී අධ්‍යක්ෂ කාර්යාල	බූන්දල වනජීවී කාර්යාලයේ ස්ථානභාර නිලධාරී ඇතුළු නිලධාරීන්, දකුණු පළාත් නියෝජ්‍ය වනජීවී අධ්‍යක්ෂ සහ කළමනාකරණ සහකාරවරුන්, බෝගහවැව බිට්ටු කාර්යාලයේ නිලධාරීන්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	දිසා අඩවි වන නිලධාරී, හම්බන්තොට
ඉඩම් පරිහරන කාර්යාලය	දිස්ත්‍රික් ඉඩම් පරිහරන නිලධාරී, ඉඩම් පරිහරන කාර්යාලයේ (කොළඹ) සැලසුම් අධ්‍යක්ෂ
නාගරික සංවර්ධන අධිකාරිය	හම්බන්තොට කාර්යාලයේ සැලසුම් අංශයේ නිලධාරීන්
වරාය සංවර්ධන අධිකාරිය	හම්බන්තොට වරාය ව්‍යාපෘති නිලධාරී
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන කොමසාරිස් කාර්යාලයේ විෂයය භාර කළමනාකාර සහකාර
පුරා විද්‍යා දෙපාර්තමේන්තුව	හම්බන්තොට දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාලයේ නිලධාරීන්
දිස්ත්‍රික් මැණුම් අධිකාරී කාර්යාලය	හම්බන්තොට දිස්ත්‍රික් මැණුම් අධිකාරී
අධ්‍යයනය සිදුකළ ප්‍රදේශවල පළාත් පාලන ආයතන	අම්බලන්තොට, සූරියවැව, හම්බන්තොට, වලස්මුල්ල, තංගල්ල, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සභාපතිවරු සහ ඉඩම් විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන කළමනාකරණ සහකාරවරුන්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජන හා නිවාස සංගණන තොරතුරු, පර්යේෂණ වාර්තා, පොත්පත් සහ පුවත්පත් ලිපි ආශ්‍රයෙන් සපයා ගත් තොරතුරු ද්විතියික තොරතුරු වශයෙන් භාවිතා කරනු ලැබිණි.

1.5.2 අධ්‍යයන ප්‍රදේශය

මෙම අධ්‍යයනය හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට, හම්බන්තොට, සූරියවැව, තංගල්ල, වලස්මුල්ල, ලුණුගම්වෙහෙර සහ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශවල පළාත් සභා, මහවැලි සහ අන්තර් පළාත් ඉඩම් ආවරණය වන පරිදි සිදු කරන ලදී. අධ්‍යයනය සඳහා සේවාලාභීන් තෝරා ගැනීමේ දී බහුපිය නියැදි ක්‍රමය භාවිතා කරන ලදී.

1. පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දත්ත අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් වැඩි වශයෙන් පවතින සහ සේවා ඉල්ලීම් වැඩි වශයෙන් ඉදිරිපත් ව ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල හයක් සහ රජයේ ඉඩම් ප්‍රමාණය සාපේක්ෂව අඩු සහ සේවා ඉල්ලීම් අඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් (වලස්මුල්ල) තෝරා ගන්නා ලදී

2. තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයේ නිලධාරීන් හෝ පරිපාලන ග්‍රාම නිලධාරිවරයා සමඟ සිදු කෙරුණු සාකච්ඡාවලින් පසුව, රජයේ ඉඩම් බහුලව පවතින සහ සේවා ඉල්ලීම් වැඩි වශයෙන් ඉදිරිපත් වන ග්‍රාම නිලධාරී වසම් අතුරෙන් අහඹු ලෙස ග්‍රාම නිලධාරී වසම් තෝරා ගන්නා ලදී.

3. අදාළ ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී වෙත ඉඩම් සම්බන්ධයෙන් වන අධ්‍යයනයට අදාළ ගැටලු ඉදිරිපත් කොට ඇති සේවාලාභීන් අහඹු ලෙස තෝරා ගැණුනි.

4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත් නිලධාරී ලැයිස්තුවෙන් (ග්‍රාම නිලධාරී, ඉඩම් අංශයේ සේවා නියුක්ත කළමනාකරණ සහකාර, සංවර්ධන සහකාරවරුන්/වරියන්ගේ) අහඹු ලෙස තෝරාගත් නිලධාරී මහත්ම මහත්මීන් වෙතින් නිලධාරීන්ගේ ප්‍රශ්නාවලිය සඳහා තොරතුරු ලබා ගන්නා ලදී. එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාවෙන් 25%ක් ආවරණය වන ආකාරයට ග්‍රාම නිලධාරීන් තෝරාගත් අතර එහි දී මහවැලි අධිකාරිය යටතේ පාලනය වන ප්‍රදේශවල ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමට ග්‍රාම නිලධාරීන්ගේ මැදිහත්වීමක් නොවන නමුත් ඉඩම් විෂයය සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුවත්භාවය සහ ආකල්ප පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ අරමුණින් අධ්‍යයනය සඳහා එවන් ප්‍රදේශවල සේවය කරන නිලධාරීන් ද තෝරා ගැණුනි. මේ අනුව නිලධාරීන්ගේ ප්‍රශ්නාවලිය සඳහා පළාත් සභා, මධ්‍ය රජය සහ මහවැලි බල ප්‍රදේශවලට අයත් ග්‍රාම නිලධාරී වසම්වල සේවය කරන ග්‍රාම නිලධාරීන් ඇතුළත් විය.

5. ඉහත නිලධාරී කාණ්ඩවලට අමතරව, ජනපද නිලධාරීන්, ඉඩම් නිලධාරීන්ගෙන් ද ප්‍රශ්නාවලි ඇසුරින් තොරතුරු ලබා ගන්නා ලදී.

ප්‍රදේශ අනුව සේවාලාභීන්ගේ විසිරීම වගු සටහන් 1.3න් දැක් වේ.

වගුව 1.3: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව සේවාලාභීන්ගේ ව්‍යාප්තිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	සේවාලාභීන් සංඛ්‍යාව	මුළු සේවාලාභීන්ගෙන් ප්‍රතිශතය (%)
අම්බලන්තොට	58	11.9
සූරියවැව	74	15.2
ලුණුගම්වෙහෙර	61	12.6
හම්බන්තොට	67	13.8
තිස්සමහාරාම	80	16.5
වලස්මුල්ල	76	15.6
තංගල්ල	70	14.4
එකතුව	486	100.0

1.5.3 දත්ත විශ්ලේෂණය

ප්‍රමාණාත්මක දත්ත වගු සටහන් සහ ප්‍රස්තාර ඇතුළත් වූ සරල සංඛ්‍යානමය විධි ක්‍රම භාවිතයෙන් ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමය භාවිතයෙන් ද විශ්ලේෂණය කරන ලදී.

1.6 අධ්‍යයනයේ කාල රාමුව

අධ්‍යයනය 2010 ඔක්තෝබර් මස ආරම්භ කර 2011 අප්‍රේල් මස අවසන් කරන ලදී. ක්ෂේත්‍රයේ තොරතුරු රැස් කිරීම 2010 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සිදු කරන ලදී.

1.7 අධ්‍යයනයේ සීමා

1. මහවැලි අධිකාරිය යටතේ පාලනය වන ප්‍රදේශවල කොට්ඨාස කළමනාකරණ කාර්යාලවල (මයුරපුර, සූරියවැව, මුරවැසිහේන සහ අගුණුකොළපැලැස්ස) ඉඩම් විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන කොට්ඨාස කළමනාකාරවරුන්, ඒකක කළමනාකාර සහ විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන කළමනාකරණ සහකාරවරුන්/වරියන්ගෙන් තොරතුරු ලබා ගැනීමට පර්යේෂණ යෝජනාවලි අවස්ථාවේ දී සැලසුම් ඉදිරිපත් කර තිබුණ ද, ඒ සඳහා අවශ්‍ය අවසරය ලබා ගැනීමේදී මුහුණ පෑමට සිදුවූ දුෂ්කරතා නිසා ඉලක්කගත පරිදි නිලධාරීන්ගෙන් සහ අදාළ කාර්ය මණ්ඩලයෙන් තොරතුරු ලබා ගැනීමට නො හැකි විය. අවසර ලබා ගැනීමෙන් පසු මහවැලි අධිකාරියේ නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් ප්‍රශ්නාවලි මාර්ගයෙන් තොරතුරු ලබා ගත්ත ද, එය සංඛ්‍යාත්මකව ප්‍රමාණවත් නො වන හෙයින් සංඛ්‍යා ඉදිරිපත් කිරීමේ දී අදාළ දත්ත ඇතුළත් කොට

නොමැත. කෙසේ වූව ද, ඔවුන්ගෙන් ලබාගත් ගුණාත්මක තොරතුරු වාර්තාවෙහි ඇතුළත් කරන ලදී.

2. අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගත යුතු වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන ආයතනවලින් තොරතුරු ලබා ගැනීමට නො හැකි විය. අධ්‍යයනය සඳහා 2012 වසරට මුදල් ප්‍රතිපාදන නො තිබීමත් 2011 වසර තුළ අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු නිම කිරීමට සිදුවීමත් එයට හේතු විය.

1.8 පරිච්ඡේද සැලැස්ම

වාර්තාව පරිච්ඡේද අටකින් සමන්විත වේ. පළමු පරිච්ඡේදය අධ්‍යයනයේ පසුබිම, ගැටලුව සහ පර්යේෂණ ක්‍රමවේදය ඇතුළත් වූ හැඳින්වීම වේ. දෙවැනි පරිච්ඡේදයෙන් රජයේ ඉඩම් සහ ඉඩම් සම්බන්ධිත රාජ්‍ය ප්‍රතිපත්ති, විමධ්‍යගතකරණ න්‍යාය සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව, රැකියා තෘප්තිය සහ අභිප්‍රේරණය සම්බන්ධයෙන් කරුණු ඇතුළත් කළ සාහිත්‍ය විමර්ශනයක් සිදු කෙරේ. තෙවැනි පරිච්ඡේදයෙන් අධ්‍යයන ප්‍රදේශයේ ප්‍රතිචාරින්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරේ. මෙම පරිච්ඡේදයෙන්, දිස්ත්‍රික්කයේ භූගෝලයීය පිහිටීම සහ ස්වභාවික සම්පත්, පරිපාලන ව්‍යුහය, ඉඩම් පරිහරණ රටාව, ජනගහන තොරතුරු, සේවාලාභීන්ගේ සමාජ ආර්ථික පසුබිම, ඉදිරිපත් කර ඇති ගැටලුවේ ස්වභාවය සහ නිලධාරීන්ගේ වෘත්තීමය පසුබිම පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරේ. සිව්වැනි පරිච්ඡේදයෙන් සේවක අභිප්‍රේරණය, පුහුණුවීම් සහ සේවාවේ තෘප්තිමත්භාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කෙරේ. එමෙන් ම නිලධාරීන්ගේ සේවා තෘප්තිමත්/අතෘප්තිමත්භාවයට බලපා ඇති හේතු සාධක, සේවා සැපයීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම, විෂයය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ පුහුණුවීම් සහ සේවා පහසුකම් සම්බන්ධයෙන් නිලධාරීන්ගේ ඇගයීම සහ ඔවුන් මුහුණ දෙන ගැටලු පිළිබඳ සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කෙරේ. පස්වැනි පරිච්ඡේදයෙන් සේවා සැපයීමේ දී සිදුවන ප්‍රමාදයන් එයට හේතු වශයෙන් නිලධාරීන් මෙන් ම සේවාලාභීන් හඳුනාගත් කරුණුත් ඉදිරිපත් කෙරේ. එමෙන් ම සේවා සැපයීමේ දී සිදුවන ප්‍රමාදය මගහැරීම සඳහා නිලධාරීන් මෙන් ම සේවාලාභීන් ඉදිරිපත් කළ යෝජනා එම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. හයවැනි පරිච්ඡේදයෙන් සේවා සැපයීමේ ක්‍රියාදාමය තුළින් සේවාලාභීන් වෙත සිදු කරන සමාජ-ආර්ථික බලපෑම පිළිබඳ කරුණු සාකච්ඡා කෙරේ. හත්වන පරිච්ඡේදයෙන් රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සැපයීමට සෘජුව මැදිහත් නො වන නමුත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් වගකීම් උසුලන අනෙකුත් රාජ්‍ය ආයතන සහ ක්‍රියාත්මක භාවයේදී ඒවා මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන අතර අටවැනි පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ සාරාංශය, නිගමන සහ වඩා කාර්යක්ෂම සේවාවන් සඳහා යෝජනා ඉදිරිපත් කෙරේ.

දෙවැනි පරිච්ඡේදය

සාහිත්‍ය විමර්ශනය

2.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනයට අදාළ සාහිත්‍යමය විමර්ශනය සහ න්‍යායික පසුබිම ඉදිරිපත් කෙරේ. මෙහි දී, 'රජයේ ඉඩම්' යන්න සම්බන්ධයෙන් පවතින අර්ථ නිරූපණ මෙන් ම රාජාණ්ඩු යුගයේ සිට ඉඩම් සම්බන්ධිත රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ කෙටි විවරණයක් ඉදිරිපත් කෙරේ. එමෙන් ම, විමධ්‍යගතකරණ න්‍යාය සහ ශ්‍රී ලංකාවේ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව පිළිබඳ සාකච්ඡා කෙරේ. එයට අමතරව, මෙම අධ්‍යයනය සේවා සැපයීම සම්බන්ධයෙන් සිදු කරන ලද්දක් වන බැවින් රැකියා තෘප්තිය සහ අභිප්‍රේරණ සම්බන්ධයෙන් වන න්‍යායික පසුබිම විමසුමකට ලක් කෙරේ.

2.2 රජයේ ඉඩම් සහ ඉඩම් සම්බන්ධිත රාජ්‍ය ප්‍රතිපත්ති

2.2.1 රජයේ ඉඩම්

යම් පුද්ගලයෙකුට පෞද්ගලික අයිතිය ඇති බවට තහවුරු කළ නො හැකි සියලු ඉඩම් රජයේ ඉඩම් ලෙස සැලකේ. රජයේ ඉඩම් යන්න විවිධ නීති ලේඛනවල බොහෝ දුරට සමාන අරුතකින් අර්ථ දක්වා ඇත. 1840 අංක 12 දරන රජයේ ඉඩම් ආඥා පනතේ (State Land Encroachment Ordinance) 6 වැනි වගන්තියට අනුව, "පෞද්ගලික අයිතියක් ඉදිරිපත් නො වන සියලු ඉඩම් රජයේ ඉඩම් ලෙස පූර්ව නිගමනය කළ යුතු වේ." 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි (Land Development Ordinance) 2 වැනි වගන්තියෙන් විස්තර කෙරෙන අන්දමට "නීත්‍යානුකූලව ආණ්ඩුව සතුව පවතින සියලු ඉඩම් හා එයට අදාළ සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා හා වරප්‍රසාද රජයේ ඉඩම් යන්නෙන් අදහස් වේ." 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනතේ 18 වැනි වගන්තියෙන් ඉදිරිපත් කෙරෙන අන්දමට "නීත්‍යානුකූලව රජයට හිමිකම ඇත්තා වූ හෝ බද්ධ හෝ අනුබද්ධ සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද සමඟ රජය විසින් බැහැර කරනු ලැබිය හැක්කා වූ ඉඩම් හෝ ඉඩමෙහි පිහිටි යම් ගොඩනැඟිල්ලක් සමඟ ඒ ඉඩම රජයේ ඉඩම් යන්නෙන් අදහස් කෙරේ." මේ අනුව රජයේ ඉඩම් යන්නට පුද්ගලික හිමිකමට යටත් නො වන භූමිය මෙන් ම එයට අදාළ වන්නා වූ ගොඩනැඟිලි ඇතුළු අනෙකුත් භෞතික දේවල් සේම එම භූමිය සම්බන්ධයෙන් භුක්ති විඳිය හැකි අයිතිවාසිකම් සහ වරප්‍රසාද ද ඇතුළත් වේ.

2.2.2 පැරණි ලංකාවේ ඉඩම් භුක්තිය සහ නීති

ඉඩම්වල සිදු කෙරෙන වගාව, අස්වැන්න බෙදා ගැනීමේ ක්‍රමය සහ ඉඩම් භුක්ති විඳින්නාට ඉඩම පිළිබඳ ඇති අයිතිය අනුව පුරාණ ලංකාවේ ඉඩම් වර්ගීකරණය කොට ඇත. ඒ අනුව, වී වගා කළ ඉඩම් "කෙත්" හෙවත් "කුඹුරු" වශයෙන් ද, අනෙකුත් වගාවන්ගෙන් හා පදිංචි නිවාස සහිත ඉඩමෙන් බැහැරව සිදු කළ වල්පිට වගාවන් "හේන්" වශයෙන් ද සලකා ඇත (හේරත්, 2010:9).

අස්වැන්න බෙදී යාමේ පදනම මත ඉඩම් කිහිප ආකාරයකට වර්ග කෙරේ. "නින්දගම්" මේ අතරින් වැදගත් ඉඩම් කාණ්ඩයක් වන අතර එම ඉඩම්වල උපදින භෝගවල අයිතිය නින්දගම් අයත් පුද්ගලයාට සම්පූර්ණයෙන්ම හිමි වේ. ඉඩම් හිමියා සහ ඉඩම් භුක්ති විඳින්නා අතර අස්වැන්න බෙදා ගැනීම සිදු වූ ඉඩම් 'අඳ' ඉඩම් ලෙස වර්ග කළ අතර අඳයට වගා කිරීමට ලබා දෙන ඉඩම් තරම් සාරවත් නො වූ, එහෙත්, ගොවියා අඳයට වඩා අඩු අනුපාතයකින් ඉඩමේ භූමි ප්‍රමාණය මත පදනම්ව ඉඩම් හිමියාට අස්වැන්නෙන් කොටසක් බදු වශයෙන් ගෙවූ "ඔතු බදු" නම් වූ ඉඩම් කාණ්ඩයක් ද, විය. මෙයට අමතරව පරම්පරාවෙන් අයිතිය හිමිවන ඉඩම් "පරවේණි ඉඩම්" හෙවත් "ප්‍රවේණි ඉඩම්" ලෙස හඳුන්වන අතර ආගමික ස්ථාන සතු වූ ඉඩම් "විහාරගම්" සහ "දේවාලගම්" යනුවෙන් හැඳින්විණි (ඉහත ග්‍රන්ථය, 2010:10-17). රජය සතු වූ "ගබඩාගම්", "මුත්තෙටුව" සහ "නින්දගම්" මෙන් ම රජයට සේවා සැපයීම වෙනුවෙන් එම සේවා සපයන්නන්ට වගා කර ගැනීමට ලබා දී තිබූ "සේවා ඉඩම්" ද විය.

ඉහත කාණ්ඩවලට අමතරව රජු හෝ ප්‍රාදේශීය නායකයින් වෙනුවෙන් සේවාවන් ඉටු කළ නිලධාරින්ට ලබා දී තිබූ ඉඩම් "දිවෙල්" ඉඩම් වශයෙන් ද, වෘත්තීය සේවාවන් සැපයූවන්ට ලබා දී තිබූ ඉඩම් "වෘති" හෙවත් "ජීවිත දාන" ඉඩම් වශයෙන් ද හැඳින්විණි. මෙම ඉඩම් දෙවර්ගය සඳහා ම භුක්තිය සඳහා කිසිදු බද්දක් අය නො කළ අතර ඉඩම් භුක්ති විඳින පුද්ගලයින්ට එම ඉඩම් විකිණීමේ හෝ වෙනත් අයෙකුට පැවරීමේ අයිතිය නො තිබිණි (ඉහත ග්‍රන්ථය, 2010:22). පුරාණ ඉඩම් අයිතිය සම්බන්ධයෙන් විමසා බැලීමේ දී පෙනී යන්නේ එය බටහිර රටවල පැවති ඉඩම් අයිතිය පිළිබඳ තත්ත්වයෙන් වෙනස් වන බවයි. එනම්, මෙරට "රජු" හෙවත් "භූපති" භූමියේ/ඉඩම්වල තනි අයිතිකරු නොවූ අතර ඔහු ඉඩම්වල භාරකරු නැතහොත් ආරක්ෂකයා පමණක් විය (හේරත්, 2010:1-3, Wijedasa, දාතම නොමැති, 33). කෙසේ වූව ද, දීර්ඝ කාලයක් තිස්සේ වගා නො කොට අත්හැර දමා තිබෙන අයිතිකරුවෙකු නැති ඉඩම් රජුට අයත් ය යන්න එකල රාජ නීතිය විය.

මෙයට අමතරව, සේවා සැපයීම යටතේ ම තවත් ආකාරයක ඉඩම් භුක්තියක් පුරාණ ලංකාවේ පැවතිණි. එනම්, "මඩිගේ කාර්යාංශය" වෙත නිවාස තනා ගැනීම සඳහා උඩරටින් ලබා දී තිබූ ඉඩම් ය. මඩිගේ කාර්යාංශය මුවර්වරුන්ගෙන් සමන්විත වූ අතර මොවුන් රජුගේ ධාන්‍ය මුහුදු බඩ ප්‍රදේශවලට ගෙන ගොස් අලෙවි කිරීමත්, මුහුදුබඩ ප්‍රදේශයෙන් ලුණු, ජාඩි හා කරවල උඩරටට ගෙන යාමත් සිදු කළ වෙළෙඳුන් විය. ඔවුන්ගේ ලුණු හා ජාඩිවලින් බද්දක් ගෙවීමට ද රජුට අවශ්‍ය වූ විට එම වෙළෙන්දන්ගේ ගවයින් ගොවිතැන් කටයුතු සඳහා සපයාදීමට ද සිදු විය (හේරත්, 2010:24).

මහාචාර්ය තම්බයියා උපුටා දක්වමින් මිහිඳුකුලසූරිය (2000:2-6) පෙන්වා දෙන්නේ මෙරට ඉඩම් පරිහරණයේ අනන්‍යතා ලක්ෂණ කිහිපයක් ම පැවති බවයි. ඉන් පළමුවැන්න වන්නේ, ඉඩම් භුක්තිය කුල ක්‍රමය මත පදනම්ව පැවතීමයි. ඔහු පෙන්වා දෙන අන්දමට ඉහළ යැයි සම්මත කුලවල ජනයාට වැඩි ඉඩම් ප්‍රමාණයක් හිමි වූ අතර පහත් යැයි සම්මත කුලවල ජනයාට අඩු ඉඩම් ප්‍රමාණයක් හිමි විය. එමෙන් ම, චංඩාල කුලය වැනි ඇතැම් කුලවල ජනතාවට ඉඩම් හිමිකමක් නො තිබුණි. දෙවැන්න, සේවයට අනුව භුක්තිය ලබාදීමේ ක්‍රමයයි. තෙවැන්න, ඉඩම් භුක්තිය රාජකාරි ක්‍රමය මත රඳා පැවතීමයි. සිවුවැන්න, මෙරට පැවති ඉඩම් භුක්තිය ප්‍රාදේශීය

අවශ්‍යතාවන්ට සරිලන ක්‍රමයක් වීමයි. ජනගහනයට සාපේක්ෂව ඉඩම් බහුලව පැවති හෙයින් ඒක පුද්ගල ඉඩම් පරිභෝජනය ඉහළ මට්ටමක පැවති අතර කැලෑ ප්‍රදේශ බහුලව පැවතීම නිසා පරිසර සමතුලිතතාව ආරක්ෂා විය. පස්වැන්න වූයේ ඉඩම් භුක්තියේ පැවති නම්‍යශීලී ස්වභාවයයි. සාම්ප්‍රදායික ආචාර ධර්ම ඉඩම් නීතිය වශයෙන් ක්‍රියාවට නැඟුණු අතර තට්ටුමාරු, කට්ටිමාරු ක්‍රම මේ සඳහා උදාහරණ වේ. සයවැන්න වන්නේ අයිතිය සනාථ කෙරෙන අන්දමේ ලේඛන ක්‍රමයක් පැවතීමයි. රජු විසින් තුමන පදනමකින් හෝ ප්‍රදානය කරනු ලැබූ ඉඩම් පිළිබඳ විස්තර "ලේකම් මිටි" නමින් හැඳින්වෙන තල්පත් ලේඛනවල සටහන් කොට පවත්වාගෙන ගොස් ඇත. සමස්තයක් වශයෙන් ගත් කළ ඉඩම් පිළිබඳ ලේඛන "මහලේකමා" නැතහොත් "මහලේකම්" ධූරය දැරූ රජුගේ නිලධාරියෙකු විසින් සම්බන්ධීකරණය කොට පවත්වාගෙන ගොස් ඇති අතර ලේකම් මිටිවලට නම් ඇතුළත් කිරීම සහ බැහැර කිරීම මහ ලේකම්තුමාගේ අධීක්ෂණය යටතේ සිදු විය. ඉඩම් ආරවුල් විසඳීමේ දී මෙන් ම වෙනත් පරිපාලන, අධිකරණ හා මූල්‍ය කටයුතුවල දී මෙම ලේකම් මිටි භාවිතා කර ඇත.

2.2.3 විදේශීය පාලනයන් යටතේ මෙරට ඉඩම් ප්‍රතිපත්තිය

දිවයිනෙ හි මුහුදු බඩ ප්‍රදේශ පෘතුගීසි පාලනයට යටත් වන අවස්ථාව වන විට ද සේවා භුක්ති ක්‍රමය පදනම් කරගත් ඉඩම් ප්‍රතිපත්තිය මෙරට ක්‍රියාත්මක වූ අතර පෘතුගීසින් විසින් ඉඩම් භුක්තිය "තෝම්බු" ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම ආරම්භ කිරීමත් සමඟ ඉඩම් වෙනුවෙන් රජුට/රජයට සේවාවන් සැපයීමේ ක්‍රමය මුදල්වලින් බදු ගෙවීමේ ක්‍රමයකට ක්‍රමයෙන් පරිවර්තනය වී ඇත.

17 වැනි සියවසේ මැද භාගයේ ලන්දේසි පාලනය ක්‍රියාත්මක වීමත් සමඟ ඉඩම් ප්‍රතිපත්තියේ සැලකිය යුතු වෙනසක් සිදු වී ඇත. පෘතුගීසීන්ගේ තෝම්බු ක්‍රමය වෙනුවට නව තෝම්බු ක්‍රමයක් හඳුන්වාදීමත්, දිවෙල් ඉඩම්වල (ඇකමඩේෂන් ඉඩම්) ප්‍රමාණය සීමා කර වැඩි භූමි ප්‍රමාණය සඳහා භෝග බද්දක් අය කිරීමත් සිදු විය.[4] එමෙන් ම, සේවා භුක්තිය මත ලබා දී තිබූ ඉඩම්වල සේවා සපයන්නා මිය ගිය විට එම ඉඩම් නැවත රජයට පවරා ගැනීම (මලපලා ඉඩම්) සහ සේවය අවසන් වීම/අවසන් කිරීම මත පදනම්ව අදාළ සේවා ඉඩම් නැවත රජයට පවරා ගැනීම (නිලපලා ඉඩම්) සිදු කළ අතර එම ඉඩම් නව ක්‍රමයකට බදුදීමෙන් රජයේ ආදායම වර්ධනය කර ගැනීමට කටයුතු කෙරිණි.

බ්‍රිතාන්‍යයන් විසින් 1796 සිට ම සේවා භුක්ති ක්‍රමය වෙනුවට බදු අය කිරීමේ ක්‍රමයක් අනුගමනය කළ අතර මුහුදු බඩ ප්‍රදේශවල එක් පොල් ගසකට වර්ෂයකට රිදී පනමක් ද, කුඹුරුවල අස්වැන්නෙන් 1/10 ක් ද, බදු වශයෙන් අය කරන ලදී. මෙම ක්‍රමය 1798 දී අහෝසි කර පැරණි ක්‍රමයට අනුගත වූ නමුත් ෆෙඩ්රික් නෝත් ආණ්ඩුකාරවරයා විසින් 1800 දී පැන වූ රාජාඥාවක් මඟින් නැවත සේවා භුක්ති ක්‍රමය අවලංගු කොට ඉඩම් සඳහා බදු ගෙවීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. මෙහි විශේෂ ලක්ෂණ කිහිපයක් විය. පළමුවැන්න වූයේ හමුදා සේවය වෙනුවෙන් දිවෙල් ඉඩම් ලබා සිටි පුද්ගලයන්ට එම ඉඩම් අතහැර දමා ඒ වෙනුවෙන්

---

[4] 1745 සිට මෙම ඉඩම්වලින් පෝරෝ බද්ද නම් බද්දක් අය කරනු ලැබිණි. එය මුල්වරට අය කර ඇත්තේ මාතර දිසාවෙනි (හේරත්, 2010:25)

වැටුප් මත සේවයේ යෙදිය හැකි වීම යි. දෙවැන්න, සේවා භුක්තිය මත ලැබූ ඉඩම්වලට සේවා සැපයීම වෙනුවට ගොඩ ඉඩම්වල අස්වැන්නෙන් 1/10ක් ද, මඩ ඉඩම්වල අස්වැන්නෙන් 1/4 ද ගෙවා එම ඉඩම් අත් කරගත හැකිවීමයි. එමෙන් ම, එම ඉඩම් දිවෙල් ඉඩම් වූයේ නම් එම ඉඩම්වල බෝගයෙන් 1/4 ගෙවා අයිතිකර ගත හැකි විය. තුන්වැන්න, නො බෙදූ ඉඩම් භුක්ති විඳින සියලු දෙනා 1801 මැයි මස පළමු දිනට පෙර ඒ බව ලැන්ඩ්‍රාඩ් උසාවියට දන්වා තම අයිතිය තහවුරු කරගත යුතු වීම යි. එමෙන් ම, මෙකී හවුල් ඉඩම්වල භෝගයෙන් 1/5ක් බදු වශයෙන් ආණ්ඩුවට ගෙවිය යුතු විය. බෙදූ ඉඩම්වල අද භුක්තිය පවතින අවස්ථාවල බදු වශයෙන් අය කරනු ලැබුවේ 1/10 ක් පමණි. හතරවැන්න, ඔප්පුවක් හෝ සන්නසක් නොමැතිව පුද්ගලයින් විසින් ඒ වන විට භුක්ති විඳි "කණු පරවේණි"[5] සහ "රත්මැහැර"[6] ඉඩම් ඇතුළු සියලු ඉඩම් 1800 නොවැම්බර් මස 01 දිනට පෙර ලැන්ඩ්‍රාඩ් උසාවිය ඉදිරියේ ප්‍රකාශ කර ඉඩම් ලියාපදිංචි කිරීමේ කොන්දේසි යටතේ තම අයිතිය ලියාපදිංචි කර ගත යුතු වීමයි. එසේ ලියාපදිංචි කළ පසුව, එම ඉඩම්වල ආදායමෙන් 1/10ක් බදු වශයෙන් ගෙවිය යුතු විය. පස්වැන්න වූයේ, තනි පුද්ගලයෙකු වෙත එකවර ප්‍රදානය කෙරෙන ඉඩම් ප්‍රමාණය සීමා කිරීම ය. ඒ යටතේ මඩ ඉඩම් ප්‍රමාණය අක්කර 10 ද, ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 20ට ද, සීමා කෙරිණි. මෙවැනි ඉඩම් සඳහා මුල් අවුරුදු 5 තුළ බදු අය නො කළ නමුත් ඉන් පසුව මඩ ඉඩම් සඳහා අස්වැන්නෙන් 1/4 ද, ගොඩ ඉඩම් සඳහා 1/10 ක් ද වශයෙන් බදු අය කිරීමට නියම විය.

සේවා භුක්තිය මත අයත් වූ ඉඩම්වල අයිතිය බ්‍රිතාන්‍ය නීතිය යටතේ ද නවදුරටත් ආණ්ඩුව යටතේ ම පැවති අතර එම ඉඩම්වල උරුමය පිරිමි උරුමක්කාරයන්ට පමණක් පැවරිණි. සේවා ඉඩම් සම්බන්ධයෙන් පනවා තිබූ කොන්දේසි කඩකළහොත් හෝ පිරිමි උරුමක්කරුවෙකු නොමැති වූ විට ඉඩම් ආපසු රජයට පැවරිණි (හේරත්, 2010:29).

1818 දී රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා පැන වූ රාජාඥාව අනුව, උඩරට ප්‍රදේශවල ද ඉඩම් සම්බන්ධයෙන් වූ සේවා භුක්ති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කරන ලදී. මෙරට ජනතාව භුක්ති විඳි ඉඩම් විශාල ප්‍රමාණයක් ඔවුන්ට අහිමි කිරීමෙන් පසුව, 1890 අංක 28 දරන වියළි ධාන්‍ය බදු අවලංගු කිරීමේ ආඥා පනත සහ 1892 අංක 04 දරන වී බද්ද අවලංගු කිරීමේ ආඥා පනත මඟින් දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වූ, බ්‍රිතාන්‍යයන් විසින් මුල් කාලයේ පැන වූ නීති අවලංගු කරන ලදී.

යුරෝපීයයන්ට මෙරට ඉඩම් අයත් කර ගැනීමට තිබූ තහනම 1810 දී ඉවත් කළ අතර 1812 වන විට යුරෝපීය ජාතීන්ට අක්කර 4000 නො ඉක්මවන කැබලි වශයෙන් ඉඩම් අත්පත් කරගත හැකි බවට නීති පැනවිණි. මේ සඳහා අවශ්‍ය ඉඩම් සපයා ගැනීමට දේශීය ජනතාවගේ භුක්තියට යටත්ව එහෙත් නීත්‍යානුකූල ලියවිල්ලකින් ඔප්පු කළ නො හැකි මුඩු ඉඩම් ද, වගා නො කළ ඉඩම් ද, රජයේ ඉඩම් ලෙස සලකා අත්පත් කර ගැනීමට 1840 අංක 05 දරන ආඥා පනතින් විධි විධාන සලසන ලදී. මෙයට අමතරව 1840 අංක 12 දරන පනතින් අවුරුදු තිහක කාලයක් නො කඩවා භුක්තිය හෝ පදිංචිය ඔප්පු කළ නො හැකි ඉඩම් රජයට අයත් සේ සලකා ක්‍රියා කළ අතර 1856 විහාරගම් ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ (The Temple

[5] කණු පරවේණි - මිනිසුන් විසින් ගස් හෝ කැලෑ කපා ඉවත් කළ රජයේ කැලෑ
[6] රත්මැහැර – රජුට අයත් ලන්ද

Lands Registration Ordinance) අයිතිය තහවුරු කළ නො හැකි වූ ඉඩම් රජයට ගැනිණි (ගමගේ සහ දමයන්ති, 2008:60, Jogaratnam.2011:9).

1948 අංක 24 දරන කැලෑ ආඥා පනත තුළින් කැලෑවල දැව කැපීම සහ ප්‍රවාහනය තහනම් කෙරිණි. එමෙන් ම, 1897 අංක 01 දරන මුඩු බිම් ආඥා පනතින් ලිඛිත සාක්ෂි මත ඔප්පු කළ නො හැකි සෑම අවස්ථාවක ම ඒ සියලු ඉඩම් රජය සතු ඉඩම් වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි (බොරලැස්ස, 2007:44). මෙම පනත 1899, 1900, 1907 සහ 1927 දී සංශෝධනයට ලක් කළ ද, නමුත් මූලික පරමාර්ථ සහ ක්‍රමවේදයෙහි ලිහිල්වීමක් නො විණි. මෙකී නීතිවල බලපෑමෙන් දිවයිනේ ඉඩම්වලින් 90%ක් පමණ රජය යටතට පත් වූ අතර 1931 අංක 20 දරණ ඉඩම් නිරවුල් කිරීමේ පනත මඟින් මුඩු බිම් ආඥා පනත අවලංගු කරන විට අක්කර ලක්ෂ 55ට ආසන්න ප්‍රමාණයක් රජයේ ඉඩම් බවට පත්ව තිබුණි (හේරත්, 2010:89).

මෙසේ අයත් කරගත් ඉඩම්, අක්කරය සිලිං 5 බැගින් යුරෝපා ජාතිකයින්ට අලෙවි කළ අතර 1840 සිට 1843 දක්වා වූ කාලය තුළ අක්කර 230,000 මේ ආකාරයට බ්‍රිතාන්‍ය වැවිලිකරුවන්ට අලෙවි කොට තිබුණි. යටත්විජිතවාදීන් මෙරට ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති හේතුවෙන් උඩරට ප්‍රදේශවල විශාල ඉඩම් ප්‍රමාණයක් වැවිලි කර්මාන්තය සඳහා ලබා දී තිබූ අතර ස්වදේශීය ජනතාව ඉඩම් අහිමි පිරිසක් බවට පත්ව තිබිණි. මෙය කෙතරම් උග්‍ර තත්ත්වයක පැවතියේ ද යත් 1934 දී වැවිලි කර්මාන්තය සඳහා ලබා දී තිබූ අක්කර 49 භූමි ප්‍රමාණය නිදහස ලබන අවස්ථාව වන විට තේ සහ රබර් වගාව සඳහා පමණක් වූ බිම් ප්‍රමාණය අක්කර ලක්ෂ 12 ක් දක්වා ව්‍යාප්ත වී තිබුණි. එසේ ම, 1833 හා 1899 කාලය තුළ ශ්‍රී ලංකාවේ ගොඩ ඉඩම්වලින් 10%ක් විකුණා දමා තිබුණි (ගමගේ සහ දමයන්ති, 2008:61). එමෙන් ම, රජයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම වළක්වාලමින් පැන වූ නීති (Crown Land Encroachment Ordinance) උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ යටත් විජිත කාර්යාලය විසින් අක්කර 230,000 අලෙවි කොට ඇත (Snodgrass, 1966:22). ඉහත කී රජයේ ඉඩම් ප්‍රතිපත්ති යැපුම් කෘෂිකර්මාන්තය කෙරෙහි දැඩි බලපෑමක් සිදු කරන ලදී. සෙනෙවිරත්න (1993:37) පෙන්වා දෙන අන්දමට 1948 වන විට යැපුම් කෘෂිකර්මාන්තයේ නියැලුණු ගොවි පවුල්වලින් 26.3%ට කිසිදු ඉඩමක හිමිකම නො වූ අතර 42.3%ට හිමි වූයේ අක්කර භාගයකට අඩු බිම් ප්‍රමාණයකි. එමෙන් ම 54.1% අක්කර 01 ට අඩු බිම් ප්‍රමාණයක් පමණක් හිමි විය.

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පසු කාලීනව සිදු කරන ලද අධ්‍යයන කිහිපයකින් ම මෙම තත්ත්වය තහවුරු කරනු ලැබිණි. එනම්, 1975 කෑගල්ල දිස්ත්‍රික්කයේ බැමිණියවත්ත ගමෙහි සිදු කරන ලද අධ්‍යයනයකින් අනාවරණය වූ අන්දමට එම ගමේ ගෘහ ඒකකවලින් 23%ට කිසිදු ආකාරයේ ඉඩම් හිමිකමක් නො විය (Wijedasa, N.D:37).

2.2.4 නිදහසින් පසු ඉඩම් ප්‍රතිපත්ති

1927 ප්‍රථම ඉඩම් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව යමින් ව්‍යවස්ථාදායකය විසින් 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත සම්මත කරනු ලබන්නේ ඉහත කී පසුබිම තුළ ඉඩම් අහිමි දේශීය ජනතාවට යම් කිසි සහනයක් සැලසීමේ අරමුණෙනි. එය මෙරට ඉඩම් ප්‍රතිපත්තියේ

නොමැකෙන පිය සටහනක් වූ අතර පනතින් ඉඩම් භුක්තිය ආරක්ෂා කොට තහවුරු කරන ආකාරයේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙනු ලැබිණි. මේ අනුව, රජයෙන් ප්‍රදානය කරන ලද ඉඩමක් වෙනත් අයෙකුට අලෙවි කිරීමට නොහැකි වූ අතර උකස් තැබීම කළ හැකි වූයේ බලධාරීන්ගේ පූර්ව අවසරයක් මත පමණි. රජයේ ඉඩම් සම්බන්ධයෙන් මුල්කාලීනව හඳුන්වා දුන් ඉඩම් විකිණීම තහනම් කිරීම තුළින් ඉඩමේ අයිතිය තහවුරු කිරීමේ ප්‍රතිපත්ති මේ වන විටත් ක්‍රියාත්මක නමුත් 1981 ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනතේ විධි විධාන තුළින් ඉඩම් සම්බන්ධයෙන් වන රාජ්‍ය ප්‍රතිපත්තිය මුල් ප්‍රතිපත්තියෙන් යම් දුරකට බැහැර වෙමින් විවෘත ඉඩම් වෙළෙඳපොළක් දක්වා ගමන් කරමින් පවතී (Jogaratnam, 2001:10).

මෙම නීතිමය සංශෝධන යටතේ රජයෙන් ප්‍රදානය කළ ස්වර්ණභූමි සහ ජයභූමි දීමනා පත්‍ර මෙන් ම වර්තමානයේ ප්‍රදානය කරනු ලබන රත්නභූමි දීමනා පත්‍ර යටතේ වන ඉඩම් කට්ටිකරුට තම ඉඩම වත්කමක් වශයෙන් ඇපයට තබා අනුමත මූල්‍ය ආයතනයකින් ණය ලබා ගැනීමේ හැකියාව පවතී. යම් යම් සීමාවන්ට එනම්, ඉඩම් ගොවි පත්තියේ ම අයෙකුට පමණක් අලෙවි කිරීමට හැකිවීම, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වීම ආදියට යටත්ව මෙවැනි ඉඩම් වෙනත් පුද්ගලයෙකු වෙත බැහැර කිරීමේ නීතිමය අයිතිය ද පසුකාලීනව ලබා දී ඇත.

මෙයට අමතරව, මෙරට රාජ්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ වැදගත් පියවර කිහිපයක් 1970 දශකයේ දී ගන්නා ලදී. 1971 අප්‍රේල් මස ඇති වූ කැරල්ල මෙන් ම උඩරට ප්‍රදේශවල ඉඩම් අහිමි විශාල ජනතාවක් විසීම ද ඉඩම් සම්බන්ධයෙන් ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමට ප්‍රධාන වශයෙන් ම බලපෑ හේතුවක් විය (හැන්සාඩ් වාර්තාව, 1972 අගෝස්තු 18, තීරු අංක 2050-2052).

මේ අනුව, 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතත්, 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනතත්, 1976 අංක 25 දරන ජනාවාස නීතියත් හඳුන්වා දෙනු ලැබිණි. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත තුළින් ඉඩම් සඳහා උපරිම සීමාවන් පනවන ලදී. ඒ අනුව, කුඹුරු ඉඩම් සඳහා උපරිම සීමාව අක්කර 25ක් වූ අතර ගොඩ ඉඩම් සඳහා එය අක්කර 50ක් විය. පනත ඉදිරිපත් කිරීමේ මූලික අරමුණ වශයෙන් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීම, නිෂ්පාදන ඵලදායීතා වර්ධනය තුළින් ආනයන වියදම අඩු කිරීම හා වර්ධනය වන ඉඩම් ගැටලුවලට පිළියම් සෙවීම සඳහන් කෙරුණු අතර ම ගොවි ජනතාව අතර නොමිලේ ඉඩම් බෙදාදීම අරමුණක් නොවිය[7] (හැන්සාඩ් වාර්තාව, 1972 අංක 18, තීරු අංක 2057-2058). කෙසේ වූව ද, මෙම තත්ත්වය 1978 අංක 43 දරන ඉඩම් ප්‍රදාන (විශේෂ විධි විධාන) පනත මඟින් වෙනසකට ලක් වූ අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු රජයේ ඉඩම් කිසිදු අයකිරීමක් නොමැතිව පුද්ගලයන් වෙත නොමිලේ හිමි කරදීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරිණි (හේරත්, 2010:321). 1974 වසර අවසානය වන විට මෙම පනත යටතේ

---

7 "………. ගරු කථානායකතුමනි, මගේ පරමාර්ථ මේ පනතින් ඉටු නොවන බව කී මැද කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා (ආර්. ප්‍රේමදාස මහතා) ඊට හේතුන් ඉදිරිපත් කළා. ඉඩම් නැති අයට ලොකු මුදලක් ගෙවා ඉඩම් මිල දී ගන්නට නොහැකි බව එතුමා ප්‍රකාශ කළා. මේ ඉඩම් නිකම් දෙන්නට අප ලැස්ති නැති බව නම් මා කිව යුතුයි. ඉඩම් වගා කර ආදායමක් උපදවා ඉඩම්වල වටිනාකම ගෙවන්නට ඉඩම් ගන්නවුන්ට අවස්ථාව ලැබෙනවා ….." (හැන්සාඩ් වාර්තාව, 1972 අංක 18: තීරු අංක 2057-2058).

අක්කර 563,411 ට අයත් වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරා ගෙන තිබූ අතර එය ලංකාවේ කෘෂිකාර්මික බිම්වලින් 12%ක් ලෙස ගණන් බලා ඇත (Chandrasiri, 1988).

1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ සංශෝධන යටතේ සමාගම් 232ක අක්කර 418,000ක් පවරා ගන්නා ලදී (ගමගේ සහ දමයන්ති, 2008:68). මේ අනුව, පනත් දෙක යටතේ කුඹුරු අක්කර 20,000 අඩු ප්‍රමාණයක් ඇතුළත්ව අක්කර 981,368ක් රජයට අත්පත් කර ගෙන තිබූ අතර එය ලංකාවේ එවකට වගා කළ ඉඩම් ප්‍රමාණයෙන් 24%කට ආසන්න විය (Jogarathnam, 2001:11, Chandrasiri, 1988, CIRDAP, 2009:84).

1975 අංක 39 දරන පනත යටතේ ගම් පුළුල් කිරීමේ කාර්යය සඳහා ඉඩම් ලබාදීමේ හැකියාව හිමි වූ අතර එතෙක් පවරා ගෙන තිබූ ඉඩම්වලින් 14% ආසන්න ප්‍රමාණයක් (අක්කර 135,000)ක් ජනතාව අතර බෙදා දී තිබුණි. පීරිස් (1996) උපුටා දක්වමින් ජෝගරත්නම් (2011:12) පෙන්වා දෙනු ලබන්නේ ජනගහනයෙන් 1/3ට ආසන්න ප්‍රමාණයක් වෙත ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරය යටතේ ඉඩම් හිමිකම ලබා දී ඇති බවයි.

රජයේ ඉඩම් සම්බන්ධයෙන් මෑතකාලීන තවත් වැදගත් ප්‍රතිපත්තියක් වූයේ අනවසර ඉඩම් නියමානුකූල කිරීම සම්බන්ධයෙන් ගෙන තිබූ ප්‍රතිපත්තිමය තීන්දුවයි. ජනගහන වර්ධනය, නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව, රාජ්‍ය තන්ත්‍රයේ දේශපාලනීකරණය ආදී හේතු ගණනාවක් මුල් කර ගනිමින් මෙරට රජයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම පසුගිය දශක කිහිපය තුළ වර්ධනය වී ඇත (හේරත්, 2010:342, Jogarathnam, 2001:12). 1978 දී ඉඩම් අමාත්‍යාංශය විසින් සිදු කරන ලද සමීක්ෂණයකින් අනාවරණය කරගෙන ඇති අන්දමට පුද්ගලයින් ලක්ෂ 5කට ආසන්න ප්‍රමාණයක් විසින් ඉඩම් අක්කර ලක්ෂ 12ක ප්‍රමාණයක් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි (හේරත්, 2010:342). 1979-1985 කාලය තුළ තවත් අක්කර 175,000 ප්‍රමාණයක් පුද්ගලයින් 105,000ක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබුණි. 2006 වර්ෂයේ දී පමණක් පුද්ගලයන් 80,000 ක් විසින් විවිධ ප්‍රමාණයේ ඉඩම් කැබලි අනවසරයෙන් අත්පත් කරගෙන ඇත (බොරලැස්ස, 2008:55).

මේ ආකාරයට රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම සමඟ ඒ සම්බන්ධයෙන් රජය ගත් පියවර වූයේ අනවසරයෙන් අත්පත් කරගෙන ඇති ඉඩම් නියමානුකූල කොට ඒ ඉඩම්වල අයිතිය අනවසරකරුවන්ට පැවරීම ය. මේ අනුව 1982 වන විට අක්කර 485,000ට වැඩි භූමි ප්‍රමාණයක් නියමානුකූල කොට තිබූ අතර 1997 වන විට පුද්ගලයින් 410,000ක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ අක්කර 515,000ක ප්‍රමාණයක් නියමානුකූල කර තිබිණි (Jogarathnam, 2001:13).

විවිධ හේතු සාධක මුල් කරගනිමින් සිදු කළ අනවසර නියමානුකූල කිරීමේ දී මූලික කොන්දේසියක් වූයේ නියමානුකූල කරන ඉඩම් 1995.06.15 දිනට පෙර අනවසරයෙන් අත්පත් කරගත් ඉඩමක් විය යුතු වීම යි. 2008 මාර්තු 21 දින ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2008.06.13 වැනි දින ඉඩම් අමාත්‍යාංශය විසින් නිකුත් කළ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක

එල්ඩී/4/1/1/34/06 අනුව, දිගු කාලයක් තිස්සේ ක්‍රියාත්මක වූ අනවසර ඉඩම් නියමානුකල කිරීමේ ප්‍රතිපත්තිය නතර කිරීමට රජය විසින් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නා ලදී. ඒ අනුව, මේ වන විට අනවසර නියමානුකූල කිරීම නතර කොට ඇතත්, මහවැලි අධිකාරිය විසින් ක්‍රියාවට නංවන අවිධිමත් ඉඩම් විධිමත් කිරීමේ වැඩසටහන යටතේ එය යම් තාක් දුරකට මේ වන විට ද, අදාළ බල ප්‍රදේශවල ක්‍රියාත්මක වේ.

2.3 විමධ්‍යගතකරණ න්‍යාය සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව

පුළුල් අර්ථයකින් විමසා බලන විට විමධ්‍යගතකරණය යනු රාජ්‍ය කටයුතු සඳහා වන වගකීම් සහ අධිකාරිත්වය මධ්‍යයේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා විතැන් කිරීමයි. ඩෙනිස් ඒ. රොන්ඩිනෙල්ලි (1980;137) විග්‍රහ කරන අන්දමට "විමධ්‍යගතකරණය යනු සැලසුම් කිරීම, තීරණ ගැනීම සහ රාජ්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය සඳහා වන නීතිමය හා දේශපාලන අධිකාරිත්වය මධ්‍ය රජයේ සිට එහි ක්ෂේත්‍ර සංවිධාන සහ ආයතන, අර්ධ ස්වායත්ත ආයතන, ප්‍රදේශ සංවර්ධනය හෝ විශේෂිත කාර්යයන් සඳහා ස්ථාපිත කළ අධිකාරි හෝ රාජ්‍ය නොවන සංවිධාන වෙත පැවරීමයි." මධ්‍ය රජය විසින් විමධ්‍යගතකරණ ආයතනවලට ලබාදෙන නීතිමය, මූල්‍යමය සහ පරිපාලනමය ස්වාධීනත්වය හෝ එහි බලයේ ප්‍රමාණය මත විමධ්‍යගතකරණයේ ප්‍රමාණය රඳා පවතී (Navaratne – Bandara, 2010: 16 -192).

ලොව බොහෝ රටවල විමධ්‍යගතකරණ භාවිතාවන්ට යොමුව ඇති අතර ඒ සඳහා විවිධ හේතු සාධක බලපා තිබේ. සංවර්ධනය වෙමින් පවත්නා රටවල්, පාලනයෙහි සහ සේවා සැපයීමේ ක්‍රමවේදයන්හි පවතින ඵලදායක නොවන ලක්ෂණ මග හැරීම සඳහා ද සංවර්ධිත රටවල් පිරිවැය සඵලදායක ක්‍රමවේදයකට, කාර්යක්ෂමව සේවා සැපයීමේ අරමුණින් ද, විමධ්‍යගතකරණ භාවිතාවන්ට යොමු වී ඇත (Devas, 2005; 2). මෙකී කරුණුවලට අමතරව දරිද්‍රතාව අවම කිරීම, පුරවැසියන් සහ බදු ගෙවන්නන් කෙරෙහි වන වගවීම ඉහළ නැංවීම, සංකීර්ණ පරිපාලනමය ක්‍රියාදාමය සරල කිරීම තුළින් පුළුල් මට්ටමේ යහපාලනයක් ස්ථාපිත කිරීම ආදී කරුණු රාශියක් විමධගතකරණය සඳහා දායක වේ (Rondinelli, n.d, Scott, 1996: 4, Devas, 2002 : 1, Aminuzaman, 1999).

විමධ්‍යගතකරණයට බලපාතු ලබන අරමුණු අනුව එය; දේශපාලන, මූල්‍ය, පරිපාලන සහ වෙළෙඳපොළ විමධ්‍යගතකරණය වශයෙන් සිවු ආකාර වර්ගීකරණයකට ලක් කෙරේ (Rondinelli, 1980;137, Work;2002;5). මෙයට අමතරව, විමධ්‍යගත ආයතන වෙත බලතල පැවරීමේ ස්වභාවය හා එහි ප්‍රමාණය මත පරිපාලන විමධ්‍යගතකරණය: විභේදනය, අර්ධ ස්වායත්ත ආයතනවලට බලතල පැවරීම සහ පළාත් ආණ්ඩුවලට දේශපාලන බලතල පැවරීම යනුවෙන් තවත් ආකාර තුනකට වර්ග කෙරේ. වෙළෙඳපොළ විමධ්‍යගතකරණය රෙගුලාසිකරණය සහ පෞද්ගලීකකරණය යනුවෙන් තවදුරටත් කොටස් දෙකකට වර්ග කරනු ලබයි. මේ අනුව, ක්‍රියාත්මක තත්ත්වයේ දී විමධ්‍යගතකරණයේ ආකාර 5ක් ක්‍රියාත්මක වේ. එනම්,

1. පරිපාලන විමධ්‍යගතකරණය හෙවත් විභේදනය (Deconcentration)

2. බලතල පැවරීම (Delegation)
3. දේශපාලන බලතල පැවරීම (Devolution)
4. පුද්ගලීකරණය (Privatization)
5. රෙගුලාසිහරණය (de-regulation)

පහසුව තකා විමධ්‍යගතකරණ ආකාරයන් ඉහත දැක් වූ අන්දමට වර්ග කර දැක්වූව ද ප්‍රායෝගික භාවිතාවේ දී මේ සියලු ආකාරයන් එකිනෙක හා මිශ්‍රව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් සලකා බලන කළ, විභේදනය, අර්ධ ස්වායත්ත ආයතනවලට බලතල පැවරීම සහ පළාත් ආණ්ඩුවලට දේශපාලන බලතල පැවරීම යන පරිපාලන විමධ්‍යගතකරණයේ තුන් ආකාරය අනුව ම විමධ්‍යගතකරණය ක්‍රියාත්මක කරනු දැකිය හැකි ය.

2.3.1 විභේදනය සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව

විමධ්‍යගතකරණයේ (Deconcentration) දුර්වල ම ආකාරය වශයෙන් හඳුනා ගැනෙන විභේදනයේ දී සියළු ප්‍රදේශ සහ අංශවලට භාණ්ඩ සහ සේවා සැපයීමේ අරමුණෙන් වගකීම් සහ කාර්යයන් රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර කාර්යාල වෙත පවරාදීම සිදු වේ. මෙම විමධ්‍යගතකරණ ක්‍රමය තුළ ක්ෂේත්‍ර කාර්යාලවලට ස්වකීය වූ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ අධිකාරීමය බලයක් හෝ ස්වකීය ආදායම් උත්පාදනයේ බලය හිමි නොවේ. එමෙන් ම, තමන්ට පැවරෙන කාර්යයන් හෝ වගකීම් සම්බන්ධයෙන් නීති පැනවීමේ බලයක් විභේදනය යටතේ ක්ෂේත්‍ර කාර්යාලවලට හිමි නොවේ. ක්ෂේත්‍ර කාර්යාල නිරන්තරයෙන් එහි ප්‍රධාන කාර්යාලයට යටත්ව පවතින අතර ක්ෂේත්‍රයේ දී සිදු වන්නේ ඉහළින් ලැබෙන විධාන අනුව ක්ෂේත්‍ර කටයුතු ඉටු කිරීම පමණි.

විභේදනයට ශ්‍රී ලංකාවෙන් සැපයෙන හොඳ ම උදාහරණය කච්චේරි ක්‍රමය වේ. එමෙන් ම, රජයේ ඉඩම් සම්බන්ධයෙන් සලකා බලන විට පළාත් සභා පිහිටුවීමට පෙර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විභේදන ක්‍රමය ක්‍රියාත්මක කළ ආයතනයක් වශයෙන් හඳුනා ගත හැක. එම ක්‍රමය යටතේ ඉඩම් සංවර්ධන ආඥා පනත සහ වෙනත් පනත් මඟින් ඉඩම් කොමසාරිස්වරයා වෙත පැවරුනු කාර්යයන් ක්‍රියාවට නැඟුනේ දිස්ත්‍රික් මට්ටමේ දී දිසාපතිවරයාගේ අධීක්ෂණය යටතේ ඉඩම් විෂයය සඳහා පත් කරන ලද අතිරේක දිසාපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පැවති කච්චේරියේ ඉඩම් අංශය මඟිනි. මේ අනුව, අතිරේක දිසාපතිවරයා යටතේ දිස්ත්‍රික් සහකාර ඉඩම් කොමසාරිස්වරයෙකු ද, ඉඩම් නිලධාරීන් ද වූ අතර ජනපද නිලධාරීන් හා ක්ෂේත්‍ර උපදේශකවරු මාර්ගයෙන් බිම් මට්ටමේ වැඩ කටයුතු සිදු කරන ලදී (ජයතිලක, 2007: 34, බොරලැස්ස, 2007: 45). වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් ක්‍රමය මෙම විමධ්‍යගතකරණ ක්‍රමය සඳහා සමකාලීන නිදර්ශනයක් වේ. 1992 අංක 58 දරණ ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලය පැවරීමේ පනත යටතේ එතෙක් දිසාපතිවරයා විසින් දැරූ බලතල රාශියක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරූ අතර එසේ පැවරුනු විෂයයන් අතර "ඉඩම්" යනු ඉතා ම වැදගත් විෂයයකි. ඉඩම් සම්බන්ධ විෂයයන් පැවරීම යටතේ ප්‍රාදේශීය ලේකම්වරුන්ට පහත සඳහන් රාජකාරී පැවරී ඇත.

01. කොට්ඨාසය තුළ පිහිටි රජයේ ඉඩම්වල භාරකරු වශයෙන් කටයුතු කිරීම සහ රජයේ අවශ්‍යතා සඳහා ඉඩම් නිර්දේශ කිරීම.

02. අනෙකුත් ආයතනවලට අවශ්‍ය ඉඩම් අත්සතුකරණය සඳහා නිර්දේශ කිරීම

03. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා නිර්දේශ කිරීම

04. මැණුම් කටයුතු සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

05. සංරක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම

06. පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ගේ පූර්ව අනුමැතිය සහිතව ගොවි පන්තියේ පුද්ගලයන්ගෙන් ඉඩම් කච්චේරි සඳහා අයදුම්පත් කැඳවීම, ඉඩම් කච්චේරි පැවැත්වීම, කට්ටිකරුවන් තේරීම සහ තෝරාගත් පුද්ගලයන්ගේ නාම ලේඛන ප්‍රදර්ශනය කිරීම

07. ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම

08. දීමනා පත්‍රවල මූලික කෙටුම්පත් සැකසීම

09. තෝරාගත් කට්ටිකරුවන්ට රජයෙන් ලබා දී ඇති ඉඩම්වල පෞද්ගලික මිණුම් කිරීමටත්, බැංකු හෝ අනුමත මූල්‍ය ආයතන වෙත උකස් කිරීමටත් අවශ්‍ය අනුමැතිය ලබාදීම

10. දීමනා පත්‍ර සහිත ගොවි පන්තියේ පුද්ගලයෙකුට ලබාදුන් ඉඩමක අයිතිය ගොවි පන්තියේ ම වෙනත් අයෙකුට නොතාරිස් ඔප්පුවක් මඟින් බැහැර කිරීම/විකිණීම සඳහා අනුමැතිය ලබාදීම

11. රාජ්‍ය ඉඩම්වලට සම්බන්ධ ලෙජර්, සිතියම්, පිඹුරුපත් සහ බැහැර කිරීමේ ලේඛන ඇතුළු වැදගත් ලේඛන පවත්වාගෙන යාම, නඩත්තු කිරීම සහ ආරක්ෂා කිරීම

12. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබාදී ඇති බලපත්‍ර සහිත ඉඩම්වල බලපත්‍ර හිමියන් අදාළ කොන්දේසි සපුරා නොමැති අවස්ථාවල දී එම බලපත්‍ර අවලංගු කිරීම

13. රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම්වල කට්ටිකරුවන්ගේ කැමැත්ත පරිදි පසු අයිතිකරුවන් නම් කිරීම, වෙනස් කිරීම හෝ අළුතින් නම් එකතු කිරීම

14. රජයේ කාර්යයන් සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු (දමයන්ති, 2011:56)

මේ අනුව වර්තමානය වන විට ඉඩම් විෂයයෙහි පුළුල් බලතල සහ කාර්යයන් රසක් ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී තිබේ.

2.3.2 බලතල පැවරීම සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව

මධ්‍ය ආණ්ඩුවේ සාමාන්‍ය පාලනයෙන් බැහැරව පවතින, එහෙත් මධ්‍ය රජයට වගකිව යුතු අර්ධ ස්වායත්ත/අර්ධ රාජ්‍ය නියෝජිත ආයතන හෝ විශේෂිත කාර්යයන්/ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් ස්ථාපිත කරන ලද ආයතන වෙත පරිපාලන නියෝග හෝ තීන්දු මඟින් තීරණ ගැනීමේ අධිකාරිත්වය සහ වගකීම් පවරාදීම, බලතල පැවරීම (Delegation) යන්නෙන් අදහස් වේ. මේ තුළින් මධ්‍යයේ වගකීම් එක් එක් ආයතන වෙත පවරා දෙනු ලැබුවත් පළාත් හෝ ප්‍රාදේශීය මට්ටමේ ආණ්ඩු වෙත බලය පැවරීමක් නො වන අතර සත්‍ය වශයෙන් බලතල මධ්‍ය රජය වෙත රඳවා තබා ගැනීම සිදු වේ. ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් බලතල

පැවරීමේ ක්‍රමයට උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය පෙන්වා දිය හැකි ය.

අර්ධ ස්වායත්ත ආයතනවලට බලතල පැවරීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් 1979 අංක 23 ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ඉඩම් සම්බන්ධයෙන් පුළුල් බලතල හිමිව තිබේ. පනතේ 3 (1) වගන්තිය අනුව මහවැලි ගඟෙහි හෝ වෙනත් යම් ප්‍රධාන ගංගාවක ජල සම්පත්වලින් සංවර්ධනය කළ හැකි යම් ප්‍රදේශයක, මහවැලි අධිකාරියේ විශේෂ ප්‍රදේශයක් ලෙස ජනාධිපතිවරයාගේ අනුමැතිය සහිතව ගැසට් නිවේදනයක් මඟින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි අතර පනතේ අනෙකුත් විධි විධානවලට යටත්ව එම ප්‍රදේශ සම්බන්ධයෙන් අධිකාරියේ බලතල සියල්ල ම හෝ ඉන් කොටසක් ක්‍රියාත්මක කිරීමට ද තම කටයුතු සියල්ල ම හෝ ඉන් කොටසක් ඉටු කිරීමට ද හැකියාව ඇත. පනතේ 13 (4) සිට (6) දක්වා වගන්තිවලින් මහවැලි විශේෂ බල ප්‍රදේශයක ඉඩම්වල, ගොවිපොළවල සහ දේපළවල පදිංචිවීම දියුණු කිරීමට, එයට සහාය වීමට සහ එය සුරක්ෂිත කිරීමටත් එම ඉඩම්වල පදිංචි වන හෝ වෙනත් අන්දමකින් එම ඉඩම් සංවර්ධනය කරන හෝ එසේ කිරීමට කැමැත්ත දක්වන පුද්ගලයින්ගේ එම වියදම් ගෙවීමට හෝ ඒ සඳහා දායකවීමටත් අධිකාරියට බලය ඇත. එ මෙන් ම විශේෂ ප්‍රදේශවල සියළු ඉඩම් හෝ ඉන් කොටසක් සංවර්ධනයට, කළමනාකරණයට, වගා කිරීමට, නඩත්තු කිරීමට, බදු දීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීමට මහවැලි අධිකාරියට බලය ඇත. එ මෙන් ම පනතේ 13 (34) වගන්තිය යටතේ යම් විශේෂ ප්‍රදේශයක ප්‍රජාවගේ පොදු සුභ සිද්ධිය සඳහා අවශ්‍ය වන සියළු පියවර ගැනීමට අධිකාරියට බලය හිමි වේ.

මහවැලි අධිකාරියේ 22 (1) සහ (2) වගන්ති මඟින් මහවැලි විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියේ විශේෂ බලතල පිළිබඳව සඳහන් කෙරේ. ඒ අනුව, “22 (1) මෙහි “ආ” උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් තත් කාලයේ ලිඛිත නීති, එයින් යම් ලිඛිත නීතියකින් යම් අධිකාරියක්, නිලධාරියෙකු හෝ නැනැත්තෙකු වෙත පැවරී ඇති බලතල අතරින් කිසිවක් ක්‍රියාත්මක කිරීමට හෝ බලය පවරන ලද ඒ අධිකාරිය, නිලධාරියා නැතහොත් නැනැත්තා පිළිබඳ සඳහන් කිරීමට අධිකාරිය පිළිබඳව සඳහන් කිරීමක් ද ඇතුළත්ව ඇත්තාක් මෙන් අධිකාරිය විසින් ඒ ප්‍රදේශයෙහි, ඒ බලතල අතරින් කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය අතරින් කිසිවක් කිරීම හෝ නීත්‍යානුකූලය යන මද වෙනස්කම් කිරීමට යටත්ව, සෑම විශේෂ ප්‍රදේශයකම බල පැවැත්විය යුතු ය.” යනුවෙන් දැක් වේ.

පනතේ 22 (2) වගන්තියෙන්, පනතේ “ආ” උප ලේඛනයෙහි තත් කාලයෙහි නිශ්චිත සඳහන් යම් ලිඛිත නීතියක් මඟින් බලතල හෝ කාර්යයන් කිසිවක් පැවරී ඇති කිසියම් අධිකාරියක් විසින්, නිලධාරියෙකු විසින් හෝ නැනැත්තෙකු විසින් 14 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් ඇති කර ගන්නා ලද යම් වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යෙදවීමේ නැතහොත් ගිවිසුමක් ඉටු කිරීමේ කාර්යය සඳහා හැර, විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් එවැනි බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය කිසිවක් කිරීම හෝ කරනු නො ලැබිය යුතු ය.” යනුවෙන් සඳහන් වේ.

පනතේ "ආ" උප ලේඛනයෙහි රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් සංවර්ධන ආඥා පනත, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධි විධාන) පනත, කැලෑ ආඥා පත සහ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනත ආදී පනත් රාශියක් ඇතුළත්ව තිබේ. ඒ අනුව එකී පනත්වලට අදාළ කාර්යයන් හි නිරතවීමේ හැකියාව සහ බලය 1979 අංක 23 දරන පනතින් මහවැලි අධිකාරිය වෙත හිමි කර දී ඇත. මේ අනුව, මහවැලි සංවර්ධන අධිකාරිය රජයේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන බොහෝ ආයතනවලට අදාළ කාර්යයන් ඉටු කිරීමේ හැකියාව ලබන අතර ඒ සඳහා අවශ්‍ය බලතල පනත මඟින් අධිකාරියට ලබා දී ඇත.

2.3.3 දේශපාලන බලතල පැවරීම සහ ඉඩම් සම්බන්ධයෙන් එහි භාවිතාව

විමධ්‍යගතකරණයේ ඉහළ ම ආකාරය ලෙසින් සැලකෙන්නේ ප්‍රාදේශීය හෝ ප්‍රාන්ත ආණ්ඩු වෙත බලතල පැවරීමයි. මෙහි දී, බලතල පැවරෙන ඒකකයන්ට හෙවත් උප ජාතික මට්ටමේ ආණ්ඩුවලට මධ්‍ය රජයේ සෘජු පාලනයකින් තොරව ස්වායත්තව සහ ස්වාධීනව තමන්ට පැවරී ඇති විෂයය ක්ෂේත්‍රයන් හි ක්‍රියාත්මක විය හැක. එසේ තම වගකීම් ක්‍රියාවට නැංවීම සඳහා එම විෂයය පථයන්ට අදාළව නීති පැනවීමේ බලයත් ස්වකීය කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමේ බලයත් එම උප ජාතික ආණ්ඩුවලට හිමි වේ. එමෙන් ම, විමධ්‍යගත ඒකකයන්ට ස්වකීය අයවැයක් පවත්වාගෙන යාමේ, අරමුදල් ස්ථාපිත කිරීමේ, කළමනාකරණයේ සහ ආදායම් උත්පාදනයේත්, එම ක්‍රමවේදය සහ පද්ධතිය නිරීක්ෂණය සහ ඇගයීමේත් බලය හිමි වේ. එමෙන් ම, මෙම ඒකකයන් හි අධීක්ෂණය ප්‍රදේශයේ ජනතාව විසින් ඡන්දයෙන් තෝරා පත් කර ගත් නියෝජිතයන් මාර්ගයෙන් සිදුවන අතර බලතල පැවරෙන ඒකකවලට නිශ්චිත වූ භූමි සීමාවක් පවතී.

කෙසේ වූව ද, ඇතැම් පරිපාලන න්‍යායාචාර්යවරුන් පෙන්වා දෙන අන්දමට දේශපාලන බලතල පැවරීම, විමධ්‍යගතකරණයෙන් යම්තාක් දුරට වෙනස් වේ. එනම්, විමධ්‍යගතකරණයේ දී සංවිධාන අභ්‍යන්තරයේ බල සම්බන්ධතාවේ හැසිරීම පිළිබඳ විස්තර කළ ද, දේශපාලන බලතල පැවරීම මඟින් විස්තර කෙරෙන්නේ අන්තර් සංවිධානයන් හි බල සම්බන්ධතාවේ හැසිරීම වීම මෙයට හේතුව ලෙස ඔවුහු පෙන්වා දෙති (Rondinelli, 1980;138).

13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මඟින් පළාත් සභා පිහිටුවීම දේශපාලන බලතල පැවරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වන හොඳ ම නිදසුන වන අතර දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ, 9 වැනි උප ලේඛනයෙහි පළාත් සභා ලැයිස්තුවෙහි 18 වැනි අයිතමය වශයෙන් "ඉඩම්" සඳහන් කර ඇත. ඒ අනුව, පළාත් සභා ලැයිස්තුවේ II වැනි පරිශිෂ්ඨයෙහි දක්වා ඇති ප්‍රමාණයට ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයයෙහි ඇති අයිතිවාසිකම්, ඉඩම් භුක්තිය, ඉඩම් විකිණීම හා අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම්වල පදිංචි කරවීම හා ඉඩම් සංවර්ධනය සම්බන්ධ කරුණු පළාත් සභාවලට හිමි වේ. දේශපාලන බලතල පැවරීම යටතේ "ඉඩම්" විෂයය තවදුරටත් පළාත් සභා සමඟින් සම්බන්ධ වන්නේ ඉඩම් විෂයය හා බැඳුණු ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම, කෘෂිකර්ම හා ගොවිජන සේවා, වාරිමාර්ග සහ සත්ත්ව පාලන විෂයයන්, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළෙඳ ව්‍යවසාය සංවර්ධනය,

සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ බලය මෙන් ම රජයේ අත්සතු කළ ඉඩම් සඳහා ගාස්තු හා බදු අය කර ගැනීමේ බලය ද පළාත් සභාවලට හිමි කර දී ඇති බැවිනි.

පළාත් සභා ලැයිස්තුවේ 18 වැනි අයිතමය යටතේ ඉඩම් පළාත් සභා විෂයයන් වශයෙන් හඳුන්වා ඇතත් එම ලැයිස්තුවේ ම II වැනි පරිශිෂ්ඨයේ ඉදිරිපත් කෙරෙන කොන්දේසිවලින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (ඇ) වගන්තියෙන් එම බලතල දැඩිව සීමා කරනු ලබයි. 33 (ඇ) වගන්තියට අනුව ඉඩම් ප්‍රදානය කිරීමේ හෝ බැහැර කිරීමේ බලය දිගට ම ජනරජයේ ජනාධිපතිවරයා වෙත හිමි වේ. එනම්, ඉඩම් බැහැර කිරීමේ අනන්‍ය බලය තවදුරටත් මධ්‍ය රජය යටතේ පවතී. පළාත් සභා ලැයිස්තුවේ දෙවැනි පරිශිෂ්ඨයේ විධි විධානවලට අනුව ජනාධිපතිධූරය දරන්නා විසින් පළාතක් තුළ පිහිටි රජයේ ඉඩමක් යම් සංවිධානයකට හෝ පුද්ගලයෙකුට බැහැර කිරීමේ දී පළාත් සභාවේ උපදේශ මත ක්‍රියා කළ යුතු වුව ද, පළාත් සභාවේ අවසරය ඒ සඳහා අවශ්‍ය නො වේ. මේ අනුව විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ඉඩම් සම්බන්ධ බලතල පළාත් සභා වෙත පවරා ඇතත් සත්‍ය වශයෙන්ම පළාත් සභාවලට හිමිව ඇත්තේ ඉඩම් පරිහරණය කිරීමේ බලය මිස ඉඩම්වල අයිතිය බැහැර කිරීමේ බලය නො වන බව යි (හේරත්, 2010: 684, Damayanthi, 2011: 80, දමයන්ති, 2011: 53).

එමෙන් ම, පළාත් සභා ලැයිස්තුවේ II වැනි පරිශිෂ්ඨයේ 1.1 ඡේදයෙන් ඉදිරිපත් කරන ආකාරයට යම් පළාතක් තුළ පිහිටි ඉඩමක් සංචෘත හෝ සමගාමී විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍ය රජයට අවශ්‍ය වන අවස්ථාවක මධ්‍ය රජය ඒ සම්බන්ධයෙන් පළාත් සභාවේ කැමැත්ත/අකමැත්ත විමසිය යුතු ය. බොරලැස්ස (2007; 93) ඉදිරිපත් කරන ආකාරයට අදාළ කාර්යය සඳහා ඉඩම් යෙදවීම පිළිබඳව පළාත් සභාව අකැමැත්තක් දක්වන්නේ නම් ඒ සඳහා විකල්ප ඉඩමක් යෝජනා කිරීමට පළාත් සභාවට හැකියාව පවතින අතර පළාත් සභා සීමාව තුළ පිහිටි රජයේ ඉඩමක් රජයේ කාර්යයන් සඳහා යොදවා ගැනීමට පළාත් සභාවෙන් කැමැත්ත විමසා දින 42ක් ඇතුළත පළාත් සභාවෙන් පිළිතුරු ලබා නොදුනහොත් ඒ සඳහා පළාත් සභාවේ විරෝධතාවක් නොමැති සේ සලකා ක්‍රියා කරනු ලබයි. එමෙන් ම, යම් පළාත් සභාවක් රජයේ ඉඩමක් තම කටයුතු සඳහා යොදා ගන්නා විට අදාළ ඉඩමේ අයිතිය රජයෙන් පළාත් සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු ය. කෙසේ වුවද ද, පළාත් සභා විෂයයක් ක්‍රියාත්මක කිරීම සඳහා පෞද්ගලික ඉඩමක් අවශ්‍ය වූ විට එම ඉඩම පවරා ගැනීම පළාත් සභාවට සිදු කළ නො හැකි අතර රජය විසින් එම ඉඩම අත්පත් කරගෙන පළාත් සභාවට ලබාදිය යුතු ය (හේරත්, 2010; 685).

පළාත් සභා වෙත විමධ්‍යගත කරනු ලැබූ ඉඩම් බලතල අනුව පළාත් ඉඩම් කොමසාරිස් සහ ඔහු/ඇයගේ කාර්ය මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

1. ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත පූර්ව අනුමැතිය ලබාදීම.
2. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර සහ දීමනා පත්‍ර සම්බන්ධ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සහ නිරීක්ෂණය කිරීම.

3. රජයේ ඉඩම් සම්බන්ධ කටයුතුවල දී ඉඩම් කොමසාරිස් ජනරාල් පළාත් සහ මධ්‍ය රජයේ ඉඩම් අමාත්‍යාංශ සහ පළාත් සභා සහ ප්‍රාදේශීය ලේකම් අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

4. රජයේ ඉඩම් ආරවුල් සම්බන්ධ අභියාචනා, ඉඩම් කච්චේරිවල අභියාචනා විමර්ශනය කොට තීන්දු ලබාදීම.

5. පළාත සඳහා අදාළ ඉඩම් සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම.

6. පළාත සඳහා අවශ්‍ය නීති සහ ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

7. ඉඩම් සම්බන්ධ කටයුතුවල දී අවශ්‍ය විටෙක අධිකරණය ඉදිරියේ පෙනී සිටීම.

8. අවශ්‍ය අවස්ථාවල දී ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් නිකුත් කිරීම.

9. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සකසා එවනු ලබන දීමනා පත්‍ර පරීක්ෂා කොට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

10. පළාතේ ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචිය සඳහා කටයුතු කිරීම සහ ගොවි නොවන පත්තිවල ඉඩම් කච්චේරි සඳහා අයදුම්පත් කැඳවීම.

පළාත් සභා වෙත ඉඩම් සම්බන්ධයෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභාව විසින් පනවනු ලබන ප්‍රඥප්ති මඟින් ඒ සඳහා ඇවැසි බලය උත්පාදනය කර ගැනීමේ හැකියාව පවතී. මේ වන විට උතුරු මැද පළාතේ 1994 අංක 05 සහ 1994 අංක 04 දරන ප්‍රඥප්ති ද බස්නාහිර පළාතේ 2002 අංක 07 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය ද සම්මත කර ඇති නමුත් උතුරු මැද පළාත් සභා ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් විධි විධාන සකස් කර නොතිබීම නිසා ක්‍රියාත්මක නොවේ. එමෙන් ම, බස්නාහිර පළාත් ප්‍රඥප්තියේ පවතින ඇතැම් වගන්ති, මූලික නීතිය සමඟ ගැටීමේ ස්වභාවයත්, මධ්‍ය රජයේ ආකල්පයනුත් හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණ ඇත. මෙයට අමතරව පළාත් සභාවලට තම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලය පළාත් සභා (අනුෂාංගික විධි විධාන) පනත යටතේ ලබා ගනී. එමෙන් ම, සියළු ම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්/වරියන් ගැසට් නිවේදනයක් මඟින් මධ්‍ය රජයේ අතිරේක ඉඩම් කොමසාරිස්වරුන්/වරියන් ලෙස පත් කිරීම සිදුවන අතර මේ මඟින් පළාත් සභා ඉඩම් කොමසාරිස්වරයා මුහුණ දෙන ඇතැම් ගැටලු විසඳා ගැනීමට හැකියාව ලැබෙන අතර ම මධ්‍ය රජයට තම කාර්යයන් ඉටු කර ගැනීම සඳහා පළාත් නිලධාරියෙකු පත් කර ගැනීම ද සිදු වේ.

2.4 රැකියා තෘප්තිය හා අභිප්‍රේරණ

රැකියා තෘප්තිය යනු සේවකයෙකු විසින් ඉටු කරනු ලබන කාර්යයන්, රාජකාරී හෝ වගකීම් පිළිබඳ ඇගයීමක් පමණක් නොවන අතර එය සමස්තයක් වශයෙන් සම්පූර්ණ රාජකාරී පරිසරය ම පිළිබඳව වන ඇගයීමක් සහිත පොදු ආකල්පයකි. කළුආරච්චි (2000; 58) නිර්වචනය කරන අන්දමට "රැකියා තෘප්තිය යනු, කිසියම් පුද්ගලයෙකු විසින් කරනු ලබන්නා වූ රැකියාව කෙරෙහි ඔහු හෝ ඇය තුළ පවතින පොදු ආකල්පයකි." රැකියා තෘප්තිය තීරණය වීමෙහි ලා මානසික වශයෙන් සම්බන්ධ වන රැකියා අභියෝග, සාධාරණ ප්‍රතිලාභ, සහයෝගී

වැඩ පරිසරය සහ සහයෝගී සම සේවාදායකයින් යන සාධක වැදගත් වන බව පර්යේෂණ මඟින් හඳුනා ගෙන ඇත (කළුආරච්චි, 2000; 59 – 61).

'රැකියා තෘප්තිය' සේවා කාර්ය ඵලදායිතාව සමඟ සම්පව බැඳී පවතින්නකි. එමෙන් ම, 'සේවක අභිප්‍රේරණය' සේවක ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා යොදා ගනු ලබන මාධ්‍යයකි. පුළුල් අර්ථයෙන් නිර්වචනය කරන කළ "අභිප්‍රේරණය යනු කිසියම් පුද්ගලයෙකුගේ භෞතික හෝ මානසික සාධක ක්‍රියාත්මක වීම තුළින් ඔහු/ඇය කෙරෙහි සිදු කරනු ලබන බලපෑමක්" වන අතර සංවිධානයක හෝ ආයතනයක සේවක අභිප්‍රේරණය යනු "යම් පුද්ගලයෙකුගේ යම් අවශ්‍යතාවක් හෝ අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට ඇති හැකියාව සහ ඉඩ ප්‍රස්තා මත ඔහු/ඇය විසින් සිය සංවිධානයේ ඉලක්ක සපුරාලීම සඳහා උත්සාහ දරන්නා වූ ඉහළ මට්ටමේ සූදානම් වීමකි" (ඉහත ග්‍රන්ථය, 2000; 65-66).

සේවක අභිප්‍රේරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන න්‍යායන් අතර මුල්කාලීන න්‍යායන් මෙන් ම සමකාලීන න්‍යායන් ද වැදගත් වේ. අවශ්‍යතා ධූරාවලි න්‍යාය (Hierarchy of Needs Theory) එක්ස් සහ වයි න්‍යාය (X and Y Theory) සහ අභිප්‍රේරණ ස්වස්ථතා (Motivation – Hygiene Theory) මුල් කාලීන අභිප්‍රේරණ න්‍යායන් වේ. සමකාලීන න්‍යායන් සම්බන්ධයෙන් අපේක්ෂා න්‍යාය (Expectancy Theory), අවශ්‍යතා න්‍යාය (Need Theory), ඊ.ආර්.ජී. න්‍යාය (ERG Theory), අභිමතාර්ථ තබා ගැනීමේ න්‍යාය (Goal Setting Theory), උපස්ථම්භක න්‍යාය (Reinforcement Theory) සහ සාධාරණත්ව න්‍යාය (Equity Theory) වැදගත් වේ.

2.4.1 අවශ්‍යතා ධූරාවලි න්‍යාය

ඒබ්‍රහම් මැස්ලෝ විසින් (Abraham Maslow) ඉදිරිපත් කරන ලද අවශ්‍යතා ධූරාවලි න්‍යායෙන් ඉදිරිපත් කෙරෙන අන්දමට අවශ්‍යතා වර්ග පහක් ධූරාවලියක අන්දමින් සෑම මිනිසෙකු තුළ ම ක්‍රියාත්මක වේ.

මැස්ලෝ විසින් ඉදිරිපත් කරන ලද පුද්ගල අවශ්‍යතා පහළ මට්ටමේ අවශ්‍යතා (භෞතික සහ ආරක්ෂණ අවශ්‍යතා) සහ ඉහළ මට්ටමේ අවශ්‍යතා (සමාජයීය, සම්මානනීය සහ ආත්ම පරිපූර්ණ අවශ්‍යතා) යනුවෙන් කොටස් දෙකකට වර්ග කර දක්වනු ලබයි. මැස්ලෝ පෙන්වා දෙන අන්දමට පහළ මට්ටමේ අවශ්‍යතා සම්පූර්ණයෙන් තෘප්තිමත් වූ පසු එයට ඉහළ මට්ටමේ අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයා පෙළඹෙන අතර පුද්ගලයා විසින් නිරන්තරයෙන් යම් අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමට උත්සාහ දරනු ලබයි. එමෙන් ම, බොහෝ විට මිනිසුන්ගේ අවශ්‍යතා ජාලය සංකීර්ණ වන අතර පහළ මට්ටමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ මාර්ගවලට වඩා ඉහළ මට්ටමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මාර්ග පවතී. මෙම ධූරාවලි න්‍යායට අනුව සම්පූර්ණ නො වූ අවශ්‍යතා අභිප්‍රේරණ සාධක සේ ක්‍රියා කරයි.



(උපුටා ගැනීම කළුආරච්චි, 2000; 70)

2.4.2 'එක්ස්' සහ 'වයි' න්‍යාය

පුද්ගලයන් තුළ මූලික වශයෙන් දක්නට ලැබෙන සෘණාත්මක සහ ධනාත්මක ලක්ෂණ පදනම් කොට ගෙන ඩග්ලස් මැක්ග්‍රෙගර් විසින් මෙම න්‍යාය ගොඩනඟා ඇත. 'එක්ස්' (X) න්‍යායට අනුව සේවකයින් වැඩ කිරීමට අකමැති, කම්මැලි, වගකීම් භාර ගැනීමට අකමැති සහ දඬුවම් කළ යුතු පිරිස් ලෙස කළමනාකරුවන් විසින් උපකල්පනය කරනු ලබයි. වයි (Y) න්‍යායට අනුව සේවකයින් වැඩ කිරීමට කැමති, නිර්මාණශීලී, වගකීම් භාර ගැනීමට කැමති සහ ස්වයං මඟපෙන්වීමක් කරනු ලබන පිරිසක් ලෙස කළමනාකරුවන් විසින් උපකල්පනය කරනු ලබයි. මැක්ග්‍රෙගර්ගේ එක්ස් න්‍යායට අනුව හැකි සෑම අවස්ථාවක ම කාර්යයන් මගහැරීමට සේවකයින් උත්සාහ දරන හෙයින් ඔවුන්ට තර්ජනය කිරීම, පාලනය කිරීම හෝ දඬුවම් කිරීම තුළින් සේවා කාර්යයන් ඉටු කරවා ගැනීමට කළමනාකරුවන්ට සිදු වේ. මෙම සේවකයින් සේවා වගකීම් භාර ගැනීමෙන් වළකින අතර හැකි සෑම අවස්ථාවක ම විධිමත් මඟපෙන්වීමක් බලාපොරොත්තු වේ. එමෙන් ම, ඔවුන් අනෙක් සියළු ම සාධකවලට වඩා සේවා ස්ථානයේ පවතින ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිලිමත් වේ.

මැක්ග්‍රෙගර්ගේ 'වයි' (Y) න්‍යායට අනුව නිර්මාණශීලී තීරණ ගැනීමේ කටයුතුවල දී සියළු ම සේවකයින් උනන්දු වන අතර ස්වයං පාලනයක් හා මඟපෙන්වීමක් ඇති කරගැනීම තුළින් සංවිධානයේ ඉලක්ක සපුරා ගැනීමට සේවකයින් උත්සාහ දරනු ලබයි. එමෙන් ම" සේවකයින් තම සේවා කාර්යයන් තමන් විනෝදය තකා කරන කාර්යයන් සේ සැහැල්ලුවෙන් ඉටු කිරීමට

පෙළැඹේ. මැක්ග්‍රෙගර් පෙන්වා දෙන අන්දමට 'වයි' න්‍යායේ ලක්ෂණ වඩා වලංගු වන අතර සේවක අභිප්‍රේරණය සඳහා සංවිධාන තීරණ ගැනීමේ කටයුතුවලට ඔවුන්ව සම්බන්ධ කරවා ගැනීම සහ සාමූහික සම්බන්ධතා ඇතිවන ආකාරයේ ප්‍රවේශයන් සේවා කාර්යයන් ඉටු කිරීමේ දී යොදා ගැනීම ආදිය කළමනාකරුවන් විසින් සිදු කළ යුතු බව සඳහන් කරනු ලබයි.

2.4.3 අභිප්‍රේරණ ස්වස්ථතා න්‍යාය හෙවත් ද්වි සාධක න්‍යාය

ෆ්‍රෙඩ්රික් හර්ෂ්බර්ග් (Frederick Herzberg) ගේ අභිප්‍රේරණ ස්වස්ථතා න්‍යාය තුළින් මිනිසුන් තම රැකියාව තුළින් බලාපොරොත්තු වන්නේ කුමක් ද? යන්නට පිළිතුරු සැපයීමට උත්සුක විය. මෙම න්‍යායට අනුව සේවාවේ තෘප්තිමත්භාවයට අභිප්‍රේරණ සාධක (ඉලක්ක සපුරා ගැනීම, අන් අයගේ පිළිගැනීමට ලක්වීම, රැකියාවේ ස්වභාවය, වගකීම්, උසස්වීම්, වර්ධන අවශ්‍යතා) බලපාන අතර අතෘප්තියක් ඇති නො වීමට ස්වස්ථතා සාධක (සේවා ස්ථානයේ ප්‍රතිපත්ති සහ පරිපාලනය, සුපරීක්ෂණය, අන්තර් පුද්ගල සබඳතා, වැටුප්, සේවා කොන්දේසි/සේවා තත්ත්වයන්, සම සේවා දායකයින් සහ ආරක්ෂාව ආදිය) බලපානු ලබයි.

සේවක අභිප්‍රේරණය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික මතයට වෙනස්ව ඉදිරිපත් කෙරෙන අභිප්‍රේරණ ස්වස්ථතා න්‍යායෙන් අභිප්‍රේරණ සාධක සහ ස්වස්ථතා සාධකවල ද්විත්ව සම්බන්ධතාව තුළින් පුද්ගලයන් තුළ සිය රැකියාව සම්බන්ධයෙන් අතෘප්තියක් ඇති නො කරන බව පැවසේ. මෙම න්‍යායට අනුව කළමනාකරුවන්ට ස්වස්ථතා සාධක තුළින් සේවකයින් අතෘප්තියට පත් නොවී තබා ගත හැකි වුවත්, ඒ සාධක තුළින් සේවකයින් අභිප්‍රේරණයට ලක් කළ නො හැකි ය.

2.4.4 අපේක්ෂා න්‍යාය (Expectancy Theory)

වික්ටර් රූම් (Victor Vroom) විසින් ඉදිරිපත් කරන ලද අපේක්ෂා න්‍යායෙන් රැකියා තෘප්තියට/අතෘප්තියට බලපානු ලබන සාධක පිළිබඳ විමර්ශනයට කරනවාට වඩා සමස්ත රැකියා පරිසරය ම පිළිබඳ අවධානය යොමු කරනු ලබයි. මෙම න්‍යායට අනුව සේවකයා සිය රැකියාවෙන් අපේක්ෂා කරන දෑ ලැබෙන බව විශ්වාස කරන විට ඔවුන් අභිප්‍රේරණයට ලක් වේ.

2.4.5 මැක්ලෙලන්ඩ්ගේ අවශ්‍යතා න්‍යාය (Mcclelland's Theory of Needs)

ඉලක්ක සපුරා ගැනීම හෙවත් සාධනය, බලය සහ අනුබද්ධවීම යන ප්‍රධාන සාධක තුන මූලික කරගනිමින් මැක්ලෙලන්ඩ් සහ ඔහුගේ අනුගාමිකයන් විසින් ඉදිරිපත් කළ මෙම න්‍යායෙන් පැවසෙන්නේ එකී අවශ්‍යතා අභිප්‍රේරණ සාධක වශයෙන් ක්‍රියාත්මක වන බවයි. මෙහි දී, සාධන අවශ්‍යතා යනුවෙන් යම් කිසි සම්මතයන් හෝ පුද්ගල අපේක්ෂාවන් ළඟා කර ගැනීම සඳහා පවතින අවශ්‍යතාව අදහස් කෙරේ. සාධන අවශ්‍යතා ඇති පුද්ගලයින් තම කටයුතු වෙනත් අයට වඩා හොඳින් ඉටු කිරීමට නිරන්තරයෙන් පෙළඹේ. බලය සඳහා වන අවශ්‍යතාව යන්නෙන් යම්

කිසි පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමක හැසිරීම කෙරෙහි බලපෑම් කිරීමට ඇති අවශ්‍යතාව අවධාරණය කෙරෙන අතර සෙසු අය සමඟ අන්තර් පුද්ගල සම්බන්ධතා ඇති කර ගැනීමට පවතින අවශ්‍යතාව අනුබද්ධවීම සඳහා ඇති අවශ්‍යතාව යන්නෙන් අදහස් කෙරේ.

2.4.6 ඊ.ආර්.ජී. න්‍යාය (E.R.G. Theory)

ක්ලේටන් ඇල්ඩෆර් (Clayton Alderfer) විසින් මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යාය සංශෝධනයට ලක් කරමින් ඉදිරිපත් කරනු ලැබූ ERG (Existence, Relatedness and Growth) හෙවත් පැවැත්ම, සම්බන්ධතා පවත්වා ගැනීම සහ වර්ධනය යන පුද්ගල මූලික අවශ්‍යතා තුන පදනම් කර ගත් න්‍යායේ අන්තර්ගතය බොහෝ දුරට මැස්ලෝගේ න්‍යායේ අන්තර්ගතයට සමාන වේ. ඇල්ඩර්ෆර්ගේ න්‍යායේ පැවැත්ම පිළිබඳ අවශ්‍යතාවට මැස්ලෝ සඳහන් කරනු ලබන භෞතික හා ආරක්ෂණ අවශ්‍යතා ඇතුළත් වන අතර සබඳතා පවත්වා ගැනීම යන්නෙන් අදහස් වන්නේ මැස්ලෝ ඉදිරිපත් කළ සම්මානනීය සහ ආත්ම පරිපූර්ණ අවශ්‍යතා වේ.

කෙසේ වුව ද, මැස්ලෝට වෙනස්ව යමින් මොහු ඉදිරිපත් කරනු ලබන්නේ යම් ඉහළ මට්ටමේ අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීමට නො හැකිවීමෙන් හට ගන්නා කලකිරීම එයට පහළ මට්ටමේ අවශ්‍යතාවන් සම්පූර්ණ කර ගැනීම තුළින් වළක්වන බවයි.

තුන් වැනි පරිච්ඡේදය

අධ්‍යයන ප්‍රදේශයේ සමාජ-ආර්ථික පසුබිම

3.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදය මඟින් අධ්‍යයන ප්‍රදේශයේ සමාජ ආර්ථික පසුබිම හා භූගෝලීය ස්වභාවය පිළිබඳ මූලික හැඳින්වීමක් සිදු කෙරේ. එමෙන් ම, අධ්‍යයනයේ නියැදියට අයත් සේවාලාභීන්ගේ සමාජ-ආර්ථික පසුබිම පිළිබඳ තොරතුරු ද ඉදිරිපත් කෙරේ.

3.2 භූගෝලයීය පිහිටීම සහ ස්වභාවික සම්පත් හා පරිපාලන ව්‍යුහය

ඓතිහාසික රුහුණු රාජධානියට අයත්ව තිබූ හම්බන්තොට දිස්ත්‍රික්කය අතීතයේ සිට ම පරිපාලනමය වශයෙන් වැදගත්කමක් හිමි වූ ප්‍රදේශයකි. දකුණු පළාතට අයත් ප්‍රධාන දිස්ත්‍රික්කයක් වන හම්බන්තොට ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක අතරින් විශාලත්වයෙන් 12 වන ස්ථානයේ පසු වේ. දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කි.මී. 2,609ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 3.97කට හිමිකම් කියයි.

හම්බන්තොට දිස්ත්‍රික්කය උතුරු දෙසින් පතිලකන්ද, ගෝනගල, කබරගල, කෝප්පකන්ද සහ බිසෝගල යන කඳු පන්තීන්ගෙන් ද, බටහිර දෙසින් නාගලකන්ද, කොටිහේන, කේරකැලේ, අඹන්ගල හා දෙනියකන්ද යන කඳු පන්තීන්ගෙන් ද මායිම් වේ. වෙරළබඩ දිස්ත්‍රික්කයක් වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා දකුණු මායිම් කුඹුක්කන් ඔයෙන් හා ඉන්දියන් සාගරයෙන් වෙන් කෙරෙයි.

අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටි හම්බන්තොට දිස්ත්‍රික්කයට වසර පුරා හොඳින් සූර්යාලෝකය ලැබේ. දුර්ලභ භූගෝලීය ලක්ෂණ සහිත හම්බන්තොට දිස්ත්‍රික්කය, ස්වභාවික වනාන්තර හා ජාතික වටිනාකමකින් යුත් අභයභූමිවලින් ද බහුල ප්‍රදේශයක් වේ. යාල, බුන්දල හා ලුණුගම්වෙහෙර යන ප්‍රධාන අභයභූමිවලට අමතරව වීරවිල, රිදියගම, පල්ලෙවෙල, කලමැටිය, නිමලාව හා මදුනාගල අභයභූමි ද ඒ අතරින් විශේෂයෙන් වැදගත් වේ. ස්වභාවික ගංගා 19ක් හා තවත් ජල ප්‍රභවයන්ගෙන් සපිරි හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙරළ තීරය කි.මී. 151ක දිගින් යුක්ත ය. ස්වභාවික කලපු, තුඩු හා වරායවලින් පොහොසත් මෙම දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය කරන ප්‍රධාන ප්‍රදේශයක් වේ.

2004 සුනාමි ව්‍යසනයට ගොදුරු වූ හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි වර්තමානයේ විශාල සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වේ. එය දිස්ත්‍රික්කයේ සංවර්ධනය නව දිශාවකට යොමු කරවා ඇත. මෙම ව්‍යාපෘති අතර හම්බන්තොට වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල, වියළි කලාපීය උද්භිද උද්‍යානය, අම්බලන්තොට සෆාරි උද්‍යානය, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, රුහුණු මාගම්පුර පරිපාලන සංකීර්ණය ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති වේ.

3.2.1 අධ්‍යයන ප්‍රදේශයේ පරිපාලන ව්‍යුහය

හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12කින් සමන්විත පරිපාලන ඒකකයකි. ග්‍රාම නිලධාරී කොට්ඨාස 576ක ගම්මාන 1,338ක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් වේ. දිස්ත්‍රික්කයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වන දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණයෙන් මෙම පරිපාලන ඒකකය පාලනය වේ.

කෘෂිකර්මය මූලික කරගත් මෙම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 16ක් තුළින් ජනතාවට සේවය සැපයේ. තංගල්ල හා හම්බන්තොට යන මහ නගර සභා දෙක ද, එයට අමතරව ප්‍රාදේශීය සභා 10ක් සහ පොලිස් ස්ථාන 14ක් ජනතාවට සේවය සලසන ආයතන අතර පෙරමුණේ සිටී (වගුව 3.1).

වගු 3.1: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව පරිපාලන ව්‍යුහය - 2010

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ග්‍රා.නි. වසම් සංඛ්‍යාව	ගම් සංඛ්‍යාව	ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව	පළාත් පාලන ආයතන			පොලිස් ස්ථාන සංඛ්‍යාව
				මහ නගර සභා/ නගර සභා	ප්‍රාදේශීය සභා	ප්‍රදේශීය සභා උප කාර්යාල	
කටුවන	56	87	1	0	1	2	2
වලස්මුල්ල	53	97	1	0	0	0	1
වීරකැටිය	60	89	2	0	1	1	1
ඕකේවෙල	27	58	1	0	0	0	0
බෙලිඅත්ත	71	192	1	0	1	0	1
තංගල්ල	72	182	1	1	1	0	1
අගුණුකොළපැලැස්ස	51	110	2	0	1	0	1
අම්බලන්තොට	55	147	2	0	1	2	2
සූරියවැව	21	56	1	0	1	0	1
හම්බන්තොට	30	98	1	1	1	0	1
තිස්සමහාරාමය	44	154	3	0	1	0	1
ලුණුගම්වෙහෙර	36	68	0	0	1	0	1
එකතුව	576	1,338	16	2	10	5	13

මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය, 2011

හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හැර අනෙකුත් සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රදේශයේ ප්‍රධාන පරිපාලන ඒකකය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට කි.මී. 25ක් හෝ ඊට වැඩි දුරකින් පිහිටා ඇත. ඉන් කටුවන, වලස්මුල්ල, වීරකැටිය, ඕකේවෙල, බෙලිඅත්ත, තංගල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට කි.මී. 50කට වැඩි දුරකින් පිහිටා ඇත.

3.2.2 ප්‍රදේශයේ භූමි ප්‍රමාණය හා ඉඩම් පරිහරණ රටාව

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 262,550ක් වේ. එම භූමි ප්‍රමාණයෙන් 96.1%ක් ගොඩ ඉඩම් වන අතර 3.9%ක් අභ්‍යන්තර ජලාශ ලෙස පවතී. දැනට වනාන්තර ලෙස පවතින්නේ මුළු භූමි ප්‍රමාණයෙන් 14.5%ක් පමණි. ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 29.6%ක් ලඳු කැලෑ හා හේන් වන අතර 25.4%ක් ගෙවතු වේ (වගුව 3.2).

වගුව 3.2: දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ රටාව - 2010

ඉඩම් ස්වභාවය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)	ප්‍රතිශතය (%)
01. අස්වද්දන ලද කුඹුරු		
1. වාරිමාර්ග	36,148.4	13.77
11. අහස් දියෙන්	3,575.1	1.60
02. තේ	393.7	0.15
03. රබර්	143.6	0.05
04. පොල්	15,967.2	6.08
05. කුරුඳු	547.1	0.21
06. වෙනත් වගාවන්	3,858.2	1.47
07. වනාන්තර		
1. ඝන වනාන්තර	11,441.2	4.36
11. විවෘත වනාන්තර	22,844.0	8.70
111. වගා කරන ලද වනාන්තර	3,693.4	1.41
08. ලඳු කැලෑ හා හේන්	77,905.6	29.67
09. වගුරු හා කඩොලාන කැලෑ	3,658.1	1.39
10. ගෙවතු	66,792.9	25.44
11. ජලාශ	10,258.7	3.91
12. ගොඩනැඟිලි	1,511.7	0.58
13. වැලි හා ගල් පර	1,094.7	0.42
14.මුඩු බිම් හා අත්හරින ලද ඉඩම්	2,652.3	1.01
15. වෙනත් (පූජා භූමි, මාර්ග සුසාන භූමි ආදිය)	64.1	0.02
එකතුව	262,550.0	100.00

මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංඛ්‍යාලේඛන අංශය - 2011

මේ අනුව, ඉදිරියේ දී මිනිස් අවශ්‍යතා සඳහා භාවිත කළ හැකි ඉඩම් සීමාසහිත නිසා මිනිස් අවශ්‍යතා ඉටු කිරීම සඳහා ද, සංවර්ධන කටයුතු සඳහා ද, පරිසරයේ සමතුලිතබව රැක ගැනීම සඳහා ද, ඉඩම් මනා ලෙස සැලසුම් කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ. එසේ මිනිස් අවශ්‍යතා සඳහා යොදවා ගැනීමට ඉතිරිව ඇති ඉඩම් වශයෙන් හඳුනාගත හැකි වන්නේ 30%ට ආසන්න වන ලඳු කැලෑ සහ හේන් පමණි. කෙසේ වුව ද, මෙම ඉඩම්වලින් ද සැලකිය යුතු ප්‍රමාණයක් අනවසර හේන් වගාව යටතට පත්ව ඇති බව ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී අනාවරණය විය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ගත් කළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩි ම භූමි ප්‍රමාණයක් හිමි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. එයට හෙක්ටයාර 78,220 ක භූමි ප්‍රමාණයක් අයත් වේ. දිස්ත්‍රික්කයේ අඩු ම භූමි ප්‍රමාණයකට හිමිකම් කියන්නේ හෙක්ටයාර 4,215ක් හිමි ඕකේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වේ.

දිස්ත්‍රික්කයේ ඒක පුද්ගල භූමි පරිභෝජනය හෙක්ටයාර 0.4ක් වේ. එසේ වුව ද, බෙලිඅත්ත, තංගල්ල, වලස්මුල්ල, කටුවන හා ඕකේවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඒක පුද්ගල භූමි පරිභෝජනය හෙක්ටයාර 0.2ක් පමණි. එමෙන් ම, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඒක පුද්ගල ඉඩම් පරිභෝජනය හෙක්ටයාර 1.0 තරම් අගයක් ගන්නේ සාපේක්ෂව වැඩි භූමි ප්‍රමාණයක් පැවතීම හේතු කරගෙන ය.

දිස්ත්‍රික්කයේ ඒක පුද්ගල ගෘහ ඒකක භූමි පරිභෝජනය 1.56ක් වන අතර වැඩි ම ගෘහ ඒකක භූමි පරිභෝජනය තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද (හෙක්ටයාර 3.98) අඩු ම ගෘහ ඒකක භූමි පරිභෝජනය බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් (හෙක්ටයාර 0.59) ද වාර්තා වේ (වගුව 3.3).

වගුව 3.3: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ගෘහ ඒකක භූමි පරිභෝජනය -2010

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	වර්ග ප්‍රමාණය (හෙක්ටයාර්)	ඇස්තමේන්තු ගත ජනගහනය	ඒක පුද්ගල භූමි පරිභෝජනය (හෙක්ටයාර්)	ගෘහ ඒකක ගණන	ගෘහ ඒකක භූමි පරිභෝජනය (හෙක්ටයාර්)
අඟුණුකොළපැලැස්ස	17,250	53,891	0.3	13,902	1.24
වීරකැටිය	11,720	45,814	0.3	12,118	0.97
සූරියවැව	18,580	50,919	0.4	11,118	1.67
තිස්සමහාරාම	78,220	81,452	1.0	19,640	3.98
හම්බන්තොට	38,841	62,691	0.6	16,100	2.41
බෙලිඅත්ත	10,130	64,722	0.2	17,262	0.59
තංගල්ල	15,650	69,081	0.2	17,270	0.91
ලුණුගම්වෙහෙර	25,500	33,664	0.8	8,858	2.88
අම්බලන්තොට	21,620	82,714	0.3	20,522	1.05
වලස්මුල්ල	10,484	45,376	0.2	12,366	0.85
කටුවන	10,340	50,743	0.2	13,643	0.76
ඕකේවෙල	4,215	20,889	0.2	5,566	0.76
හම්බන්තොට දිස්ත්‍රික්කය	**262,550**	**661,956**	**0.4**	**168, 365**	**1.56**

මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංඛ්‍යාලේඛන අංශය - 2011

3.3 අධ්‍යයන ප්‍රදේශයේ සමාජ-ආර්ථික පසුබිම

3.3.1 අධ්‍යයන ප්‍රදේශයේ ජනගහන තොරතුරු

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් 2011 වසරේ පැවැත් වූ ජන සංගණනයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 595,877 ලෙස වාර්තා විය.

වගුව 3.4: සංගණන වර්ෂ අනුව ශ්‍රී ලංකාවේ හා දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය

සංගණන වර්ෂය	ශ්‍රී ලංකාව		හම්බන්තොට දිස්ත්‍රික්කය	
	ජනගහනය (දහස්)	අන්තර් සංගණන වර්ධනය (%)	ජනගහනය (දහස්)	අන්තර් සංගණන වර්ධනය (%)
1881	2,759.80	15	71.9	18
1891	3,007.80	9	89.3	24
1901	3,566.00	19	104.9	17
1911	4,106.40	15	110.0	5
1921	4,497.90	10	119.6	8
1931	5,306.90	18	124.4	4
1940	6,657.30	25	149.7	20
1953	8,097.90	22	191.5	28
1963	10,582.00	31	274.3	43
1971	12,689.90	20	340.3	24
1981	14,846.80	17	424.3	25
2001	18,797.30	27	526.4	24
2011	20,277.60	8	595.4	13

මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001, 2011

සමස්තයක් ලෙස 1871 සිට 2001 දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය පිළිබඳ විමසා බලන විට බොහෝ අවස්ථාවල දී ජාතික මට්ටමේ ජනගහන වර්ධනයට වඩා දිස්ත්‍රික්කයේ ජනගහනය වර්ධනයවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. 1911 සිට 1931 කාල සීමාවේ දී ජාතික ජනගහන වර්ධන වේගය සමඟ සැසඳීමේ දී දිස්ත්‍රික්කයේ ජනගහන වර්ධනය ඉතා අඩු මට්ටමක පැවතීම කැපී පෙනෙන අතර (වගුව 3.4) 1953 සිට 1981 වර්ෂය වන විට දිස්ත්‍රික් ජනගහන වර්ධනය ජාතික ජනගහන වර්ධනයට වඩා ඉහළ අගයක් ගනී. 1981 සිට 2001 අන්තර් සංගණන කාල සීමාව තුළ දී ජාතික ජනගහන වර්ධනය 26% වන අතර දිස්ත්‍රික් මට්ටමේ දී එය 24% ක් ලෙස පැවතිණි. එමෙන් ම, 2001-2011 අන්තර් සංගණන කාලය තුළ සැලකිය යුතු ජනගහන වර්ධනයක් දිස්ත්‍රික්කය තුළ සිදුව ඇති බව 3.4 වගු සටහන අනුව පැහැදිලි වේ. කෙසේ වෙතත්, මෙම ජනගහන වර්ධන වේගය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉඩම් භුක්තිය කෙරෙහි දැඩි බලපෑමක් කරන කරුණක් බව පැහැදිලි ය. විශේෂයෙන්, දැනට ප්‍රදේශයේ ජනතාව භුක්ති විඳින ඉඩම් කෙරෙහි මෙන් ම ඉතිරිව පවතින සීමිත ඉඩම් ප්‍රමාණය

ද, වනාන්තර ඇතුළු සුරැකිය යුතු ස්වභාවික සම්පත කෙරෙහි ද අනිවාර්ය පීඩනයක් එල්ලවීමට මෙකී ජනගහන වර්ධනය සෘජු හා වක්‍ර බලපෑමක් සිදු කරනු ලබයි.

2010 දී දිස්ත්‍රික්කයේ සමස්ත පවුල් ඒකක සංඛ්‍යාව 168,365ක් විය. ප්‍රදේශයේ මුළු නිවාස ඒකක ගණන 160,216ක් වන අතර නිවාස ඒකකයක සාමාන්‍ය පුද්ගලයන් සංඛ්‍යාව 4.13කි (වගුව 3.5). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් එම ජනගහන තොරතුරු සවිස්තරාත්මකව පහත වගුවෙන් දක්වා ඇත.

වගුව 3.5: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජන හා නිවාස තොරතුරු - 2010

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ජනගහනය	දිස්ත්‍රික් ජනගහනයෙන් ප්‍රතිශතය (%)	පවුල් සංඛ්‍යාව	නිවාස ඒකක සංඛ්‍යාව	නිවාස ඒකකයක සාමාන්‍ය පුද්ගලයින් සංඛ්‍යාව
ලුණුගම්වෙහෙර	33,664.00	5	8,858	9,706	3.47
හම්බන්තොට	62,691.00	9	16,100	14,456	4.34
අම්බලන්තොට	82,714.00	12	20,522	18,729	4.42
තිස්සමහාරාම	81,452.00	12	19,640	18,444	4.42
බෙලිඅත්ත	64,722.00	10	17,262	15,373	4.21
සූරියවැව	50,919.00	8	11,118	12,193	4.18
ඕකේවෙල	20,889.00	3	5,566	5,123	4.08
වලස්මුල්ල	45,376.00	7	12,366	11,142	4.07
වීරකැටිය	45,814.00	7	12,118	11,365	4.03
කටුවන	50,743.00	8	13,643	12,499	4.06
තංගල්ල	69,081.00	10	17,270	17,238	4.01
අගුණුකොළපැලැස්ස	53,891.00	8	13,902	13,948	3.86
දිස්ත්‍රික්කය	661,956.00	100	168,365	160,216	4.13

මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංඛ්‍යාලේඛන අංශය, 2011

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමස්ත ගෘහ ඒකකවලින් 87%ක ම මිනිසුන් පදිංචි නිවාස වේ. එයින් ගෘහ ඒකක සියයට 84ක් ම ග්‍රාමීය අංශයට අයත් ය. මුළු නිවාස ගණනින් 72.3% ගඩොලින් නිමවා ඇති අතර නිවාසවලින් 22.2%ක බිත්ති මැටියෙන් නිමවා ඇත. සිමෙන්ති පොළොව සහිත නිවාස 66.8%ක් පවතින අතර 31.5%ක් මැටි පොළොවකින් යුක්ත වේ. උළු සෙවිලි කළ නිවාස 73.7%ක් පැවති අතර ඇස්බැස්ටෝස් හා පිදුරු සෙවිලි කරන ලද නිවාස පිළිවෙළින් 20.1%ක් සහ 2.8%ක් විය (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001).

මෙයට අමතරව දිස්ත්‍රික්කයේ නිවසක ඇති කාමරවල සාමාන්‍යය වන්නේ කාමර 3.9කි. එමෙන් ම, 45%ක් වූ ගෘහ ඒකක ප්‍රමාණයක් 1970-1994 කාල සීමාව තුළ ඉදිකරන ලද ඒවා වේ. නිවාසවලින් 38.7%ක් 1994න් පසු කාලයේ නිමවා තිබුණි. ගෘහ ඒකකවලින් 96%ක

ප්‍රමාණයකට වැසිකිළි පහසුකම් පැවති අතර 02%ක් සඳහා කිසිදු ආකාරයක වැසිකිළි පහසුකම් නොමැත.

ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් 97.1 %ක් සිංහල ද, 0.4 %ක් ශ්‍රී ලාංකික දෙමළ ද 0.1 %ක් ඉන්දියානු දෙමළ ද, 1.1 %ක් මුස්ලිම් ද, 1.4 %ක් මැලේ ද වූහ. ආගම් අනුව ජනගහනය වර්ග කළ විට බෞද්ධයින් 96.9 %ක් වූ අතර 0.3 %ක්, 2.5%ක්, 0.4 %ක් පිළිවෙළින් හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තු ලබ්ධිකයෝ වූහ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001).

වගුව 3.6: වයස් කාණ්ඩ හා ස්ත්‍රී පුරුෂභාවය අනුව දිස්ත්‍රික්කයේ ජනගහනය - 2010

වයස් කාණ්ඩ	ජනගහන			මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස (%)
	මුළු සංඛ්‍යාව	පුරුෂ	ස්ත්‍රී	
0 - 4	58,808	27,711	31,097	9
5 - 9	64,771	34,182	30,589	10
10 - 14	70,065	35,210	34,855	11
15 - 19	63,438	31,198	32,240	10
20 - 24	53,513	27,285	26,228	8
25 - 29	49,535	24,125	25,410	7
30 - 34	46,893	22,821	24,072	7
35 - 39	46,893	22,821	24,072	7
40 - 44	46,893	23,110	23,783	7
45 - 49	42,928	20,845	22,083	6
50 - 54	32,339	15,649	16,690	5
55 - 59	21,756	10,418	11,338	3
60 ≤	64,124	30,645	33,479	10
සියළු ම වයස් කාණ්ඩ	661,956	326,020	335,936	100

මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංඛ්‍යාලේඛන අංශය, 2011

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය වර්ගීකරණය කළ විට මුළු ජනගහනයෙන් 50%ක් පුරුෂයන් ද, 50%ක් ස්ත්‍රීන් ද, ලෙස සමානුපාතිකව බෙදී පැවතීම විශේෂත්වයකි. එමෙන් ම, ජනගහන වයස් කාණ්ඩ අනුව ගත් කළ ජනගහනයෙන් 39%ක් ම අවුරුදු 0-19 දක්වා වූ වයස් කාණ්ඩයන්ට අයත් වේ. ජනගහනයෙන් 10%ක් අවුරුදු 60ට වඩා වැඩි පුද්ගලයන් වීම ප්‍රදේශයේ යැපීම් අනුපාතය වර්ධනය වීමට ද සෘජු දායකත්වයක් සපයයි (වගුව 3.6).

දිගු කලක් තිස්සේ කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් මූලික කොටගත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් බහුතරයක්, එනම් 97%ක් දැනටත් ජීවත් වන්නේ ග්‍රාමීය අංශයේ වන අතර නාගරික අංශය තුළ ජීවත් වන්නේ 3%ක් පමණ පිරිසකි (වගුව 3.7).

වගුව 3.7: දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා අංශ මට්ටමෙන් ජනගහනය හා ජන ඝනත්වය - 2010

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ජනගහනය			වර්ග ප්‍රමාණය	ජන ඝනත්වය
	නාගරික	ග්‍රාමීය	සමස්තය		
වීරකැටිය	0	45,814	45,814	11,720	3.9
බෙලිඅත්ත	0	64,722	64,722	10,130	6.4
තංගල්ල	11,503	57,578	69,081	15,650	4.4
වලස්මුල්ල	0	45,376	45,376	10,484	4.3
කටුවන	0	50,743	50,743	10,340	4.9
සූරියවැව	0	50,909	50,909	18,580	2.7
අඟුණුකොළපැලැස්ස	0	53,891	53,891	17,250	3.1
ඕකේවෙල	0	20,889	20,889	4,215	5.0
අම්බලන්තොට	0	82,714	82,714	21,620	3.8
හම්බන්තොට	11,333	51,358	62,691	38,841	1.6
තිස්සමහාරාම	0	81,452	81,452	78,220	1.0
ලුණුගම්වෙහෙර	0	33,664	33,664	25,500	1.3
එකතුව	22,836	639,110	661,946	262,550	2.5

මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංඛ්‍යාලේඛන අංශය 2011

3.3.2 අධ්‍යාපන මට්ටම

ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම කලාපයේ බොහෝ රටවලට වඩා ඉහළ අගයක් ගනී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සාක්ෂරතා මට්ටම ද ජාතික මට්ටම හා බොහෝ දුරට සමාන තත්ත්වයක පවතින අතර ප්‍රදේශයේ සාමාන්‍ය සාක්ෂරතාව 88.9%ක් වේ. ඉන් පුරුෂ පක්ෂයේ සාක්ෂරතාව සියයට 90.9%ක් ද, කාන්තා පක්ෂයේ සාක්ෂරතාව 88.9%ක් ද වේ.

ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපන මට්ටම සැලකිල්ලට ගැනීමේ දී 21.5% ක් 9-10 වසර දක්වා අධ්‍යාපනය ලැබූ අය වේ. එමෙන් ම, මුළු ජනගහනයෙන් 15.4%ක් සාමාන්‍ය පෙළ දක්වා ද, 6.7% උසස් පෙළ දක්වා ද, ඉගෙනුම ලබා ඇත. උපාධි මට්ටම දක්වා අධ්‍යාපනය ලබා ඇත්තේ 1%ක් තරමේ අඩු පිරිසකි (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001).

3.3.3 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආර්ථික පසුබිම

2011 ජන සංගණනයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකා සහභාගීත්වය 50.8%ක් විය. එයින් 69.4%ක් පුරුෂයින් වූ අතර කාන්තා ශ්‍රම බලකාය සියයට 33.4%ක් විය. එමෙන් ම, 2010 වසරේ ශ්‍රම බලකා සමීක්ෂණය අනුව රැකියා විරහිත ජනගහනය ශ්‍රම බලකායෙන් 8.9% ප්‍රමාණයක් විය.

දිස්ත්‍රික්කයේ සේවා නියුක්තිකයන්ගෙන් 43.6%ක් කෘෂිකාර්මික අංශයට ද, 23.3%ක් කාර්මික අංශයට ද, 33.2% සේවා අංශයට ද ඇතුළත් විය. සෙසු අංශ හා සැසඳීමේ දී කෘෂිකාර්මික අංශයේ රැකියාවල නිරතවන්නන් වැඩි ප්‍රමාණයක් වේ. ඒ අනුව, කෘෂිකර්මාන්තයට අවශ්‍ය ප්‍රධාන ප්‍රාග්ධනය වන ඉඩම් සම්බන්ධව දිස්ත්‍රික්කයේ පවතින වැදගත්කම පැහැදිලි වේ.

එසේ වුවත්, 2010 වසරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ සංඛ්‍යාලේඛන අනුව ප්‍රදේශයේ යැපීම් අනුපාතිකය 56.87%ක් තරම් අධික ප්‍රමාණයක පැවතීම ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනයට සෘජු හා වක්‍ර බලපෑමක් ඇති කරයි. මේ අතරින් ළමා යැපෙන්නන් 45.9 % ක් ද, වයස්ගත යැපෙන්නන් සියයට 11%ක් ලෙසින් ද වාර්තා වේ (හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, 2011).

ප්‍රස්තාර 3.1: දිස්ත්‍රික්කයේ ආදායම විවිධ ආර්ථික මට්ටම්වල ජනතාව අතර බෙදී යන ආකාරය



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2009/2010 ගෘහ ආදායම් හා වියදම් සමීක්ෂණය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ පුද්ගලයින් ලබන ආදායමෙන් 47.2%ක් පොහොසත් ම 20% අතර බෙදී යන අතර දුප්පත් ම 20% අතර බෙදී යන්නේ සමස්ත ආදායමෙන් 5.5%ක් පමණි. එමෙන් ම මධ්‍යම මට්ටමේ ආදායම් ලබන ජන කොටසට අයත් 60% අතරේ බෙදී යන්නේ දිස්ත්‍රික්කයේ

සමස්ත ආදායමෙන් 47.2%කි. ඒ අනුව, දිස්ත්‍රික්කයේ ආදායම් විෂමතාව ඉතා ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි ය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ 163,649ක් වන මුළු පවුල් ඒකක සංඛ්‍යාවෙන් 37%ක් ම සමෘද්ධි ආධාර ලබන පවුල් වේ. ඉන් පවුල් 99%කට ලැබෙන්නේ රු. 1,000 කට අඩු මාසික ආධාර මුදලකි (ප්‍රස්තාර 3.2).

ප්‍රස්තාර 3.2: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව - 2010 (කොට්ඨාසයේ මුළු පවුල් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස)



මූලාශ්‍රය: හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංඛ්‍යාලේඛන අංශය, 2011

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මුළු ජනගහනයට සාපේක්ෂව වැඩි ම සමෘද්ධි ආධාර ලබන ජනගහනය ජීවත් වන්නේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන අතර එහි මුළු ජනගහනයෙන් සියයට 64ක් සමෘද්ධි සහනාධාර ලබයි. 2009/10 ගෘහ ආදායම් සහ වියදම් සමීක්ෂණය අනුව දිස්ත්‍රික්කයේ දරිද්‍රතා මට්ටම 6.9%ක් වේ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2011).

3.3.4 දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම්

3.3.4.1 ජල හා ආලෝක ප්‍රභවයන්

2001 ජන සංගණනයට අනුව දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් සියයට 43.8ක් පානීය ජලය ලබා ගන්නේ ආරක්ෂිත ළිං මඟිනි. ජනගහනයෙන් සියයට 11.5ක් අනාරක්ෂිත ළිං වලින් ද, සියයට 33.4ක් ජලනල මාර්ග ඔස්සේ ද, සියයට 6.2ක් නල ළිං මඟින් ද පානීය ජලය ලබා ගනී (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001).

2001 සංඛ්‍යාලේඛන අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් සියයට 50.3ක් ආලෝකය ලබා ගැනීමේ ප්‍රභවය ලෙස භූමිතෙල් භාවිතා කරයි. ඉතුරු සියයට 49.7 විදුලි බලය මඟින් ආලෝකය ලබා ගනී. නමුත් නාගරික ජනයාගෙන් සියයට 86.9ක් විදුලි බලය මඟින් ආලෝකය උත්පාදනය කර ගනී. කෙසේ වුව ද, ග්‍රාමීය ප්‍රදේශවල තත්ත්වය මේ වන විට බොහෝ දුරට වෙනස්ව ඇති බවත්, ග්‍රාමීය ප්‍රදේශවල බොහෝ නිවාසවලට විදුලි බලය සපයා ඇති බවත් ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හෙළි විය.

3.3.4.2 මාර්ග පහසුකම්

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාර්ග පද්ධතියේ මුළු දිග කි.මී. 4,488.48 වේ. ඉන් "ඒ" ශ්‍රේණියේ මාර්ග ඇත්තේ කි.මී. 114 පමණි. සියළු මාර්ගවලින් සියයට 29ක් තාර දමා ද, සියයට 7.88කට කොන්ක්‍රීට් ආවරණයන් යොදා ගනිමින් ද, සකසා ඇත. විශේෂයෙන් කඩිනම් සංවර්ධන ව්‍යාපෘතීන් යටතේ ඉතා උසස් තත්ත්වයේ මාර්ග පද්ධතියක් බිහි වෙමින් පැවතීම ප්‍රදේශයේ සංවර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට, 2010).

3.4 සේවාලාභීන්ගේ සමාජ ආර්ථික පසුබිම

3.4.1 සේවාලාභීන්ගේ සමාජ පසුබිම

අධ්‍යයන නියැදියට අයත් සමස්ත සේවාලාභීන්ගේ නියෝජනය අම්බලන්තොට (11.9%), සූරියවැව (15.2%), හම්බන්තොට (13.8%), තිස්සමහාරාමය (16.5%), ලුණුගම්වෙහෙර (12.6%), වලස්මුල්ල (15.6%) හා තංගල්ල (14.4%) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හත පදනම් කරගෙන සිදුවිය.

වගුව 3.8: අධ්‍යයන ප්‍රදේශය හා ස්ත්‍රී/පුරුෂ භාවය අනුව සේවාලාභීන්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන ප්‍රදේශය	ස්ත්‍රී පුරුෂ භාවය				මුළු සේවාලාභීන්ගෙන් ප්‍රතිශතය (සංඛ්‍යාව =486)	
	ස්ත්‍රී		පුරුෂ			
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
අම්බලන්තොට	27	46.6	31	53.4	58	11.9
සූරියවැව	32	43.2	42	56.8	74	15.2
හම්බන්තොට	23	34.3	44	65.7	67	13.8
තිස්සමහාරාමය	36	45.0	44	55.0	80	16.5
ලුණුගම්වෙහෙර	24	39.3	37	60.7	61	12.6
වලස්මුල්ල	31	40.8	45	59.2	76	15.6
තංගල්ල	33	47.1	37	52.9	70	14.4
එකතුව	206	42.4	280	57.6	486	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

සමස්ත නියැදියෙන් 57.6%ක් පුරුෂයින් ද, 42.4%ක් ස්ත්‍රීන් ද විය. ඉහත සඳහන් වගුව මගින් අධ්‍යයනයට ලක් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවාලාභී ප්‍රතිචාරින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය වෙන් වෙන් වශයෙන් දැක් වේ (වගුව 3.8). සියලු අධ්‍යයන ප්‍රදේශයන් හි ස්ත්‍රී සේවාලාභී නියෝජනය 50%කට අඩු වූ අතර එයට සමගාමීව පුරුෂ සේවාලාභී නියෝජනය 50%කට වඩා වැඩිවීම විශේෂත්වයක් විය.

වගුව 3.9: ස්ත්‍රී/පුරුෂභාවය හා වයස් කාණ්ඩ අනුව සේවාලාභීන්ගේ ව්‍යාප්තිය

වයස් කාණ්ඩ (අවුරුදු)	ස්ත්‍රී පුරුෂ භාවය				අදාළ වයස් කාණ්ඩයේ සමස්ත නියෝජනය	
	ස්ත්‍රී		පුරුෂ			
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	මුළු සේවාලාභීන්ගෙන් ප්‍රතිශතයක් ලෙස (සංඛ්‍යාව=486)
25ට අඩු	3	1.5	4	1.4	7	1.4
25-35	33	16.0	26	9.3	59	12.1
35-45	57	27.7	66	23.6	123	25.3
45-55	56	27.2	72	25.7	128	26.3
55-65	43	20.9	69	24.6	112	23.0
65 ට වැඩි	14	6.8	43	15.4	57	11.7
එකතුව	206	100.0	280	100.0	486	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

සේවාලාභීන්ගේ වයස් ව්‍යුහය සලකා බලන විට නියැදියෙන් 50% (317)ට වැඩි ප්‍රමාණයක් අවුරුදු 35-55 වයස් ප්‍රමාණයේ පසු වේ. එයින් 26.3% (128)ක් ම අවුරුදු 45-55 අතර වයස්වලට අයත් වූවන් ය. නියැදියෙන් අවුරුදු 25ට අඩු සේවාලාභීන් සිටියේ 1.4% (7)ක් පමණි (වගුව 3.9).

නිරීක්ෂණවලට අනුව මැදි වයස් ජනතාව අතර ඉඩම් සම්බන්ධ සේවා ලබා ගැනීමට වැඩි නැඹුරුවක් ඇති බව පෙනී ගිය අතර අධ්‍යයන නියැදිය තුළ ද එම තත්ත්වය පැහැදිලිව දක්නට ලැබිණි. විශේෂයෙන් මැදි වයසට එළඹීමත් සමඟ ඔවුන්ගේ තරුණ වයසට පත් වූ හා විවාහපත් වූ දූ දරුවන්ට ඉඩකඩම් නිරවුල්ව පැවරීමත්, ඉඩම් භුක්තිය නෛතිකව සහතික කරගැනීමත් බොහෝ සේවාලාභීන්ගේ ප්‍රධාන අරමුණක් බවට පත්ව ඇත. එම නිසා අදාළ වයස් කාණ්ඩයේ සේවාලාභීන් බහුතරයක් දැඩි උනන්දුවකින් හා විශාල කැපවීමෙන් මෙම සේවා ලබා ගැනීමට පෙළඹී සිටිති.

වගුව 3.10: විවාහක/අවිවාහකත්වය අනුව සේවාලාභීන්ගේ විසිරීම

ස්ත්‍රී/පුරුෂ භාවය	විවාහක		අවිවාහක		වැන්දඹු		වෙන් වූ		නීතියෙන් විවාහ නො වූ	
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
ස්ත්‍රී	174	84.5	7	3.3	18	8.7	4	2.0	3	1.5
පුරුෂ	262	93.6	14	5.0	4	1.4	0	0.0	0	0.0
එකතුව	436	89.7	21	4.3	22	4.5	4	0.8	3	0.6

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

නියැදියට අයත් සේවාලාභීන්ගෙන් බහුතරය, එනම් 90% (436)ක් විවාහකයන් වූ අතර 4% (21)ක් අවිවාහක ද, 5% (22)ක් වැන්දඹුවන් ද විය (වගුව 3.10). අවිවාහක පුද්ගලයන්ට වඩා විවාහ වූ පසු ඉඩම් පැවරීම, අයිතිය ලබා ගැනීම වැනි කාරණා සම්බන්ධව වැඩි අවධානයක් දැරීමට සිදුවීම තුළ විවාහකයන් ඉඩම් සම්බන්ධව සේවා ලබා ගැනීමට වැඩි වශයෙන් යොමුවීමක් නිරායාසයෙන් ම සිදු වේ. තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඳුපැළැන ග්‍රාම නිලධාරී වසමේ නීතියෙන් විවාහ නොවූ සේවාලාභීන්ගෙන් වැඩි පිරිසක් හමු වූ අතර නෛතික විවාහයක් සිදු නො වීම නිසා කට්ටිකරුට අයත් ඉඩම්වල හිමිකාරිත්වය කලත්‍රයාට හා දරුවන්ට ලබා ගැනීම සම්බන්ධ ගැටලුවලට ඔවුහු මුහුණ සිටිති.

එමෙන් ම, අධ්‍යයනයට ලක්කරන ලද සේවාලාභීන්ගේ අධ්‍යාපන මට්ටම විමසූ කල් හි පෙනී යන්නේ ඔවුන්ගේ වැඩිදෙනෙකු අඩු අධ්‍යාපන මට්ටමකට හිමිකම් කියන බව ය (ප්‍රස්තාර 3.3).

ප්‍රස්තාර 3.3: අධ්‍යාපන මට්ටම අනුව සේවාලාභීන්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය -2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

නියැදියෙන් 43.8% (213)ක් 6 සිට 11 වසර දක්වා ද, 27.6% (134)ක් 1 සිට 5 වසර දක්වා ද අධ්‍යාපනය ලැබුවෝ වෙති. උපාධි හෝ පශ්චාත් උපාධි ලබාගෙන ඇත්තේ 1.6% (8)ක් වන අවම සේවාලාභීන් ප්‍රමාණයක් වන අතර සේවාලාභීන්ගෙන් 2.3% (11)ක් පාසැල් අධ්‍යාපනය නො ලැබූ අතර ලිවීමට හෝ කියවීමට නො හැකි ය. නියැදියට අයත් සේවාලාභීන් බහුතරය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ජීවනෝපාය මාර්ගවල යෙදී සිටින අතර ඉහළ අධ්‍යාපන මට්ටමක් ලැබීමට පහසුකම් හෝ අවශ්‍යතාවක් නො වීම සේවාලාභීන්ගේ පහළ අධ්‍යාපන මට්ටමට හේතු සාධක වී ඇත.

සේවාලාභීන්ගේ නිවාසවල ජල හා විදුලි පහසුකම් පිළිබඳ තත්ත්වය විමසීමේ දී පෙනී යන්නේ නියැදියෙන් බහුතරය ජල හා විදුලි පහසුකම් භුක්ති විඳින බවයි. ඒ අනුව අධ්‍යයනයට ලක් වූ සේවාලාභීන්ගෙන් 86% (419)ක නිවාස සඳහා ජල පහසුකම් පවතින අතර නිවාස ඒකක 88% (428)ක් සඳහා විදුලි බලය ලබාගෙන ඇත (ප්‍රස්තාර 3.4).

ප්‍රස්තාර 3.4: සේවාලාභීන්ගේ නිවාස ඒකකයන් හි ජල හා විදුලි පහසුකම් හිමිකම පිළිබඳ තත්ත්වය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

සේවාලාභීන්ගේ නියැදිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් සලකා බැලීමේ දී ජල හා විදුලි පහසුකම් සහිත නිවාස වැඩි ම ප්‍රතිශතය හම්බන්තොටින් ද, අඩු ම ප්‍රතිශතය සූරියවැවෙන් ද වාර්තා වේ. හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස සඳහා ජල හා විදුලි පහසුකම් සහිත සේවාලාභීන්ගේ ප්‍රතිශතය 93% පමණ ඉහළ ප්‍රමාණයකි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ කඩිනම් සංවර්ධනය සමඟ ඇති වූ සාපේක්ෂ දියුණු යටිතල පහසුකම් මෙම තත්ත්වය ඇති වීමෙහිලා ප්‍රමුඛ බලපෑමක් සිදුකර ඇත. එමෙන් ම, බහුතර මහවැලි ජනපදිකයන් පිරිසක් වෙසෙන සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නියැදියෙන් නිවාස ඒකක 78.4% (58)කට ජල පහසුකම් ද, නිවාස ඒකක 71.6% (53)කට පමණක් විදුලි පහසුකම් ද සපයා ගෙන ඇත. නිරීක්ෂණවලට අනුව, සූරියවැව ප්‍රදේශය අධ්‍යයනයට ලක් වූ සෙසු ප්‍රදේශ හා සාපේක්ෂව බැලීමේ දී අනවසර ඉඩම් භුක්තිය බහුලව පවතින ප්‍රදේශයක් වේ. එම අනවසර ඉඩම් භුක්තිය හේතු කොට ගෙන නිත්‍යානුකූලව ජල හා විදුලි පහසුකම් ලබා ගැනීම ගැටලුවක් වීම මෙම සේවාලාභීන් අතර ජල හා විදුලි පහසුකම් භුක්තිය සාපේක්ෂව අඩු මට්ටමක පැවතීමට ප්‍රධාන හේතුවකි.

ප්‍රස්තාර 3.5: ප්‍රජා සංවිධානවල නිලතල දරන සේවාලාභීන්ගේ ව්‍යාප්තිය (නිලතල දරන මුළු සේවාලාභීන්ගේ ප්‍රතිශතයක් ලෙස)



සටහන: එක් එක් පුද්ගලයා සමිති කිහිපයක නිලතල දරන හෙයින් ප්‍රතිශත එකතුව සියයට සමාන නො වේ.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය-2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

සේවාලාභීන්ගේ සමාජ සබඳතා හා ඔවුන්ගේ සමාජයීය කටයුතු අනුව අධ්‍යයනයට ලක්කළ මුළු සේවාලාභීන්ගෙන් 32% (100)ක් කිසියම් හෝ සමිතියක නිලතල දරයි (ප්‍රස්තාර 3.5). ඔවුන්ගෙන් 29% (44)ක් සමෘද්ධි සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා පාසැල් සංවර්ධන සමිති ඇතුළු විවිධ සංවර්ධන සමිතිවල සාමාජිකත්වය උසුලන අතර ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව මොවුන් අතුරින් සැලකිය යුතු පිරිසක් ගම නැගුම හා මහනැගුම වැනි ජාතික සංවර්ධන වැඩපිළිවෙලවල් සමඟ ද සම්බන්ධව ඇත. මෙයට අමතරව ඔවුන්ගෙන් 20.1% (31) ගොවි සංවිධාන ප්‍රමුඛ කරගත් වෘත්තිය වශයෙන් වැදගත් වන සමිතිවල නිලතල දරන අතර 16.2% (25)ක් විවිධ රාජ්‍ය නො වන සංවිධානවලට අයත් සමිතිවල ද සාමාජිකත්වය දරති. එමෙන් ම, සමිති කිහිපයක සාමාජිකත්වය දරන ප්‍රජා නායකයින් ද නියැදියට අයත් විය.

නියුතු කාර්යයන් අනුව අධ්‍යයනයට ලක් කරන ලද සේවාලාභීන් සැලකූ විට ඔවුන්ගෙන් බහුතරය එනම් 71% (346)ක් ම ප්‍රදේශයේ ශ්‍රම බලකායට සඵලදායීව සම්බන්ධ වන්නෝ ය. අවශේෂ පුද්ගලයන්ගෙන් 26% (80) ගෘහනියන් වන අතර රැකියා විරහිත තත්ත්වයේ පසුවන්නේ 2% (11)ක් පමණි.

ප්‍රස්තාර 3.6: නියුතු කාර්යය අනුව සේවාලාභීන්ගේ ව්‍යාප්තිය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ප්‍රදේශයේ සාම්ප්‍රදායික හා නව ආර්ථික රටාවට අනුව කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා ඉදිකිරීම් ක්ෂේත්‍රය ප්‍රමුඛ කරගත් අවිධිමත් අංශයේ රැකියාවක නිරත වීමට අවකාශ පැවතීම රැකියා විරහිත පුද්ගල ප්‍රමාණය අඩු මට්ටමක පැවතීම සඳහා සැලකිය යුතු බලපෑමක් කර තිබේ.

වගුව 3.11: නියැදියට අයත් සේවාලාභීන්ගේ ප්‍රාථමික ආදායම් මාර්ගය

ප්‍රාථමික ආදායම් මාර්ගය	සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
ගොවි	227	59.7
කම්කරු	32	8.4
ව්‍යාපාරික	31	8.2
රජයේ රැකියා	21	5.5
පෞද්ගලික අංශයේ රැකියා	6	1.6
ස්වයං රැකියා	27	7.1
ධීවර කර්මාන්තය	23	6.1
විශ්‍රාම වැටුප	8	2.1
වෙනත් රැකියා	5	1.3
එකතුව	380	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් සහිත මෙම ප්‍රදේශයේ, ආදායම් මාර්ගයකට හිමිකම් කියන ප්‍රතිචාරිහු බහුතරයක් එනම්, 59.7% (227)ක් ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ගොවිතැන් කටයුතුවල නියැලෙති (වගුව 3.11). ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස වී වගාව ද, සෙසු පිරිස හේන් වගාව, එළවළු හා පලතුරු වගාව ඇතුළු කෘෂි අංශයට සම්බන්ධිත විවිධ කාර්යයන් හි නියුක්ත වේ. මෙහි දී වෙනත් රැකියා යන්නෙන් අදහස් වන්නේ රියදුරු, විදේශ රැකියා, කොන්ත්‍රාත් යන රැකියාවන් වේ.

රජයේ රැකියාවල නිරතව සිටියේ ආදායම් මාර්ගයක් හිමි සේවාලාභීන්ගෙන් 5.5 %ක් පමණි. ඔවුන්ගෙන් වැඩි පිරිස තැපැල් සේවයට (24%) හා ආරක්ෂක අංශයට (24%) සම්බන්ධ රැකියාවල නියුක්ත ය. මෙයට අමතරව ප්‍රතිචාරීන්ගෙන් 12%කගේ පවුල්වල කිසියම් හෝ සාමාජිකයෙක් කුමන හෝ රජයේ රැකියාවක නිරතව සිටී. මෙයට සමගාමීව නියැදියට අයත් ද්විතියික ආදායම් මාර්ග හිමි සේවාලාභීන්ගෙන් බහුතරයකගේ ද්විතියික ආදායම් මාර්ගය වී ඇත්තේ ද ගොවිතැන (31%) වේ. තවත් 21 %ක් විවිධ ව්‍යාපාරික කටයුතුවල නිරත වීමෙන් ද, 17 %ක් ස්වයං රැකියාවල් මඟින් ද, 12 %ක් කම්කරු වෘත්තියේ නිරත වීමෙන් ද ද්විතියික ආදායම් උපයති.

ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය වන සේවාලාභීන්ගෙන් 67 %ක් පුරුෂයින් ද, 33%ක් ස්ත්‍රීන් ද වේ. එමෙන් ම, ගොවිතැන ජීවනෝපාය කරගත් සේවාලාභීන්ගෙන් 49 %ක් 1 වසර සිට 11 වසර දක්වා අධ්‍යාපනය ලැබූ අය වන අතර 31% ක් 1 වසර සිට 5 වසර දක්වා පමණක් ඉගෙනුම ලැබුවන් විය. රජයේ රැකියාලාභීන්ගෙන් 33%ක් අ.පො.ස උසස් පෙළ සමතුන් වේ. එමෙන් ම, රැකියා නියුක්ත ප්‍රතිචාරීන්ගෙන් 44.8%ක් ද, ගෘහනියන්ගෙන් 53.8 %ක් ද, 6 වසර සිට 11 වසර තෙක් අධ්‍යාපනය ලැබුවන් වේ. කෙසේ වෙතත් නියැදියට අයත් සේවාලාභීන්ගේ අධ්‍යාපන මට්ටම රැකියා තත්ත්වය තීරණය කිරීමෙහි යම් බලපෑමක් කළ ද එය එතරම් කැපී පෙනෙන වෙනසක් නො වන්නේ බහුතරය ගොවීන් ලෙස කටයුතු කිරීම හේතුවෙනි.

3.4.2 සේවාලාභීන්ගේ ඉඩම් භුක්තියේ ස්වභාවය

නියැදියට අයත් සේවාලාභීන්ගෙන් 94% (455)ක් ගොඩ ඉඩම්වල භුක්තිය ද, 33% (153)ක් මඩ ඉඩම්වල භුක්තිය ද, 12% (56)ක් හේන් ඉඩම්වල භුක්තිය ද දරති. ඒ අනුව, නියැදියට අයත් සේවාලාභීහු බහුතරය ගොඩ ඉඩම්වල භුක්තිය දරති.

ප්‍රස්තාර 3.7: සේවාලාභීන්ගේ ඉඩම් භුක්තියේ ස්වභාවය (ඉඩමේ වර්ගය අනුව)



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නියැදියට අයත් වූ කිසිදු සේවාලාභියෙකු හට හේන් ඉඩම් භුක්තිය නො තිබූ අතර පිළිවෙළින් වලස්මුල්ල හා තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවාලාභීන් එක් අයෙක් හා දෙදෙනෙක් හේන් ඉඩම්වල භුක්තිය දැරූ හ. අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල හේන් ඉඩම් භුක්තිය සැලකිය යුතු මට්ටමක පැවතිණි.

එමෙන් ම, ගැටලුවට සම්බන්ධ ඉඩම්වල ඇති හිමිකාරිත්වය විමසා බැලීමේ දී අධ්‍යයනයට ලක් කරන ලද ඉඩම්වලින් 31% (153)ක ඉඩමේ හිමිකාරිත්වය සේවාලාභියා සතු අතර තවත් 18% (86)ක් ඉඩම්වල හිමිකාරිත්වය සේවාලාභීන්ගේ දෙමාපියන් සතු විය. එමෙන් ම, සේවාලාභීන් භුක්ති විඳි ඉඩම්වලින් 20% (96)ක් ඉඩම් රජයේ අනවසර ඉඩම් ද, තවත් 1.9% (9)ක් විවිධ රක්ෂිත ඉඩම් ද විය (ප්‍රස්තාර 3.8)

ප්‍රස්තාර 3.8: ඉඩම් හිමිකාරීත්වය අනුව සේවාලාභීන්ගේ ඉඩම් භුක්තිය



මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු.ආයතනය

ඉඩම් සම්බන්ධ ගැටලුවල දී තමාගේ නමින් භුක්තිය ඇති ඉඩම් සම්බන්ධව ගැටලු වැඩි ප්‍රමාණයක් වාර්තා වූයේ තිස්සමහාරාමය (38%), අම්බලන්තොට (31%), හම්බන්තොට (42%) හා ලුණුගම්වෙහෙර (34%) යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවාලාභීන් වෙතිනි. මෙයට අමතරව, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවාලාභීන් වැඩි ප්‍රමාණයක් (24%) සිය දෙමාපියන්ගේ ඉඩම්වල භුක්තිය සම්බන්ධව ගැටලු ද, සූරියවැව ප්‍රාදේශීය කොට්ඨාසයේ 53% සේවාලාභීන් රජයේ අනවසර ඉඩම්වල භුක්තිය ද, දරති. එම නිසා ඔවුන්ගේ ගැටලු වැඩි ප්‍රමාණයක් කේන්ද්‍රගත වූයේ අනවසර ඉඩම් සම්බන්ධව වේ.

සේවාලාභීන්ගේ ඉඩම් පිළිබඳ ගැටලු සම්බන්ධ විමසීමේ දී පෙනී යන්නේ වැඩි ම ගැටලු ප්‍රමාණයක් එනම්, සමස්ත ගැටලුවලින් 33% (161)ක් ඉඩම් බලපත්‍ර ලබා ගැනීම හා අනවසර නියමානුකූල කිරීම සම්බන්ධව පවතින බව යි.

වගුව 3.12: නියැදියට අයත් සේවාලාභීන්ගේ ඉඩම් ගැටලුවේ ස්වභාවය

ඉඩම් ගැටලුවේ ස්වභාවය	අධ්‍යයන ප්‍රදේශ							සමස්ත නියැදියෙන් ගැටලුවට මුහුණදුන් සේවාලාභීන්	
	අම්බලන්තොට	සූරියවැව	හම්බන්තොට	තිස්සමහාරාම	ලුණුගම්වෙහෙර	වලස්මුල්ල	තංගල්ල	සංඛ්‍යාව	%
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම/ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචිය	19	43	20	26	14	15	24	161	33
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	8	0	8	15	7	20	7	65	13
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	11	17	9	4	8	4	10	63	13
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	6	4	2	7	8	11	6	44	9
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	6	1	7	4	4	10	7	39	8
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	2	0	3	9	13	5	6	38	8
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	1	1	2	2	3	3	4	16	3
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	4	6	15	7	2	7	5	46	10
දීර්ඝකාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	0	2	1	5	1	1	1	11	2
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	1	0	0	1	1	0	0	3	1
එකතුව	58	74	67	80	61	76	70	486	100

සටහන: රජයෙන් ලබා දී ඇති ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් නො කිරීම, අනවසර නියමානුකූල කිරීමේ නීතිය යටතේ නියමානුකූල කිරීමට හැකියාව තිබූ ඉඩම් නියමානුකූල කිරීම ප්‍රමාදවීම හෝ එය ඉටු නො වීම, නව නීති යටතේ ඉඩම් නොමැති පුද්ගලයින් වශයෙන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර ඇතත් ඒ සඳහා මෙතෙක් කිසිදු ප්‍රතිචාරයක් නො ලැබුණු සේවාලාභීන් වගුවේ පළමු තීරය යටතට ඇතුළත් කර ඇත.

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

විශේෂයෙන් මහවැලි ව්‍යාපාරයට අයත් ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින සූරියවැව ප්‍රදේශයේ අනවසර ඉඩම් භාවිතය සෙසු ප්‍රදේශවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මයුරපුර මහවැලි කොට්ඨාස කළමනාකරණ කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ මෙම ගැටලුව ඉහළ මට්ටමක පැවතිණි. මෙම කොට්ඨාසයේ ඉඩම් බෙදා දීමේ දී මුල් අවස්ථාවේ ම සිදුව ඇති කළමනාකරණ දුර්වලතා මෙයට හේතු වී ඇත. සූරියවැව ප්‍රදේශයේ අධ්‍යයනයට ලක් කරන ලද නියැදියෙන් 59%ක් ම අනවසර ඉඩම්ලාභීන් වීම එම ගැටලුවේ ප්‍රබලත්වයට සාක්ෂි සපයයි. සූරියවැව කොට්ඨාසයට අමතරව අනවසර ඉඩම් සම්බන්ධව ගැටලුව ප්‍රබලව මතුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන්නේ තිස්සමහාරාමය වේ. අනවසර ඉඩම් භාවිතය පිළිබඳ පැවති නීතිවල ලිහිල් බව සහ අනවසර අල්ලා ගැනීම්වලට එරෙහිව විවිධ හේතු සාධක නිසා නිලධාරීන්ගේ ක්‍රියාකලාපය දුර්වල මට්ටමක පැවතීම, නීතියේ ආධිපතිත්වය සම්බන්ධයෙන් ජනතාව තුළ පවතින අල්ප විශ්වාසය සහ නීතියට ගරු නො කිරීමේ ප්‍රවණතාව හේතුවෙන් අවසානයේ සංකීර්ණ ගැටලු මතු කරන ආකාරය ක්ෂේත්‍ර අධ්‍යයනයේදී කැපී පෙනෙන කරුණක් විය.

අධ්‍යයනයට ලක් කරන ලද සේවාලාභීන් අතර ඉඩම් සඳහා දීමනා පත්‍ර/ ඔප්පු ලබා ගැනීම (13%) හා ඉඩම් ආරවුල් නිරවුල් කිරීම සම්බන්ධව (13%) සැලකිය යුතු ගැටලු සංඛ්‍යාවක් පවතී. විශේෂයෙන් දීමනා පත්‍ර/ඔප්පු ලබා දීමට දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් ගැටලු කල්පවතින ආකාරයත්, ඒවා වඩාත් සංකීර්ණ වන ආකාරයත් දැකගත හැකි විය. දීමනා පත්‍ර ලබා ගැනීම සඳහා වන ඉල්ලීම වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නියැදියට අයත් සේවාලාභීන් අතර වැඩි ප්‍රමාණයක් තිබූ අතර ඉඩම් ආරවුල් නිරවුල් කිරීම බහුතර ගැටලුවක්ව පැවතියේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ය. දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම හා රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩමක් බැංකු හෝ අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම සම්බන්ධව ගැටලු සහිත සේවාලාභීන් සුළු ප්‍රමාණයක් නියැදියට අයත් විය. රජයෙන් ප්‍රදානය කරන ලද ඉඩමක් මූල්‍ය ආයතනයක් වෙත උකස් කිරීම සඳහා වන ක්‍රියාවලියේ දී අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ ප්‍රාදේශීය ලේකම් වෙතින් පමණක් වීම නිසාත්, ඒ සම්බන්ධයෙන් සේවාලාභීන් දැඩි කැපවීමකින් කටයුතු කිරීම නිසාත් එම සේවාව සැපයීම ගැටලුවක්ව තිබූ බව අධ්‍යයනයේ දී අනාවරණය නො විණි.

ප්‍රස්තාර 3.9: ඉඩම් කැබලිවල ප්‍රමාණය අනුව සේවාලාභීන්ගේ ඉඩම් භුක්තියේ ස්වභාවය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ඉහත ප්‍රස්තාර සටහන අනුව පෙනී යන්නේ සමස්තයක් ලෙස නියැදියට අයත් සේවාලාභීන් සතු ඉඩම් කට්ටිවලින් 33% (220)ක් වන ඉඩම් ප්‍රමාණය අක්කර 2ට වැඩි බව ය. එමෙන් ම, කුඹුරු ඉඩම් කැබලිවලින් 67%ක් ද, හේන් ඉඩම් කැබලිවලින් 55% (31)ක් ද, ඉඩම් අක්කර 2ට වඩා වැඩි ප්‍රමාණයකි. එහෙත්, අධ්‍යයනයට ලක් කරන ලද සේවාලාභීන්ට අයත් ගොඩ ඉඩම්වලින් අක්කර 2ට වඩා වැඩි ඉඩම් කට්ටි පැවතියේ මුළු ගොඩ ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් 19% (127)ක් පමණි. එය ඉඩම් බෙදීයාම, ඉඩම් කැබලි බවට පත්වීමේ ප්‍රවණතාව හේතුවෙන් ඇති වූ ප්‍රධාන ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකි ය. නියැදියට අයත් සේවාලාභීන්ගේ ඉඩම් කට්ටිවලින් බහුතරයක් (78%) අක්කර භාගයකට හෝ එයට වැඩි ප්‍රමාණයක ඉඩම් ප්‍රමාණයක් භුක්ති විඳින අතර ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය අඩුවීම ඉඩම් ඵලදායිතාව හීනවීමට බලපෑමක් කරයි.

වගුව 3.13: ඉඩම් අයිතියේ ස්වභාවය අනුව සේවාලාභීන්ගේ ඉඩම් භුක්තිය

ඉඩමේ අයිතිය	ඉඩමේ ස්වභාවය						එකතුව	
	ගොඩ		මඩ		හේන්			
	ඉඩම් කැබලි සංඛ්‍යාව	%	ඉඩම් කැබලි සංඛ්‍යාව	%	ඉඩම් කැබලි සංඛ්‍යාව	%	ඉඩම් කැබලි සංඛ්‍යාව	%
රජයෙන් ලබාදුන්	284	60	105	70	21	38	410	61
අනවසර	140	30	28	19	35	63	203	30
ජයභූමි යටතේ තිරවුල් නොවූ ඉඩම්	40	9	15	10	-	-	55	8
වෙනත් ඉඩම්	6	1	1	1	-	-	7	1

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

සේවාලාභීන් භුක්ති විඳින ඉඩම්වල ස්වභාවය විග්‍රහ කළ විට පෙනී යන්නේ සමස්ත ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් 61% (410)ක් රජයෙන් ලබාදුන් ඉඩම් වන අතර 30% (203)ක් අනවසර ඉඩම් ද, 8% (55)ක් ජයභූමි යටතේ තිරවුල් නො වූ ඉඩම් බවත් ය. ගොඩ ඉඩම් කැබලිවලින් 60% (284)ක් ද, මඩ ඉඩම් කැබලිවලින් 70%ක් ද, හේන් ඉඩම් කැබලිවලින් 38% (21)ක් ද රජයෙන් ලබාදුන් ඒවා විය. එමෙන් ම, මුළු ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් ගොඩ ඉඩම්වලින් 30% (140)ක්, මඩ ඉඩම්වලින් 19% (28)ක්, හේන් ඉඩම්වලින් 63% (35)ක් ද, සේවාලාභීන් විසින් අනවසරයෙන් භුක්ති විඳින බව 3.13 වගුව අනුව පැහැදිලි වේ. මෙහි දී වෙනත් ඉඩම් යනුවෙන් අදහස් කර ඇත්තේ නින්දගම් හා වෙනත් අයගෙන් මිල දී ගත් ඉඩම් වේ.

3.5: ඉඩම් සම්බන්ධ සේවා සපයන නිලධාරීන්ගේ පසුබිම

ඉඩම් සම්බන්ධ සේවා සැපයීම සඳහා සෘජුව ම සම්බන්ධ වන වෘත්තීන්වල නිරත නිලධාරීන් මෙම අධ්‍යයනයේ නියැදියට අයත් විය. නියැදියට අයත් වූ නිලධාරීන්ගේ ව්‍යාප්තිය 1.1 වගුව දැක් වේ. අධ්‍යයනයට ලක් කළ නිලධාරීන්ගෙන් 143ක් ග්‍රාම නිලධාරීන් වූ අතර 12 දෙනෙකු ඉඩම් නිලධාරීන් ද, 24ක් සංවර්ධන සහකාර හෝ කළමනාකරණ සහකාරවරුන් ද වූහ.

අධ්‍යයනයේ දී සේවා සපයන නිලධාරීන්ගේ/නිලධාරිනියන්ගේ වෘත්තිමය පසුබිම පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. එහි දී අනාවරණය වූ පරිදි නියැදියට අයත් නිලධාරීන්ගේ රාජ්‍ය සේවයේ සේවා කාලය පිළිබඳ තොරතුරු 3.14 වගුවෙන් දැක් වේ.

වගුව 3.14: රාජ්‍ය සේවයේ සේවා කාලය අනුව නියැදියට අයත් නිලධාරීන්

නිලධාරී කාණ්ඩය	ප්‍රතිශතය (%)				
	අවු. 10ට අඩු	අවු.10-20 දක්වා	අවු. 20-30 දක්වා	අවු.30ට වැඩි	එකතුව
ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව=143)	25.2	34.3	29.4	11.1	100.0
ජනපද නිලධාරී (සංඛ්‍යාව=12)	33.3	0.0	41.7	25.0	100.0
සංවර්ධන/ කළමනාකරණ සහකාර (සංඛ්‍යාව=24)	45.8	41.7	8.3	4.2	100.0
සහකාර ප්‍රාදේශීය ලේකම් (සංඛ්‍යාව=6)	80.0	20.0	0.0	0.0	100.0
කොට්ඨාස කළමනාකරු (සංඛ්‍යාව= 1)	100.0	0.0	0.0	0.0	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

අධ්‍යයනයට ලක් කරන ලද නිලධාරීන්ගෙන් 32.4% (60)ක් රාජ්‍ය සේවාවේ අවුරුදු 10-20 අත්දැකීම් සහිත වූවෝ වූහ. රාජ්‍ය සේවාවේ අවුරුදු 30ට වැඩි සේවා කාලයක් සහිත අත්දැකීම් සපිරි නිලධාරීන් අධ්‍යයන නියැදියෙන් 10.8% (20)ක් වූ අතර ඔවුන්ගෙන් 16 දෙනෙකු ග්‍රාම නිලධාරීහු වූහ. එම ග්‍රාම නිලධාරීන්ගෙන් 4ක් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සේවය කරන්නන් වූ අතර නියැදියට අයත් වූ ප්‍රාදේශීය ලේකම්වරුන් 5දෙනාගෙන් 4ක් ම අවුරුදු 10ට අඩු සේවා කාලයක් සහිත නිලධාරීහු වූහ.

වගුව 3.15: අදාළ වෘත්තියේ සේවා කාලය අනුව නිලධාරීන්ගේ ව්‍යාප්තිය

සේවා කාලය (අවුරුදු)	ප්‍රතිශතය (%)					එකතුව	
	ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව =143)	ජනපද නිලධාරී (සංඛ්‍යාව = 12)	සංවර්ධන/කළමනාකරණ සහකාර (සංඛ්‍යාව = 24)	සහකාර ප්‍රාදේශීය ලේකම් (සංඛ්‍යාව= 5)	කොට්ඨාස කළමනාකරු (සංඛ්‍යාව = 1)	සංඛ්‍යාව	ප්‍රතිශතය
10ට අඩු	25.9	75.0	79.2	100.0	100.0	71	38.4
10- 20 දක්වා	37.0	25.0	20.8	0.0	0.0	61	33.0
20-30 දක්වා	35.0	0.0	0.0	0.0	0.0	50	27.0
30ට වැඩි	2.1	0.0	0.0	0.0	0.0	3	1.6
එකතුව	100.0	100.0	100.0	100.0	100.0	185	100.0

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

නියැදියට අයත් ඉඩම් සම්බන්ධ සේවා සපයන නිලධාරීන්ගේ අදාළ වෘත්තියේ සේවා කාලය පිළිබඳ විමසූ විට පෙනී යන්නේ ඔවුන්ගෙන් බහුතරයක් එකී වෘත්තීන්වල නිරතවන්නේ අවුරුදු 10ට අඩු කාල සීමාවක සිට බව ය (වගුව 3.15). ඒ අනුව, නිලධාරීන්ගෙන් 38.4% (71)ම අදාළ වෘත්තියේ සේවා කාලය අවුරුදු 10ට අඩු ය. නියැදියට අයත් ජනපද/ඉඩම් නිලධාරීන්ගෙන් 75% (9)ක් ද, සංවර්ධන/කළමනාකරණ සහකාරවරුන්ගෙන් 79.2% (19)ක් ද, සහකාර ලේකම්වරුන් සියල්ලන්ගේමත් එම වෘත්තීන් හි සේවා කාලය අවුරුදු 10ට අඩු වේ. නියැදියට අයත් අවුරුදු 30ට වැඩි නිලධාරීන් තිදෙනාමත්, අවුරුදු 20-30 අතර කාල සීමාවක අත්දැකීම් සහිත නිලධාරීන් 50දෙනාත්, ග්‍රාම නිලධාරීන් වීම කැපී පෙනෙන ලක්ෂණයකි. අවුරුදු 30ට වඩා වැඩි කාලයක් ග්‍රාම නිලධාරී වෘත්තියේ සේවය කළ තිදෙනාගෙන් දෙදෙනෙකු තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවය කරන අතර අවුරුදු 20-30 කාලයක සේවා අත්දැකීම් සහිත ග්‍රාම නිලධාරීන්ගෙන් 10ක් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද, 9ක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද සේවය කරති.

වගුව 3.16: අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවා නියුක්ත කාලය අනුව නිලධාරීන්ගේ විසිරීම

සේවා කාලය (අවුරුදු)	ප්‍රතිශතය (%) ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව =143)	ජනපද නිලධාරී (සංඛ්‍යාව = 12)	සංවර්ධන/ කළමනාකරණ සහකාර (සංඛ්‍යාව = 24)	සහකාර ප්‍රාදේශීය ලේකම් (සංඛ්‍යාව= 5)	කොට්ඨාශ කළමනාකරු (සංඛ්‍යාව = 1)	එකතුව සංඛ්‍යාව	ප්‍රතිශතය
10ට අඩු	42.7	83.3	91.7	100.0	100.0	99	53.5
10-20 දක්වා	35.0	8.3	4.2	0.0	0.0	52	28.1
20-30 දක්වා	18.2	8.3	4.2	0.0	0.0	28	15.1
30ට වැඩි	4.2	0.0	0.0	0.0	0.0	6	3.2
එකතුව	100.0	100.0	100.0	100.0	100.0	185	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

නියැදියට අයත් නිලධාරීන්ගෙන් බහුතරය ඔවුන් දැනට සේවය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවය කර ඇත්තේ කෙටි කාල සීමාවක සිට ය (වගුව 3.16). එම නිලධාරීන් අතුරින් 53.5% (99) ම අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවා කාලය අවුරුදු 10ට අඩු ය. එක ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවුරුදු 30ට වැඩි කාලයක් අඛණ්ඩව සේවය කළ නිලධාරීන් හයදෙනෙකු පමණක් වූ අතර ඔවුන් සියල්ලෝ ම ග්‍රාම නිලධාරීහු වූහ. ඔවුහු අම්බලන්තොට, වලස්මුල්ල, සූරියවැව, තිස්සමහාරාම සහ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවය කරති.

වගුව 3.17: අදාළ ග්‍රාම නිලධාරී වසමේ සේවා කාලය අනුව ග්‍රාම නිලධාරී/ නිලධාරිනියන්ගේ විසිරීම

සේවා කාලය	සංඛ්‍යාව	%
අවුරුදු 5ට අඩු	105	73.4
අවුරුදු 5-10 අතර	34	23.8
අවුරුදු 10ට වැඩි	04	2.8
එකතුව	143	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය-2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

අධ්‍යයන නියැදියට අයත් ග්‍රාම නිලධාරින්ගෙන් 73.4%ක් ඔවුන් දැනට සේවය කරන වසමේ සේවා නියුතු කාලය අවුරුදු 5ට අඩු වේ (වගුව 3.18). ඔවුන්ගෙන් බහුතරය එම සේවාවට ආධුනිකයින් වීම ද, සේවා ස්ථාන මාරුවීම් ද මේ සඳහා බලපා ඇත. ග්‍රාම නිලධාරීන් අතුරින් 3%ට ආසන්න ප්‍රතිශතයක් (4 දෙනෙකු) වසර 10ට වැඩි කාලයක් එක ම වසමේ රාජකාරිවල නියුක්ත වේ. ග්‍රාම නිලධාරීන් හට එක ම වසමක දිගු කාලයක් සේවය කිරීම ද තරමක අභියෝගාත්මක හා දුෂ්කර කාර්යයක් බව ඇතැම් ග්‍රාම නිලධාරීහු ප්‍රකාශ කළ හ. විශේෂයෙන්, ඇතැම්විට ඉඩම් ගැටලුවල දී විවිධ පුද්ගලයින් සමඟ ඇතිවන මතභේදාත්මක හා ගැටලුකාරී තත්ත්වයන් නිසා දිගු කාලයක් එක ම ස්ථානයක රාජකාරි කටයුතු කිරීම දුෂ්කර වී ඇත.

3.5 සාරාංශය

දිස්ත්‍රික්කයේ ප්‍රධාන ම සම්පතක් වන ඉඩම් සම්බන්ධයෙන් සලකා බලන කළ වැඩිවන ජනගහනයට සාපේක්ෂව මිනිස් අවශ්‍යතා සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණය ඉතා සීමිත වන අතර එය ද ළඳු කැලෑ සහ හේන් වගාවෙන් යුක්ත වේ. දිස්ත්‍රික්කයේ සේවාලාභීන් විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් කැබලිවලින් 30% ආසන්න ප්‍රමාණයක් අනවසර ඉඩම් වේ. සේවාලාභීන්ගෙන් බහුතරය මැදි වයස් කාණ්ඩයට අයත් විවාහකයින් වූ අතර බහුතරය අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ එයට අඩු මට්ටමක අධ්‍යාපන පසුබිමක් සහිත පුද්ගලයෝ වූහ. නියැදියේ සේවාලාභීන්ගෙන් බහුතරය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සේවා නියුක්තිකයින් විය. ඉඩම් සඳහා බලපත්‍ර ලබා ගැනීම හෝ අනවසර නියමානුකූල කිරීම සේවාලාභීන් වැඩි පිරිසක් මුහුණ දුන් ගැටලුව වූ අතර එය ප්‍රදේශයේ අනවසර ඉඩම් භුක්තිය දැඩිව පවතින බවට සාක්ෂි සපයයි.

සිව්වැනි පරිච්ඡේදය

සේවක අභිප්‍රේරණ, පුහුණුවීම් සහ සේවාවේ තෘප්තිමත්භාවය

4.1 හැඳින්වීම

දෙවැනි පරිච්ඡේදයේ දී සඳහන් කළ අන්දමට සේවා ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සේවක අභිප්‍රේරණ සහ පුහුණුවීම් බොහෝ සෙයින් ඉවහල් වේ. මෙම පරිච්ඡේදය තුළින් තමන් සපයන සේවාව සම්බන්ධයෙන් එක් එක් නිලධාරි කාණ්ඩවල තෘප්තිමත්භාවය සහ ඒ සඳහා බලපා ඇති හේතු සාධක, පහසුකම් සම්බන්ධයෙන් සේවා කාණ්ඩවල අදහස් සාකච්ඡා කෙරේ. එයට අමතරව, ඉඩම් නීතිය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ පුහුණුවීම්, තම දැනුම වර්ධනය කිරීම සඳහා නිලධාරීන් බලාපොරොත්තු වන පුහුණුවීම්, ගැටලු නිරාකරණයේ දී ඉහළ නිලධාරීන්ගෙන් ලැබෙන සහාය පිළිබඳව නිලධාරීන් පළකළ අදහස් මෙන් ම සේවා සැපයීමේ ක්‍රියාවලිය සහ එක් එක් නිලධාරි කාණ්ඩය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම ද මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

4.2 සේවාව සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය

ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමට සම්බන්ධ වන සමස්ත නිලධාරීන්ගෙන් 27.6% (51)ක් තමන් සපයන සේවාව සම්බන්ධයෙන් ඉතා තෘප්තිමත් බවත්, 57.3% (106)ක් තෘප්තිමත් බවත් පවසා තිබිණි. කෙසේ වුව ද, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන් අතුරින් කිසිවෙකු තමන් සපයන සේවාව සම්බන්ධයෙන් ඉතා තෘප්තිමත් බව පවසා නො තිබූ අතර බහුතරය අතෘප්තිමත් බව පවසා තිබිණි. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්ගෙන් 40% (2)ක් තම සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් මට්ටමෙහි පසු වූහ. ග්‍රාම නිලධාරීන්ගෙන් 86% (123)ක් තමන් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් හෝ ඉතා තෘප්තිමත් බව අනාවරණය කළ අතර ජනපද නිලධාරීන්ගෙන් 75% (9)ක් ද, ඉඩම් අංශයේ සේවා නියුතු කළමනාකරණ සහකාර සහ සංවර්ධන සහකාරවරුන්/වරියන්ගෙන් 92% (22) ද තමන් විසින් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් හෝ දැඩි සේ තෘප්තිමත් බව පවසන ලදී.

වගුව 4.1: සපයන සේවාව සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තෘප්තිමත්භාවය

තෘප්තිමත් භාවය	ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව=143)	ජනපද නිලධාරී (සංඛ්‍යාව=12)	කළමනාකරණ/ සංවර්ධන සහකාර (සංඛ්‍යාව=24)	ස.ග්‍රා.ලේ. (සංඛ්‍යාව=5)	සමස්තය (සංඛ්‍යාව=185) %
ඉතා තෘප්තිමත්	28.7	25.0	25.0	0.0	27.6
තෘප්තිමත්	57.3	50.0	66.7	40.0	57.3
අතෘප්තිමත්	11.9	25.0	8.3	60.0	13.5
ඉතා අතෘප්තිමත්	2.1	0.0	0.0	0.0	1.6
එකතුව	100.0	100.0	100.0	100.0	100.0

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

4.2.1 සේවාව සම්බන්ධයෙන් නිලධාරීන්ගේ තෘප්තිමත්භාවයට/අතෘප්තිමත්භාවයට හේතු

4.2.1.1 තෘප්තිමත්භාවයට හේතු

ප්‍රස්තාර 4.1න් සමස්ත නිලධාරීන්ගේ තෘප්තිමත්භාවයට හේතු ඉදිරිපත් කෙරේ. ජනතාව සතු මූලික ම වත්කම 'ඉඩම්' වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ, එයට අදාළ සේවාවන් සපයන නිලධාරීන්ගෙන් බහුතරයක් (51%) තමන් විසින් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් වීමට බලපෑ ප්‍රධාන හේතුව වශයෙන් සඳහන් කරනු ලැබුවේ ජනතාවගේ ප්‍රධාන ගැටලුවක් විසඳීමට දායක වීමට ලැබීම ය. එමෙන් ම, ප්‍රදේශවාසීන්ගේ ඉඩම් සම්බන්ධයෙන් වන ගැටලු ගමේ දී ම හෝ ප්‍රාදේශීය මට්ටමින් විසඳීමට හැකිවීම හෙවත් විමධ්‍යගතකරණයේ ප්‍රතිඵල ජනතාවට ලබා දීමට හැකිවීම තම තෘප්තියට හේතුවන බැව් නිලධාරීන්ගෙන් 8%ක් සඳහන් කළ අතර ඉහළ නිලධාරීන් ඇතුළු විශාල පිරිසක් සමඟ මනා සබඳතාවක් පවත්වා ගැනීමට හැකිවීමත්, ජනතා ගැටලු විසඳීම හේතුවෙන් ජනතාව අතර ජනප්‍රියතාවට සහ ගෞරවයට පාත්‍රවීමට හැකිවීමත්, තම තෘප්තියට හේතු වන බව නිලධාරීන්ගෙන් 14% ද, ලබා ගන්නා වැටුපට සහ හෘද සාක්ෂියට එකඟව අවංකව සේවය කිරීමෙන් ලැබෙන ආත්ම තෘප්තිය තම තෘප්තියට හේතු වන බව නිලධාරීන්ගෙන් 4%ක් ද සඳහන් කරනු ලැබිණි.

නිලධාරීන්ගෙන් 5%ක් සඳහන් කරනු ලැබුවේ ඉඩම් සම්බන්ධයෙන් වන ගැටලුවල දී සාමාන්‍ය ජනතාව අදාළ නීති රීති සම්බන්ධයෙන් නො දැනුවත් හෙයින් ඔවුන් ඒ සම්බන්ධයෙන් දැනුවත් කොට අදාළ ස්ථානවලට නිසි පරිදි යොමු කිරීමට හැකිවීමෙන් ජනතාවගේ කාලය සහ ශ්‍රමය අනවශ්‍ය පරිදි වැය කිරීමෙන් වළක්වා ගැනීමත්, ඒ තුළින් කඩිනමින් සේවයක් ලබා ගැනීමට සැලැස්වීමත් නිසා තමන් තෘප්තිමත් වන බවයි. තමන් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් බව පැවසූ නිලධාරීන්ගෙන් ඉතිරි 18% ඒ සඳහා බලපෑ විවිධ හේතු සඳහන් කර තිබූ අතර තම රැකියාව නිසා ලබන දැනුම තමන්ගේ පෞද්ගලික ගැටලු නිරාකරණයේ දී ද යොදා

ගත හැකි වීම, ඉහළ නිලධාරීන් විසින් තම සේවාව ඇගයීම සහ උසස්වීම් ලැබීම, තම රැකියාව තුළ පවතින නිදහස සහ විවිධත්වය (විශේෂයෙන් ම ග්‍රාම නිලධාරීන්) රජයේ දේපළ ආරක්ෂා කිරීමෙන් මතු පරපුර සඳහා සම්පත් රැකගැනීමට දායකවීම, නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට බාධාවක් නො වීම සහ විෂයය සම්බන්ධයෙන් තම දැනුම වර්ධනය කර ගැනීමට රැකියාව පිටිවහලක් වීම ආදී කරුණු ඒ අතර විය. නිලධාරීන් වෙන් වෙන් වශයෙන් ගත් කළ ඔවුන්ගේ තෘප්තිමත්භාවයට බලපෑ හේතු සාධක වගු අංක 4.2න් ඉදිරිපත් කෙරේ.

ප්‍රස්තාර 4.1: නිලධාරීන්ගේ තෘප්තිමත්භාවයට හේතු



මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

වගු 4.2: නිලධාරී කාණ්ඩ අනුව ඔවුන්ගේ තෘප්තිමත්භාවයට බලපෑ හේතු

හේතුව	ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව=123)	ජනපද නිලධාරී (සංඛ්‍යාව=9)	කළමනාකරණ/ සංවර්ධන සහකාර (සංඛ්‍යාව=22)	ස.ග්‍රා.සේ. (සංඛ්‍යාව=2)
ජනතා ගැටලු විසඳීමට හැකිවීම	79 (64.2%)	5 (55.5%)	14 (63.6%)	2 (100.0%)
සමාජය සමඟ මනා සබඳතාවක් පවත්වා ගැනීමට හැකිවීම	23 (18.7%)	0 (0.0%)	5 (22.7%)	0 (0.0%)
අවංකව සේවය කිරීමේ ආත්ම තෘප්තිය	7 (5.7%)	0 (0.0%)	1 (4.5%)	0 (0.0%)
ගැටලු ගමේදීම විසඳීමට හැකිවීම	13 (10.6%)	3 (33.3%)	0 (0.0%)	0 (0.0%)
නීතිමය වශයෙන් ජනතාව දැනුවත් කිරීමට හැකිවීම	8 (6.5%)	0 (0.0%)	2 9.1%)	0 (0.0%)
වෙනත්	28 (22.7%)	2 (22.2%)	3 (13.6%)	1 (50.0%)

සටහන: එකම ප්‍රතිචාරියා හේතු ගණනාවක් සඳහන් කිරීම නිසා ප්‍රතිශත එකතුව සියයට සමාන නො වේ.
මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ඉහත වගු සටහනේ වෙනත් හේතු යන්නට රැකියාවේ පවතින නිදහස් ස්වභාවය, ඒකාකාරී නොවීම සහ විෂයය සම්බන්ධයෙන් දැනුම වර්ධනය කර ගැනීමට හැකිවීම, ඉහළ නිලධාරීන්ගේ ඇගයුමට පාත්‍රවීම සහ උසස්වීම් ලැබීම, ඉඩම් රාජකාරිවලට අදාළව ජනතාව තුළ ගොඩ නඟා ගන්නා යහපත් ප්‍රතිරූපය ඔස්සේ ගමේ වෙනත් සංවර්ධන වැඩකටයුතුවලට ජනතා දායකත්වය ලබා ගැනීමට හැකිවීම ආදිය ඇතුළත් වේ.

4.2.1.2 අතෘප්තිමත්භාවයට හේතු

තමන් සපයන සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත් බව ප්‍රකාශ කළ නිලධාරීන් 28 දෙනා ග්‍රාම නිලධාරීන් 19, ජනපද නිලධාරීන් 3, කළමනාකරණ/සංවර්ධන සහකාර දෙදෙනෙක් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය. ඔවුන්ගේ අතෘප්තිමත්/දැඩි අතෘප්තිමත්භාවයට බලපෑ හේතු සාධක අතර තමන් වෙත ඉදිරිපත් වන ගැටලු අදාළ අංශ සහ නිලධාරීන් වෙත ඉදිරිපත් කර ඇතත් ඒවා නො විසඳීම නිසා ජනතාවට එම කටයුත්ත සඳහා නිකරුනේ කාලය වැය කිරීමට සිදුවීම (32%), ජනතා අප්‍රසාදයට ලක්වීම (22%), ජනතාවට සේවය ලබා දීමට නිසි පහසුකම් සහ සාර්ථක ක්‍රමවේදයක් නො වීම (11%), ඉහළ නිලධාරීන්ගේ කාර්යය ප්‍රමාදය (11%), නිසි පරිදි ඇගයීමකට ලක් නො වීම (11%), උගත් දෙයින් ප්‍රයෝජනයක් ගත නො හැකිවීම (11%), ඉහළ නිලධාරීන් විසින් විනිවිදභාවයකින් තොරව සහ සාධාරණ නො වන අන්දමින් කටයුතු කිරීම (11%), ඉඩම් විෂයය නීරස විෂයයක් වීම, කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් දැනුමක් නොවීම සහ නීතියේ පවතින අපැහැදිලි බව නිසා ගැටලු මතුවීම (15%), රාජ්‍ය සේවාවේ උසස්වීම් ලැබීමේ ප්‍රමාදය වැනි රාජ්‍ය සේවයට ආවේණික දුර්වලතා (11%) සහ ජනතාවගේ ගැටලුවලට සවන් දීමෙන් ඇතිවන කළකිරීම (4%) සඳහන් කරුනු ලැබිණි. නිලධාරීන් වශයෙන් වෙන් වෙන්ව සලකා බැලීමේ දී ග්‍රාම නිලධාරීන්ගෙන් බහුතරයක් තම අතෘප්තියට හේතු වශයෙන් සඳහන් කරනු ලැබුවේ තමන් වෙත ඉදිරිපත්ව ඇති ගැටලු ඉහළ අංශවලට යොමු කර ඇතත් නො විසඳීම නිසා ජනතාව නිරන්තරයෙන් තමන්ගෙන් ඒ සම්බන්ධයෙන් විමසීමත්, තමන් රාජකාරිය නිසි පරිදි ඉටු නො කළ බවට ජනතාව තුළ මතයක් ගොඩනැගීමත් (37%) ය. කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්, ජනපද නිලධාරීන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සඳහන් කළ හේතු අතර ද එය ප්‍රමුඛ කරුණක් වේ.

4.3 සේවා ඇගයීම

අධ්‍යයනයට ලක් කළ නිලධාරීන් 185 දෙනා අතුරෙන් 65% (120)ක් සේවාලාභීන්, ඉහළ නිලධාරීන්, මහජන සංවිධාන හෝ දේශපාලනඥයින් යන කවුරුන් විසින් හෝ තම සේවාව ඇගයීමට ලක් කළ බව පවසා ඇත. මෙයට ග්‍රාම නිලධාරීන්ගෙන් 66.4% (95)ක්, ජනපද නිලධාරීන්ගෙන් 58.3% (7)ක්, කළමනාකරණ/සංවර්ධන සහකාර 66.7% (16)ක් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්ගෙන් 20% (1)ක් ඇතුළත් විය. තමන් ඇගයීමට ලක් වූ බව පවසන නිලධාරීන්ගෙන් 94.2% (113)ක් ඇගයීමට ලක් කර ඇත්තේ ඔවුන් වෙතින් සේවාව ලබා ගන්නා සේවාලාභීන් විසින් වීම විශේෂත්වයකි. කිසිවෙකු විසින් තම සේවාව ඇගයීමට ලක් කළ බව සඳහන් කළ නිලධාරීන්ගෙන් 54.2% (64) ඉහළ නිලධාරීන් විසින් ද, තවත් 28.3% (34) ගොවි සංවිධාන ඇතුළු මහජන සංවිධාන විසින් ද, 19.2% (23) දේශපාලනඥයින් විසින් ද ඇගයීමට ලක් කර ඇත.

ඇගයුමට ලක්ව ඇති ග්‍රාම නිලධාරීන්ගෙන් 97% (92)ක් සේවාලාභීන් වෙතින් ද, 52% (49)ක් සහකාර ප්‍රාදේශීය ලේකම්/ප්‍රාදේශීය ලේකම් ඇතුළු ඉහළ නිලධාරීන් වෙතින් ද, 32% (30)ක් මහජන සංවිධාන වෙතින් ද, 22% (21)ක් දේශපාලනඥයින් වෙතින් ද ඇගයුමට ලක්ව ඇත. එමෙන් ම, ඇගයුමට ලක් වූ බව පැවසූ ජනපද නිලධාරීන්ගෙන් 86% (6)ක් සේවාලාභීන් වෙතින් ද, 71% (5) ඉහළ නිලධාරීන් වෙතින් ද, 29% (2)ක් මහජන සංවිධාන වෙතින් ද, 14% (1)ක් දේශපාලනඥයින් වෙතින් ද ඇගයුමට ලක්ව ඇත. ඇගයුමට ලක් වූ කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්/වරියන්ගෙන් 81% (13)ක් සේවාලාභීන් වෙතින් ද, 69% (11)ක් ඉහළ නිලධාරීන් වෙතින් ද, 12% (2) මහජන සංවිධාන වෙතින් ද, 6% (1) දේශපාලනඥයින් වෙතින් ද ඇගයීමට භාජනය වී ඇති අතර සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්ගෙන් එක් අයෙකු පමණක් සේවාලාභීන් වෙතින් ඇගයුමට ලක්ව ඇත.

4.3.1 සේවා සැපයීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම

සමස්තයක් වශයෙන් සේවා සැපයීමේ ක්‍රියාවලිය සාමාන්‍ය බව සේවාලාභීන්ගෙන් 50.6% ද සතුටුදායක බව 3.1% ද, ඉතා සතුටුදායක බව 1.0% ද සඳහන් කරනු ලැබිණි. සේවාලාභීන්ගෙන් 29.2% සේවා සැපයීමේ ක්‍රියාවලිය දුර්වල බවත්, 9.9%ක් ඉතා දුර්වල බවත් පැවසූ අතර 5.8%ක් ඒ සම්බන්ධයෙන් ඇගයීමක් කිරීමට තමන්ට හැකියාවක් නොමැති බව සඳහන් කළ හ (ප්‍රස්තාර 4.2). සේවා සැපයීමේ ක්‍රියාදාමය පිළිබඳ සේවාලාභීන්ගේ ඇගයීම වගු 4.2න් දැක් වේ. ඒ අනුව, විශේෂිත ලක්ෂණයක් වන්නේ පළාත් සභා සහ මධ්‍ය රජයේ සේවා සැපයීම්වලට සාපේක්ෂව මහවැලි අධිකාරියෙන් සැපයෙන සේවාවන් පිළිබඳ සේවාලාභීන්ගෙන් 53.6%ක් දුර්වල හෝ ඉතා දුර්වල බව පැවසීම ය. මයුරපුර මහවැලි කොට්ඨාසයේ ඉඩම් බෙදා දීමේ දී මතුව ඇති ගැටලු මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

ප්‍රස්තාර 4.2: ඉඩම් සම්බන්ධ සේවාව පිළබඳ ව සේවාලාභීන්ගේ ඇගයීම



මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

වගුව 4.3: සේවා සපයන ආයතන අනුව සේවා සැපයීමේ ක්‍රියාවලිය පිළිබඳ සේවාලාභීන්ගේ ඇගයීම

ඇගයීම	සේවා සපයන ආයතන			සමස්තයෙ හි ප්‍රතිශතය (සංඛ්‍යාව=486)
	අන්තර් පළාත් (%)	පළාත් සභා (%)	මහවැලි අධිකාරිය (%)	
ඉතා සතුටුදායක/ සතුටුදායක	5.3	3.8	3.6	4.1
සාමාන්‍ය	48.2	53.2	41.7	50.6
දුර්වල/ඉතා දුර්වල	42.1	35.4	53.6	39.1
කිව නොහැක	4.4	7.7	1.8	6.2
එකතුව	100.0	100.0	100.0	100.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

එක් එක් නිලධාරි කාණ්ඩ සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම වගු 4.3න් ඉදිරිපත් කෙරේ. ග්‍රාම නිලධාරීන් වෙතින් ඉඩම් විෂයය සම්බන්ධයෙන් තමන්ට ලැබෙන සේවාව සතුටුදායක හෝ ඉතා සතුටුදායක බව සේවාලාභීන්ගෙන් 38%ක් සඳහන් කළ අතර දුර්වල හෝ ඉතා දුර්වල බව 10%ක් පමණක් සඳහන් කරනු ලැබිණි. මෙහි විශේෂත්වය වන්නේ අනෙකුත් නිලධාරි කාණ්ඩ සමඟ සසඳා බැලීමේ දී ග්‍රාම නිලධාරීන් වෙතින් සැපයෙන සේවාව දුර්වල හෝ ඉතා දුර්වල බව පැවසූ සේවාලාභීන්ගේ ප්‍රතිශතය අඩු වීමයි. ග්‍රාම නිලධාරීන් මෙම විෂයයට පමණක් සීමා නොවී වසමේ ජනතාවගේ පරිපාලනමය සහ නීතිමය මෙන් ම සුභසාධන කටයුතුවලින් බොහොමයකට සම්බන්ධවීමත්, බොහෝ දුරට ජනතාවගේ ම කෙනෙකු වශයෙන් ජනතාව අතර රැදී සිටින ක්ෂේත්‍ර නිලධාරියෙකු වීමත්,' මෙම තත්ත්වයට හේතු වී ඇත. කාර්යාල මට්ටමේ නිලධාරීන් වෙතින් ඉඩම් සම්බන්ධයෙන් සැපයෙන සේවාව දුර්වල හෝ ඉතා දුර්වල බව සේවාලාභීන්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් පැවසීමට හේතු වී ඇත්තේ බොහෝ අවස්ථාවල දී සේවා සැපයීමේ ක්‍රියාවලිය තුළ පවතින අඩුපාඩු තුළින් සේවාලාභීන්ට මුහුණ දීමට සිදුවන ගැටලු සහ දුෂ්කරතා, සේවාවන් ප්‍රමාදවීම, දුර්වල කළමනාකරණය සහ නිලධාරීන් ඇතැම් අවස්ථාවලදී තමන් සේවාලාභියාගේ ස්වාමියා ය හෝ සේවාලාභියාට වඩා උසස් ය හෝ යන මතයේ සිටිමින් ක්‍රියාකිරීම ය. අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු නිලධාරීන් සහ පළාත් ඉඩම් කොමසාරිස්, නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් සැපයෙන සේවාව දුර්වල හෝ ඉතා දුර්වල බව සේවාලාභීන්ගෙන් අඩක් පමණ සඳහන් කර ඇත. මෙම කාර්යාලවල පවතින සේවා සැපයීමේ ප්‍රමාදය මෙයට හේතු වී ඇත.

වගුව 4.4: එක් එක් නිලධාරී කාණ්ඩ වෙතින් ඉඩම් විෂයයට අදාළ ව සැපයෙන සේවාව සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ ඇගයීම

නිලධාරී කාණ්ඩය	ඉතා සෑහීමදායක	සෑහීමදායක	සාමාන්‍ය	දුර්වල	ඉතා දුර්වල	එකතුව
ග්‍රාම නිලධාරී	7.0	31.0	53.0	6.0	4.0	100.0
ඉඩම් නිලධාරී	2.0	10.0	46.0	24.0	17.0	100.0
ජනපද නිලධාරී	2.0	5.0	53.0	28.0	11.0	100.0
ප්‍රාදේශීය ලේකම්	2.0	12.0	57.0	17.0	12.0	100.0
සහකාර ප්‍රාදේශීය ලේකම්	3.0	10.0	59.0	19.0	9.0	100.0
ඉඩම් අංශයේ කළමනාකරණ සහකාරවරුන්	4.0	8.0	46.0	20.0	21.0	100.0
නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්	0.0	9.0	41.0	22.0	28.0	100.0
පළාත් ඉඩම් කොමසාරිස්	0.0	18.0	39.0	21.0	21.0	100.0
ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු නිලධාරීන්	0.0	5.0	45.0	25.0	25.0	100.0
දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරීන්	5.0	5.0	50.0	23.0	18.0	100.0
මහවැලි කොට්ඨාස කළමනාකරු	0.0	5.0	40.0	35.0	20.0	100.0
මහවැලි නේවාසික ව්‍යාපාර කළමනාකරු	0.0	0.0	10.0	90.0	0.0	100.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

4.4 ඉඩම් විෂයය සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුවත් භාවය සහ පුහුණුවීම්

අධ්‍යයනයට ලක්කළ නිලධාරීන්ගෙන් 92% (170)ක් ඉඩම් විෂයය සම්බන්ධයෙන් තම දැනුම තවදුරටත් වර්ධනය කළ යුතු බව පවසා තිබිණි. එයට ග්‍රාම නිලධාරීන්ගෙන් 93% (133)ක් ජනපද නිලධාරීන්ගෙන් 83% (10)ක්, කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්/වරියන්ගෙන් 92% (22) සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන් 100% (5)ක් ඇතුළත් විණි. ඉඩම් විෂයය සම්බන්ධයෙන් තම දැනුම ප්‍රමාණවත් බව පැවසූ නිලධාරීන්ගෙන් 74% (10)ක් ග්‍රාම නිලධාරීන් වූ අතර ජනපද නිලධාරීන් සහ සංවර්ධන සහකාරවරුන්ගෙන් 13% බැගින් එයට ඇතුළත් විය. විෂයය සම්බන්ධයෙන් තමන් ප්‍රමාණවත් තරම් දැනුවත් බව ප්‍රකාශ කළ නිලධාරීන්ගෙන් 20%

(3) අවුරුදු තුනකට අඩු සේවා කාලයක අය වූ අතර 13% බැගින් අවු. 5-10 සහ 10-20 අතර ද 40% (6) අවුරුදු 20ට වැඩි සේවා කාලයකින් ද යුක්ත වූහ. ඉඩම් විෂයය සම්බන්ධයෙන් තම දැනුම වර්ධනය කළ යුතු බව පැවසූ නිලධාරීන් ඒ සඳහා කළ යෝජනා වගු අංක 4.5 න් ඉදිරිපත් කෙරේ.

වගු 4.5: දැනුම වර්ධනය සඳහා ඉදිරිපත් කළ යෝජනා (ප්‍රතිශතයක් ලෙස)

යෝජනාව	ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව=133)	ජනපද නිලධාරී (සංඛ්‍යාව=10)	කළමනාකරණ/ සංවර්ධන සහකාර (සංඛ්‍යාව=22)	ස.ප්‍රා.ලේ (සංඛ්‍යාව=5)
ප්‍රායෝගික ගැටලුවලට විසඳුම් සොයන ආකාරය පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම	37	50	59	80
නව නීති සහ සංශෝධන පිළිබඳ කාලීන දැනුවත් කිරීම	41	60	32	20
විෂයය සම්බන්ධ අණ පනත් සහ චක්‍රලේඛ මුද්‍රිත පිටපත් ලබාදීම	32	20	0	0
අත්දැකීම් සහිත පුද්ගලයින් යොදා ගනිමින් නිලධාරීන්ට උපදෙස් ලබා දීම	14	10	14	20
ගැටලු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය ඇතුළත් සී.ඩී.පට/ පත්‍රිකා ලබාදීම	10	0	0	0
අවසාන ගම් සිතියම් ලබාදීම තුළින් දැනුවත් කිරීම	10	0	0	0
සිතියම් පරිහරණය පිළිබඳ දැනුවත් කිරීම	2	20	0	20
තාක්ෂණික දැනුම ලබාදීම	4	0	9	0
වෙනත්	8	0	23	60

සටහන: එක ම නිලධාරියා විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව සියයට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

වෙනත් යෝජනා යන්නට දිස්ත්‍රික් කාර්යාලවලට යොමු කර පුහුණු කිරීම, බිම් සවිය වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීම, අධිකරණ වාර්තා සැපයීම, කොට්ඨාස මට්ටමින් දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව සැලසීම, සමථකරණය පිළිබඳ දැනුවත් භාවය ලබාදීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් වෘත්තිමය පුස්තකාල පවත්වා ගෙනයාම, රක්ෂිත මායිම් සහ ඒ සම්බන්ධ නීතිය පිළිබඳ දැනුවත් කිරීම, කළමණාකරණ සහකාරවරුන්/වරියන්ගේ විෂයයන් කලින් කලට මාරු කිරීම, ලිපිගොනු පරිශීලනය සහ පවත්වා ගෙන යාම පිළිබඳ දැනුවත් කිරීම ඇතුළත් ව ඇත. දැනුවත් කිරීම සම්බන්ධ යෝජනාවන්හි දී නව නීති සහ සංශෝධන පිළිබඳව කාලීන දැනුවත් කිරීම් සිදු කිරීම සහ ප්‍රායෝගික ගැටලුවලට අදාළව විසඳුම් සොයන ආකාරය පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීහු විශේෂයෙන් සඳහන් කළ හ. මෙහි දී, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීන්

බහුතරයක් පෙන්වා දෙනු ලැබුවේ පවතින නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමට වඩා එම නීති ප්‍රායෝගික ගැටලුවලට අදාළ කර ගන්නා ආකාරය ඉස්මතු කරමින් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරයා විසින් 2011 වසරේ පවත්වනු ලැබූ ආකාරයේ වැඩමුළු තුළින් වසම්වල පවතින ඉඩම් ගැටලු විසඳා ගැනීමට වැඩි ඉඩකඩක් ලැබෙන බවයි.

අධ්‍යයනයට ලක් කරන ලද නිලධාරීන්ගෙන් 95% (175)ක් තමන් ඉඩම් විෂයය සම්බන්ධයෙන් කිසියම් ආකාරයක පුහුණුවක් ලබා ඇති බව පවසන අතර ම (වගු අංක 4.6) පුහුණුව ලැබූ නිලධාරීන්ගෙන් 10.3% (19)ක් එම පුහුණුවලින් කිසිදු ප්‍රතිඵලයක් නො ලද බව සඳහන් කිරීමෙන් හා සමස්ත නිලධාරීන්ගෙන් 92%ක් ඉඩම් විෂයය සම්බන්ධයෙන් වන තම දැනුම වර්ධනය කළ යුතු බව පැවසීමෙන් මෙම කරුණ සනාථ කරනු ලබයි. එනම්, ඉඩම් විෂයය සම්බන්ධයෙන් වන අණ පනත් සහ චක්‍රලේඛ පිළිබඳ නිලධාරීන් විවිධ අවස්ථාවන්හි දී වැඩමුළු සහ දේශන මඟින් දැනුවත් කර ඇතත් එම දැනුම ප්‍රායෝගික ගැටලුවල දී යොදා ගන්නා ආකාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සහභාගීත්ව විමසුම් ප්‍රවේශය ඔස්සේ ලබා නො දීම ඉහත ගැටලුවලට හේතු වී ඇත. බොහෝ විට මෙම පුහුණු වැඩමුළු දේශන ස්වරූපයෙන් පැවැත්වීමත්, නීති සම්බන්ධයෙන් වන විස්තර කිරීම් අදාළ පොත්පත්වල පවතින ආකාරයෙන් ම ඉදිරිපත් කිරීමත් ඇතුළත් ව වැඩිහිටි අධ්‍යාපනයට උචිත ක්‍රමවේද ඔස්සේ ඉදිරිපත් නො කිරීම පුහුණු වැඩමුළුවලින් අපේක්ෂිත ප්‍රතිඵල නො ලැබීමට හේතු වී ඇත. ඇතැම් සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් පෙන්වා දුන් පරිදි ශ්‍රී ලංකා පරිපාලන අභ්‍යාස ආයතනයේ මූලික පුහුණු පාඨමාලාවේ දී ඉඩම් විෂයය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන නමුත් එය එතරම් ප්‍රයෝජනවත් නො වන්නේ එයට ඉඩම් සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණුව ඇතුළත් නො වන බැවිණි.

වගුව 4.6: ඉඩම් විෂයය සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා ඇති නිලධාරීන්

නිලධාරී කාණ්ඩය	පුහුණුවීම් ලබා ඇති සංඛ්‍යාව	අදාළ කාණ්ඩයේ නිලධාරීන්ගෙන් ප්‍රතිශතය (%)
ග්‍රාම නිලධාරී (සංඛ්‍යා=143)	137	96
ජනපද නිලධාරී (සංඛ්‍යාව=12)	11	92
කළමනාකරණ/සංවර්ධන සහකාර (සංඛ්‍යාව=24)	21	87
ස.ප්‍රා.ලේ (සංඛ්‍යාව=05)	5	100
එකතුව	175	95

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

4.4.1 නව නීති සංශෝධන පිළිබඳ දැනුවත් වීමේ මාර්ග

කාර්යක්ෂම සේවාවක් සැපයීමේ දී නිලධාරීන් අදාළ නීති රීති පිළිබඳ මනාව දැනුවත් ව සිටීම වැදගත් වන අතර මූලික නීති රීති පිළිබඳ දැනුවත්භාවය පුහුණු වැඩමුළු තුළින් ලබා දේ. කලින් කලට සිදුවන නීති සංශෝධන සහ චක්‍රලේඛ නියෝග සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම

අදාළ ආයතන ප්‍රධානියා වෙත පැවරෙන වගකීමකි. අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි මාර්ගයෙන් තොරතුරු ලබාදුන් නිලධාරීන් 185න් 72.4% (134)ක් කාලීන නීති සංශෝධන සහ චක්‍රලේඛ සම්බන්ධයෙන් දැනුවත් වන්නේ මාසික කොට්ඨාස දින රැස්වීමේ දී බව ප්‍රකාශ කෙරිණි. විශේෂයෙන් ම, මහවැලි බල ප්‍රදේශ හැර අනෙක් ප්‍රදේශවල ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් ග්‍රාමීය මට්ටමේ මූලික වගකීම දරන ග්‍රාම නිලධාරීන්ගෙන් 90.2% (129)ක් ප්‍රකාශ කරනු ලැබුවේ තමන්ගේ මූලික දැනුවත්වීමේ මාර්ගය කොට්ඨාස දින රැස්වීමේ දී චක්‍රලේඛ සම්බන්ධයෙන් කෙරෙන දැනුවත් වීම බවයි. කෙසේ වුව ද, මෙම දැනුවත් කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් එතරම් මනාපයක් නො දැක් වූ අතර බොහෝ නිලධාරීන් ප්‍රකාශ කළේ එය "කියවන විට ලිවීමක්" වන හෙයින් මතකයේ රඳවා ගැනීම අපහසු වන බවයි. එම නිසා ඉඩම් නීතියේ නව සංශෝධන, චක්‍රලේඛ පිළිබඳ ආයතන ප්‍රධානීන් විසින් අදාළ නිලධාරීන් දැනුවත් කළ ද, එය සාර්ථක ක්‍රමයක් නො වන අතර එහි අවසාන ප්‍රතිඵලය වන්නේ සේවාලාභීන්ට තම කාර්යයන් වෙනුවෙන් අනවශ්‍ය පරිදි කාලය හා ශ්‍රමය වැය කිරීමට සිදුවීමය.

ඉහත තත්ත්වය මඟහරවා ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ යෝජනාව වූයේ අදාළ චක්‍රලේඛ සහ පනත් සංශෝධන තමන් වෙත මුද්‍රිත ව ලබාදීමෙන් වැඩි ප්‍රයෝජනයක් අත්වන බවයි. කෙසේ වුව ද, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් මේ සම්බන්ධයෙන් විමසූ විට පෙන්වා දෙනු ලැබුවේ ඒ ආකාරයෙන් චක්‍රලේඛ ජායා පිටපත් කර ලබාදීමට සිදු වුවහොත් ඒ සඳහා විශාල අමතර මුදලක් දැරීම සිදුවන බවත,' පවතින මූල්‍ය ප්‍රතිපාදන යටතේ එය සිදු කිරීමට අපහසු බවත් ය. කෙසේ වුව ද, නිලධාරීන්ගෙන් 37.8% (70)ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් චක්‍රලේඛ පිටපත් ලබාදීම, ප්‍රාදේශීය ලේකම් විසින් එම කරුණු සම්බන්ධයෙන් ලිඛිතව දැනුවත් කිරීම හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සංයුක්ත තැටිවල අන්තර්ගත කොට ලබාදීම යන මාර්ගවලින් නව නීති සහ චක්‍රලේඛ සම්බන්ධයෙන් දැනුවත් වන බව හෙළි කෙරිණි. විද්‍යුත් මාධ්‍යයෙන් (සංයුක්ත තැටි මඟින්) නිලධාරීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැකිය හැකි වූ අතර එහි අවශ්‍ය නිලධාරියෙකුට ඉඩම් සම්බන්ධයෙන් 1991 සිට 2009 දක්වා වූ චක්‍රලේඛවල ගොනුවක් විද්‍යුත් මාධ්‍යයෙන් ලබාගැනීමේ හැකියාව අධ්‍යයනය සිදු කරන කාල සීමාව තුළ පැවතිණි.

හිටපු සහකාර ප්‍රාදේශීය ලේකම්වරයාගේ මැදිහත් වීම මත මෙම වැඩසටහන ක්‍රියාවට නංවා තිබූ අතර සී.ඩී. පටියකට ඇතුළත් කොට බෑහැර ගෙනයාමට මෙන් ම අවශ්‍ය අවස්ථාවක කාර්යාලයීය පරිඝනකයෙන් අදාළ චක්‍රලේඛ පරිහරණය කිරීමේ අවස්ථාව ද නිලධාරීන්ට ලබා දී තිබූ නමුත් ක්ෂේත්‍රයේ කටයුතු කිරීමේ දී චක්‍රලේඛ සහ අණ පනත් සම්බන්ධයෙන් විශේෂ දැනුවත්වීමක් අවශ්‍ය ග්‍රාම නිලධාරීන්ට බොහෝ විට, පෞද්ගලික පරිඝනක නො තිබීමත්, තාක්ෂණය කෙරෙහි ඔවුන්ගේ පවතින අල්ප උනන්දුවත් නිසා එයින් ප්‍රයෝජන ගන්නා සංඛ්‍යාව ඉතා ම අල්ප බව නිලධාරීන් සමඟ කළ සාකච්ඡාවේ දී අනාවරණය විය.

පුහුණු වැඩසටහන් සහ ඉඩම් කවයේ රැස්වීම් ඉඩම් නීති සංශෝධන හා චක්‍රලේඛ සම්බන්ධයෙන් දැනුවත්වීමේ තෙ වැනි ප්‍රධාන මාර්ගය වන අතර සමස්ත නිලධාරීන්ගෙන් 27%ක් මෙම කාණ්ඩයට අයත් වූ අතර ග්‍රාම නිලධාරීන්ගෙන් 31%ක්, ජනපද නිලධාරීන්ගෙන් 33%ක් සහ කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්/වරියන්ගෙන් 25%ක් ද, මෙම කාණ්ඩයටත් ඇතුළත් වූහ. අන්තර්ජාලය මඟින් තමන් දැනුවත් වන බැව් පැවසූ 2% (නිලධාරීන් 4)ක් අතරින්

බහුතරය සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුර දරන්නෝ වූහ. ගැටලු පැන නැගුණු විට ඉහළ නිලධාරීන් විමසීමෙන් තමන් නීති සංශෝධන සම්බන්ධයෙන් දැනුවත් වන බව පැවසූ ප්‍රතිශතය 15% (නිලධාරීන් 28)කි. ග්‍රාම නිලධාරීන් දෙදෙනෙකු (1.4%) තමන් දැනුවත් වීමේ මාර්ගයක් වශයෙන් ජනමාධ්‍ය සඳහන් කර තිබිණි. ඇතැම් ග්‍රාම නිලධාරීන් අනාවරණය කළ අන්දමට දැව සම්බන්ධයෙන් නිකුත් වන චක්‍රලේඛ සම්බන්ධයෙන් ඔවුන් බොහෝ විට දැනුවත් වන්නේ ලී මෝල් හිමියන්ගෙනි. එයට හේතුව වශයෙන් ඔවුන් සඳහන් කළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ චක්‍රලේඛ ලැබීමේ දී ත්, ඒ සම්බන්ධයෙන් තමන් දැනුවත් වීමේදීත්, සිදුවන ප්‍රමාදයයි. අධ්‍යයනය සඳහා තොරතුරු ලබාදුන් මහවැලි කොට්ඨාස කළමනාකරු කාලීන නීතිරීති සම්බන්ධයෙන් දැනුවත් වීමේ මාර්ගය වශයෙන් කොට්ඨාස දින රැස්වීම හා නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයෙන් චක්‍රලේඛ පිටපත් ලබාදීම සඳහන් කරන ලදී.

වගුව 4.7: නව නීති පිළිබඳ නිලධාරීන්ගේ දැනුවත්වීමේ මාර්ග

දැනුවත්වීමේ මාර්ගය	ග්‍රාම නිලධාරී (සංඛ්‍යාව=143)	ජනපද නිලධාරී (සංඛ්‍යාව=12)	කළමනාකරණ/ සංවර්ධන සහකාර (සංඛ්‍යාව=24)	සහකාර ප්‍රාදේශීය ලේකම් (සංඛ්‍යාව=5)	එකතුව (සංඛ්‍යාව= 185)
කොට්ඨාස දින රැස්වීම	90.2	16.7	8.3	0.0	134
පුහුණු වැඩටසහන්/ඉඩම් කච්චේරි රැස්වීම්	31.5	33.3	16.7	0.0	53
බාහිර පොත්පත් මඟින්	7.7	33.3	25.0	40.0	23
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාදුන් චක්‍රලේඛ පිටපත්	28.0	75.0	79.2	20.0	70
අන්තර් ජාලය	0.7	0.0	0.0	60.0	04
ඉහළ නිලධාරීන්ගෙන් විමසීමෙන්	14.7	16.7	12.5	40.0	28
සමාන්තර නිලධාරීන්ගෙන් විමසීමෙන්	5.6	8.3	0.0	0.0	09
ජනමාධ්‍ය මඟින්	1.4	0.0	4.2	0.0	03
අමාත්‍යාංශයෙන්/පළාත් සභාවෙන් ලබා දීමෙන්	0.0	8.3	0.0	0.0	1

සටහන: එක ම නිලධාරියා විසින් යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව සියයට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

නීති සංශෝධන සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් වීමට ගත වන කාලය සති 1 සිට මාස 6 දක්වා පරාසයක විසිර පැතිරිණි. නිලධාරීන්ගෙන් 40% (74) මාස 1 තුළ ද, 19% (27) සති එකක් තුළ ද, 12% (22) මාස 1-3 තුළ ද, 3% මාස 3-6 තුළ ද, චක්‍රලේඛ සහ නීති සංශෝධන සම්බන්ධයෙන් දැනුවත් වන බව සඳහන් කළ අතර 9%ක් අවශ්‍ය විටෙක ආයතන ප්‍රධානීන් විසින් ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන බව ද, 2% බොහෝ කාලයක් ගත වන බව ද සඳහන් කර ඇත. ආයතන ප්‍රධානීන් විසින් නීති සංශෝධන සහ චක්‍රලේඛ සම්බන්ධයෙන් තමන් දැනුවත් නො කරන බව 2% (4) සඳහන් කළ අතර 4%ක් (8) ඒ සම්බන්ධයෙන් ගත වන කාලය කිව

නොහැකි බව සඳහන් කර ඇත. සතියකට අඩු කාලයක් තුළ තමන් ඒ සම්බන්ධයෙන් දැනුවත් වන බව 2% (4) විසින් සඳහන් කරනු ලැබිණි (ප්‍රස්තාර 4.3). ඉන් එක් නිලධාරියෙකු චක්‍රලේඛ නිකුත් වී දින 02ක් ඇතුළත තමන් ඒ සම්බන්ධයෙන් දැනුවත් වන බව සඳහන් කළ අතර ඔහු පෞද්ගලිකව අන්තර්ජාල පහසුකම් සපයා ගෙන ඇති ග්‍රාම නිලධාරිවරයෙකි.

ප්‍රස්තාර 4.3: නීති සංශෝධන සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත්වීමට ගත වන කාලය



මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

නිලධාරීන් වෙන් වෙන් කාණ්ඩ වශයෙන් ගත් කළ ග්‍රාම නිලධාරීන්ගෙන් 62.2% (89) ද, ජනපද නිලධාරීන්ගෙන් 33.3 (4) ද, සංවර්ධන/කළමනාකරණ සහකාරවරුන්ගෙන් 37.6% (9) ද, නීති සංශෝධන සම්බන්ධයෙන් දැනුවත්වීමට මාස 01 හෝ එයට වැඩි කාලයක් ගත වන බව පවසයි. මෙයට අමතර ව, ග්‍රාම නිලධාරීන්ගෙන් 18.2% (26) ද, ජනපද නිලධාරීන්ගෙන් 25% (3) සහ සංවර්ධන/කළමනාකරණ සහකාරවරුන්ගෙන් 8.2% (2) ද තමන් අදාළ නීති රීති සම්බන්ධයෙන් දැනුවත් වීමට ගත වන කාලය නිශ්චිතව කිව නො හැකි හෝ තමන් ඒ සම්බන්ධයෙන් දැනුවත් නො කරන බව සඳහන් කරන ඇත (වගු 4.8). දැනුවත්වීමට ගත වන කාලය කිව නො හැකි බව පැවසූ බහුතරයක් විෂයයට අදාළ චක්‍රලේඛයක් නිකුත් වූවා ද? යන්න නො දැන තමන්ට දැනුවත් වීමේ කාලය සම්බන්ධයෙන් පැවසිය නො හැකි බව පැවසූහ. මෙහි දී විශේෂයෙන් ම අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත වන නිලධාරීන් (ග්‍රාම නිලධාරීන් සහ ජනපද නිලධාරීන්) නීති සංශෝධන සම්බන්ධයෙන් දැනුවත් වීමට වැඩි කාලයක් ගත වන බවයි. සේවාලාභීන්ට ඉඩම් සම්බන්ධිත සේවාවන් සපයා ගැනීම සඳහා වැඩි කාලයක් හා ශ්‍රමයක් වැය කිරීමට මෙය ද එක් හේතුවක් වේ.

වගු 4.8: නීති සංශෝධන පිළිබඳ දැනුවත්වීමට ගත වන කාලය (නිලධාරී කාණ්ඩ අනුව)

ගත වන කාලය	නිලධාරීන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස			
	ග්‍රාම නිලධාරි (සංඛ්‍යාව=143)	ජනපද නිලධාරි (සංඛ්‍යාව=12)	කළමනාකරණ සංවර්ධන සහකාර (සංඛ්‍යාව=24)	සහකාර ප්‍රාදේශීය ලේකම් (සංඛ්‍යාව=5)
සති 1	10.5	16.7	37.5	80.0
සති 2	6.3	8.3	16.7	0.0
සති 3	2.8	16.7	0.0	0.0
මාස 1	46.8	25.0	16.7	0.0
මාස 1-3	12.6	0.0	16.7	0.0
මාස 3-6	2.8	8.3	4.2	0.0
කිව නො හැක	16.1	25.0	8.2	20.0
දැනුවත් නො කෙරේ	2.1	0.0	0.0	0.0
එකතුව	100.0	100.0	100.0	100.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය-2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

4.5 රාජකාරී ගැටලු නිරාකරණයේ දී ඉහළ නිලධාරීන්ගේ සහාය ලැබෙන ආකාරය

ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් ගැටලු මතු වූ අවස්ථාවල ඒවා නිරාකරණය කර ගැනීමට තම ඉහළ නිලධාරීන්ගෙන් සහාය ලැබෙන බව 97.3% (180) සඳහන් කළ අතර ග්‍රාම නිලධාරීන්ගෙන් 96.5% (138) සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 100% බැගින් එයට ඇතුළත් විණි. ගැටලු නිරාකරණයේ දී ඉහළ නිලධාරීන්ගේ සහාය ලැබෙන බව පැවසූ නිලධාරීන්ගෙන් 62% (112) අනාවරණය කරන අන්දමට එම සහාය ලැබෙන්නේ උපදෙස් ලබාදීම තුළිනි. මෙයට ග්‍රාම නිලධාරීන්ගෙන් 58% (80) ද, ජනපද නිලධාරීන්ගෙන් 75% (9) ද, කළමනාකරණ/ සංවර්ධන සහකාරවරුන්ගෙන් 79.2% (19)ද සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්ගෙන් 60% ද ඇතුළත් විණි.

තමන්ට ඉහළ නිලධාරීන්ගේ සහාය ලැබෙන බව පැවසූ නිලධාරීන්ගෙන් 19% (35)ක් සඳහන් කළ අන්දමට ගැටලු මතු වූ විට ඉහළ නිලධාරීන් ක්ෂේත්‍රයට ගොස් විමසා බලා අවශ්‍ය සහාය ලබා දෙයි. එයට ග්‍රාම නිලධාරීන්ගෙන් 23% (32)ක් ද, ජනපද නිලධාරීන්ගෙන් 17% (2)ක් ද, කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගෙන් 4% (1)ක් ද ඇතුළත් වූහ. තමන් මුහුණ දෙන

ගැටලු ඉදිරිපත් කළ විට ඒවා පිළිබඳ සාකච්ඡා කොට අවශ්‍ය තොරතුරු සහ තීරණ ලබාදීමෙන් ඉහළ නිලධාරීන් ගැටලු නිරාකරණයේ දී සහාය වන බවට නිලධාරීන්ගෙන් 33% (60) පැවසූහ. තමන්ට විසඳුම් ලබාදීමට අපහසු ගැටලුවලට කාර්යාල පරීක්ෂණවල දී හෝ කොට්ඨාස දින පැවැත්වීමෙන් විසඳුම් ලබාදීමට ඉහළ නිලධාරීන් ක්‍රියා කිරීමෙන් තමන්ට සහායක් ලබා දෙන බව නිලධාරීන්ගෙන් 11% (28)ක් සඳහන් කරන ලදී. නිලධාරීන්ගෙන් 6% (10)ක් පවසා සිටියේ යම් යම් අවස්ථාවල දී ක්ෂේත්‍ර ගැටලු විසඳා ගැනීමට උපදෙස් ලබා දීමෙන් හා පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීමෙන් ඉහළ නිලධාරීන් සහයෝගය දැක් වුව ද, ඉඩම් අංශයට ලැබෙන සේවා ඉල්ලීම්වල සංකීර්ණ ස්වභාවයත්, ඉහළ නිලධාරීන්ට විශේෂයෙන් ම ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම්ට තම ප්‍රදේශය තුළ විශාල වගකීම් සම්භාරයකි පැවරීම, අති විශාල ඉල්ලීම් ප්‍රමාණයක් ලැබීමත් නිසා තම ඉල්ලීම් යටපත් වීමක් සිදුවන බව යි. එම නිසා, නැවත වරින් වර එය සිහි කැඳවීමට සිදුවන බවත්, එම නිසා ගැටලු විසඳීමට ලැබෙන සහාය ඵලදායක අන්දමේ සහායක් නො වන බවත් ය. තමන්ට රාජකාරිමය ගැටලු පැන නැඟුණු විට ඒවා නිරාකරණයට ඉහළ නිලධාරීන්ගේ සහාය ලැබෙන බව නිලධාරීන්ගෙන් අති බහුතරය ප්‍රකාශ කළ ද ආයතන රාශියක් මැදිහත් වී ලබා දෙන සේවාවල දී අනෙකුත් ආයතන සම්බන්ධීකරණයට ඉහළ නිලධාරීන්ගේ මැදිහත්වීමක් සිදුවන්නේ අවම වශයෙනි. ගැටලු නිරාකරණය සඳහා ඉහළ නිලධාරීන්ගේ සහාය තමන්ට ලැබෙන බව ප්‍රකාශ කළ නිලධාරීන්ගෙන් 8% (15)ක් පමණක් අනෙකුත් ආයතන සම්බන්ධීකරණයේ දී ඉහළ නිලධාරීන්ගේ සහාය ලැබෙන බව පැවසීමෙන් එය තහවුරු වේ.

ඉඩම් රාජකාරිවල දී මතුවන ගැටලු විසඳා ගැනීමට ඉහළ නිලධාරීන්ගෙන් සහාය නො ලැබෙන බව ප්‍රකාශ කළ සියළු දෙනා ම (2.7%) ග්‍රාම නිලධාරීන් වූ අතර ඔවුන් ඒ සඳහා හේතු කිහිපයක් සඳහන් කර තිබුණි. ඉහළ නිලධාරීන්ගේ පවතින අකාර්යක්ෂමතාව, ඔවුන් රාජකාරී බහුල වීම නිසා ඉඩම් විෂයය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට ප්‍රමාණවත් කාලයක් නො තිබීම, දේශපාලන හෝ වෙනත් බලපෑම් නිසා ඔවුන්ට නිහඬ වීමට සිදු වීම, ඇතැම් අවස්ථාවල දී නීතියට අනුව සිදු කළ යුතු දෙයක් වුවත් ඉහළ නිලධාරීන් විසින් ම එය ඉටු නො කරන ලෙස දැන්වීම, ඇතැම් අවස්ථාවල දී ඉහළ නිලධාරීන් විසින් ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට ඇහුම්කන් නො දී තනි තීරණ ගැනීම සහ අදාළ අනෙකුත් ආයතනවල සහාය නො ලැබීම හෝ එය ලබාදීමට මැදිහත් නො වීම ආදිය එයට ඇතුළත් වී තිබිණි.

ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් ගැටලු මතු වූ විට අදාළ නිලධාරීන් සමඟ එම ගැටලු සාකච්ඡා කිරීමට තමන්ට අවස්ථාව හිමිවන බව නිලධාරීන්ගෙන් 22% (184)ක් සඳහන් කරනු ලැබිණි. කෙසේ වුව ද, හමුවීමට සිදුවන නිලධාරීන් අනුව, ඔවුන් හමුවීමට පවතින ඉඩ ප්‍රස්ථා පිළිබඳ වෙනසක් පවතී.

ග්‍රාම නිලධාරීන්ගෙන් 59% (84)ක් තමන්ට ඕනෑ ම අවස්ථාවක ජනපද/ඉඩම් නිලධාරී දුරකතනයෙන් හෝ සම්බන්ධ කර ගනිමින් උපදෙස් ලබාගැනීමට හෝ සාකච්ඡා කිරීමට අවස්ථාව පවතින බව සඳහන් කළ අතර 32% (46)ක් සඳුදා, බදාදා යන මහජන දිනයන්හි දී පමණක් එම නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබෙන බව සඳහන් කර ඇත. ඉතිරි 9% (13) සඳහන් කරනු ලබන්නේ කොට්ඨාස දින, කෘෂිකර්ම කමිටු හෝ වෙනත් විශේෂ රැස්වීම් අවස්ථාවල දී පමණක් තමන්ට ජනපද/ඉඩම් නිලධාරී සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව සැලසෙන බවයි. ග්‍රාම නිලධාරීන්ගෙන් 78% (111)ක් පවසන පරිදි ඔවුන්ට ගැටලු මතු වූ ඕනෑ

ම අවස්ථාවක ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබේ. ග්‍රාම නිලධාරීන්ගෙන් 9% (13)ක් තමන්ට මහජන දිනයේ දී පමණක් ප්‍රාදේශීය ලේකම්/සහකාර ප්‍රාදේශීය ලේකම් සම්බන්ධ කර ගැනීමට අවස්ථාව ලැබෙන බවත්, 11% (16)ක් කොට්ඨාස දිනයේ දී හා වෙනත් රැස්වීම්වල දී තම ගැටලු සාකච්ඡා කිරීමට අවස්ථාව සැලසෙන බවත් සඳහන් කළ අතර 2% (3)ක් හමුවීම දුෂ්කර බව සඳහන් කරනු ලැබිණි.

ඉඩම් රාජකාරී සම්බන්ධ ගැටලුවල දී අතිරේක දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් හෝ පළාත් ඉඩම් කොමසාරිස් සෘජුවම හමුවීමට අවශ්‍යතාවක් නො වන බව ග්‍රාම නිලධාරීන් සියල්ල ම පැවසූ අතර අවශ්‍ය වුවහොත් ඕනෑ ම අවස්ථාවක තමන්ට අතිරේක දිස්ත්‍රික් ලේකම් හමු වී සාකච්ඡා කිරීමට අවස්ථාව පවතින බව ග්‍රාම නිලධාරීන්ගෙන් 10% (15) ද, දිස්ත්‍රික් ලේකම් හමුවීමට හැකි බව ග්‍රාම නිලධාරීන්ගෙන් 5% (7) සඳහන් කළහ. එසේ ම, තම ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය වුවහොත් ඕනෑ ම අවස්ථාවක පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් මුණ ගැසීමට හැකි බව ග්‍රාම නිලධාරී 10% (14) ද, පළාත් ඉඩම් කොමසාරිස් සමග සාකච්ඡා කිරීමට හැකි බව ග්‍රාම නිලධාරීන්ගෙන් 8% (11) ද සඳහන් කළහ. අවශ්‍ය වූ ඕනෑ ම අවස්ථාවක තමන්ට පරිපාලන ග්‍රාම නිලධාරී සමග සාකච්ඡා කර උපදෙස් ලබා ගැනීමට හැකි බව ග්‍රාම නිලධාරීන්ගෙන් 59% (84) පැවසූ අතර 2% (3) පවසා සිටියේ තමන්ට ඒ සඳහා මෙතෙක් අවශ්‍යතාවක් මතු වී නොමැති බවයි. අනෙක් පිරිස මහජන දිනයේ දී හෝ වෙනත් රැස්වීම් පැවැත්වෙන දිනයන්හි දී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට හැකි බව සඳහන් කළ හ.

ජනපද නිලධාරීන්ගෙන් 92%ක් තමන්ට ගැටලු පැන නැගුණු ඕනෑ ම අවස්ථාවක ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් සමග ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට හැකි බව සඳහන් කළ අතර 33% (4)ක් ගැටලු මතුවන ඕනෑ ම අවස්ථාවක ඒ ආකාරයෙන් අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් සමග සාකච්ඡා කළ හැකි බව සඳහන් කළහ. එසේ ම, ජනපද නිලධාරීන්ගෙන් 50% (6)ක් සඳහන් කරනු ලැබුවේ අතිරේක දිස්ත්‍රික් ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් මුණ ගැසීම සඳහා අවශ්‍යතාවක් මතුව නොමැති බවයි. ජනපද නිලධාරීන්ගෙන් 58% (7)ක් තමන්ට ගැටලු පැන නැගුණු ඕනෑ ම අවස්ථාවක නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් සමග සාකච්ඡා කිරීමට අවස්ථාව හිමිවන බව පැවසූ අතර 8% (1)ක් මෙතෙක් තමන්ට එවැනි අවශ්‍යතාවක් මතු වී නොමැති බවත්, 16% (2)ක් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට අවස්ථාව හිමිවන බවත් සඳහන් කළහ.

ජනපද නිලධාරීන්ගෙන් 50% (6)ක් තමන්ට පැන නගින ගැටලු සම්බන්ධයෙන් ඕනෑ ම අවස්ථාවක දී පළාත් ඉඩම් කොමසාරිස් සමග සාකච්ඡා කිරීමට හැකි බව ප්‍රකාශ කළ අතර 16% (2)ක් එවැනි අවශ්‍යතාවක් මතුව නොමැති බවත් 16% (2)ක් මහජන දිනයන් හි දී සහ වෙනත් රැස්වීම් අවස්ථාවල ඒ සඳහා අවස්ථාව හිමිවන බවත් ප්‍රකාශ කළ හ. එම නිලධාරීන්ගෙන් 8% (1) තමන්ට නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් හෝ පළාත් ඉඩම් කොමසාරිස් හමු වී තම ගැටලු සාකච්ඡා කිරීමට අවස්ථාව නො ලැබෙන බව සඳහන් කළහ.

ඉඩම් රාජකාරි සම්බන්ධයෙන් ගැටලු පැන නැගුණු ඕනෑ ම අවස්ථාවක තමන්ට ජනපද/ඉඩම් නිලධාරී සමග සාකච්ඡා කිරීමට අවස්ථාව හිමිවන බව කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගෙන් 58% (14)ක් ප්‍රකාශ කරන ලද අතර ඔවුන් සමග සාකච්ඡා කිරීම තමන්ට අදාළ නො වන බව 8% (2)ක් සඳහන් කළ හ. එමෙන් ම, තවත් 8% (2)ක් සඳහන් කරනු ලැබුවේ මහජන දිනයන්හිදී පමණක් තමන්ට ජනපද/ඉඩම් නිලධාරී හමුවී සාකච්ඡා කිරීමට අවස්ථාව සැලසෙන බවයි. මෙම නිලධාරීන්ගෙන් 87% (21)ක් තමන්ට ගැටලු මතු වූ ඕනෑ ම අවස්ථාවක සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් හමු වී ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි බව පැවසූ අතර 8% (2)ක් මහජන දිනයන් හි දී ද 4% (1)ක් රැස්වීම් අවස්ථාවන් හි දී තමන්ට එම නිලධාරීන් සමඟ සාකච්ඡා කළ හැකි බව සඳහන් කෙරිණි. කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගෙන් 25% (6)ක් සහ 29% (7)ක් පිළිවෙලින් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් සහ පළාත් ඉඩම් කොමසාරිස් සමඟ අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක රාජකාරි ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කළ හැකි බව සඳහන් කළ අතර ඉතිරි පිරිස තමන්ට එවැනි අවශ්‍යතාවක් පැන නැගී නොමැති බව සඳහන් කරන ලදී.

සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 80% (4)ක් ඉඩම් රාජකාරි සම්බන්ධයෙන් තමන්ට ගැටලු පැන නැගුණු විට ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්, නියෝජ්‍ය දිස්ත්‍රික් ලේකම් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබෙන බව ප්‍රකාශ කළ අතර 20% (1)ක් එවැනි අවශ්‍යතාවක් පැන නැගී නොමැති බව සඳහන් කරන ලදී. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 100%ම රාජකාරි ගැටලු සම්බන්ධයෙන් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් සහ පළාත් ඉඩම් කොමසාරිස් සමඟ ඕනෑ ම අවස්ථාවක සාකච්ඡා කිරීමට හැකියාව පවතින බව ප්‍රකාශ කළ හ.

4.6 සේවා පහසුකම් පිළිබඳ නිලධාරීන්ගේ ඇගයීම සහ ඔවුන් මුහුණ දෙන ගැටලු

4.6.1 ග්‍රාම නිලධාරීන්ගේ ඇගයීම

ග්‍රාම නිලධාරීන්ගෙන් 39% (57)ක් තම කාර්යාලයීය පහසුකම් සම්බන්ධයෙන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බවත්, 31.5% (46)ක් එම පහසුකම් මධ්‍යස්ථ මට්ටමේ පවතින බවත් පැවසූ හ. ග්‍රාම නිලධාරීන්ගෙන් 29.5% (43)ක් තම කාර්යාලීය පහසුකම් සම්බන්ධයෙන් අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් බව පවසන ලදී. කාර්යාලයීය පහසුකම් සම්බන්ධයෙන් අතෘප්තිමත් බව පැවසූ නිලධාරීන් එයට හේතු වශයෙන් කාර්යාලය පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යෑමට සිදුව ඇති බවත්, ඇතැම් වසම්වල ඒ සඳහා යෝග්‍ය ස්ථානයක් සොයා ගැනීමේ අපහසුව, රජයෙන් ගෙවන දීමනාව ප්‍රමාණවත් නොවීම, පෞද්ගලික ස්ථානයක සේවා ස්ථානය පවත්වාගෙන යාමේ දී රාජකාරි කටයුතු නිදහසේ සහ ස්වාධීනව කරගෙන යාමේ අපහසුව ආදිය සඳහන් කළ අතර එයට පිළියමක් වශයෙන් සේවා පියසක අවශ්‍යතාව පවතින බව සඳහන් කෙරිණි. රජයේ හෝ අන්තර්ජාතික සංවිධානවල මැදිහත් වීමෙන් තම වසමට අදාළ සේවා පියස පිහිටුවා ඇති බව ග්‍රාම නිලධාරීන්ගෙන් 15% (22)ක් ප්‍රකාශ කළ අතර නිලධාරීන්ගෙන් 8% (11)ක් තමන්ට සපයා ඇති කාර්යාලයීය උපකරණ සම්බන්ධයෙන් තෘප්තිමත් නො වන බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති පාවිච්චියට ගැනීමට අපහසු, අබලන් උපකරණ තමන්ට ලබා දී ඇති බවත් පැවසූ හ.

තමන්ට සැපයෙන ලිපි ද්‍රව්‍ය ප්‍රමාණය සහ එහි ගුණාත්මක තත්ත්වය පිළිබඳ ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව ග්‍රාම නිලධාරීන්ගෙන් 61% (9) පැවසූ අතර එය මධ්‍යස්ථ මට්ටමේ පවතින බව ග්‍රාම නිලධාරීන්ගෙන් 20% (29)ක් ද, 17% (25)ක් ඉතා අතෘප්තිමත් හෝ අතෘප්තිමත් බව ද පැවසූ හ. තමන්ට සැපයෙන ලිපි ද්‍රව්‍ය සම්බන්ධයෙන් තෘප්තිමත් නො වන බව පැවසූ නිලධාරීන්ගෙන් 56% (14)ක් තමන්ට ලැබෙන ලිපි ද්‍රව්‍ය ප්‍රමාණවත් නො වන බවත්, 20% (5)ක් එම ලිපි ද්‍රව්‍ය ගුණාත්මක තත්ත්වයෙන් පහළ මට්ටමක පවතින බව ද ඉතිරි පිරිස තමන්ට නිසි වේලාවට එම ද්‍රව්‍ය නො ලැබෙන බව ද පැවසූ හ.

ඉඩම් රාජකාරි සඳහා අවශ්‍ය වන අවසාන ගම් සිතියම් ඇතුළු සිතියම් සහ මිණුම් රේඛා ලබාදීම සම්බන්ධයෙන් තමන් අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් බව ග්‍රාම නිලධාරීන්ගෙන් 66.4% (97)ක් පැවසූ අතර ඔවුන් අතුරින් බහුතරය ප්‍රකාශ කරනු ලැබුවේ තමන්ට එම සිතියම් ලැබී නොමැති බවයි. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් විමසූ විට ඔවුන් ප්‍රකාශ කරනු ලැබුවේ, කාර්යාලයීය ලේඛනාගාරයේ පවතින සිතියම් පරිහරණය කිරීමට එම නිලධාරීන්ට හැකියාව පවතින නමුත් ඔවුන් ඒ සඳහා යොමු නො වන බව යි. ග්‍රාම නිලධාරීන්ගෙන් 36% (49)ක් තමන්ට ඉඩම් රාජකාරි ඉටු කිරීම සඳහා අවසාන ගම් සිතියම් අවශ්‍ය බවත් 3.4% (5)ක් මිණුම් පට අවශ්‍ය බවත් ප්‍රකාශ කළ හ. 4% (6)ක් සිතියම් පරිහරණය සම්බන්ධයෙන් තමන්ට පුහුණුවක් අවශ්‍ය බව පැවසූ හ.

ග්‍රාම නිලධාරීන්ට පෞද්ගලික දුරකථන පහසුකම් සපයා නොමැති නමුත් මොබිටෙල් දුරකථන සමාගම විසින් රාජ්‍ය සේවකයින් සඳහා ලබා දී ඇති 'උපහාර' පැකේජය ඔවුන්ගෙන් අති බහුතරයක් පාවිච්චි කරන අතර ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 'ඩයලොග්' සමාගම විසින් ලබාදී ඇති කාර්යාල නිලධාරීන්ගේ ජාලය අතර භාවිතයේ දී, ගාස්තුවෙන් නිදහස් පැකේජය ද භාවිතා කරනු ලබයි. එසේ වුවත්, දුරකථන පහසුකම් සම්බන්ධයෙන් කිසිදු නිලධාරියෙකු ඉතා තෘප්තිමත් බව නො පැවසූ අතර 1.3 % (2)ක් පමණක් තෘප්තිමත් බවත් 0.7% (1)ක් මධ්‍යස්ථ බවත් පැවසූ හ. ඉතිරි සියලුදෙනා (95.6%) දුරකථන පහසුකම් සම්බන්ධයෙන් තමන් අතෘප්තිමත් බව පැවසූ හ (වගුව 4.9).

ග්‍රාම නිලධාරීන්ගෙන් 7% (10)ක් තම සේවාවන් කඩිනමින් ඉටු කිරීමටත්, නිවැරදි දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාමටත්, පරිඝනක පහසුකම් අවශ්‍ය බව පවසා සිටි අතර එසේ පැවසූවන්ගෙන් 60% (6) තමන්ට අන්තර්ජාල පහසුකම් සහිතව එම පහසුකම් තිබිය යුතු බවත්, එසේ වුවහොත් සුළු කරුණක් උදෙසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් වැයකරන කාලය, ශ්‍රමය සහ මුදල් අපතේ යාම වළක්වා ගැනීමත්, කඩිනමින් සේවාව ඉටුකර දීමටත් හැකියාව පවතින බවත් සඳහන් කරනු ලැබී ය. මෙම නිලධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් සහන පදනමක් මත එම උපකරණ ලබාගැනීමට කැමැත්තෙන් පසුවෙති.

නිලධාරීන්ගෙන් 54.3% (79)ක් තම ලිපිලේඛන ගබඩා කර තැබීමට සහ ආරක්ෂා කර ගැනීමට සපයා ඇති වානේ අල්මාරි සම්බන්ධයෙන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව පැවසූ අතර 25.3% (37)ක් මධ්‍යස්ථ බව පැවසූ හ. ඉතිරි පිරිස (20.4%) එම උපකරණ සම්බන්ධයෙන් ඉතා අතෘප්තිමත් හෝ අතෘප්තිමත් බව සඳහන් කළ අතර එයට හේතු වශයෙන් දැනට ඔවුන් සතුව පවතින වානේ අල්මාරි පාවිච්චියට ගත නො හැකි අන්දමින් අබලන් ව පැවතීම (60%),

ප්‍රමාණවත් නො වීම (20%) සහ මෙතෙක් සපයා නො තිබීම (20%) සඳහන් කරන ලද මූලික කරුණු විය.

ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ග්‍රාම නිලධාරීන්ගෙන් 83.6% (132)ක් ඉතා අතෘප්තිමත් හෝ අතෘප්තිමත් බව ප්‍රකාශ කළ අතර ඔවුන්ගෙන් 6% (8)ක් ප්‍රකාශ කරනු ලැබුවේ තම වසම්වල රාජකාරි කටයුතු සඳහා යාමට පොදු ප්‍රවාහන පහසුකම් හෝ නොමැති බව යි. හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තම්මැන්නාව වැනි ග්‍රාම නිලධාරී වසම් සම්බන්ධයෙන් සලකා බලන කළ මෙය සත්‍යයකි. තවත් 10% (13)ක් තීරු බදු රහිත සහන මිලකට යතුරු පැදි ලබා ගැනීමට වැඩපිළිවෙලක් සකස් කරන්නේ නම් යෝග්‍ය බව සඳහන් කළ හ. ග්‍රාම නිලධාරීන්ගෙන් 87.7% (128)ක් තම ප්‍රවාහන දීමනා සම්බන්ධයෙන් ඉතා අතෘප්තිමත් හෝ අතෘප්තිමත් වන අතර (වගුව 4.9) ඔවුන්ගෙන් 19% (25)ක් කිසියම් මුදලකින් ප්‍රවාහන දීමනාව වැඩිකළ යුතු බව පැවසූ හ. එම පිරිසෙන් 12.5% (16)ක් රුපියල් 500 දක්වා ද, 11.7% (15)ක් රුපියල් 1000 දක්වා ද, ඉන්ධන දීමනාව වැඩිකළ යුතු බවත්, 2.3% (3) මාසයකට ඉන්ධන ලීටර් 5ක් ලබා දිය යුතු බව ද සඳහන් කරන ලදී. තවත් 7% (9)ක් සඳහන් කරනු ලැබුවේ වසමේ විශාලත්වය සලකා බලා ඒ අනුව ඉන්ධන දීමනාව ලබා දිය යුතු බව යි.

වගුව 4.9: සේවා පහසුකම් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන්ගේ ඇගයීම

පහසුකම	ඉතා තෘප්තිමත්	තෘප්තිමත්	මධ්‍යස්ථ	අතෘප්තිමත්	ඉතා අතෘප්තිමත්	එකතුව
	සංඛ්‍යාව=143					
කාර්යාලයීය පහසුකම්	4.8	34.2	31.5	21.9	7.5	100.0
ලිපිද්‍රව්‍ය	3.4	57.5	19.9	16.4	0.7	100.0
සිතියම් සහ මිණුම් රේඛා	-	17.8	13.7	17.1	49.3	100.0
ප්‍රවාහන පහසුකම්						
වාහන	0.7	8.9	2.0	10.3	73.3	100.0
දීමනා	0.0	3.4	4.8	36.3	51.4	100.0
දුරකථන පහසුකම්	0.0	1.3	0.7	10.3	85.6	100.0
ලිපිලේඛන ගබඩා කිරීමේ/ ආරක්ෂා කිරීමේ පහසුකම්	1.3	53	25.3	13.7	5.5	100.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය.

4.6.2 ජනපද/ඉඩම් නිලධාරීන්ගේ ඇගයීම

තම කාර්යාලයීය පහසුකම් සම්බන්ධයෙන් තමන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව ජනපද නිලධාරීන්ගෙන් 75% (9)ක් ද, මධ්‍යස්ථ බව 8.3% (1) ද, සඳහන් කළ අතර ඒ සම්බන්ධයෙන් අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් බව සඳහන් කළ ප්‍රතිශතය 16.6% (2)කි. ඉඩම් අංශයේ

භාවිතය සඳහා ප්‍රමාණවත් තරම් පරිඝනක නොමැති බව මෙම නිලධාරීන්ගෙන් 16.7%ක් සඳහන් කළ අතර විශේෂයෙන් ම, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයට නිසි පරිදි ක්‍රියාත්මක කළ හැකි සිංහල යතුරු ලියන යන්ත්‍රයක් නොමැති වීම නිසා දීමනා පත්‍ර සකස් කිරීමේ කාර්යයන් ප්‍රමාදවන හෙයින් එම අවශ්‍යතාව කඩිනමින් ඉටු කළ යුතු බව සඳහන් කළ හ. තමන්ට සැපයෙන ලිපි ද්‍රව්‍ය සම්බන්ධයෙන් තමන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව ජනපද නිලධාරීන්ගෙන් අති බහුතරය ප්‍රකාශ කළ අතර 41.6%ක් රාජකාරි කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට පවතින සිතියම් සහ මිණුම් රේඛා සම්බන්ධයෙන් තමන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව පැවසූ හ. සුනාමි ව්‍යසනයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිතියම් සහ මිණුම් රේඛා විනාශ වී ඇති හෙයින් තවමත් ඒවා නිසි පරිදි සම්පූර්ණ කර ගැනීමට නොහැකි වී ඇති බවත්, එය තමන් සේවා පහසුකම් සම්බන්ධයෙන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් බවත් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා නියුතු ජනපද නිලධාරීහු පැවසූ හ.

වගුව 4.10: සේවා පහසුකම් සම්බන්ධයෙන් ජනපද නිලධාරීන්ගේ ඇගයීම

පහසුකම	ඉතා තෘප්තිමත්	තෘප්තිමත්	මධ්‍යස්ථ	අතෘප්තිමත්	ඉතා අතෘප්තිමත්	එකතුව
	සංඛ්‍යාව=12					
කාර්යාලයීය පහසුකම්	16.7	58.3	8.3	8.3	8.3	100.0
ලිපිද්‍රව්‍ය	16.7	66.6	0.0	16.7	0.0	100.0
සිතියම් සහ මිණුම් රේඛා	8.3	33.3	25.0	16.7	8.3	100.0
ප්‍රවාහන පහසුකම්						
වාහන	0.0	16.7	16.7	16.7	49.9	100.0
දීමනා	0.0	16.7	16.7	16.7	49.9	100.0
දුරකථන පහසුකම්	0.0	16.7	25.0	8.3	50.0	100.0
ලිපිලේඛන ගබඩා කිරීමේ/ ආරක්ෂා කිරීමේ පහසුකම්	0.0	58.3	33.3	8.4	0.0	100.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.ගො.ප.පු. ආයතනය.

ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් 67% අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් තත්ත්වයේ පසු වූ හ. ක්ෂේත්‍ර රාජකාරි සඳහා තමන්ට ගමන් කිරීමට සිදුවන දුර සමඟ සන්සන්දනය කර බැලීමේ දී තමන්ට ගෙවන ප්‍රවාහන දීමනාව ප්‍රමාණවත් නො වන බවත්, ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත වීම තමන්ගේ රාජකාරියේ ප්‍රධාන කාර්යයක් වන හෙයින් තමන්ට සහන පදනමකින් යතුරු පැදි ලබා දීමෙන් කාර්යය පහසු වන බවත්, ජනපද නිලධාරීන්ගෙන් බහුතරය (83.3%)ක් සඳහන් කළ හ. එමෙන් ම, තමන්ට කිසිදු වාහන පහසුකමක් සපයා නොමැති බවත් පොදු ප්‍රවාහන සේවාවන් භාවිතා කරමින් ක්ෂේත්‍රයට යාමේ දී ජනතාව තුළ තමන් සම්බන්ධයෙන් එතරම් පිළිගැනීමක් නො වන බවත් මෙම නිලධාරීන් පැවසූ අතර

විශේෂයෙන් ම වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඳු සහිත වසම්වල රාජකාරි කටයුතු ප්‍රමාදය සඳහා ප්‍රවාහන පහසුකම්වල පවතින අපහසුතාව ද හේතුවක් වන බව ප්‍රකාශ කෙරිණි.

4.6.3 කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගේ ඇගයීම

මෙම නිලධාරීන්ගෙන් 62.5% (15)ක් තම කාර්යාලයීය ඉඩ පහසුකම් සම්බන්ධයෙන් තෘප්තිමත් හෝ ඉතා තෘප්තිමත් බව සඳහන් කළ අතර 25% (6)ක් අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් බව පැවසූ හ. නිලධාරීන්ගෙන් 12.5% (3)ක් තමන්ට සපයා ඇති පරිඝනක පහසුකම් ප්‍රමාණවත් නො වන බව පවසන ලදී. නිලධාරීන්ගෙන් 37.5% (9)ක් සිතියම් සහ මිණුම් රේඛා සම්බන්ධයෙන් තමන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව පැවසූ අතර 41.7% (10)ක් ඉතා අතෘප්තිමත් හෝ අතෘප්තිමත් බව පැවසූ හ. විශේෂයෙන් 2001 වර්ෂයේ දී කටුවන සහ වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් වසම් එකතුකර පිහිටුවා ඇති වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රජයේ ඉඩම්වලට අදාළ සිතියම් සහ අනෙකුත් ලේඛන තවමත් නිසි පරිදි ලැබී නොමැති අතර අවශ්‍ය අවස්ථාවල දී එම ග්‍රාම නිලධාරී වසම් පෙර අයත්ව තිබූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඒවා ලබා ගැනීමට සිදු වේ. එම නිසා එහි දී යම් යම් අපහසුතාවන්ට සහ කාල පමාවන්ට මුහුණ දීමට සිදු වේ. නිලධාරීන්ගෙන් 32.5% (8)ක් ලිපිලේඛන ගබඩා කිරීමේ සහ ආරක්ෂා කිරීමේ පහසුකම් සම්බන්ධයෙන් අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් බව පැවසූ අතර ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාතේ අල්මාරි අගුළු ක්‍රියාවිරහිත වීම නිසා මීයන් වැනි සතුන්ගෙන් ලිපි ලේඛනවලට හානි සිදුවන බව ද අනාවරණය විය.

වගුව 4.11: සේවා පහසුකම් සම්බන්ධයෙන් කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගේ ඇගයීම

පහසුකම	ඉතා තෘප්තිමත්	තෘප්තිමත්	මධ්‍යස්ථ	අතෘප්තිමත්	ඉතා අතෘප්තිමත්	එකතුව
	සංඛ්‍යාව=24					
කාර්යාලයීය පහසුකම් (සංඛ්‍යා=24)	12.5	50.0	12.5	20.8	4.2	100.0
ලිපිද්‍රව්‍ය	4.2	66.7	8.4	20.8	0.0	100.0
සිතියම් සහ මිණුම් රේඛා	4.2	33.3	20.8	25.0	16.7	100.0
ප්‍රවාහන පහසුකම්						
වාහන	0.0	4.2	20.8	12.5	62.5	100.0
දීමනා	0.0	8.4	8.4	16.7	62.5	100.0
දුරකථන පහසුකම්	0.0	37.5	16.7	16.7	29.2	100.0
ලිපිලේඛන ගබඩා කිරීමේ/ ආරක්ෂා කිරීමේ පහසුකම්	0.0	50.0	16.7	25.0	8.4	100.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය.

4.6.4 සේවා පහසුකම් සම්බන්ධයෙන් සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඇගයීම

අධ්‍යයනයට ලක් කරන ලද සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 80% (4)ක් තම කාර්යාලයීය පහසුකම් සම්බන්ධයෙන් ඉතා තෘප්තිමත් හෝ තෘප්තිමත් බව පැවසූ අතර 60% (3) ලිපි ද්‍රව්‍ය සම්බන්ධයෙන් තෘප්තිමත් බව පැවසූ හ. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 20%ක් පමණක් ලිපිද්‍රව්‍ය ප්‍රමාණවත් නො වන බව සඳහන් කරන ලදී. මෙම නිලධාරීන්ගෙන් 60%ක් සිතියම් සහ මිණුම් රේඛා සම්බන්ධයෙන් පැවසුවේ මධ්‍යස්ථ තත්ත්වයක පවතින බව යි. ඉතිරි පිරිස එය තෘප්තිමත් මට්ටමක පවතින බව සඳහන් කළ හ. එමෙන් ම, නිලධාරීන්ගෙන් 60%ක් වාහන සහ ප්‍රවාහන දීමනා සම්බන්ධයෙන් තෘප්තිමත් බව පැවසූ අතර 20%ක් බැගින් මධ්‍යස්ථ සහ අතෘප්තිමත් බව සඳහන් කළ හ. ඉඩම් අංශයේ ලිපි ලේඛන ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වන පහසුකම් සම්බන්ධයෙන් තමන් තෘප්තිමත් බව නිලධාරීන්ගෙන් 20%ද, මධ්‍යස්ථ බව තවත් 20% ද පැවසූ අතර ඉතිරි පිරිස එය දුර්වල මට්ටමක පවතින බව පැවසූ හ.

4.6.5 නිලධාරීන් මුහුණ දෙන වෙනත් ගැටලු

තම රාජකාරි නිසි පරිදි ඉටු කිරීමේ දී එක් පාර්ශවයක් අමනාපයට පත්වීම, ආරවුල්වලට පැටලීමට සිදුවීම, ඇතැම් අවස්ථාවල දී ජනතාව නීති ගරුක නො වීම නිසා රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමට බාධා එල්ල කිරීම ආදී ගැටලුවලට මුහුණ දෙන බව සමස්ත නිලධාරීන්ගෙන් 29.2% (54)ක් පැවසූ අතර එයට ග්‍රාම නිලධාරීන්ගෙන් 29% (42)ක් ද, ජනපද නිලධාරීන්ගෙන් 25% (3) ද, කළමනාකරණ සංවර්ධන සහකාරවරුන්ගෙන් 29% (7) ද, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 40% (2) ද ඇතුළත් වූහ. ඉඩම් සම්බන්ධ සේවා සැපයීමට අදාළ වෙනත් ආයතන විසින් තම කාර්යයන් නිසි පරිදි ඉටු නො කිරීමත්, ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නො වීමත් නිසා තම සේවාවන් සැපයීම ප්‍රමාද වන බව ග්‍රාම නිලධාරීන්ගෙන් 13% (19)ක් ද, ජනපද නිලධාරීන්ගෙන් 17% (2)ක් ද, කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගෙන් 8.3% (2)ක් ද, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 40% (2)ක් ද, සඳහන් කළ හ.

දැනට පවතින නීතිය වර්තමාන සමාජයට ගැලපෙන පරිදි යාවත්කාලීන නො වීම නිසා විශේෂයෙන් ම තුන්වැනි උප ලේඛනයේ අඩු දුහුඩුකම් නිසා තමන් අපහසුතාවට පත්වන බව ග්‍රාම නිලධාරීන්ගෙන් 10% (15)ක් ද, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 20%ක් ද, සඳහන් කළ අතර කාලානුරූපීව එම නීති සංශෝධනය විය යුතු බව පැවසූ හ. එමෙන් ම, ග්‍රාම නිලධාරීන්ගෙන් 14% (20)ක් පැවසූ පරිදි ජනතාව තම කටයුතු ඉටු කර ගැනීමේ දී අනවශ්‍ය ආකාරයෙන් දේශපාලනඥයින් ඒ සඳහා මැදිහත් කර ගැනීමට උත්සාහ දැරීම නිසා නිලධාරීහු අපහසුතාවට පත් වෙති .

ග්‍රාම නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යොමු කරන ඉල්ලීම් ඉටු වූවා ද? නැද්ද? යන්න සම්බන්ධයෙන් දැන ගැනීමට ක්‍රමවේදයක් සකසා නො තිබීම නිසා බොහෝ විට ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු යාවත්කාලීනවීමක් නො වන බව ග්‍රාම නිලධාරීන්ගේ 4% (6)ක් පැවසූ අතර විශේෂයෙන් ම නොතාරිස් ඔප්පු මගින් ඉඩම් පැවරීමේ දී, මූල්‍ය ආයතන වෙත උකස්

කිරීමේ දී සහ පසු අයිතිය පැවරීම් ආදිය කිරීමේ දී තොරතුරු යාවත්කාලීන නො වීම නිසා ගැටලු මතුවන බව සඳහන් කෙරිණි. තමන්ට ඉහළ නිලධාරීන් විසින් ගනු ලබන තීන්දු තීරණ විනිවිදභාවයකින් තොර වීම නිසාත්, දැන හැඳුනුම්කම් සහිත හෝ වෙනත් ක්‍රමවලින් නිලධාරීන්ට බලපෑම් කිරීමට සමත් සේවාලාභීන්ගේ කටයුතු ඉක්මණින් ඉටු කරමින් සමාජ, දේශපාලන සහ ආර්ථිකමය වශයෙන් බල රහිත සේවාලාභීන්ගේ කටයුතු ප්‍රමාද වෙමින්, යටපත්වීම නිසාත් තමන් ක්ෂේත්‍රයේ දී දුෂ්කරතාවන්ට මුහුණ දෙන බව නිලධාරීන්ගෙන් 11% (16)ක් සඳහන් කළ අතර අධ්‍යයනයට ලක් කළ සේවාලාභීන් විසින් ද ආයතනවල කටයුතු විනිවිද භාවයකින් තොර බවටත්, නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව නිසා තමන් බොහෝ ගැටලුවලට මුහුණ දෙන බවත් සඳහන් කරනු ලැබිණි.

ග්‍රාම නිලධාරීන්ගෙන් 76% (111)ක් සහ ජනපද නිලධාරීන්ගෙන් 25% (3)ක් තම ස්ථාන මාරුවීමකදී අනුප්‍රාප්තිකයා වෙත රක්ෂිත සහ වෙනත් පොදු ස්ථානවල මායිම් ප්‍රායෝගිකව පෙන්වා දීම සිදු කරන බව පැවසූ නමුත් නිලධාරීන් සමඟ දීර්ඝව සාකච්ඡා කිරීමේ දී පැහැදිලි වූයේ සත්‍ය වශයෙන් ම එසේ පෙන්වා දීමේ අවස්ථා විරල බව යි. බොහෝ දුරට කාර්යාලයීය ලිපි ලේඛන භාරදීම සිදුවන අතර ග්‍රාමීය නායකයින් කිහිප දෙනෙකු හඳුන්වා දීමෙන් පසුව තම වගකීමෙන් නිදහස් වන බව පැහැදිලි වූ අතර රජයේ ඉඩම් නැවත නැවත මැණීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් වීමට ද රක්ෂිත සම්බන්ධයෙන් ගැටලු මතුවීමට ද මෙය ප්‍රධාන හේතුවක් වේ. තමන් විසින් සේවා ඉල්ලීම් සම්බන්ධයෙන් අදාළ ලිපි ගොනු නඩත්තු කරන බවට ග්‍රාම නිලධාරීන්ගෙන් 85% (124) සඳහන් කළ නමුත් එක් එක් ගැටලුවට අදාළව එසේ ලිපිගොනු නඩත්තු කිරීමක් සිදු නො වන බව ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී නිරීක්ෂණය විය. ඒ වෙනුවට ග්‍රාම නිලධාරීන් බොහෝ විට සිදු කරනු ලබන්නේ තම රාජකාරි දිනපොතෙ හි තමන්ට ඉදිරිපත් වන ගැටලු සම්බන්ධයෙන් සටහනක් තැබීම ය. ඉඩම් රාජකාරි සම්බන්ධයෙන් මුහුණ දීමට සිදු වන ප්‍රමාදයන්, සංකීර්ණතාවන් සහ අක්‍රමිකතාවන් සඳහා රජයේ ඉඩම් සහ රජයේ ඉඩම්ලාභීන් සම්බන්ධයෙන් නිසි පරිදි දත්ත සහ තොරතුරු යාවත්කාලීන නො වීම බොහෝ දුරට බලපා තිබේ.

4.7 සාරාංශය

සමස්තයක් වශයෙන් ගත් කළ නිලධාරීන්ගෙන් 85% පමණ තමන් සපයන සේවාව සම්බන්ධයෙන් තෘප්තිමත් හෝ ඉතා තෘප්තිමත් බව පැවසූ අතර තමන්ට සැපයෙන සේවාව සාමාන්‍ය මට්ටමක පවතින බව සේවාලාභීන්ගෙන් 50.6%ක් සඳහන් කරනු ලැබිණි. කෙසේ වූව ද, තමන්ට සැපයෙන සේවාව සතුටුදායක හෝ ඉතා සතුටුදායක බව පැවසූ සේවාලාභීන් ප්‍රතිශතය 4.1% තරම් අඩු මට්ටමක පැවතිණි. ආයතන වෙන් වෙන් වශයෙන් ගත් කළ මහවැලි සංවර්ධන අධිකාරියේ සේවා සැපයීම සම්බන්ධයෙන් සේවාලාභීන් 53.6%ක් එය දුර්වල හෝ ඉතා දුර්වල මට්ටමක පවතින බව පැවසූ අතර මයුරපුර මහවැලි කොට්ඨාසයේ ව්‍යාපෘති ආරම්භයේ පටන් පවතින ගැටලු එයට මූලික ම හේතු වේ.

නිලධාරී කාණ්ඩ වෙන් වෙන් වශයෙන් ගත් කළ ග්‍රාම නිලධාරීන් වෙතින් තමන්ට සැපයෙන සේවාව සතුටුදායක බව සාපේක්ෂව ඉහළ ප්‍රතිශතයක් සඳහන් කර ඇති අතර ඉඩම් විෂයයට පමණක් සීමා වී ඇති නිලධාරීන්ගේ සහ ඔවුන්ගේ අධීක්ෂණ නිලධාරීන්ගේ සේවය දුර්වල මට්ටමක පවතින බව සේවාලාභීන්ගේ ඇගයීම වේ.

සේවා සැපයීමේ දී නිලධාරීන් ද විවිධ දුෂ්කරතාවන්ට හා අපහසුතාවන්ට මුහුණ දෙනු ලබයි. වෙනත් රාජකාරි සඳහා කාලය වැය කිරීමට සිදුවීම, නව නීති, චක්‍රලේඛ සම්බන්ධයෙන් දැනුවත්වීමට සැලකිය යුතු කාලයක් ගතවීම, එම දැනුවත්වීම් සිදු කෙරෙන ක්‍රමවේදය පිළිබඳ නිලධාරීන්ගේ ඇති අකමැත්ත සහ දැනුවත් කිරීමෙන් අත්වන ප්‍රයෝජනය අවමවීම, නිලධාරීන් සියලු දෙනා ම පාහේ පුහුණුවීම් ලබා ඇතත් පුහුණුවීම් ක්‍රමවේදයේ පවතින දුර්වලතා නිසා සේවා සැපයීමේ දී ඉන් ලැබෙන ප්‍රයෝජනවත්භාවය සීමා සහිතවීම, වසම් දෙකක රාජකාරි ආවරණය කිරීමට සිදුවීම ඒ අතර වේ. මෙයට අමතරව, සේවා පහසුකම් සම්බන්ධයෙන් නිලධාරීහු විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටිති. සමස්තයක් වශයෙන් ගත් කළ ප්‍රවාහන පහසුකම් සම්බන්ධයෙන් දැඩි ගැටලුවකට ග්‍රාම නිලධාරීන්, ජනපද ඉඩම් නිලධාරීන් ඇතුළු ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මුහුණ දී සිටින අතර ප්‍රවාහන පහසුකම් මෙන් ම ක්ෂේත්‍ර කටයුතු සඳහා ඔවුන්ට හිමිවන දීමනා ද ප්‍රමාණවත් නො වේ. මෙයට අමතරව ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙන් ම ග්‍රාම නිලධාරී කාර්යාලවල ලිපි ලේඛන සුරක්ෂිතව ගබඩා කිරීමේ පහසුකම් ප්‍රමාණවත් නො වන නිසා අත්‍යවශ්‍ය ලිපි ලේඛන විනාශවීම ද සේවා සැපයීමේ දී නිලධාරීන් මුහුණ දෙන ගැටලුවක් වේ.

පස් වැනි පරිච්ඡේදය

සේවා සැපයීමේ ප්‍රමාදය සහ ප්‍රමාදය මගහැරීමට ඉදිරිපත් වූ යෝජනා

5.1 හැඳින්වීම

ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමේ දී කිසියම් ප්‍රමාදයක් පවතින බව මෙයට ඉහත සිදු කරන ලද අධ්‍යයනවලින් තහවුරු කර ඇත (දමයන්ති සහ නානායක්කාර, 2008, Damayanthi, 2011). මෙම පරිච්ඡේදයේ දී සේවා සැපයීමේ දී සිදුවන ප්‍රමාදය, එම ප්‍රමාදයට හේතු වශයෙන් සේවාලාභීන් සහ නිලධාරීන් විසින් හඳුනාගත් කරුණු ඉදිරිපත් කෙරේ. එමෙන් ම, එක් එක් ආයතන හෝ නිලධාරීන් වෙතින් සිදුවන ප්‍රමාදය වැළැක්වීම සඳහා ඉහත කී පාර්ශව දෙක වෙතින් ඉදිරිපත් වූ යෝජනා ද ඉදිරිපත් කෙරේ.

5.2 සේවා ඉල්ලීම් සහ ගැටලු විසඳීමේ ප්‍රගතිය

5.2.1 සේවා ලබාදීම අවසන් අදියරට පැමිණීමට ගතවන කාලය

අධ්‍යයනයට ලක් කෙරුණු සේවාලාභීන් 486 දෙනාගේ ඉල්ලීම් අතරින් 3.7% (18)ක් පමණක් සේවා සැපයීමේ අවසන් අදියරට පැමිණ තිබිණි. එම ගැටලුවලින් 39% (ගැටලු 07)ක්, එනම් ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම සඳහා ඉදිරිපත් වූ එක් ගැටලුවක්, ආරවුල් නිරවුල් කිරීමේ ගැටලු 02ක් සහ ඉඩමක් රජයට පවරා ගැනීම වෙනුවෙන් වන්දි ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ ඉල්ලීම් 04ක් අවසන් අදියරට පැමිණීම සඳහා වසර 1-5ත් අතර කාලයක් ගත වී තිබුණි. අවසන් අදියරේ පැවති ගැටලු අතුරින් 27.7% (ගැටලු 05ක්) එනම්, ආරවුල් නිරවුල් කිරීම (01), පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම හෝ අළුතින් නමක් එක් කිරීම සඳහා වූ ඉල්ලීම් 02ක් සහ රජයෙන් ප්‍රදානය කරන ලද ඉඩමක් බැංකු හෝ අනුමත මූල්‍ය ආයතනයක් වෙත උකස් කිරීම සඳහා අවසර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම් 02ක් අවසන් අදියරට පැමිණීමට මාස 03කට අඩු කාලයක් ගත ව තිබිණි. එමෙන් ම, ඉඩමක් බැංකු/අනුමත මූල්‍ය ආයතනයක් වෙත උකස් කිරීම සඳහා වූ තවත් ඉල්ලීමක් අවසන් අදියරට පැමිණීම සඳහා මාස 3-6 අතර කාලයක් ගත වී තිබිණි.

ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම සඳහා වූ ඉල්ලීමක් අවසන් අදියරට පැමිණීම සඳහා මාස 6-අවු. 01ත් අතර කාලයක් ගත ව තිබූ අතර ගැටලුවලින් 16.6% (ගැටලු 03)ක් අවසන් අදියරට පැමිණීම සඳහා වසර 10ට වැඩි කාලයක් ගත ව තිබිණි. එසේ වසර 10කට වැඩි කාලයක් ගත ව තිබූ ගැටලු වූයේ ආරවුල් නිරවුල් කිරීම, ජයභූමි ඔප්පු යටතේ ප්‍රදානය කර ඇති ඉඩම්වල මායිම්/භූමි ප්‍රමාණය හෝ අයිතිය පිළිබඳ ගැටලු සහ දීර්ඝකාලීන බදු යටතේ ඉඩම් ලබාගැනීම සඳහා වූ ඉල්ලීම් ය. මේ අනුව, සේවා සැපයීමේ යම් කිසි ප්‍රමාදයක් පවතින බව තහවුරු වේ. ඇතැම් අවස්ථාවල දී සේවාලාභීහු තම සේවා ඉල්ලීම ඉටු නො වීම නිසා

කිහිප වරක් එක ම ඉල්ලීම එක් එක් නිලධාරියා හෝ ආයතනය වෙත ඉදිරිපත් කිරීම සිදු වේ. වගු අංක 5.1න් එවැනි අවස්ථා සහ එම ඉල්ලීම් ඉදිරිපත් කළ පළමු සහ අවසන් අවස්ථාව අතර කාලය ඉදිරිපත් කෙරේ.

වගු 5.1: එක ම නිලධාරියා වෙත සේවා ඉල්ලීම් කිහිප වරක් ඉදිරිපත් කර ඇති කාල පරාසය

ගැටලුව	එක ම වරක් තුළ (%)	වරක් 5ක් තුළ (%)	වරක් 5ට වැඩි (%)	වාර්තා නොකළ (%)
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම (සංඛ්‍යාව = 154)	6.9	21.8	36.8	34.4
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම (සංඛ්‍යාව = 65)	14.7	17.8	31.8	35.6
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම (සංඛ්‍යාව = 63)	13.2	23.6	20.7	42.5
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම (සංඛ්‍යාව = 44)	25.0	19.0	28.6	27.4
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම (සංඛ්‍යාව = 35)	32.4	12.2	28.4	27.0
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු (සංඛ්‍යාව = 38)	25.0	19.3	13.6	42.0
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු (සංඛ්‍යාව = 16)	3.0	9.1	30.3	57.6
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම (සංඛ්‍යාව = 46)	12.7	0.0	36.4	50.9
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම (සංඛ්‍යාව = 11)	11.1	22.2	33.0	33.3

සටහන: වාර්තා නො කළ යන්නට අවස්ථා කිහිපයක දී එක ම නිලධාරියා වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් කාල වකවානු අමතක සේවාලාභීන් සහ එක් අවස්ථාවක පමණක් ඉල්ලීම් ඉදිරිපත් කළ සේවාලාභීන් ඇතුළත් වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

පසු උරුමකරු නම් කිරීම/නම්කර තිබූ පසු උරුමකරු අවලංගු කිරීම හෝ නම්කර ඇති පුද්ගලයින් අතරට තවත් අයෙකුගේ නමක් ඇතුළත් කිරීම ඉඩම් විෂයය සම්බන්ධයෙන් වන කාරණා පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී සරල කාර්යයකි. කෙසේ වුව ද, ඉහත වගු සටහනෙන් පෙන්නුම් කරන පරිදි පසු උරුමකරු නම් කිරීම සම්බන්ධයෙන් වන ගැටලුවලට අදාළ ව නම

ඉල්ලීම එක් වසරක් තුළ එක ම නිලධාරීන් පිරිසක් වෙත දෙ වතාවක් හෝ එයට වැඩි වාර ගණනක් ඉදිරිපත් කළ ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය 32.4%ක් වන අතර වසර පහකට වැඩි කාලයක් තිස්සේ තම ඉල්ලීම දෙ වතාවක් හෝ එයට වැඩි වාර ගණනක් ඉදිරිපත් කළ ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය 28.4%කි.

ජයභූමි දීමනා පත්‍ර සම්බන්ධයෙන් පැන නැගුණු ගැටලු නිරාකරණය සඳහා එක ම වසර තුළ දෙ වතාවක් හෝ එයට වැඩි වාර ගණනක් අදාළ නිලධාරීන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය 25%ක් වන අතර වසර 5ක් තුළ එසේ එක ම ගැටලුව සම්බන්ධයෙන් කිහිප වතාවක් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති ප්‍රතිචාරීන්ගේ ප්‍රතිශතය 19.3%කි. එක් එක් ගැටලුව සම්බන්ධයෙන් විමසූ කල ඉඩම් බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිචාරීන්ගෙන් 36.8%ක් ද, දීමනා පත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් 31.8%ක් ද, ඉඩම් ආරවුල් නිරවුල් කිරීම සම්බන්ධයෙන් 20.7%ක් ද, ඉඩමේ අයිතිය වෙනත් අයෙකුට පැවරීම හෝ වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම සඳහා 28.6%ක් ද, පසු උරුමකරු සම්බන්ධයෙන් වන ගැටලු සඳහා 28.4%ක් ද, ජයභූමි දීමනා පත්‍ර යටතේ ලබා දී ඇති ඉඩම්වල ගැටලු සම්බන්ධයෙන් 13.6%ක් ද, දීමනා පත්‍ර සම්බන්ධයෙන් වන වෙනත් නීත්‍යානුකූල ගැටලු සඳහා 30.3%ක් ද ඉඩමක් රජයට පවරා ගැනීම සම්බන්ධයෙන් වන ගැටලු සඳහා 36.4%ක් ද, දීර්ඝ කාලීන බද්ද යටතේ ඉඩම් ලබා ගැනීම සඳහා 33.3%ක් ද, වසර පහකට වැඩි කාලයක් තිස්සේ දෙ වතාවක් හෝ එයට වැඩි වාර ගණනක් අදාළ ආයතන සහ නිලධාරීන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. මේ අනුව, පැහැදිලි වන්නේ ඉඩම් ගැටලු විසඳීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රමාදයක් පවතින බව යි.

ඇතැම් අවස්ථාවල දී සේවාලාභීන් සුදුසුකම් සපුරා නො තිබීම, අයදුම්පත හෝ ඉල්ලීම නිසි ලිපි ලේඛන සහිතව ඉදිරිපත් නො කිරීම මෙන් ම ඉදිරිපත් කළ පසු ලිපි ලේඛන අස්ථානගත වීම, නිලධාරීන් ස්ථාන මාරුවීම් ලැබ යාමෙන් පසුව පැමිණෙන නිලධාරියාට නැවත වතාවක් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට සිදුවීම ආදියත්, තම ඉල්ලීම ඉටු නො වුණු අවස්ථාවල දී නැවත නැවත එම ඉල්ලීම ඉදිරිපත් කිරීමට සේවාලාභීන් පෙළඹීමත්, මේ ආකාරයට කිහිප වතාවක් සේවා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට හේතු සාධක වී ඇත.

5.2.2 ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් වන සේවා ඉල්ලීම් ඉටු කිරීම

බොහෝ විට, සේවාලාභීන් විසින් තම ගැටලුව නිලධාරීන් කිහිප දෙනෙකුට හෝ ආයතන කිහිපයකට ඉදිරිපත් කර තිබීම සාමාන්‍ය ලක්ෂණයක් විය. ඒ අනුව, ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් කර තිබූ ගැටලු 333න් එම වසර තුළ ම මූලික විමර්ශන අවසන් වී තිබූ ගැටලු ප්‍රමාණය 12.3% (41) ක් වූ අතර 7.5% (25) ක මූලික විමර්ශන සිදු කෙරෙමින් පැවතිණි. මූලික විමර්ශනවලින් පසුව ඉහළ නිලධාරීන්ට යොමු කළ ප්‍රමාණය 47.4% (158)කි. තවත් 2.4% (8) පරීක්ෂණ අවසන් අදියරේ පැවතිණි. මේ අනුව ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලින් 69.7%ක ප්‍රමාණයක් එම නිලධාරීන් වෙතින් ඉටු විය යුතු කාර්යය අවසන් කර හෝ අවසන් අදියරේ පැවතී ඇත.

තමන්ගේ ඉල්ලීම්වලින් 17.7% (ඉල්ලීම් 59)ක් වෙනුවෙන් කිසිවක් සිදු කර නොමැති බව සේවාලාභීහු සඳහන් කළ හ. සේවාලාභීන් 3.0% (10)ක් තමන් ඒ සම්බන්ධයෙන් පසු විපරමක් නො කළ බව සඳහන් කරනු ලැබිණි. ග්‍රාම නිලධාරීන්ට ඉදිරිපත් කළ ඉල්ලීම් අතරින් 0.9% (03)ක් ඉල්ලුම්කරු විසින් අතහැර දමා ඇති අතර 0.3% (1)ක් නැවත ඒ වෙනුවෙන් ඉල්ලීමක් කිරීම සිදු කර ඇත. ගැටලුවට සම්බන්ධිත අනෙක් පාර්ශවය ඉදිරිපත් නො වීම නිසා විමර්ශන කටයුතු ප්‍රමාද වී ඇති බව සේවාලාභීන් 0.6% (02) සඳහන් කළ හ. නිලධාරීන් වෙත ඉදිරිපත් වන ගැටලුවේ ස්වභාවය අනුව එයට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ගත වන කාලය වෙනස් වන අතර වගු සටහන් 5.2න් තමන් වෙතින් සැපයෙන සේවාව සඳහා ගත වෙතැ යි ග්‍රාම නිලධාරීන් සඳහන් කළ කාලය දැක් වේ.

වගුව 5.2: ග්‍රාම නිලධාරීන් වෙතින් සැපයෙන සේවාවට ගත වන කාලය

ගැටලුව	වැඩි ම පිරිසක් සඳහන් කළ කාලය (මිනිස් දින)	අඩු ම මිනිස් දින ගණන	වැඩි ම මිනිස් දින ගණන
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම	21.00	0.02	135.00
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	1.00	0.02	30.00
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	1.00	0.02	30.00
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	21.00	0.02	225.00
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	0.09	0.02	21.00
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	21.00	0.02	30.00
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	21.00	0.02	30.00
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	21.00	0.02	225.00
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	21.00	0.02	135.00
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	1.00	0.02	21.00

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ඉහත වගු සටහන අනුව ග්‍රාම නිලධාරීන් වෙතින් රාජකාරී ඉටු කිරීම සඳහා වැය වූ අවම කාලය මිනිස් දින 0.02ක් වන අතර මිනිස් දින 225 උපරිම කාලයක් වන්දි ලබා ගැනීම සහ වෙනත් අයෙකුගෙන් ඉඩමක් පවරා ගැනීම වෙනුවෙන් වැය කර ඇත.

සේවා ලබාදීම සඳහා ගත වන අවම කාලය සහ උපරිම කාලය අතර ඉතා ඉහළ කාල පරාසයක් පවතින අතර මේ සඳහා සාධක රාශියක් බලපා ඇත. ග්‍රාම නිලධාරීවරයාට අමතර වසමක වැඩ ආවරණය කිරීමට සිදුවන අවස්ථාවක තොරතුරුවල සත්‍යතාව තහවුරු කරගැනීමට කාලය ගතවීම, වසමේ භූමි ප්‍රමාණය හෝ පවුල් සංඛ්‍යාව වැඩිවන අවස්ථා, සේවාලාභීන් විසින් අවශ්‍ය ලිපි ලේඛන නිසි පරිදි ඉදිරිපත් නො කිරීම සහ අයදුම්පත් අසම්පූර්ණ වීම, සේවාලාභීන් විසින් ලිපි ලේඛන වරින් වර ඉදිරිපත් කිරීම සහ ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම, ග්‍රාම නිලධාරීන්හට වෙනත් අමතර රාජකාරි පැවරීම ආදී හේතු සාධක ඒ අතර මූලික වේ.

කෙසේ වුව ද, ඉඩම් සම්බන්ධයෙන් වන ඇතැම් සේවා සැපයීම සඳහා අනුගමනය කළ යුතු පියවර සහ නීතිරීති අනුව ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ. උදාහරණ වශයෙන් අනවසර නියමානුකූල කිරීම හෝ ඉඩම් බලපත්‍ර සඳහා නිර්දේශිත වාර්තා ඉදිරිපත් කිරීමේ දී ග්‍රාම නිලධාරි විසින් ඒ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ යුතු අතර ඉඩමේ පිහිටීම, දළ භූමි ප්‍රමාණය, කෙතරම් කාලයක සිට භුක්ති විඳින්නේ ද? ඉඩම කිසියම් රක්ෂිතයකට අයත් වන්නේ ද? නැතහොත් රජයේ පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩමක් ද? ආදිය ඇතුළත් විය යුතු ය. එසේ නිර්දේශාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමේ දී ඒ සම්බන්ධයෙන් මනාව කරුණු අධ්‍යයනය කොට ඉදිරිපත් කිරීම කළ යුතුව ඇති අතර එවන් කටයුත්තක් මිනිස් දින 0.02ක් වැනි කාලයකදී ඉදිරිපත් කිරීමේ දී බොහෝ දුරට එහි විශ්වසනීයත්වය පිළිබඳ ගැටලු මතු වේ.

එමෙන් ම, ඉඩම් අයිතිය වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම හෝ වෙනත් අයෙකුට පැවරීම සඳහා ග්‍රාම නිලධාරි වෙතින් ඉටුවිය යුතු කාර්යයන් ඉටු කිරීම සඳහා වැය වෙතැ යි ග්‍රාම නිලධාරීන් සඳහන් කළ අවම සහ උපරිම කාලයෙහි පරතරයෙ හි සැලකිය යුතු වෙනසක් පවතී. එම සේවාව ලබාදීමේ දී ඉඩමේ හිමිකරු සහ පවුලේ අය ඉඩම වෙනත් අයෙකුට පැවරීම (අලෙවි කිරීම) නිසා අනාථ භාවයට පත් නො වන බව, ඉඩම් හිමිකරුට වෙනත් ඉඩම් ඇති බව, ගොවි පත්තියේ ඉඩමක් නම් ඉඩම මිල දී ගනු ලබන්නේ ගොවි පත්තියේ ම අයෙකු බව ආදී කරුණු රාශියක් තම වාර්තාව තුළින් ග්‍රාම නිලධාරී විසින් ඉදිරිපත් කළ යුතු වේ. මෙම කරුණු තහවුරු කර ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන අතර ග්‍රාම නිලධාරීවරයා ප්‍රදේශයට නවකයකු වන්නේ නම් තවදුරටත් ඒ සඳහා කාලය අවශ්‍ය වේ.

වගුව 5.3: ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් වූ සේවා ඉල්ලීම් සහ ඒවායෙහි ප්‍රගතිය

ගැටලුව	ඉල්ලීම් සංඛ්‍යාව		ප්‍රගතිය	
	මුළු සංඛ්‍යාව	එක් නිලධාරියෙකුට ඉදිරිපත් වන සාමාන්‍ය	අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ සංඛ්‍යාව	අඩුපාඩු නිසා නැවත හරවා යැවූ සංඛ්‍යාව
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම	7,370	58.96	5,729	811
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	2,701	27.85	2,417	93
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	3,241	24.74	1,735	17
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	976	10.28	856	35
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	1,100	13.92	1,069	16
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	926	13.23	799	14
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	174	3.16	147	7
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	693	23.90	614	0
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	433	11.10	392	1
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	600	18.45	593	3
ජයභූමි ඔප්පු සහිත ඉඩමක් මැණීමට අවසර ඉල්ලීම	642	13.10	581	40
එකතුව	18,856	148.02	14,802	1,037

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කෝ.ගො.ප.පු. ආයතනය

අධ්‍යයනයට ලක් කළ ග්‍රාම නිලධාරීන් වෙත පසුගිය වසර තුළ ඉදිරිපත් වී ඇතැයි ඔවුන් සඳහන් කළ දළ ඉල්ලීම් සංඛ්‍යාවේ එකතුව 18,856ක් වන අතර ඉන් 78.5% (14,802)ක කටයුතු අවසන් කර අදාළ ආයතනය වෙත ඉදිරිපත් කර ඇති අතර 5.5% (1,037) විවිධ අඩුපාඩු නිසා නැවත හරවා යවා ඇත. ඉතිරි 16% ඉල්ලීම් ප්‍රමාණයෙ හි කටයුතු සම්බන්ධයෙන් කටයුතු කර නොමැත.

5.2.3 ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී වෙත ඉදිරිපත් කළ ගැටලු

ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ සේවාලාභීන් 113ක් අතුරින් 12.4% (14)ක මූලික විමර්ශන අවසන්ව ඇති අතර 22.1% (25)ක මූලික විමර්ශන සිදු කෙරෙමින් පැවතිණි. මූලික විමර්ශනවලින් පසු ඉහළ නිලධාරීන් වෙත යොමු කළ ඉල්ලීම් ප්‍රමාණය 17.7% (20) කි. ඉල්ලීම්වලින් 21.2% (24)ක් සඳහා කිසිදු පියවරක් ගෙන නොමැති බව සේවාලාභීන් සඳහන් කළ අතර 3.5% (4)ක් පිළිබඳ පසු විපරමක් කර නොමැති හෙයින් ප්‍රගතිය සම්බන්ධයෙන් සේවාලාභීන්ට අදහසක් නොමැත. අයදුම්පතෙ හි අඩුපාඩු නිසා ඉදිරි පියවර ගැනීමට නොහැකිවීම 4.4% (5), අදාළ වෙනත් ආයතන වෙත යොමු කර පිළිතුරු අපේක්ෂාවෙන් සිටින (2.6%) සහ ගැටලුව තාවකාලිකව විසඳා ඇති ඉල්ලීම් 7.1% ද වේ.

ජනපද/ඉඩම් නිලධාරීන් ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2010 ඔක්තෝබර් සිට 2011 සැප්තැම්බර් මාසය දක්වා වසරක කාලය තුළ ඔවුන් වෙත දළ වශයෙන් ලැබුණු සේවා ඉල්ලීම් ප්‍රමාණය හා ඒ සම්බන්ධයෙන් ප්‍රගතිය වගු අංක 5.4න් දැක්වෙන අතර වගු අංක 5.5න් මෙම නිලධාරීන්ට සේවා සැපයීමට ගත වන කාලය ද ඉදිරිපත් කෙරේ.

අධ්‍යයනයට ලක් කළ ජනපද නිලධාරීන් වෙත දළ වශයෙන් ඉදිරිපත් ව ඇති ඉල්ලීම් සංඛ්‍යාව 13,931ක් වන අතර ඉන් 37.5% (5,221)ක කටයුතු නිම කර ඉදිරි වැඩ කටයුතු සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම හෝ කටයුතු අවසන් කර ඇත. එමෙන් ම, අඩුපාඩු නිසා 3.0% ප්‍රතිශතයක් නැවත හරවා යවා ඇත. ඉතිරි ඉල්ලීම් ප්‍රමාණය නො විසඳුණු ගැටලු සේ ඉඩම් අංශයේ පවතී.

වගුව 5.4: ජනපද/ඉඩම් නිලධාරී වෙත ඉදිරිපත් වූ සේවා ඉල්ලීම් සහ ඒවායේ ප්‍රගතිය

ගැටලුව	ඉල්ලීම් සංඛ්‍යාව		ප්‍රතිශතය	
	මුළු සංඛ්‍යාව	එක් නිලධාරියෙකුට ලැබෙන සාමාන්‍ය	අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ සංඛ්‍යාව	අඩුපාඩු නිසා නැවත හරවා යැවූ සංඛ්‍යාව
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම	8,621	783.73	1,828	224
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	1,080	90.00	1,018	62
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	883	73.58	473	0
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	936	85.09	637	44
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	1,060	96.36	680	65
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	300	33.33	255	5
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	37	5.29	37	0
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	60	12.00	10	0
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	235	26.11	223	20
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	559	55.90	30	0
ජයභූමි ඔප්පු සහිත ඉඩමක් මැණීමට අවසර ඉල්ලීම	160	22.00	30	00
සමස්තය	13,931	-	5,221	420

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011 - හෙ.කො.ගො.ප.පු. ආයතනය

වගුව 5.5: ජනපද/ඉඩම් නිලධාරීන් වෙතින් සැපයෙන සේවාවට ගත වන කාලය

ගැටලුව	මිනිස් දින			වැඩිම පිරිසක් සඳහන් කළ කාලය (මිනිස් දින)
	සාමාන්‍ය	උපරිම	අවම	
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම	60.00	135.00	0.03	60.00
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	36.33	60.00	0.31	60.00
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	9.60	21.00	1.00	1.00
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	18.44	21.00	1.00	1.00
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	11.00	60.00	0.03	1.00
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	18.25	30.00	1.00	21.00
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	11.04	30.00	0.19	0.19
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	60.00	60.00	60.00	60.00
දීර්ඝකාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	28.29	60.00	1.00	21.00
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	4.90	21.00	0.03	0.19
ජයභූමි ඔප්පු සහිත ඉඩමක් මැණීමට අවසර ඉල්ලීම	5.90	21.00	0.19	0.19

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කෝ.ගො.ප.පු. ආයතනය

සේවාව සැපයීම සඳහා ජනපද නිලධාරීන්ට ගතව ඇති අවම කාලය විනාඩි 15 (මිනිස් දින 0.03)ක් වන අතර එය පසු උරුමකරු නම් කිරීම, මූල්‍ය ආයතන වෙත ඉඩම් උකස් කිරීමේ අවසර ලබා ගැනීම සහ ඉඩම් සඳහා බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම වෙනුවෙනි. 'මිනිස් දින 135 උපරිම කාලයක් ඉඩම් බලපත්‍ර ලබාදීම හෝ අනවසර නියමානුකූල කිරීම සම්බන්ධයෙන් ගතවන බව සඳහන් කරනු ලබයි. මිනිස් දින 135ක උපරිම කාලයක්

ඉඩම් බලපත්‍ර ලබාදීම හෝ අනවසර නියමානුකූල කිරීම සම්බන්ධයෙන් ගතවන බව සඳහන් කරනු ලබ යි. ඉහත වගුවෙන් ඉදිරිපත් කරනු ලැබූ කාල සීමාවන් මෙන් ම ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය සම්බන්ධ සංඛ්‍යාතීන් ජනපද නිලධාරින් විසින් දළ වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ ඒවා වේ.

සේවා ඉල්ලීම් ඉටු කිරීම සඳහා ගතවන කාලය එක් එක් සේවා ඉල්ලීම අනුව මෙන් ම ලිපි ලේඛන සහිතව සම්පූර්ණ අයදුම්පතක් වශයෙන් ඉදිරිපත් කිරීම හෝ නො කිරීම, ස්ථානීය පරීක්ෂණ සිදු කළයුතු අවස්ථාවන්වල දී එම මාර්ගවල තත්ත්වය සහ පොදු ප්‍රවාහන සේවාවන්වල කාර්යක්ෂමතාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ වෙනත් ආයතනයක දී ලිපිලේඛන අස්ථානගතවීම[8] ආදී සාධක රාශියක් මත රඳා පවතී. උදාහරණ වශයෙන් වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් ජනපද නිලධාරිනියක පෙන්වා දුන් අන්දමට වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රම්මල, හඳුවල වැනි කඳු ප්‍රදේශවල ස්ථානීය පරීක්ෂණයකට යාමට සිදුවන විට ඒ සඳහා සම්පූර්ණ දවසක් වැය වන්නේ පොදු ප්‍රවාහන සේවාවල දුෂ්කරතාව මෙන් ම ඇතැම් ඉඩම් සහ නිවාස වෙත ප්‍රවේශවීම සඳහා කිලෝ මීටර ගණනාවක් පා ගමනින් කඳුවල ගමන් කිරීමට සිදු වන බැවිනි. මේ හේතුව නිසා බොහෝ විට එවන් දුෂ්කර ප්‍රදේශවල සේවා ඉල්ලීම් ඉදිරිපත් වීමේ දී ප්‍රායෝගිකව සිදු වන්නේ එක් ග්‍රාම නිලධාරී වසමකින් ඉල්ලීම් කිහිපයක් ඉදිරිපත් වන තෙක් ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම ප්‍රමාද වීම ය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රදර්ශනය කෙරෙන පුරවැසි ප්‍රඥප්තියෙහි සඳහන් කර ඇති අන්දමට සියලු අවශ්‍යතා සපුරා අදාළ ලිපි ලේඛන සම්පූර්ණයෙන් ඉදිරිපත් කර ඇති අවස්ථාවක සේවා සපයා ගැනීම සඳහා එතරම් කාලයක් ගත නො වේ. එසේ වුව ද, ප්‍රායෝගිකව එම තත්ත්වය ඉටු කළ නො හැකි බව අධ්‍යයනය සඳහා තොරතුරු ලබාදුන් ජනපද නිලධාරීන් මෙන් ම අනෙකුත් කාණ්ඩවල නිලධාරීහු ද සඳහන් කළ හ[9].

5.2.4: ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ ගැටලු

අධ්‍යයනයට ලක් කරන ලද සේවාලාභීන්ගේ ගැටලුවලින් 25%ක් ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ බව සේවාලාභීහු පවසති. එසේ ඉදිරිපත් කරනු ලැබූ සේවා ඉල්ලීම්වල ප්‍රගතිය වගු සටහන් 5.6න් දැක් වේ.

---

[8] කිසිදු ලිපි ලේඛනයක් භාරදුන් බවට හෝ භාරගත් බවට තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශවල වැඩපිළිවෙලක් නොමැත.

[9] සේවාලාභියෙකු වශයෙන් අධ්‍යයනය සඳහා තොරතුරු ලබාදුන් ප්‍රදේශයේ එක්තරා මාධ්‍යවේදියෙකු පුරවැසි ප්‍රඥප්තිය සම්බන්ධයෙන් අගය කරනු ලැබුවේ "සේවා අවශ්‍යතාවක් වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියවිට බුලත් කා කෙළ ගැසීමට සිතෙනා, මහජන මුදල් නාස්තිකර ප්‍රදර්ශනය කරනු ලබන පුවරුවක් ම මිස සේවා සැපයීම වෙනුවෙන් හෝ කාර්යක්ෂමතාව වෙනුවෙන් එමගින් කිසිවක් සිදු වී නොමැති බව" පවසමිනි.

වගුව 5.6: ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ සේවා ඉල්ලීම්වල ප්‍රගතිය

ප්‍රගතිය	ප්‍රතිචාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව =251)
මූලික විමර්ශන අවසන්ව ඇත	19	7.6
මූලික විමර්ශන සිදු කෙරමින් පවතී	35	13.9
මූලික විමර්ශනවලින් පසුව අදාළ ආයතන වෙත යොමු කර ඇත	50	19.9
පරීක්ෂණ අවසන් අදියරේ පවතී	16	6.4
කිසිවක් සිදු කර නොමැත	84	33.5
අයදුම්පතෙහි අඩුපාඩු නිසා පියවර ගෙන නොමැත	14	5.6
ඉල්ලීම පිළිබඳ පසු විපරමක් කර නැත	14	5.6
වාර්තා කර නොමැත	10	4.0
ඉල්ලුම්කරු විසින් ඉල්ලීම අතහැර දමා ඇත	04	1.6
තාවකාලිකව විසඳා ඇත	05	2.0

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

මේ අනුව, ප්‍රාදේශීය/සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් ව ඇති ඉල්ලීම්වලින් 48% ආසන්න ප්‍රමාණයක් මූලික කටයුතු අවසන්ව ඇති අතර කිසිවක් සිදු නො කරන ලද බව සේවාලාභීන් විසින් පවසන ලද ප්‍රමාණය 1/3ක් වේ. මෙසේ කිසිවක් සිදු කර නොමැති බවට සේවාලාභීන් විසින් පවසන ඉල්ලීම් බොහොමයක් අනවසර නියමානුකූල කිරීම හෝ බලපත්‍ර ලබා ගැනීම සඳහා වූ ඉල්ලීම් වේ. 2008.06.13 වැනි දාතමින් යුක්තව ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද එල්.ඩී -1-34 (1) 2008 චක්‍රලේඛය සහ 2008.10.5 දාතමින් යුතුව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2008/4 චක්‍රලේඛය අනුව අනවසර නියමානුකූල දිවයින පුරා නතර කිරීමට උපදෙස් ලබා දී ඇතත් දකුණු පළාත තුළ 2010 දක්වා අනවසර නියමානුකූල කිරීම සිදුව ඇත. ඉහත චක්‍රලේඛ සහ පළාත් සභාවේ ක්‍රියාත්මක තත්ත්වයත් අතර තිබූ මතභේදාත්මක තත්ත්වයත්, ලැබෙන ඉල්ලීම් ප්‍රමාණයට සාපේක්ෂව පවතින සේවක හිඟයත් නිසා අනවසර නියමානුකූල කිරීම හෝ බලපත් නිකුත් කිරීම සම්බන්ධයෙන් බොහෝ ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වා නොමැත.

කෙසේ වුව ද, මෙහි දී සඳහන් කළ යුතු විශේෂ කරුණක් වන්නේ පියවර කිහිපයක් පසු කර ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් වන ඉල්ලීම්වලින් 6% ආසන්න ප්‍රමාණයක් අඩුපාඩු හෝ නිසි ලිපි ලේඛන නොමැතිවීමේ හේතුව නිසා නැවත ආපසු හරවා එවීමයි. ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම දක්වා වූ ක්‍රියාවලියේ අඩුපාඩු හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබේ.

5.2.5 පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කළ ගැටලු

මෙකී නිලධාරී කාණ්ඩය වෙත සේවාලාභීන් වෙතින් සෘජුව ම ඉදිරිපත් වී ඇති සේවා ඉල්ලීම් සංඛ්‍යාව 33කි. එම ඉල්ලීම්වලින් 12.1% (4) ක මූලික විමර්ශන අවසන්ව ඇති අතර තවත් 12.1 (4) අවශ්‍ය කටයුතුවලින් පසුව අදාළ ආයතන වෙත යොමු කර ඇත. ඉල්ලීම්වලින් 9.1% (3)ක මූලික විමර්ශන සිදු කෙරෙමින් පැවති අතර 3% (1)ක පරීක්ෂණ සිදු කෙරෙමින් පවතින බව සේවාලාභීහු සඳහන් කළ හ. සේවාලාභීන්ගෙන් 39.4 (13)ක් සඳහන් කරනු ලැබුවේ තම ඉල්ලීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් කිසිදු පියවරක් ගෙන නොමැති බවයි. මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්වරයාගෙන් විමසූ විට අනාවරණය කළේ 2011 වසරේ ජනවාරි මාසයට පෙර හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික් දෙකෙහි ම වැඩකටයුතු මාතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් යටතේ සිදුවූ බවත්, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නො වීම සහ සම්පත් හිඟය ඇතුළු හේතු සාධක ගණනාවක් මත සේවා ඉල්ලීම් ඉටු කිරීම සම්බන්ධයෙන් යම් යම් ප්‍රමාදයන් පැවති බවයි. එමෙන් ම, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක දෙකට සාපේක්ෂව හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් බහුලව පවතින හෙයින් එහිදී ලැබෙන සේවා ඉල්ලීම් ප්‍රමාණය සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා අතර ම බොහෝ ගැටලු සංකීර්ණ ස්වභාවයක් ගන්නා බව ද අනාවරණය කෙරිණි. එ මෙන් ම පළාත ඇතුළත ගැටලු විසඳීම සඳහා සාම්ප්‍රදායික සහ ඒකාකාරී ප්‍රවේශයක් යොදා ගැනීම ද ගැටලු විසඳීම ප්‍රමාද වීම සඳහා බලපා ඇති බව පෙනේ. ගැටලුව තාවකාලිකව විසඳා ඇති බව සේවාලාභීන්ගෙන් 6% (2) සඳහන් කළ අතර ඉතිරි පිරිස ඉල්ලීමට අදාළ ප්‍රගතිය සම්බන්ධයෙන් කිසිවක් වාර්තා කර නොමැත.

5.2.6 මහවැලි සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ ගැටලු

මහවැලි සංවර්ධන අධිකාරියට සම්බන්ධ ඉඩම් ගැටලු පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරී, ඒකක කළමනාකරු, කොට්ඨාස කළමනාකරු, නේවාසික ව්‍යාපාර කළමනාකරු සහ මහවැලි අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබූ සේවා ඉල්ලීම් සංඛ්‍යාව 79කි. එම ගැටලුවලින් 5.1% (4) මූලික විමර්ශන අවසන් කොට තිබූ අතර 30.4% (24) මූලික විමර්ශන සිදු කරමින් පැවතිණි. ඉල්ලීම් ඉදිරිපත් කළ සේවාලාභීන්ගෙන් 3.2% (31)ක් තම ඉල්ලීම් සම්බන්ධයෙන් කිසිවක් සිදු වී නොමැති බව සඳහන් කළ අතර ගැටලුව විසඳා අවසන් බව 3.8% (3)ක් සඳහන් කළ හ. තවත් සේවාලාභීන්5.1% (4) ක් ප්‍රගතිය පිළිබඳ කිසිවක් සඳහන් කර නො තිබූ අතර ඉතිරි පිරිස අධිකරණ ක්‍රියාමාර්ගයක් වෙත යොමුව ඇති බව සඳහන් කරනු ලැබිණි.

5.2.7 පොලිස් ස්ථාන වෙත ඉදිරිපත්ව ඇති ගැටලු

සේවාලාභීන්ගේ ගැටලු 41ක් පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත. මෙම ගැටලුවලින් 24ක් ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් වන අතර 07ක් අනවසර ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙනි. එයට අමතරව, ජයභූමි දීමනා පත්‍ර යටතේ මතුව ඇති ගැටලු 5ක්, රජයට ඉඩම් පවරා ගැනීමේ දී වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් මතුව ඇති ගැටලු 3ක් හා පසු උරුමකරු නම් කිරීම/අවලංගු

කිරීම හෝ අලුතින් නමක් එකතු කිරීමේ දී මතුව ඇති ගැටලු 2ක් පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත. මෙම ගැටලුවලින් 56.1% (23) මූලික විමර්ශන නිමකොට ඇති අතර තවත් ගැටලු 17% (7)ක් විසඳා අවසන් අතර ගැටලුවලින් 19.5% (8)ක් තාවකාලිකව විසඳා ඇත. ගැටලුවලින් 14.8% (2)ක් මූලික විමර්ශන සිදු කර අවසන්ව ඇති අතර 2.4% (1)ක් සඳහා කිසිදු පියවරක් ගෙන නො තිබිණි.

5.2.8 වෙනත් නිලධාරීන් වෙත ඉදිරිපත් කළ ගැටලු

ඉහත සඳහන් කළ කාණ්ඩවලට අමතරව වෙනත් නිලධාරීන්, ආයතන සහ දේශපාලනඥයින් වෙත සේවාලාභීන් විසින් ගැටලු ඉදිරිපත් කර ඇත. ඒ අනුව, ප්‍රාදේශීය සභා සභාපති, පාර්ලිමේන්තු සහ පළාත් සභා මන්ත්‍රීවරුන්, ආණ්ඩුකාරවරිය සහ ජනාධිපති මහජන සම්බන්ධීකාරක වෙත ඉදිරිපත් කර ඇති ගැටලු සංඛ්‍යාව 66කි. මෙම ගැටලුවලින් 24 (36.4%)ක් මෙකී දේශපාලනඥයින් වෙත ඉදිරිපත්ව ඇත්තේ අනවසර ඉඩම් නියමානුකූල කිරීම හෝ ඉඩම් බලපත්‍ර ලබාගැනීම සඳහා වන ඉල්ලීම් වශයෙනි. මෙයට අමතරව, සමථ මණ්ඩලය (4), දිස්ත්‍රික් ලේකම් (3), පෙත්සම් කාරක සභාව (2), ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ නිලධාරීන් (2), වාරිමාර්ග ඉංජිනේරු (2), ගොවිජන සංවර්ධන නිලධාරි (2), ගොවි සංවිධාන (3), වරාය සංවර්ධන අධිකාරිය (5), මානව හිමිකම් කොමිසම (1), නාගරික සංවර්ධන අධිකාරිය (3), නගර සභාව (2), අධිකරණය (2), දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව (2), මැණුම් අධිකාරී කාර්යාලය (3), වනජීවී/වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (2), බිම් සවිය කාර්යාලය (1), තක්සේරු දෙපාර්තමේන්තුව (1), ජල සම්පාදන මණ්ඩලය (2), නීති ආධාර කොමිෂන් සභාව (2), වත්දී සමාලෝචන කමිටුව (1) සහ විහාරාධිපති ස්වාමීන් වහන්සේ (1) වෙත සේවාලාභීන් තම ගැටලු ඉදිරිපත් කර ඇත.

5.3 ගැටලු විසඳීම ප්‍රමාදවීම සම්බන්ධව ප්‍රතිචාරීන්ගේ අදහස්

5.3.1 සේවාලාභීන්ගේ අදහස්

තම ගැටලු විසඳීම ප්‍රමාදවීම සඳහා හේතු සාධක ගණනාවක් සේවාලාභීහු ඉදිරිපත් කළ හ. ඒ අතරින් ප්‍රධාන ම කරුණ වූයේ (22%) අදාළ සේවා සැපයීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව අඩුවීම හෝ සේවා සැපයීමේ දී දක්වන නො සැලකිලිමත්භාවය යි. තම ගැටලු විසඳීම ප්‍රමාදවීම කෙරෙහි බලපා ඇති අනෙකුත් කරුණු අතර අදාළ අනෙක් පාර්ශවයේ අකමැත්ත හෝ ඉදිරිපත් නො වීම (13%), ලියකියවිලි ඉදිරිපත් කිරීමේ දී තමන් වෙතින් සිදුවන ප්‍රමාදය (9.4%), රජයේ නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාවලිය දීර්ඝ වීම (7.9%), සේවාලාභීන්ගේ අනවබෝධය හා නො දැනුවත්කම (4.0%), සේවා සැපයීමට අදාළ අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ ප්‍රමාදය (3.8%), අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම් (3.6%), මහවැලි අධිකාරියේ නිලධාරීන්ගේ නො සැලකිමත්කම හෝ කාර්යය ඉටු කිරීමේ ප්‍රමාදය (3.4%), තමන් භුක්ති විඳින ඉඩම් රක්ෂිතවලට අයත්වීම (3.2%), අදාළ ලියකියවිලිවල අඩුපාඩු (2.8%) සේවාලාභීන්ගේ උනන්දුවක් නො වීම (5.9%) සහ මැණුම් කටයුතු ප්‍රමාද වීම (2.8%) වේ.

තුන් වැනි උපලේඛනයේ සහ අවම බෙදුම් සීමාව සම්බන්ධයෙන් වන ගැටලු නිසා තමන්ගේ ගැටලුව විසඳා ගැනීම ප්‍රමාද වන බව සේවාලභීන්ගෙන් 2.7%ක් සඳහන් කළ හ. එමෙන් ම, සේවාලාභීන්ගෙන් 5% සඳහන් කරනු ලැබුවේ සේවා සැපයීමේ ප්‍රමාදයක් ඒ සඳහා අදාළ හේතුව නො දන්නා බවයි. ආයතන නිලධාරීන් අතර පවතින අනවබෝධය හා අන්තර් සම්බන්ධතාවේ දුර්වලතා (2.1%) සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ඉල්ලුම් පත්‍ර හා ලිපි ලේඛන අස්ථානගත වීම (3.6%) ද සේවා ප්‍රමාදයට හේතු වශයෙන් සේවාලාභීහු සඳහන් කළ හ. සිද්ධි අධ්‍යයන 5.1න් නීතිමය තත්ත්වයන් සහ වෙනත් හේතු කිහිපයක් එක්ව සේවාලාභීන්ගේ ඉල්ලීම් විසඳීම ප්‍රමාදවන ආකාරය විස්තර කරනු ලබ යි. 5.2 සිද්ධි අධ්‍යයනය තුළින් නිලධාරීන්ගේ නො සැලකිල්ල නිසා සේවාලාභීන් මුහුණ දෙන අපහසුතා යම් පමණකට විස්තර කරනු ලබ යි.

සිද්ධි අධ්‍යයනය 5.1: ඉඩමේ අයිතිය සනාථ කිරීම සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු

ජී.ආර්.දයානන්ද මහතා බුත්දල ප්‍රදේශයේ ගොවි පවුලක එක ම පිරිමි දරුවා ලෙසින් උපත ලැබූ අතර ඔහුට සහෝදරියන් පස් දෙනෙකු විය. ඔහුගේ පියාට බලපත්‍රයකින් හිමි ව තිබූ අවුරුදු 50ක් පමණ සිට මෙම පවුල භුක්ති විඳින අක්කර 1 1/2 ගොඩ ඉඩමේ පසු අයිතිය කිසිවෙකුටත් නො පවරා 1989 දී පියා මිය ගියේ ය. 1996 දී, එම ඉඩම සඳහා ජයභූමි දීමනා පත්‍රයක් ලැබුණ අතර මව මිය යාමට පෙර එහි අයිතිය දයානන්ද මහතාට පවරන ලද නමුත් නැවත දීමනා පත්‍රය සැකසීමේ දී මවගේ නමින් ම සකස් කර එවා ඇත. 2001 වසරේ සිදුවූ මවගේ මරණයෙන් පසුව මෙම ඉඩම සම්පූර්ණයෙන් භුක්ති විඳ ඇත්තේ එම පවුලේ එක ම පිරිමි දරුවා වන දයානන්ද මහතා ය. නමුත් දැනට අවුරුදු දෙකකට පමණ පෙර මෙම ඉඩමේ අයිතිය ඉල්ලා ඔහුගේ එක් සහෝදරියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කර ඇති අතර දිගින් දිගට ම ඉඩමේ අයිතිය ගැනීම සඳහා නොයෙකුත් බලපෑම් එල්ල කරන්නී ය. මෙම ගැටලුව දයානන්ද මහතා විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරනු ලැබූ පසු නීතියට අනුව ඉඩම දයානන්ද මහතාට පැවරීමට අනෙකුත් සහෝදරියන් පස් දෙනාගේ කැමැත්ත අවශ්‍ය බවත්, එම කැමැත්ත ඉදිරිපත් කරන ලෙසත් දන්වා ඇත. මේ අනුව, එක් සහෝදරියක් පමණක් දිවුරුම් ප්‍රකාශයක් මගින් කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර අනෙකුත් සහෝදරියන් ඉඩමේ අයිතිය ඉල්ලන සහෝදරිය තමන් හා අමනාප වේ යැයි සිතා ඒ සඳහා කැමැත් දීමට මැළි වූහ.

අනුප්‍රාප්තිකයා නම් නො කොට කට්ටකරු මියගිය විට වැඩිමහල් පුතාට අයිතිය හිමිවන නමුත් දයානන්ද මහතාට ඒ සඳහා ද බාධා මතු ව ඇත. මෙම සිදුවීම් වන අතරවාරයේ දයානන්ද මහතා උප්පැන්න සහතිකයේ තමාට හිමි ව තිබූ ජී.ආර්. දයානන්ද නම වෙනුවට ජී.පී. දයානන්ද යනුවෙන් සිය නම 2005 මාර්තු මස දිනක දී පුවත්පත් දැන්වීමක් මගින් වෙනස් කරන ලදී. දැනට දයානන්ද මහතාට සිය නම වෙනස් කිරීම සම්බන්ධව මෙම පුවත්පත් දැන්වීම හැර වෙනත් කිසිදු සාක්ෂියක් නොමැත. මොහුගේ ජාතික හැඳුනුම්පතේ ද සඳහන් වන්නේ සිය පැරණි නම වන ජී.ආර්. දයානන්ද යන නාමය වුවත්, මේ වන විට ඡන්ද හිමි නාම ලේඛනයේ භාවිතා වන්නේ සිය අලුත් නම වන ජී.පී. දයානන්ද යන නාමය යි. පිළිගත් නීතියේ ආකාරයට නාමයක් වෙනස් කිරීමේ දී එය අදාළ පුද්ගලයාගේ උප්පැන්න සහතිකයේ සඳහන් කළ යුතු වුවත් දැනට දයානන්ද මහතාගේ උප්පැන්න සහතිකය ද අස්ථානගත ව ඇත. මේ සියල්ලේ ප්‍රතිඵලය ලෙස දයානන්ද මහතාට ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට නො හැකි ව තිබේ.

සිද්ධි අධ්‍යයනය 5.2: ඉඩම් කට්ටි අංකය වෙනස්වීම

ඒ. රණදාස මහතා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලූණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මහානාගපුර ප්‍රදේශයෙන් 1983 වසරේ දී රජයෙන් ලබාදුන් හෙක්ටයාර් 0.20ක භූමි ප්‍රමාණය අවුරුදු 29ක කාලයක් භුක්ති විඳිමින් සිටී. එම ඉඩම සඳහා 1997 වසරේ දී ජයභූමි දීමනා පත්‍රයක් හිමි වූ අතර ඒ වනවිටත් ඔහු එම ඉඩමෙ හි නිවසක් ඉදි කර තිබිණි.

පෞද්ගලික අවශ්‍යතාවක් වෙනුවෙන් ණය මුදලක් ලබා ගැනීම සඳහා 2009 වසරේ දී ඔහු අදාළ සියළු ලිපි ලේඛන සමගින් ණය අයදුම්පතක් බැංකුවට ඉදිරිපත් කරන ලද නමුත් ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප විය. එයට හේතු වී ඇත්තේ ඔහු දැනට භුක්ති විඳින සහ රජයේ නිලධාරීන් විසින් ඉඩම් ලබා දීමේ දී රණදාස මහතාගේ ඉඩම් කට්ටිය ලෙස පෙන්වා දුන් ඉඩම් කට්ටි අංකය 63 වුව ද, දීමනා පත්‍රයේ ඔහුගේ ඉඩම් කට්ටිය ලෙස වෙනත් පුද්ගලයෙකු විසින් භුක්ති විඳින 224 ඉඩම් කට්ටි අංකය සඳහන් වීම නිසා මතු වූ පරස්පරතාව යි.

5.3.2 නිලධාරීන්ගේ අදහස්

සමස්ත නිලධාරීන්ගෙන් 79% (145)ක් තමන් විසින් සපයන සේවාව කුමන හෝ හේතුවක් නිසා ප්‍රමාද වන බව සඳහන් කළ හ. මෙයට ග්‍රාම නිලධාරීන්ගෙන් 73% (106)ද, ජනපද නිලධාරීන්ගෙන් 100% ද, කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්/වරියන්ගෙන් 96% (23) ද, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්/වරියන්ගෙන් 80% (4) ද ඇතුළත් විණි.

නිලධාරීන්ගෙන් 17.3% (32)ක් තමන්ට විවිධ අන්දමේ අමතර රාජකාරි පැවරීම නිසා, විශේෂයෙන් ම, විවිධ රැස්වීම් සහ සංවර්ධන ව්‍යාපෘතිවල වැඩ කටයුතුවලට ප්‍රමුඛතාව දීමට සිදුවීම නිසා ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමේ කටයුතු කිසියම් ප්‍රමාදයකට ලක්වන බව අනාවරණය කෙරිණි. මෙයට ග්‍රාම නිලධාරීන් 15% (22), ජනපද නිලධාරීන් 8% (1), කළමනාකරණ/සංවර්ධන සහකාර 25% (6), සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් 40% (2) ඇතුළත් විණි.

සේවාලාභීන් විසින් අදාළ ලිපිලේඛන නො සැපයීම, ඔවුන්ගේ අල්ප උනන්දුව හෝ උනන්දුවක් නො වීම සහ සත්‍යය වසන් කිරීම/නිරවද්‍යතාව තහවුරු කර ගැනීමට කාලය ගතවීම ආදී දුර්වලතා නිසා සේවා සැපයීම ප්‍රමාද වන බව සමස්ත නිලධාරීන්ගෙන් 39% (68)ක් අනාවරණය කළ අතර ග්‍රාම නිලධාරීන්ගෙන් 37.1% (54), ජනපද නිලධාරීන්ගෙන් 50% (6), කළමනාකරණ/සංවර්ධන සහකාරවරුන්ගෙන් 25% (6) සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 40% (2) එයට ඇතුළත් විණි. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් නිසා තමන්ගෙන් සැපයෙන සේවාව ප්‍රමාද වන බව නිලධාරීන්ගෙන් 6.2% (9)ක් සඳහන් කළ හ. එමෙන් ම, තවත් 6.2% (9) බැගින් සඳහන් කරනු ලැබුවේ වසම්වල භූමි ප්‍රමාණය විශාල වීම හෝ වසම් දෙකක රාජකාරි කටයුතු කිරීමට සිදුවීමත්, කාර්යාල පහසුකම්වල පවතින අඩුපාඩුත් හේතුවෙන් සේවා සැපයීම ප්‍රමාද වන බව යි. ඉහත කරුණු ජනපද නිලධාරීන් සහ කළමනාකරණ සහකාරවරුන් වෙතින් ඉදිරිපත් විය.

ඉහත කරුණුවලට අමතරව, සිතියම් සහ මිණුම් රේඛා නො වීම, අනෙකුත් කාර්යාලවලින් සිදුවන ප්‍රමාදයන්, කාර්යාල අතර අන්තර් සම්බන්ධතාවක් නො වීම, ඉඩම් රාජකාරීවල දී තමන්ගේ දැනුවත් භාවයේ පවතින අඩු දුහුඩුකම් ආදිය නිසා සේවා සැපයීම ප්‍රමාද වන බව අනාවරණය කෙරිණි (වගුව 5.7). ආයතන අතර අන්තර් සම්බන්ධතාවත් හි දුර්වලතා හේතුවෙන් සේවා සැපයීම ප්‍රමාද වීමට උදාහරණයක් වශයෙන් තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඳුපැලැන, ගෝඨයිම්බරගම ආදී ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය යටතේ පැවත, දැනට මහවැලි බල ප්‍රදේශ වශයෙන් නම් කර ඇති ප්‍රදේශවලින් ඉදිරිපත් වන ගැටලු පෙන්වා දිය හැකි ය. මෙම ප්‍රදේශවල මහවැලි සහ පළාත් සභා ආදී එක් එක් ආයතනවල බල ප්‍රදේශ නිසි පරිදි සීමා මායිම් වෙන් කර දක්වා නොමැති අතර ඒ හේතුවෙන් එක ම ඉඩම සඳහා 1970/1980 දශකවල දිසාපතිවරයා විසින් එක් පුද්ගලයෙකුට ද, ඉන් පසුව මහවැලි අධිකාරිය විසින් තවත් පුද්ගලයෙකුට ද ඉඩම් බලපත්‍ර/දීමනා පත්‍ර නිකුත් කිරීම ආදී කරුණු මත ගැටලු පැන නැඟී ඇත. මේ නිසා ඉඩම් ආරවුල් මෙන් ම නීත්‍යානුකූල ගැටලු ද පැන නැඟී අතර ඒවා විසඳීම සඳහා නිසි ක්‍රමවේදයක අවශ්‍යතාව පැන නැඟී තිබේ.

වගුව 5.7: සේවා ප්‍රමාදයට බලපාන හේතු

හේතුව	සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව=145)
සේවාලාභීන් විසින් අදාළ ලිපි ලේඛන නොසැපයීම/සත්‍යය වසන් කිරීම	68	39.0
අමතර රාජකාරි පැවරීම	32	17.3
මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය	9	6.2
කාර්යාල පහසුකම්වල පවතින දුර්වලතා	9	6.2
වසම්වල භූමි ප්‍රමාණය විශාලවීම	9	6.2
අන්තර් කාර්යාල සම්බන්ධීකරණ ගැටලු	8	5.5
පැරණි/අත්‍යවශ්‍ය ලිපි ලේඛන නොවීම (සිතියම් ඇතුළත්ව)	19	13.1
නීති සම්බන්ධයෙන් නිලධාරීන් නිසි පරිදි දැනුවත්ව නොසිටීම	8	5.5
නිලධාරීන්ගේ අඩු පළපුරුද්ද	8	5.5
කාර්යාල කළමනාකරණයේ පවතින දුර්වලතා	10	6.9

සටහන: එකම ප්‍රතිචාරියා විසින් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

කාර්යාල කළමනාකරණයේ පවතින දුර්වලතා, විශේෂයෙන් ම වැඩ පැවරීමේ, අධීක්ෂණයේ සහ නිලධාරියෙකුගේ නිවාඩු අවස්ථාවල දී රාජකාරී ආවරණය සඳහා ක්‍රියාත්මක කෙරෙන ක්‍රමවේදයේ පවතින දුර්වලතා නිසා සේවා සැපයීම ප්‍රමාද වන බව නිලධාරීන්ගෙන් 9% ප්‍රකාශ කළ හ.

5.4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩකටයුතු ප්‍රමාදය

විවිධ හේතු නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සේවා සැපයීම ප්‍රමාද වන බව සමස්ත නිලධාරීන්ගෙන් 70.3% (130)ක් ප්‍රකාශ කළ හ. එසේ සඳහන් කළ නිලධාරීන්ගෙන් 21%ක් එයට හේතුව වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව සඳහන් කරනු ලැබිණි. ලිපි ගොනු නිසි පරිදි ගබඩා නො කිරීම සහ නඩත්තු නො කිරීම, රාජකාරියට වඩා පෞද්ගලික කාර්යයන්ට ප්‍රමුඛතාව දීම, නිලධාරීන් නීති සම්බන්ධයෙන් නිසි පරිදි දැනුවත් නො වීම සහ අත්දැකීම් අඩුවීම නිසා මතුවන ගැටලු මෙම තත්ත්වයට පාදක වන බව නිලධාරීන්ගේ අදහස වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සේවා සැපයීම ප්‍රමාද වන බව පැවසූ නිලධාරීන්ගෙන් 25.4%ක් කාර්යාලවල නිලධාරී හිඟය ද, 11.5%ක් කාර්යාලයේ පවතින ලිපි ලේඛන, සටහන් අස්ථානගත වීම ද එයට හේතු වශයෙන් සඳහන් කර ඇත (වගුව 5.8).

පර්යේෂණ කණ්ඩායමේ නිරීක්ෂණ අනුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අදාළ සේවාවන් සැපයීම ප්‍රමාදවීමට හේතු කිහිපයක් බලපා ඇති අතර කළමනාකාරණ දුර්වලතා (වැඩ පැවරීමේ, අධීක්ෂණයේ සහ සේවා ඇගයීමේ ගැටලු), මානව හා භෞතික සම්පත්වල හිඟය, අනෙකුත් ආයතනවලට යැවෙන ලිපි ලේඛන සඳහා පිළිතුරු ලැබීමේ ප්‍රමාදය, නිලධාරීන්ගේ අඩු අත්දැකීම් සහ ඉඩම් නීතිය සම්බන්ධයෙන් වන අඩු දැනුවත් භාවය, මැණුම් කටයුතුවල ප්‍රමාදය ඒ අතර ප්‍රමුඛ වේ. උදාහරණ වශයෙන් ගතහොත් ලුණුගම්වෙහෙර, තිස්සමහාරාම වැනි අන්තර් පළාත් වාරිමාර්ග ඉඩම් මෙන් ම පළාත් සභා මඟින් පරිපාලන කටයුතු සිදුවන ඉඩම් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මධ්‍ය රජයේ සහ පළාත් සභා යන ආයතන දෙකෙහි ම ඉඩම් නිලධාරීන් හෝ ජනපද නිලධාරීහු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමේ නිරත වී සිටිති.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයෙ හි පළාත් සභාවේ ජනපද නිලධාරියෙකු සහ මධ්‍ය ආණ්ඩුවේ ජනපද/ඉඩම් නිලධාරීන් කිහිප දෙනෙකු සේවා නියුක්තව සිටිය ද, එක් එක් ආයතනවලට පැවරෙන භූමි ප්‍රමාණය සලකා බලන විට මධ්‍ය රජයට වඩා වැඩි භූමි ප්‍රමාණයක කටයුතු පළාත් සභාවලට පැවරී ඇති තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවා සේවා සැපයීම සඳහා එම ආයතනවල නිලධාරීන් නිසි පරිදි යොදවා ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක වී නොමැත. සඳුදා සහ බදාදා දිනයන් හි පෙරවරුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය බෙහෙවින් ජනාකීර්ණ වන අතර තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ පළාත් සභා ජනපද නිලධාරීවරයා වටා බොහෝ සෙයින් පිරිසක් එක් රොක් වී සේවා ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් සිටිනු දැකිය හැකි ය. මෙම තදබදය මධ්‍ය රජයේ ජනපද/ඉඩම් නිලධාරීන් සිව් දෙනා වෙත දක්නට නොමැති අතර කට්ටිකරුවන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම වැනි ඉඩම් නිලධාරී/ජනපද නිලධාරීන්ට පමණක් කළ හැකි කාර්යයන්වල දී පළාත් සභා බල ප්‍රදේශවල කටයුතු සඳහා ද, මධ්‍ය රජයේ නිලධාරීන්ගේ සහයෝගය ලබාගැනීම තුළින් සේවා සැපයීම කාර්යක්ෂම කළ හැකි ය. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පරස්පරව අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පළාත් සභා සහ මධ්‍ය රජයේ සහයෝගයක් දැකිය හැකි වේ.

වගුව 5.8: ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සේවා සැපයීම ප්‍රමාදවීමට හේතු

හේතුව	ප්‍රතිචාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව = 130)
නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව අඩුවීම	27	20.8
නිලධාරී හිඟය	33	25.4
ලිපි ලේඛන අස්ථානගතවීම	15	11.5
වෙනත් ආයතනවලට යොමු කිරීමේ දී නැවත ලැබීමේ ප්‍රමාදය	14	10.8
සේවාලාභීන් විසින් අවශ්‍ය ලිපි ලේඛන නො සැපයීම	13	10.0
නිලධාරීන්ගේ අඩු දැනුවත්භාවය	12	9.2
කළමනාකරණ දුර්වලතා (වැඩ පැවරීමේ ක්‍රමවේදයක් නො වීම ඇතුළුව)	11	8.5
උපකරණ හිඟය	11	8.5
ක්ෂේත්‍රයෙන් නිවැරදි වාර්තා නොලැබීම	10	7.7
පසු පැවරුම් ප්‍රකාශ සටහන් කිරීම ඉඩම් නිලධාරීන්ට පමණක් කළ හැකිවීම	6	4.6
මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාද	20	15.4
ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා නිලධාරීන්ගේ සහභාගීත්වය අඩුවීම	7	5.4

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පෙත්වා දූන් අන්දමට එක් මැණුම් නියෝගයක් සඳහා සිහි කැඳවීම් කිහිපයක් යැවීමට සිදු වේ. දිස්ත්‍රික් මැණුම් අධිකාරී කාර්යාලයේ දත්ත අනුව මැණුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාදයක් පවතින බව තහවුරු වේ (වගු අංක 5.9).

වගුව 5.9: මැණුම් සඳහා වන ඉල්ලීම් සහ අදාළ වසර අවසානයේ නිම කිරීමට ඇති සංඛ්‍යාව

වර්ෂය	මුළු ඉල්ලීම් සංඛ්‍යාව	ඉටු කළ සංඛ්‍යාව	ඉටු නො කළ	
			සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
2007	820	741	79	9.6
2008	812	688	124	15.3
2009	654	508	146	22.3
2010	634	413	221	34.8
2011	587	218	369	62.9

මූලාශ්‍රය: දිස්ත්‍රික් මැණුම් අධිකාරී කාර්යාලය, හම්බන්තොට 2011

දැනට දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්තව මැණුම් නිලධාරීහු 29ක් සේවය කරති. වසරකට ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය ඉටු කිරීමට එම සංඛ්‍යාව ප්‍රමාණවත් නො වන බවත්, දිවයින පුරා ම මැණුම් නිලධාරීන්ගේ හිඟයක් ඇති බවත්, දිස්ත්‍රික්කයේ කඩිනම් සංවර්ධන කටයුතු හා බිම් සවිය වැඩසටහන නිසා මේ තත්ත්වය දිස්ත්‍රික්කය තුළ වඩාත් සංකීර්ණ වී ඇති බවත් දිස්ත්‍රික් මැණුම් අධිකාරීවරයා විසින් හෙළි කරන ලදී. වසරකට 50ට සීමා වන සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් පමණක් මෙම තනතුරට බඳවා ගැනීම මෙම නිලධාරී හිඟයට හේතු වී ඇත.

කෙසේ වුව ද, මැණුම් ඉල්ලීම් සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීමට බලපාන හේතුවක් වන්නේ වසර ගණනාවකට පෙර මැණුම් කටයුතු නිමකළ ඉඩම්වලට දීමනා පත්‍ර ලබා නො දීම ය. උදාහරණ වශයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "තම්මැන්නාව" ග්‍රාම නිලධාරී වසමේ ඉඩම් පෙන්වා දිය හැකි ය.

උපකරණ හිඟය නිසා සේවා සැපයීම ප්‍රමාද වන බව තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා එයට අනුබද්ධව සේවය කරන නිලධාරීන් විසින් විශේෂයෙන් පෙන්වා දෙනු ලැබූ කරුණකි. මෙහි දී, විශේෂයෙන් ම සඳහන් කරනු ලැබුවේ දීමනා පත්‍ර යතුරු ලියනය කිරීම සඳහා යෝග්‍ය යතුරු ලියනයක් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නො වීම නිසා දීමනා පත්‍ර සකස් කිරීමේ කාර්යයන් ප්‍රමාද වන බවයි. දැනට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් දීමනා පත්‍ර සඳහා යතුරු ලියනය කළ යුතු ආකෘති පත්‍රය පරිඝනක ආශ්‍රිතව සැකසීමට කටයුතු යොදා ඇතත් නිසි පරිදි මුද්‍රණය කර ගැනීමේ අපහසුව වැනි යම් යම් දුර්වලතා නිසා අදාළ කාර්යාලවල නිලධාරීහු එතරම් කැමැත්තක් නො දක්වති. එමෙන් ම, ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යතුරු ලියන පැවතිය ද යතුරු ලියන හැකියාව සහිත නිලධාරීන් නොමැති වීම නිසා ද දීමනා පත්‍ර සැකසීමේ කටයුතු ප්‍රමාද වේ. අනෙක් අතට යතුරු ලියනය කරන ලද දීමනා පත්‍ර ආකෘතිවල වැරදි අඩුපාඩු නිසා බොහෝ විට අනුමත නො කර නැවත ආපසු එවීම සිදු වේ. මෙයට පිළියමක් වශයෙන් සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීමනා පත්‍ර යතුරු ලියනය කිරීමේ කාර්යය හම්බන්තොට නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්

කාර්යාලය මඟින් සිදු කිරීමට කටයුතු යොදා ඇතත්, එක් නිලධාරිනියක පමණක් එම කාර්යයේ නියුක්ත වීම නිසා එයින් ද අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැත. මධ්‍ය ආණ්ඩුවේ දෙබරවැව ඉඩම් කොමසාරිස් කාර්යාලයේ දැනට පරිඝනක ආශ්‍රිතව දීමනා පත්‍ර සැකසීමේ කටයුතු සිදුවන නමුත් නියමිත තත්ත්වයෙන් ඒවා මුද්‍රණය කර ගැනීමේ යම් අපහසුතා පවතින බව හෙළි විය.

5.4.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රමාදය අවම කිරීමට ඉදිරිපත් කළ යෝජනා

සමීක්ෂණයට භාජනය කරනු ලැබූ නිලධාරීන්ගෙන් 64% (118)ක් විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සැපයෙන සේවා ප්‍රමාදය අඩු කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනා 5.10 වගු සටහනින් දැක් වේ. නිලධාරීන් අතුරින් වැඩි පිරිසක් විසින් ඉදිරිපත් කළ යෝජනාව වන්නේ ඉඩම් අංශය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් ලබා දීම ය. එමෙන් ම, නිලධාරීන් වෙත ඉදිරිපත් කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් හෝ ඒවායේ ප්‍රගතිය සම්බන්ධයෙන් සටහන් වන කිසිදු විධිමත් වැඩපිළිවෙළක් බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නොමැති හෙයින් ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් ද සිදුවන බවක් නො පෙනේ. අනෙක් අතට, ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ දී ජනතාවට වගවීම (Accountability) පිළිබඳ ගැටලු පැන නඟින අතර ලිපි ලේඛන සහ සේවා ඉල්ලීම් භාරගත් බවට පත්‍රිකාවක් නිකුත් කිරීම, සේවා සැපයීම සිදුවන කාල වකවානුව සහ යොමු අංකයක් එම පත්‍රිකාවේ සටහන් කිරීම තුළින් සේවාලාභියාට වගවීම සහතික කිරීම සිදු කළ හැකි බවත් ඒ තුළින් ප්‍රමාදය අඩු කිරීමට හැකිවන බවත් නිලධාරීන්ගෙන් 9%ක් සඳහන් කළ හ.

සේවා සැපයීම ප්‍රමාදවීම කෙරෙහි නිලධාරීන් තුළ වන "නිලධාරීවාදී" මානසිකත්වය ද ඉවහල් වන හෙයින් පුහුණු වැඩසටහන් තුළින් කාර්යාලයීය සේවයේ නියුතු නිලධාරීන්ගේ ආකල්පමය වෙනසක් ඇති කළ යුතු බවත්, බලපෑම්වලින් තොර නිදහස් වාතාවරණයක් තුළ නිලධාරීන්ට තම වැඩ කටයුතු කරගෙන යාමට ඉඩ සැලසිය යුතු බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා ප්‍රමාදය අඩු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා අතර විය.

දීමනා පත්‍ර සැකසීමේ දී, දත්ත සහ තොරතුරු ගබඩා කිරීමේ දී සහ ආයතන අතර තොරතුරු හුවමාරුවේ දී පරිඝනක සහ විද්‍යුත් තැපැල, අන්තර්ජාලය ආදී නවීන තාක්ෂණික ක්‍රමවේදයන් යොදා ගැනීම තුළින් ප්‍රමාදය අවම කර කඩිනම් සේවාවන් සැපයීමේ ක්‍රමවේදයක් සකසා ගැනීමට හැකි බව කාර්යාලයීය ප්‍රමාදයන් වළක්වා ගැනීම සම්බන්ධයෙන් අදහස් දැක් වූ නිලධාරීන්ගෙන් 4%ක් සඳහන් කළ හ. මෙවන් ක්‍රමවේද භාවිතය තුළින් ප්‍රමාදය වළක්වා ගැනීමට අමතරව නිවැරදි සහ යාවත්කාලීන දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමටත්, අදාළ පාර්ශවවලට එම තොරතුරු වෙත ක්ෂණයකින් පිවිස නිරවද්‍යතාව තහවුරු කර ගැනීමටත් හැකියාව ලැබෙන අතර ම රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන අවිධිමත් ගනුදෙනු සහ වංචා වැළැක්වීමට ද මෙය මහඟු පිටිවහලක් වනු ඇත. "ඩිජිටල් සිටි" ආයතනයේ මැදිහත්වීමෙන් දැනට හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බුන්දල ග්‍රාම නිලධාරිවරයා මෙවන් වැඩසටහනක් ආරම්භ කර සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යන නමුත් ඔහු විසින් පෙන්වා දෙනු ලැබූ අන්දමට ඉඩම් හෝ වෙනත් අංශයක සේවා සැපයීමේ දී එකී දත්ත පද්ධතිය වෙත අදාළ අනෙකුත් පාර්ශව/නිලධාරීන් ප්‍රවේශවීමක් දැනට සිදු නො වන අතර ම සම්ප්‍රදායික ලිපි ලේඛන

මඟින් කරුණු සනාථ කිරීමේ අවශ්‍යතාව ඉටු කිරීමට සිදුව ඇත. මේ නිසා, නූතන තාක්ෂණයට අනුගත වූව ද එය ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන යාවත්කාලීන කිරීමත්, නිලධාරීන් ඒ සඳහා හුරු කිරීමත් කළ යුතු ව තිබේ.

වගුව 5.10: ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට නිලධාරීන් විසින් ඉදිරිපත් කළ යෝජනා

යෝජනාව	ප්‍රතිචාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව = 118)
ඉඩම් අංශය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් ලබාදීම	32	27
ඉහළ නිලධාරීන් විසින් ක්‍රමානුකූල අධීක්ෂණයක් සිදු කිරීම/කාර්යයන් ඇගයීම	18	15
ඉඩම් නීතිය සහ සේවා ලබාදීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම	17	14
නව නිලධාරීන් සඳහා ක්‍රමවත් පුහුණුවක් ලබාදීම/පළපුරුදු නිලධාරීන් යෙදවීම	17	14
නිලධාරීන් අතර නිසි වැඩ පැවරීමක් පැවතීම සහ මනා සම්බන්ධතාවක් ගොඩනැගීමට කටයුතු කිරීම	13	11
නව නීති සම්බන්ධයෙන් නිලධාරීන් නිසි පරිදි දැනුවත් කිරීම	16	13
නිලධාරීන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම	7	6
අවශ්‍ය උපකරණ ලබාදීම	7	6
ජනතාවට වගවීම තහවුරු කිරීමේ ක්‍රමවේදයක් සැකසීම	11	9
ඉඩම් රාජකාරි සඳහා ප්‍රාදේශීයව වැය කරන කාලය වැඩි කිරීම	7	6
අනෙකුත් ආයතනවලින් සිදුවන ප්‍රමාදය අඩු කිරීම	4	3
නවීන තාක්ෂණික ක්‍රම භාවිතය	5	4
නීති සංශෝධනය කිරීම	5	4

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

5.5 පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ප්‍රමාද

පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ යම් යම් දුර්වලතා නිසා සේවා සැපයීම ප්‍රමාද වන බව ප්‍රශ්නාවලිය ඇසුරින් තොරතුරු ලබාදුන් නිලධාරීන්ගෙන් 84% (123)ක් සඳහන් කළ හ. පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලවල ප්‍රමාදයට හේතු වශයෙන් නිලධාරීන් සඳහන් කළ කරුණු වගු අංක 5.11න් ඉදිරිපත් කෙරේ.

වගුව 5.11: පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ කාර්යයන් ප්‍රමාදයට හේතු

හේතුව	ප්‍රතිචාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව =123)
ලැබෙන සේවා ඉල්ලීම් සංඛ්‍යාව සපුරාලීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නො වීම	28	22.8
නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවක් නො වීම	40	32.5
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් එවන ලිපි ලේඛන අස්ථානගත වීම	24	19.5
කාර්යාල කළමනාකරණ දුර්වලතා	16	13.0
ප්‍රමාදයන් පවතින නමුත් හේතු නො දනී	32	26.0
ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් නො වීම	12	9.8
මූල්‍ය ප්‍රතිපාදන හිඟය	04	3.2
වෙනත්	08	6.5

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් අවශ්‍ය සේවාවන් සැපයීම ප්‍රමාද වන බව පැවසූ නිලධාරීන්ගෙන් 1/3 ආසන්න සංඛ්‍යාවක් එයට හේතු වශයෙන් නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව සඳහන් කළ හ. එමෙන් ම, මෙම කාර්යාලවලින් සේවා ප්‍රමාද වන නමුත් එයට නිශ්චිත හේතුවක් නො දන්නා බව නිලධාරීන්ගෙන් 1/4ට ආසන්න සංඛ්‍යාවක් සඳහන් කරනු ලැබිණි. එයට හේතුව වන්නේ, රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවාවන් සැපයීමට සම්බන්ධ වන නිලධාරීන්ගෙන් අති බහුතරය මධ්‍ය රජයට අයත්වීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පළාත් සභා ආයතන වෙත ඉදිරිපත් කෙරෙන සේවා ඉල්ලීම් සම්බන්ධයෙන් එම ආයතන ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් නිලධාරීන්ට අවබෝධයක් නො වීමත් ය.

සේවා සැපයීම සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශව වෙත ඉදිරිපත් කෙරෙන ප්‍රබල චෝදනාවක් වන්නේ සේවාලාභීන් විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛන රාජ්‍ය/පළාත් සභා ආයතනවල දී අස්ථානගත වීමයි. පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලවල දී ද මෙය සිදුවන හෙයින් සේවා සැපයීම දිගින් දිගටම ප්‍රමාද වන බව නිලධාරීන්ගෙන් 20%කට ආසන්න ප්‍රමාණයක් සඳහන් කරනු ලැබිණි. බොහෝ විට අනවසර ඉඩම් නියමානුකූල කිරීමේ දී ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සම්පූර්ණ කර එවන ලද 20 (අ) ආකෘති පත්‍ර විශාල සංඛ්‍යාවක් අස්ථානගත වී ඇති බවත්, ඒ නිසා නැවත නැවත එම ආකෘති පත්‍ර සම්පූර්ණ කර යැවීමට සිදු වූ බවත්, ග්‍රාම නිලධාරීන් මෙන් ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශයේ නිලධාරීහු විසින් ද පෙන්වා දුන් හ. මෙවන් වාතාවරණයක් තුළ අනවසර ඉඩම් නියමානුකූල කිරීම නතර කිරීම නිසා ඇතැම් සේවාලාභීන්ට දැඩි අසාධාරණයක් සිදු වූ බවත්, එක් කොටසකට ඉඩම් බලපත්‍ර ලැබී තවත් කොටසකට බලපත්‍ර නො ලැබී යාම තුළින් ජනිත කළ

අසමානතාව හේතුවෙන් ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට තම රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදු වී ඇති බවත් අනාවරණය විය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සම්පූර්ණ කර එවන සේවා ඉල්ලීම් ලද බවට හෝ ඒවා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ පළාත් සභා ආයතන විසින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමක් නො කරන බවත්, ආයතන අතර සම්බන්ධීකරණයේ දුර්වලතා නිසා සේවා සැපයීම ප්‍රමාද වන බවත් නිලධාරීන්ගෙන් 9.8%ක් පවසන ලදී. දිස්ත්‍රික්කයේ ම සේවා ඉල්ලීම් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයටත් දිස්ත්‍රික් තුනෙහි ම ඉල්ලීම් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයටත් ලැබීම නිසා එක් ආයතනයක් වෙත විශාල ඉල්ලීම් ප්‍රමාණයක් යොමු වේ. එසේ වුව ද, ඒවා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේ දී විධිමත් වැඩ පිළිවෙළක් සකසා නො තිබීමෙන් සේවා ඉල්ලීම් නො විසඳා ගොඩ ගැසීම සිදුවන බව නිලධාරීන්ගෙන් 23%ක් සඳහන් කරනු ලැබිණි. එමෙන් ම, සේවා සැපයීම ප්‍රමාදවීමට බලපානු ලබන වෙනත් හේතු වශයෙන් නිලධාරීන් වෙත එල්ල වන දේශපාලන බලපෑම්, සේවාලාභීන්ගේ නො සැලකිල්ල සහ පසු විපරමක් නො කිරීම, අත්දැකීම් සහිත නිලධාරීන්ගේ හිඟය, ජනපද නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් විසින් එකිනෙකට පරස්පර වාර්තා ඉදිරිපත් කිරීම ආදිය සඳහන් කරනු ලැබිණි.

5.6 පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ප්‍රමාදය වැළැක්වීමට කළ යෝජනා

පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් සිදුවන ප්‍රමාදය අවම කිරීමට නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 5.12 වගු සටහනින් දැක් වේ. එයට අනුව, නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ ප්‍රමුඛතම කාරණය වන්නේ පළාත් සභාවේ ඉඩම් අංශයට සම්බන්ධ සේවාවන් සැපයීමේ නියුක්ත නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට කිසියම් නව ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු බව යි. මෙහි දී විශේෂයෙන් ම සඳහන් කළ කරුණක් වූයේ නිලධාරීන්ගේ වැඩකටයුතු සහ සේවා සැපයීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් පැවතිය යුතු බව යි. එමෙන් ම, අදාළ ආයතන වෙත ඉල්ලීම් ඉදිරිපත් වන අනුපිළිවෙළ අනුව එම ඉල්ලීම් ඉටු කිරීමටත්, නියමිත කාල රාමුවක් තුළ එම සේවාවන් සැපයීමට ක්‍රමවේදයක් සැකසීමත් කළ යුතු බව ඉහත යෝජනාවට අදාළව ඉදිරිපත් කළ අනෙකුත් කරුණු වේ.

වගුව 5.12: පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ප්‍රමාද වැළැක්වීමට ඉදිරිපත් කළ යෝජනා

යෝජනාව	ප්‍රතිචාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව=73)
කාර්යක්ෂමතාව වැඩි කිරීමට නව ක්‍රමවේදයක් හඳුන්වාදීම	24	33.3
නිලධාරීන් සංඛ්‍යාව වැඩි කිරීම	12	16.7
ප්‍රාදේශීය ලේකම්/පළාත් සභා වෙත බලය විමධ්‍යගත කිරීම	13	18.0
ජනතාවට වගවීම සම්බන්ධයෙන් නිලධාරීන්ට පුහුණුවක් ලබාදීම	7	9.7
ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ගොඩ නැංවීම	9	12.5
පුළුල් ක්‍රමවේදයක් තුළින් ජනතාව දැනුවත් කිරීම	4	5.5
කොට්ඨාස මට්ටමට පැමිණ ගැටලු විසඳීම	5	6.9
දේශපාලන මැදිහත්වීමක් සිදු කිරීම	2	2.8
ප්‍රමාණවත් සම්පත් සපයාදීම	4	5.5
තොරතුරු/දත්ත පද්ධතිගත කිරීම	2	2.8
පළාතට උචිත ක්‍රමවේදයක් සැකසීම	2	2.8
නිලධාරීන්ගේ ස්ථාන මාරු සඳහා නිසි ක්‍රමවේදයක් සැකසීම	2	2.8

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

5.7 සමස්තයක් ලෙස සේවාව කාර්යක්ෂම කිරීමට නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ යෝජනා

දැනට පළාත් ඉඩම් කොමසාරිස් වෙත පවතින බලය ප්‍රාදේශීය ලේකම් වෙත විමධ්‍යගත කිරීම ප්‍රමාදය වැළැක්වීමේ ක්‍රමවේදයක් ලෙස නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ යෝජනාවකි. කෙසේ වූව ද, දැනට ද ඉඩම් සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ බලතල ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලතල පැවරීමේ පනත යටතේ විමධ්‍යගත කර ඇත. එමෙන් ම, මේ වන විට ද ජාතික මට්ටමේ අමාත්‍යාංශවල කටයුතු ප්‍රාදේශීය මට්ටමේ දී සම්බන්ධීකරණය කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රාදේශීය ලේකම්ගේ කාර්ය බහුලත්වය මත ඔහු/ඇය වෙත තවදුරටත් ඉඩම් සම්බන්ධයෙන් බලතල පැවරීම තුළින් කාර්යක්ෂම සේවාවක් සැපයිය හැකිවේ ද? යන්න ගැටලු සහගත ය. නිලධාරීන්ගෙන් 7%ට ආසන්න ප්‍රමාණයක් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්වරයා ප්‍රාදේශීය මට්ටමට පැමිණ ගැටලු විසඳීමට දායක වීම තුළින් පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් සිදුවන ප්‍රමාදය අඩු කර ගැනීමට අවස්ථාව සැලසෙන බව සඳහන් කළ හ. මෙහි දී, ඉඩම් සම්බන්ධිත සේවා සැපයීමට දායක වන සියලු නිලධාරීන් එක් ස්ථානයකට රැස්ව

කොට්ඨාස දින හෝ ජංගම සේවා පැවැත්වීමත්, පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් එම අවස්ථාවට සහභාගී වී ඉල්ලීම්වලට අදාළව පළාත් සභාවෙන් ඉටු විය යුතු කාර්යයන් එම අවස්ථාවේ දී ම ඉටු කිරීමත් තුළින් ප්‍රමාදය බොහෝ දුරට වළක්වා ගැනීමට හැකි වේ. එමෙන් ම, මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ ඇතැම් නිලධාරීන් පෙන්වා දුන් අන්දමට නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් මාසයකට වරක් එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණ ලිපිගොනුවල කටයුතු අවසන් කිරීම තුළින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් පළාත්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාල වෙත සේවා ඉල්ලීම් ලිපි ගොනු යැවීමේ දී සිදුවන ප්‍රමාදය වළක්වා ගැනීමටත්, ලිපි ගොනු එක ස්ථානකට ගොඩගැසීම වළක්වා ගැනීම සඳහාත් අවස්ථාව උදා වේ.

වගුව 5.13: සමස්තයක් ලෙස ඉඩම් විෂයයෙ හි සේවාව කාර්යක්ෂම කිරීමට නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ යෝජනා

යෝජනාව	ප්‍රතිචාරීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (සංඛ්‍යාව=165)
ඉඩම් නීති සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම	40	24.2
තුන්වැනි උප ලේඛනය සංශෝධනය කිරීම	43	26.1
ජනතාවට වගවීමේ ක්‍රමවේදයක් සැකසීම	15	9.1
බලයලත් මිනින්දෝරු නිලධාරීන්ට කොන්ත්‍රාත් පදනම මත කටයුතු කිරීමට අවසර දීම	14	8.5
අනවසර නියමානුකූල කිරීම නැවත ආරම්භ කිරීම	15	9.1
ප්‍රමාණවත් අන්දමින් නිලධාරීන් ලබාදීම	14	8.5
නිලධාරීන් සඳහා අඛණ්ඩ පුහුණුවීමේ ක්‍රමවේදයක් පවත්වාගෙන යාම	13	7.9
මධ්‍යම තොරතුරු ඒකකයක් සකස් කිරීම	12	7.3
ඉහළ නිලධාරීන්ගේ අධීක්ෂණයන් නිරන්තරයෙන් පවත්වාගෙන යාම	19	11.5
ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම	15	9.1
වසමේ ගැටලු විසඳීම සඳහා ග්‍රා.නි. ට වැඩි බලතල දීම	9	5.4
ජංගම සේවා පැවැත්වීම	13	7.9
පළාත් ඉඩම් කොමසාරිස් බලය ප්‍රාදේශීය ලේකම් වෙත විමධ්‍යගත කිරීම	15	9.1
නිලධාරීන්ගේ සේවය ඇගයීමට ලක් කිරීම	6	3.6
නිලධාරීන් අතර කාර්යයන් බෙදීයාමේ වැඩපිළිවෙළක් සැකසීම	5	3.0
ක්ෂේත්‍ර කටයුතු කඩිනමින් ඉටු කිරීමට ක්‍රමවේදයක් සැකසීම	5	3.0

සටහන: එක ම ප්‍රතිචාරියා විසින් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නො වේ.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණ, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

5.8 කාර්යක්ෂමතාව වර්ධනය සඳහා සේවාලාභීන් ඉදිරිපත් කළ යෝජනා

කඩිනමින් සේවා ලබා ගැනීම සඳහා සේවාලාභීහු යෝජනා රාශියක් ඉදිරිපත් කළ හ. ඉන් වැඩි ම පිරිසක් එනම්, 17.4% (54)ක් ආයතනවල කාර්යක්ෂමතාව වර්ධනය සඳහා කිසියම් ක්‍රමවේදයක් අනුගමනය කළයුතු බව පැවසුවත් ඒ කෙසේ ද? කුමක් ද? යන්න ඉදිරිපත් නො කළ හ. කෙසේ වුව ද, සේවාලාභීන්ගෙන් 7.4% (23)ක් පෙන්වා දෙනු ලැබුවේ ඉහළ නිලධාරීන් විසින් පහළ නිලධාරීන් නිරන්තර අධීක්ෂණයකට ලක් කළ යුතු බවයි.

එමෙන් ම, තවත් 6.7% (21)ක් නිලධාරීන්ගේ සේවයට වන කැප වීම වර්ධනය කළ යුතු බවත්, 5.5% (17)ක් නිලධාරීන්ගේ ආකල්පමය වෙනසක් ඇති කළ යුතු බවත් පැවසූහ. සේවාලාභීන්ගෙන් 8.4% (26)ක් සඳහන් කරනු ලැබුවේ නිලධාරීන් විනිවිදභාවයකින්, අපක්ෂපාතීව සහ සාධාරණව කටයුතු කිරීමෙන් සියලු දෙනාට සාධාරණ අන්දමින් කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීමට අවස්ථාව සැලසෙන බවයි. කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා සේවාලාභීන් විසින් සඳහන් කළ තවත් යෝජනාවක් වූයේ ප්‍රාදේශීය හෝ ග්‍රාමීය මට්ටමින් ජනතාව දැනුවත් කිරීම කළ යුතු බවයි. එයට හේතු වූයේ තම ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ආයතන සහ නිලධාරීන් පිළිබඳ ජනතාවට පවතින දැනුවත් භාවය ප්‍රමාණවත් නො වීම නිසා අවශ්‍ය ලිපි ලේඛන ඉදිරිපත් නො කිරීම, අදාළ නො වන ආයතන හෝ නිලධාරීන් වෙත සේවා ඉල්ලීම් ඉදිරිපත් කිරීම වැනි කටයුතු නිසා සේවා සපයා ගැනීමේ ප්‍රමාදයක් සිදු වීම ය. කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනයට ලක් කළ යුතු බව සේවාලාභීන්ගෙන් 8.4% (26)ක මතය විය. නිලධාරීන් වගකීමෙන් සහ නීති ගරුකව කටයුතු කිරීමෙන් ප්‍රමාදය වළක්වා ගත හැකි බව සේවාලාභීන්ගෙන් 7.4% (23)ක් යෝජනා කළහ. අදාළ සියලු දත්ත ලේඛනගත කිරීම (0.6%), නවීන තාක්ෂණය භාවිතා කර කාර්යයන් පහසු කිරීම (3.5%), ඉඩම් පවරා ගැනීමට පෙර ජනතාවට අදාළ සහ අවශ්‍ය පහසුකම් සැපයීම (0.6%) බිම් සවිය වැඩසටහන නතර කිරීම (0.6%), තොරතුරු ගලා යාම ක්‍රමවත් කිරීම (1.0%) ග්‍රාමීය මට්ටමින් හෝ ප්‍රාදේශීය මට්ටමින් ගැටලු විසදීම සඳහා ක්‍රමවේදයක් සැකසීම (3.8%) එනම් ග්‍රාමීය මට්ටමට පැමිණි ඉඩම් කොට්ඨාස දින පවත්වා ගැටලු නිරාකරණය කිරීම ඒ අතර විය.

5.9 සාරාංශය

සේවාලාභීන් විසින් ඉල්ලුම් කරනු ලබන සේවාව ලබාදීමේ ප්‍රමාදයක් පවතින අතර බොහෝ සේවාලාභීහු තම ගැටලු නිලධාරීන් කිහිපදෙනෙකුට හෝ ආයතන කිහිපයකට ඉදිපත් කිරීම මෙන් ම එක ම නිලධාරියා හෝ ආයතනය වෙත කිහිප වරක් ඉදිරිපත් කිරීම සාමාන්‍ය ලක්ෂණයක් බවට පත්ව ඇත. සේවාලාභීන්ගෙන් 5% (24)ක් තම ගැටලු නිලධාරීන් මෙන් ම දේශපාලනඥයින් වෙත ද ඉදිරිපත් කර ඇත. 2010 සහ 2011 වසරවල දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානවලට ලැබුණු සුළු පැමිණිලිවලින් 15%ට ආසන්න ප්‍රමාණයක් ඉඩම් සම්බන්ධයෙන් පැමිණිලි වූ අතර එම ගැටලුවලින් 70%ට ආසන්න ප්‍රමාණයක් පොලීසිය විසින් සමථකරණය කර තිබිණි.

අධ්‍යයනයට තොරතුරු ලබාදුන් නිලධාරීන්ගෙන් 79%ක් තමන් විසින් සපයන සේවාව කුමන හෝ කරුණක් නිසා ප්‍රමාදයට ලක් වන බව සඳහන් කළ හ. නිලධාරීන්ට අමතර රාජකාරි පැවරීම, සේවාලාභීන් විසින් නිසි පරිදි ලිපි ලේඛන ඉදිරිපත් නො කිරීම, මැණුම් කටයුතුවල ප්‍රමාදය, කාර්යාල පහසුකම්වල පවතින අඩුපාඩු, ආයතන අතර සම්බන්ධීකරණ දුර්වලතා, සේවා සැපයීමේ සංකීර්ණ සහ දිගු ක්‍රමවේදය, තුන් වැනි උපලේඛනය සහ අවම බෙදුම් සීමාව නිසා පැන නඟින ගැටලු මෙන් ම ලිපි ලේඛන අස්ථානගතවීම ආදී හේතු රාශියක් සේවා ප්‍රමාදය සඳහා හේතු වේ. ග්‍රාම නිලධාරීන් වෙත පසුගිය වසර තුළ ඉදිරිපත් කළ ඉල්ලීම්වලින් 78.5% කටයුතු අවසන් කර අදාළ ආයතන වෙත යොමු කර ඇති අතර 5.5%ක් විවිධ අඩුපාඩු නිසා නැවත සේවාලාභියා වෙත භාර දී ඇත. ඉතිරි 16% සම්බන්ධයෙන් කටයුතු කර නොමැත. ජනපද නිලධාරී/ඉඩම් නිලධාරී වෙත ඉදිරිපත්ව ඇති ඉල්ලීම්වලින් 37.5%ක වැඩකටයුතු අවසන් කර හෝ අදාළ ආයතන වෙත ඉදිරිපත් කර ඇති අතර 3% අඩුපාඩු නිසා නැවත හරවා යවා ඇත. ඉතිරි 59.5% නො විසඳුණු ගැටලු ලෙස ඉඩම් අංශයේ පවතී.

හය වැනි පරිච්ඡේදය

සේවා සැපයීමේ ක්‍රියාදාමය තුළින් සේවාලාභීන් වෙත සිදු කරන සමාජ-ආර්ථික බලපෑම

6.1. හැඳින්වීම

මෙම පරිච්ඡේදය මඟින් ඉඩම් සම්බන්ධ සේවා සැපයීම තුළින් සේවාලාභීන් වෙත සිදු කරන සමාජ ආර්ථික බලපෑම විග්‍රහ කරනු ලැබේ. ඒ අනුව, ඉඩම් සම්බන්ධ නෛතික රාමුව, සේවා සපයන ආයතන, යොදාගන්නා ක්‍රමවේදය, සේවා සපයන ඇතැම් නිලධාරීන් තුළ පවතින විවිධ දුර්වලතා හේතුවෙන් සේවාලාභීන් මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු සහ දුෂ්කරතා මෙන් ම මානසික වශයෙන් සේවාලාභීන්ට සිදුවන බලපෑම පිළබඳව ද විමසා බැලීමක් කරනු ලැබේ.

6.2. සේවා සැපයීමේ දුර්වලතා හේතුවෙන් සේවාලාභීන් මුහුණ දෙන දුෂ්කරතා

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමේ දී යම් ප්‍රමාදයන් සිදුවීම හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ බහුලව දක්නට ලැබෙන තත්ත්වයකි. පවතින නෛතික රාමුවේ හා ආයතනික ව්‍යුහයේ සිට ඇතැම් නිලධාරීන්ට නියමිත රාජකාරි සිදු කිරීම සම්බන්ධ පවතින ගැටලු දක්වා පරාසයක විහිදී යන හේතු මේ සඳහා බහුවිධ ආකාරයෙන් දායකත්වයක් සපයා ඇත. ඇතැම් විට, සේවාලාභීන්ගේ ක්‍රියාකලාප සහ ඔවුන්ගේ නො දැනුවත්කම ද ඉඩම් සම්බන්ධ සේවා සැපයීම යම් ප්‍රමාණයකට ප්‍රමාද වීමට දායක වී ඇති බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අනාවරණය විය. කෙසේ වෙතත්, ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ අකාර්යක්ෂමතාව සහ සේවා සැපයීමේ දුර්වලතා නිසා සිදුවන විවිධ ආකාරයේ සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ මානසික ගැටලුවලට ගොදුරු වන ප්‍රධාන පාර්ශවය වන සේවාලාභීන්ගේ අදහස්වලට අනුව ඉඩම් සම්බන්ධ රාජකාරි අකාර්යක්ෂමව සිදුවීම සම්බන්ධයෙන් ප්‍රධාන චෝදනාව ඒ සම්බන්ධව සේවා සපයන ආයතන හා නිලධාරීන් වෙත එල්ල වේ. ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ පරිදි සමස්ත නියැදියෙන් 83% (401) ක් වූ සේවාලාභීන් ඉඩම් සම්බන්ධ සේවා සැපයීම නිසි ලෙස සිදු නො වීමෙන් හා සේවා සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් කිසියම් ආකාරයක සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ මානසික දුෂ්කරතාවලට හෝ අවාසි සහගත තත්ත්වයකට මුහුණ පා ඇත. අධ්‍යයනයට ලක් කරන ලද සියලු ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මෙම තත්ත්වයට පත් වූ සේවාලාභීන්ගේ ප්‍රතිශතය 75%ට වඩා ඉහළ මට්ටමක පැවතීම ගැටලුවේ ඇති ප්‍රබලත්වය සනාථ කරයි.

ප්‍රස්තාර 6.1: ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ දුර්වලතා නිසා දුෂ්කරතාවන්ට මුහුණ දුන් සේවාලාභීන් (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන්)



මූලශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

අධ්‍යයනයට ලක් කරන ලද අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා සසඳා බලන කල, මහවැලි සංවර්ධන බලප්‍රදේශ කිහිපයක් ඇතුළත් සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් සම්බන්ධ සේවා සැපයීම නිසි ලෙස සිදු නො වීම හා සේවා සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් කිසියම් ආකාරයක සමාජ, ආර්ථික, සංස්කෘතික හෝ මානසික දුෂ්කරතාවකට මුහුණ පා ඇති සේවාලාභීන් 89.1% ක් තරම් ඉහළ ප්‍රතිශතයකි. මහවැලි අධිකාරියේ ඉඩම් සම්බන්ධ සේවා සපයන ඇතැම් නිලධාරීන් තුළ රාජකාරි ඉටු කිරීමේ දී දැඩි අකාර්යක්ෂමතාවක් පවතින බවටත්, ඔවුන් විසින් ඉඩම් සම්බන්ධයෙන් වන රාජකාරිමය වගකීම පැහැර හැරීම සිදු වන බවටත්, එම ප්‍රදේශවල බහුතර සේවාලාභීන්ගෙන් චෝදනා එල්ල විණි.

ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හෙළි වූ අන්දමට අදාළ ප්‍රදේශවල බහුතර සේවාලාභීහු ඒ පිළිබඳ දැඩි විරෝධයකින් පසු වෙති. මේ සඳහා හේතු කිහිපයක් බලපා තිබේ. එනම්, මහජන දිනයේදී පමණක් ඇතැම් නිලධාරීන් හමුවීමට හැකිවීම, ඇතැම් නිලධාරීන්ගේ නිෂේධනාත්මක නිලබලතාන්ත්‍රික හැසිරීම් සහ ජනතා ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී පවතින පෞද්ගලික දුර්වලතා බලපා ඇත. එමෙන් ම, ඇතැම් මහවැලි බල ප්‍රදේශවල අනවසර අත්පත් කර ගැනීම් ඉහළ මට්ටමක පවතින හෙයින් ජනතාව සහ නිලධාරීන් අතර හටගන්නා ආරවුල් සහගත තත්ත්වයන් ද ඉහත කී තත්ත්වයට හේතු සාධක වී තිබේ.

එමෙන් ම, කඩිනමින් සංවර්ධනයක් සිදු වන හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවාලාභීන්ගෙන් 85%ක් ද, තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවාලාභීන්ගෙන් 84%ක් ද, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවාලාභීන්ගෙන් 77.1%ක් ද,

අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවාලාභීන්ගෙන් 79.3%ක් ද, ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ දුර්වලතා නිසා කිසියම් ආකාරයක සමාජ, ආර්ථික, සංස්කෘතික ගැටලුවකට හෝ මානසික දුෂ්කරතාවකට හෝ අවාසි සහගත තත්ත්වයකට මුහුණ පෑ බව පවසා සිටිය හ (ප්‍රස්තාර 6.1).

වගුව 6.1: ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ දුර්වලතා හේතුවෙන් සේවාලාභීන් මුහුණ පා ඇති අවාසි සහ ගැටලු සහගත තත්ත්වයන්

ගැටලුව	ගැටලුවට මුහුණ දුන් සේවාලාභීන් සංඛ්‍යාව	ප්‍රතිශතය (%) (සංඛ්‍යාව=486)
කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමේ දී මතුවන ගැටලු	81	16.6
මානසික ප්‍රශ්නයකට ගොදුරුවීම/මානසික අපහසුතා	156	32.0
නීත්‍යානුකූල ගැටලු	144	29.0
යටිතල පහසුකම් ලබා ගැනීමේ අපහසුව	36	7.4
ආර්ථිකමය වශයෙන් අවාසි සහගත තත්ත්වයන් ඇතිවීම	96	19.7
ණය ලබා ගැනීමට නො හැකිවීම/අපහසුතා ඇතිවීම	52	10.7
දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේ දුෂ්කරතා	24	5.0
ඉඩම් ආරවුල් පැන නැඟීම	25	5.1
සමාජයීය වශයෙන් අසරණ බවට පත්වීම	14	2.8
දෛනික ජීවිතයේ කටයුතු අඩාල වීම	18	3.7
වන්දි ලබා ගැනීම සම්බන්ධව ගැටලු පැන නැඟීම	8	1.6
වෙනත්	14	2.9

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව ඉඩම් සම්බන්ධ සේවා සැපයීම නිසි ලෙස සිදු නො වීම හා ප්‍රමාද වීම හේතුවෙන් සේවාලාභීන්ගෙන් 32%ක් මානසික ගැටලු හෝ අවාසි සහගත තත්ත්වයට ගොදුරු වී ඇති අතර සේවාලාභීන්ගෙන් 29.6%ක් ඉඩම් සම්බන්ධව පසු උරුමකරුවන් නම් කිරීමට නො හැකි වීම, ඉඩම් පැවරීමට හෝ භුක්තිය තහවුරු කර ගැනීමට නොහැකි වීම ආදී විවිධ නීත්‍යානුකූල ගැටලුවලට මැදි වී සිටිති. සේවාලාභීන්ගෙන් 19.7%ක් සෘජු හා වක්‍ර ලෙස ආර්ථිකමය වශයෙන් අවාසි සහගත තත්ත්වයන්ට පත්ව ඇති අතර 16.6%ක් කෘෂිකාර්මික කටයුතු සිදුකිරීමේ දී මතුවන විවිධ ගැටලුවලට මුහුණ දී ඇත. එමෙන් ම, තවත් සේවාලාභීන් පිරිසක් ණය ලබා ගැනීමේ අපහසුතාවලට මුහුණ දීම (10.7%), යටිතල පහසුකම්වලට ප්‍රවේශ වීමේ අපහසුව (7.4%), දරුවන් පාසැලට ඇතුළත් කර ගැනීමේ දුෂ්කරතා (5%) හා ඉඩම් සම්බන්ධ ආරවුල් පැන නැගීම (5.1%) සේවා සැපයීම ප්‍රමාද වීම නිසා ඇති වූ අවාසි සහගත

තත්ත්යත් ලෙස දැක්වූ හ. මෙහිදී වෙනත් ගැටලු (2%) ලෙස සඳහන් කරන ලද්දේ ඉඩම් ගැටලුවට විසඳුමක් නො වීම නිසා හා ආරවුල් ඇතිවීම මත ඇතිවන පීඩාකාරී වාතාවරණය තුළ අධි රුධිර පීඩනය වැනි රෝගාබාධ තත්ත්වයන් හට ගැනීමත්, පවතින රෝග උග්‍ර අතට පත්වීමත් නිසා ඇතිවන මානසික පීඩනය හා මෙතෙක් භුක්ති විඳි ඉඩම් ප්‍රමාණය අඩුවීමත්, සීමා මායිම් වෙන් කර ගැනීමට සිදුවීමත් ය.

6.3 ඉඩම් සම්බන්ධ නීත්‍යානුකූල ගැටලු පැන නැඟීම හේතුවෙන් සිදුවන සමාජ ආර්ථික ගැටලු

6.3.1 සමාජමය ගැටලු

ඉඩම් ආඥා පනතේ තුන්වන උප ලේඛනයේ සඳහන් අන්දමට ඉඩමක පසු අයිතිය පැවරීම හා ඉඩමේ අවම බෙදුම් ඒකකය පිළිබඳ නෛතික විධි විධානවලට අනුව රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේ දී බොහෝ සේවාලාභීන් විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. සේවාලාභීන්ගේ ගැටලු පිළිබඳ විමසීමේ දී පෙනී ගියේ නව බලපත්‍ර හා දීමනා පත්‍ර ලබා ගැනීම, ඉඩම් අයිතිය පැවරීම, පසු අයිතිය නම් කිරීම හා වෙනස් කිරීම, ඉඩම් උකස් කිරීම හා අලුතින් ඉඩම් කැබැල්ලක් ලබා ගැනීම ආදී ගැටලු මේ අතර ප්‍රධාන වන බව ය.

ඇතැම් මහවැලි ඉඩම් ඇතුළු රජයේ ඉඩම් බොහොමයක් භුක්ති විඳිනු ලබන්නේ මුල් ඉඩම් හිමියන්ගේ දෙවන, තුන්වන හෝ හතරවන පරම්පරාව විසිනි. මෙලෙස පරම්පරා අතර ඉඩම් බෙදී යාමේ දී බහුතර ඉඩම්වල භූමි ප්‍රමාණය කුඩා වීම බොහෝ ඉඩම්වලට පොදු කරුණක් විය. මෙම පසුබිම යටතේ අවම බෙදුම් ප්‍රමාණය රැකෙන ආකාරයට පවතින ඉඩම් පවුලේ සාමාජිකයන් සියලු දෙනා හට බෙදා දීමේ දී ගැටලු සහගත තත්ත්වයන් ඇති වන අවස්ථා දක්නට ලැබිණි. ඉඩමේ ප්‍රමාණය කුඩා වීම නිසා පවුලේ දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකුට වඩා වැඩි වන විට ඉඩමේ පසු අයිතිය පැවරීම වඩා සංකීර්ණ කාර්යයක් වී ඇති අතර අවම ඉඩම් සීමාව හේතුවෙන් දරුවන් සියල්ලට ම පසු අයිතිය පැවරීමට නො හැකි වීම හේතුවෙන් ඇතැම් සේවාලාභීන් පසු අයිතිය නො පවරා ම මිය ගිය අවස්ථාවන්හි දී ඉඩමේ පසු අයිතිය ඉඩම් ආඥා පනතේ තුන්වන උප ලේඛනය ප්‍රකාරව වැඩිමහල් පුතාට හෝ දියණියට පැවරේ. එවිට පවුලේ අනෙකුත් සාමාජිකයන් සමාජයීය, ආර්ථික හා මානසික වශයෙන් ගැටලුකාරී තත්ත්වයන්ට පත් වී ඇත. ජීවත්වීමට හා වගා කිරීමට භූමියක් නොමැති වීම, මෙතෙක් භුක්ති විඳි ඉඩම අත්හැරීමට සිදුවීම, ඉඩම මූලික කරගෙන පැවති ආදායම් අහිමි වීම, අනාගත අවිනිශ්චිතතාව, අනවසර ඉඩම් භුක්තියට යොමුවීමට සිදුවීම ආදිය මේ අතුරින් ප්‍රධාන වේ (සිද්ධි අධ්‍යයන 6.1).

මෙම සිද්ධි අධ්‍යයනයෙන් විස්තර කෙරෙන අන්දමට පවුලක මව ශ්‍රී ලාංකීය සමාජය තුළ කේන්ද්‍රීය භූමිකාවක් වුව ද, රජයේ ඉඩම් නීතිය නිසා ඉඩමේ අයිතිය ඇයට සෘජුව හිමි වී නොමැත. ජීවිත භුක්තිය පමණක් හිමි වීම හේතුවෙන් ඉඩම පිළිබඳ තීරණයක් ගැනීමට ඇයට හැකියාවක් නොමැති අතර තුන්වන උපලේඛනය ප්‍රකාරව ඉඩම් අයිතිය පැවරීම තුළ ඉඩම් අයිතිය නො පැවරුන දරුවන් පමණක් නොව ජීවිත භුක්තිය හිමි පුද්ගලයාට ද ගැටලුවලට මුහුණදීමට සිදුවන බව පැහැදිලි ය. ජීවත් වන ස්ථානය පිළිබඳ සුරක්ෂිතතාවක් නොමැති වීම, ජීවිත භුක්තිය හිමි තැනැත්තා/තැනැත්තිය මියගිය පසු පවුලේ සෙසු සාමාජිකයන්ට ජීවත් වීමට ස්ථානයක් නොමැති වීම, මානසික පීඩනයට පත්වීම, ආයතනික වශයෙන් සේවා ලබා ගැනීම

තුළ මතුවන ගැටලු හා ඉඩම් භුක්ති විඳීම සම්බන්ධ ගැටලු සමඟ සමාජයීය වශයෙන් අසරණ බවට පත්වීම මේ අතර ඇති ප්‍රධාන ම ගැටලු බව සිද්ධි අධ්‍යයනය තුළින් පැහැදිලි වේ.

සිද්ධි අධ්‍යයනය 6.1: ඉඩම් ආඥා පනතේ තුන්වන උප ලේඛනයට අනුව ඉඩම් හිමිකාරීත්වය පවුලේ එක් සාමාජිකයෙකුට හිමිවීම හේතුවෙන් මතු වී ඇති සමාජ-ආර්ථික ගැටලු

තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙබරවැව ප්‍රදේශයේ ජීවත් වන වැන්දඹු කාන්තාවක් වන සෝමාවතී පෙරේරා මහත්මිය 65 වියැති සිව් දරු මවකි. ප්‍රදේශයේ වැදගත් ලෙස ජීවත් වූ මෙම පවුල, පෙරේරා මහත්මියගේ සැමියාට ජයභූමි ඔප්පුවකින් අයත් වූ අක්කර එකක් හා පර්චස් හතරක ඉඩමේ ඉදි කරන ලද නිවසක පදිංචිව සිටිය හ. 2004 වර්ෂයේ දී පවුලේ වැඩිමහල් හා එක ම පිරිමි දරුවාගේ ඉල්ලීමක් මත ඔවුන් ජීවත් වූ ඉඩමෙන් පර්චස් 80ක කොටසක් ඔහුගේ නමට පවරා දෙන ලදී. වෘත්තියෙන් ඉංග්‍රීසි ගුරුවරයෙක් වන ඔහු තම දෙමාපියන් වෙසෙන නිවසට ඉදිරියෙන් වූ එම ඉඩමේ ප්‍රධාන පාරට මුහුණලා අංග සම්පූර්ණ නිවසක් ඉදි කළේ ය. මේ අතර 2005 දෙසැම්බර් මාසයේ දී පෙරේරා මහත්මියගේ සැමියා මිය ගිය අතර ඔහු මිය යන අවස්ථාවේ ඉඩමේ ඉතිරි කොටසට අනුප්‍රාප්තිකයෙකු නම් කර නො තිබිණි. එම නිසා, ඉඩමේ ජීවිත භුක්තිය පෙරේරා මහත්මියට හිමි වූ අතර ඉඩම් ආඥා පනතට අනුව ඉඩමේ ඉතිරි කොටස ද නිරායාසයෙන් ම පවුලේ වැඩිමහල් හා එක ම පිරිමි දරුවාට අයත් විය. ඒ වන විට පවුලේ ගැහැණු දරුවන්ගෙන් එක් අයෙක් පමණක් විවාහ වී පවුලෙන් වෙන් වී සිටි අතර දියණියන් දෙදෙනෙකු අවිවාහකව පෙරේරා මහත්මිය සමඟ පදිංචිව සිටිය හ.

මේ අතර ප්‍රධාන මාර්ගයට මුහුණ ලා සිය නිවස පිහිටා තිබුණ ද, පෙරේරා මහත්මියගේ පුතු තම නිවසට යාමට පාරක් අවශ්‍ය යැයි පවසමින්, සිය මව ජීවත්වන නිවස සහිත ඉඩමෙන් කොටසක් ඉල්ලා සිටියේ ය. පෙරේරා මහත්මිය එයට අකමැතිවීම හේතුවෙන් ඔහු සිය මවට හා සොයුරියන්ට හිංසාකාරී ලෙස හා පරුෂ වචනයෙන් බැන බදින්නට පටන් ගත් අතර එයින් නො නැවතී විවිධ පිරිස් යොදා ඔවුන් බිය වැද්දවීමට කටයුතු කළේ ය. එමෙන් ම, පවතින ඉඩම් ආඥා පනතට අනුව ඉඩම සම්බන්ධයෙන් තමාට හිමි ව ඇති පූර්ණ අයිතිය වටහාගත් ඔහු මෙන් ම යොවුන් වියේ පසුවන ඔහුගේ පුතු ද පෙරේරා මහත්මියගේ දියණියන්ට බැණ වදින්නට වූයේ සිය මව/ආච්චි මිය ගිය පසු ඔවුන්ට ජීවත්වන ස්ථානය අහිමි කරන බව පවසමිනි. මේ වන විට, තමාගේ ජීවිත භුක්තියේ හිමිකම තිබෙන නිසා පෙරේරා මහත්මිය එම නිවසේ අයිතිය සහිතව රැඳී සිටිය ද, තමා මිය ගිය පසු ස්ථිර රැකියාවක් හෝ නොමැති සිය දියණියන්ට ජීවත්වීමට හිසට වහලක් නොමැති වෙතැයි සිත් තැවුලෙන් පසු වන්නී ය.

මෙම පීඩාකාරී තත්ත්වයෙන් හා අනාරක්ෂිත භාවයෙන් ගැලවීමට මෙන් ම සිය දියණියන්ට ඉඩම සඳහා නීත්‍යානුකූල අයිතිවාසිකමක් ලබාදීමට ද පෙරේරා මහත්මියට වුවමනා වී ඇත. ඒ අනුව, තමා දැනට භුක්ති විඳින ඉඩම තම නමට පවරා ගැනීමට අවශ්‍ය බව ඇය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇතුළු අදාළ ආයතනවලට දන්වා ඇතත් පවතින නීතිය අනුව එසේ කළ නො හැකි බවත් නීති රීති වෙනස් වන තෙක් ඉවසා සිටින ලෙසත් නිලධාරීන් පවසා තිබේ.

එමෙන් ම, ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව ඉඩමේ වර්තමාන භුක්තිය සහිත පුද්ගලයා නොව වෙනත් පුද්ගලයකුට නීතිය අනුව ඉඩමේ පසු අයිතිය පැවරීම නිසා ඉඩමෙ හි වර්තමාන භුක්තිය සහිත පුද්ගලයාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව තිබේ. ඉඩම දීර්ඝ කාලයක් පුරා සංවර්ධනය කර භුක්ති විඳින නමුත් නිත්‍යානුකූලව ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නො හැකි වීම ඇතැම් සේවාලාභීන් මුහුණ දෙන තවත් එක් ගැටලුවකි. ඇතැම් විට, එසේ නෛතිකව

ඉඩමට හිමිකම් තියන පුද්ගලයා ඉඩම් හා දේපල හිමි, වෙනත් ප්‍රදේශයක ජිවත් වන, ඉඩම සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවක් නොමැති පුද්ගලයකු වන අතර ඉඩම් බලපත්‍රය ගොවි පන්තියේ පුද්ගලයෙකුට අයත් වුව ද, ඕනෑ ම ආර්ථික මට්ටමක පුද්ගලයකුට එහි පසු පැවරීම සිදුකල හැකි වීම තුළ මෙවන් ගැටලු ඇතිවීමට ඉඩ ඇති බව සම්මුඛ සාකච්ඡාවල දී අනාවරණය විය.[10]

තිස්සමහාරාම පොලිසියේ නිලධාරින්ගේ තොරතුරුවලට අනුව ප්‍රදේශයේ හේන් හා කුඹුර ගොවිතැන් සිදුකරන කාලයට වැඩි පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වේ. අද ගොවින් භුක්තිවිඳි කුඹුරුවල අද ගොවියා මිය යාමෙන් පසුව ඉඩම් හිමියාට අයිතිය පැවරෙන නිසා ඔහු හා අද ගොවියාගේ පවුලේ අය අතර අයිතිවාසිකම් සම්බන්ධ ගැටලු පැන නගින අතර අද ගොවි පනත වරින් වර සංශෝධනය කරන නිසා මෙම ප්‍රශ්න බොහොමයක් මතු වී ඇත.[11]

එමෙන් ම, 2004 වර්ෂයේ දී සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ප්‍රදේශයක් වන හම්බන්තොට ප්‍රදේශයේ ඉන් හානි වූ නිවාස හිමියන්ට විවිධ ව්‍යාපෘති යටතේ නිවාස හිමි වී ඇත. එසේ වුව ද, මෙම නිවාසවල අයිතිවාසිකම් තහවුරු කිරීමේ ගැටලු සහගතබව නිසා ඇතැම් පුද්ගලයන්ට අයිතියක් නොමැති නිවසක හා ඉඩමක පදිංචි වීමට සිදුව ඇත. ඒ නිසා හිමිකම ලබා ගැනීමේ, දේපල පැවරීම හා ණය පහසුකම් ලබා ගැනීමේ ආදි විවිධ සේවාවන් ලබා ගැනීමේ දී ගැටලුවලට මුහුණ පෑමට සේවාලාභීන්ට සිදුව ඇති බව ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව පැහැදිලි විය. උදාහරණයක් ලෙස ඕස්ට්‍රේලියානු සුනාමි නිවාස ව්‍යාපෘතියක් මඟින් සේවාලාභී පවුල්වලට ලබා දී ඇත්තේ නම සඳහන් නො කරන ලද අවසර පත්‍ර වේ. එම නිසා, එකී නිවාසවල අයිතිය ඇත්තේ එම ඕස්ට්‍රේලියානු සමාගමට ය. මෙම පසුබිම තුළ මෙම ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට නො හැකිව මෙම නිවාස හිමියෝ පීඩාවට පත්ව සිටිති.[12]

පවතින ඉඩම් නීතිය තුළ රජයේ ඉඩම් අලෙවිය තහනම් වුව ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සඳහා බලපත්‍ර හා දීමනා පත්‍රලාභී ඇතැම් පුද්ගලයන් විසින් රජයේ ඉඩම් කුඩා කොටස්වලට වෙන් කර නීත්‍යානුකූල නො වන ආකාරයට අත්පිට මුදලට විකිණීම සිදු කර ඇත. එම ඉඩම් මිල දී ගත්තා ලද පුද්ගලයන් අදාළ ඉඩමෙහි නිවාස ඉදිකර පදිංචි වී සිටිය ද පවතින නෛතික විධි විධාන තුළ ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම ගැටලුවක් වී ඇති ආකාරයේ සිද්ධි ක්ෂේත්‍රය තුළ දුලබ නො වුණ අතර මෙම තත්ත්වය දීර්ඝ කාලීනව විශාල සමාජ ගැටලුවක් බවට පත්වීමේ ප්‍රවණතාවක් පවතී. මේ ආකාරයට අත්පිට මුදලට අලෙවි කරනු ලබන ඉඩම්වල මුල් අයිතිකරුවන් හා ඔවුන්ගේ දූ දරුවන් විසින් ගැණුම්කරුවන්ට තම කැමැත්තෙන් ඉඩම් නො විකුණු බව පවසා නැවත ඉඩම් ඉල්ලා සිටීම වැනි ගැටලු ද ක්ෂේත්‍රය තුළ දී හමු විය. ඇතැම් විට මෙම ගැටලු ආරවුල් තත්ත්වයන් දක්වා වර්ධනය වන අතර නිලධාරින් වෙත ඉදිරිපත් වන අවස්ථා වන විට විසඳීමට අපහසු මට්ටමක් දක්වා වර්ධනය වී තිබේ.

10 සම්මුඛ සාකච්ඡා - නිල නේවාසික ව්‍යාපාර කළමනාකරු – මහවැලි ව්‍යාපාරය, උඩවලව විශේෂ බල ප්‍රදේශය (2011.12.29)

11 සම්මුඛ සාකච්ඡා - සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති - තිස්සමහාරාම පොලීසිය (2011.12.14)

12 හම්බන්තොට මයුරපුර කැන්බරා සුනාමි ව්‍යාපෘතියේ නිවාසවල වෙසෙන සේවාලාභීන්ගෙන් ලබාගත් තොරතුරු (2011.10.17)

ඉහත කරුණුවලට අමතරව, ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ නින්දගම්වලට සම්බන්ධ යම් යම් ගැටලු පැන නැගී ඇත. උදාහරණයක් ලෙස ගොන්නෝරුව ප්‍රදේශයේ පුද්ගලයෙකු අක්කර 500ක ඉඩමක් අත්පත් කරගෙන සිටින අතර ඔහුට එය පරම්පරාවෙන් උරුම වී ඇති බව පවසා හතර මායිම් නොමැතිව අක්කර 50ක් පමණ විවිධ පුද්ගලයින්ට විකුණා ඇත. නමුත් 1910 දී ගැසට් වාර්තාවකින් එය රජයට පවරාගෙන තිබේ. මේ නිසා, එම ඉඩම් මිල දී ගත් පුද්ගලයන් ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටලුවලට මුහුණ දී ඇත.

සිද්ධි අධ්‍යයනය 6.2: ඉඩමේ නෛතික අයිතිය තහවුරු කර ගැනීමට නො හැකිවීම නිසා පීඩාවට පත් වූ සේවාලාභිනියක්

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වීරවිල, සේනපුර ගම්මානයේ පදිංචි එම්.කේ. මල්කාන්ති 1974 වර්ෂයේ දී උපත ලැබුවේ එම්. කේ. ඇක්මන් හා ඒ. කේ. සුමනාවතී නම් දෙමාපිය යුවලගේ දියණිය ලෙස ය. නීත්‍යානුකූලව විවාහ වී නො සිටි මෙම යුවලට සිටි එක ම දරුවා වූයේ ද එම්.කේ. මල්කාන්ති ය. ඇයගේ දෙමාපියන්ගේ විවාහය සිරිත් විවාහයකට පමණක් සීමා වූ නිසා මල්කාන්ති මහත්මියගේ උප්පැන්න සහතිකයේ මවගේ නම සඳහන් වූව ද, පියාගේ නම සඳහන් නො වුණි.

එම්.කේ ඇක්මන්ගේ එක කුස උපන් සහෝදරයා වූ එම්.කේ. උපතේරිස් හා ඒ.කේ. සුමනාවතීගේ එක කුස උපන් සහෝදරිය වූ ඒ.කේ. සුගුණවතී ද එකිනෙකා හා විවාහ වී සිටි අතර මල්කාන්ති මහත්මියගේ දෙමාපිය යුවල මෙන් නොව ඔවුහු නීත්‍යානුකූලව විවාහ වී සිටිය හ. ඔවුන් දෙදෙනාට එම්.කේ. රමණී නමින් දියණියක් වූ අතර මල්කාන්ති මහත්මියගේ පියා වූ ඇක්මන්ගේ දේපළ සිය සොයුරාගේ එක ම දියණිය වූ රමණීට පවරා ඇත. මල්කාන්ති මහත්මියගේ විශ්වාසය අනුව එම දේපළ සිය පියා තම ඥාති සහෝදරිය වූ රමණීට පවරා ඇත්තේ උප්පැන්න සහතිකයේ පියාගේ නම සඳන් නො වූ හෙයිනි. කෙසේ වෙතත්, මේ වන විට මල්කාන්ති මහත්මියත්, ඇයගේ නීත්‍යානුකූල ස්වාමියාත් ඔවුන්ගේ දරු තිදෙනාත් ජීවත් වන්නේ සිය පියාට හිමිව තිබූ මල්කාන්ති මහත්මියගේ ඥාති සහෝදිරිය වන රමණීගේ නමින් පසු පැවරුම ඇති ඉඩමේ ය.

මල්කාන්තිගේ හෝ රමණීගේ දෙමාපියන් මේ වන විට ජීවතුන් අතර නොමැති අතර රමණී තම බාප්පා වන ඇක්මන්ගෙන් තමාට උරුම වූ දේපළ නැවත සිය ඥාති සොහොයුරියට පැවරීමට කැමැත්තෙන් සිටින්නී ය. ඒ සඳහා ඇය දිවුරුම් ප්‍රකාශයක් ද මේ වන විට ලබා දී ඇත. ඉඩම පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාළ නිලධාරීන් හමුවීමට ගිය ඔවුන්ට දැනගන්නට ලැබී ඇත්තේ උප්පැන්න සහතිකයට අනුව මල්කාන්ති හා රමණී අතර ලේ ඥාතිත්වයක් නොමැති නිසා එම ඉඩම එලෙස පැවරීමට අවකාශයක් නොමැති බව ය. අවසානයේ දී නිලධාරීන් මල්කාන්ති මහත්මියගේ පියා වන ඇක්මන්ගේත්, රමණීගේ පියා වන උපතේරිස්ගේත් උප්පැන්න සහතික පිටපත් රැගෙන එන ලෙස දන්වා ඇත. එම දෙදෙනාගේ උප්පැන්න සහතිකවල පිටපත් ගැනීමට සොයා බැලීමේ දී අදාළ කාර්යාලවලින් පවසා ඇත්තේ ඒවා අස්ථානගත වී ඇති හෙයින් පිටපත් ලබාගත නො හැකි බව ය. එම තත්ත්වය තුළ අදාළ ඉඩමේ අයිතිය මල්කාන්ති මහත්මියට පැවරීමට නො හැකි බව නිලධාරීන් ප්‍රකාශ කර ඇත.

මේ වන විට මල්කාන්ති මහත්මිය තමාට අයිතිවාසිකමක් ඇති ඉඩමේ හිමිකාරිත්වය ලබාගැනීමට පිළිසරණක් නොමැතිව මානසික වශයෙන් පීඩාවට පත්ව ඇති අතර පවුලේ අසමගිය ඇති වීමට ද මෙම ගැටලුව තුඩු දී ඇත. එමෙන් ම මෙම ගැටලුව මූලික කරගෙන සමාජය විසින් ඇයට පිළිකුල් සහගත ලෙසින් සලකා වෙනස් ආකාරයට සැලකීමක් සිදු කිරීම හේතුවෙන් ඇය මෙම ගැටලුව විසඳා ගැනීමට දැඩි උනන්දුවකින් පසු වේ.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, ඉඩම් අයිතිය අහිමි වීම, පසු අයිතිය නම් කිරීමේ ගැටලු හේතුවෙන් සමාජයේ කෙනෙහිලිකම් වෙනස් කර සැලකීම් හෝ කොන් කිරීම්වලට භාජනය වීම, සමාජ සම්බන්ධතා ගොඩ නගා ගැනීමේ අපහසුව හා විවිධාකාරයෙන් සමාජයීය වශයෙන් අසරණභාවයට පත්වීමට ඇතැම් සේවාලාභීන්ට සිදුව තිබේ. විශේෂයෙන්, ඉඩමේ හිමිකාරිත්වය හා භුක්තිය මත පදනම් වූ අයිතිවාසිකම්වලට සේවාලාභීන් උරුමකම් කියනු ලැබුව ද, පීඩනයට ලක්වුණ අවස්ථා ද ඇත. මෙවන් අවස්ථාවල නීතියෙන් පිළිසරණක් නොමැති වීම නිසා සේවාලාභීහු තවදුරටත් අසරණ වී සිටිති (සිද්ධි අධ්‍යයන 6.2). මෙම සිද්ධි අධ්‍යයනයට අනුව, ඉඩම අදාළ සේවාලාභිනියට පැවරීමට ඇයගේ ඥාති සහෝදරිය කැමැත්ත ප්‍රකාශ කර ඇතත් එම ලේ ඥාතිත්වය ඔප්පු කිරීමට නො හැකි නිසා පසු පැවරීම සිදු කර නැත. ඇයගේ අයිතිවාසිකම් සහතික කර සමාජය පිළිගත් පුද්ගලයෙකු වීමට ඇයට අවශ්‍ය වූවත්, එය සිදු නො වීමෙන් ඇයගේ විවාහ ජීවිතය ද, සමාජ ජීවිතය ද ගැටලුවකට බඳුන් වී ඇත. මෙම සිද්ධිය නිසා ඇය තවදුරටත් අසරණව ඇත්තේ නීතියෙන් ද ඇයට පිළිසරණයක් නොමැතිවීම හේතුවෙනි.

ඉඩම් අයිතිය, ප්‍රදේශයේ සමාජ තත්ත්වය හා ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කෙරෙන ප්‍රධාන සාධකයක් වීම හේතුවෙන් ම විවිධ නීත්‍යානුකූල ගැටලු යටතේ ඉඩම් අයිතිය සුරක්ෂිත නොවූ විට සමාජයීය වශයෙන් පුද්ගලයාට ඇති පිළිගැනීම ගැටලුව සහගත තත්ත්වයකට පත්ව තිබේ.

6.4 සේවාලාභීන්ට මානසික වශයෙන් සිදුවන බලපෑම

නියැදියට අයත් සේවාලාභීන්ගෙන් 1/3 කට ආසන්න ප්‍රමාණයක් ඉඩම් සම්බන්ධ සේවා සැපයීම නිසි ලෙස සිදු නො වීමෙන් හා සේවා සැපයීම ප්‍රමාද වීම හේතුවෙන් මානසික පීඩාවන්ට ලක්ව ඇති බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හෙළි විය (වගුව 6.1). ඉඩම් සම්බන්ධ පවතින විවිධ ආකාරයේ ගැටලුවලට නිසි විසඳුම් නො ලැබීම නිසා ඉඩම්, නිවාස අහිමි වේ යැයි යන බිය සේවාලාභීන් පීඩා විඳිනු ලබන ප්‍රධාන ම මානසික ගැටලුවකි.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව ඉඩමෙහි පසු පැවරුම නම් කිරීම සඳහා බහුතර සේවාලාභීන් පිරිසක් කටයුතු යොදනුයේ ඔවුන් මහලු වියට පත් වූ පසු ය. ඉඩම් සම්බන්ධ නීති පිළිබඳව ඔවුන් නිසි පරිදි දැනුවත් නො වීම හා දැනුවත් නො කිරීම මෙයට බලපාන ප්‍රධාන ම හේතුවක් වී ඇත. මේ නිසා මිය යාමට පෙර දරුවන්ට හෝ සිය ඥාතීන්ට ඉඩම පැවරීමට නො හැකි වේ යැයි බියෙන් හා අවිනිශ්චිතතාවයෙන් පසුවන ඇතැම් සේවාලාභීන්ට ජීවිතයේ සැඳෑ සමය ගත කිරීමට සිදුව ඇත්තේ මානසික ගැටලුවලට මැදිව ය. මිය යාමට ප්‍රථම සිය ඉඩම් දරුවන් හට පැවරීම එවන් සේවාලාභීන් බහුතරයකගේ ජීවිතයේ මුඛ්‍ය අරමුණ වී තිබේ.

මෙයට අමතරව පවතින සමාජ, සංස්කෘතික වටපිටාව අනුව දරුවන් සියලු දෙනාට ම එක හා සමානව තම දේපළ පැවරීමට දෙමාපියන් තුළ පවතින කැමැත්ත ඉටු කර ගැනීමට වත්මන් නීතියේ ප්‍රතිපාදන සමත් නො වන විට එක් දරුවෙකුට හෝ දෙදෙනෙකුට ඉඩම පවරා අනෙක් දරුවන් අතර අප්‍රසාදයට පත්වීමට හෝ දරුවන් අතර ගැටුම් ඇති කිරීමට දෙමාපියන් අතර

ඇති නො කැමත්ත ද මෙම තත්වය ඇතිවීමට කැපී පෙනෙන හේතුවක්ව ඇත. ඇතැම් අවස්ථාවල දී, ඉඩමේ මුල් අයිතිකරු විසින් එක් දරුවෙකුට පමණක් පසු අයිතිය පැවරූ විට අනෙකුත් දරුවන් දෙමාපියන්ට නො සලකා සිටීම නිසා මානසික පීඩනයට පත් වූ සේවාලාභීන් ද ක්ෂේත්‍රය තුළ දී හමු විය.

ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී ලබා ගත් තොරතුරුවලට අනුව, සේවාලාභීන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයකට ඥාතීත්වය ඔප්පු කර ගැනීමට නො හැකි වීම නිසා ගැටලු මතු වී ඇත. සිරිත් විවාහයන් නිසා, දෙමාපියන් නීත්‍යානුකූලව විවාහ නො වීම නිසා මෙන් ම බහු විවාහවලට ඇතුළත් වීම නිසා පසු පවුලෙහි බිරිඳට හා ද දරුවන්ට ඉඩම් භුක්තිය හා ඉඩම් පැවරීම වැනි කටයුතුවල දී ලේ ඥතීත්වය තහවුරු කර ගැනීම ගැටලුවක්ව ඇත. මෙම තත්ත්වය තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අඳුපැලැන නම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බහුලව දක්නට ලැබුණු අතර සිරිත් විවාහ නිසා ඉඩමේ අයිතිවාසිකම් දරුවන්ට ද කලත්‍රයාට ද අහිමි වී ඇත. එමෙන් ම, මේ හේතුවෙන් ඇතැම් විට එම ඥාතීන් අතර ආරවුල් ද ඇති වී ඇත.[13]

සේවා සැපයීමේ දුර්වලතා නිසා ගැටලුව විසඳීම පිළිබඳව අවිනිශ්චිතතාව හේතුවෙන් ඉඩම් සම්බන්ධව තියමිත වරප්‍රසාද අහිමි වේ යැයි යන මානසික පීඩනයට මුහුණ දී ඇති බව ඇතැම් සේවාලාභීහු ප්‍රකාශ කර සිටිය හ. එමෙන් ම, ඉඩම් පිළිබඳ ගැටලු විසඳුමක් නොමැතිව දිගු කාලයක් පැවතීමෙන් ද, විසඳුමක් ලැබීමට ප්‍රමාද වීමෙන් ද ඉඩම් ආරවුල් ඇති වීම පිළිබඳ බියක් සේවාලාභීන් තුළ පවතී. විශේෂයෙන් බැන වැදීම, පහර දීම හා පුද්ගල ඝාතන දක්වා වූ විවිධ ආකාරයේ ආරවුල් ඇති වීම සේවාලාභීන් මානසික වශයෙන් පීඩාවට පත් කර ඇත. හුදෙකලාව පසුවන වැඩිහිටි පුද්ගලයන් බිය වැද්දීම, මිනීමැරීම හා පහරදීම් ආදි සිදුවීම් ප්‍රදේශයෙන් වාර්තා වීම හේතුවෙන් එවන් අනතුරුවලට මුහුණ දීමට වේ යැයි බිය සේවාලාභීන් මානසික වශයෙන් පීඩාවට පත් වීමට තවත් හේතුවක් වී ඇත. අසූ එක් හැවිරිදි වියේ පසුවන එක්තරා වයස්ගත පුද්ගලයෙකුට යාබද නිවසේ තරුණ පුද්ගලයෙකු හා ඔහුගේ මව රාත්‍රී කාලයේ පැමිණ පිහියක් ගෙලට තබා බලහත්කාරයෙන් ලියකියවිලිවලට අත්සන් ගත් සිද්ධියක් ද සේවාලාභීන්ගේ අත්දැකීම් අතර විය. [14]

6.5. යටිතල පහසුකම් ලබා ගැනීමේ සහ ප්‍රවේශ වීමේ අපහසුව

පවතින නෛතික විධි විධාන අනුව ඉඩම් අයිතිය තහවුරු වී නො තිබීම නිසා විදුලිය, පානීය ජලය, පිවිසුම් මාර්ග වැනි මූලික අවශ්‍යතා හා යටිතල පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාව ක්ෂේත්‍ර අධ්‍යයනයේ හමු වූ ඇතැම් සේවාලාභීන්ගේ චෝදනා හා ගැටලු අතර ප්‍රධාන විය. උදාහරණයක් ලෙස සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධ්‍යයන නියැදියෙන් 21.6%ට ජල පහසුකම් ද, 28.4%ට විදුලි පහසුකම් ද නොමැත. එමෙන් ම, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අධ්‍යයන නියැදියෙන් 19.7%ට ජල පහසුකම්ද, 9.9% කට විදුලි පහසුකම් ද නොමැත (ප්‍රස්තාර 3.4). මේ තත්ත්වය ඇතිවීමට අනවසර ඉඩම් භුක්තිය කැපී පෙනෙන දායකත්වයක් සපයා ඇත. ජල පහසුකම් නොමැතිවීම නිසා එවන් සේවාලාභීන්ට පානීය ජලය

---

[13] ක්ෂේත්‍ර අධ්‍යයනය – සේවාලාභීන්ගෙන් හා ග්‍රාම නිලධාරී මහතාගෙන් ලබාගත් තොරතුරු, (2011.11.29)

[14] සේවාලාභියෙකු සමඟ සම්මුඛ සාකච්ඡාවකින් හා ප්‍රශ්නාවලියෙන් ලබාගත් තොරතුරු –සාදියස් එදිරිවීර, වැදිගල, කහදාව, රත්න (2011.11.29) මෙය තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වූ අතර ග්‍රාම නිලධාරී විසින් සත්‍ය බවට තහවුරු කරන ලදී

සපයා ගැනීම් අපහසුතා මෙන් ම ස්නානය, සේදීම් කටයුතු වැනි එදිනෙදා අවශ්‍යතාවන්ට ජලය සපුරා ගැනීම ද දුෂ්කර වී ඇත.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, මාර්ග පහසුකම් නොමැතිවීම හා මාර්ග වෙත ප්‍රවේශ වීම දුෂ්කර වීම මෙන් ම ප්‍රජා ශාලා, ක්‍රීඩා පිට්ටනි හා සුසාන භූමි ආදි පොදු පහසුකම් නොමැති වීම එකී පොදු පහසුකම් භුක්ති විඳීමට බාධා පමුණුවා ඇත. එමෙන් ම, පොදු කටයුතුවලට වෙන් කරන ලද ඉඩම් විවිධ පුද්ගලයන් විසින් අත්පත් කර ගැනීම ද දක්නට ලැබේ.[15] සංවර්ධන ව්‍යාපෘති නිසා ඉඩම් අහිමි වූ ජනතාව සම්බන්ධව නව ඉඩම් දීමේ දී මෙකී පහසුකම් සැපයීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කර නැති බවට ඇතැම් සේවාලාභීන් චෝදනා කර ප්‍රකාශ කර සිටියේ ඔවුන්ට ප්‍රමාණවත් පොදු පහසුකම්, එනම් පොදු ප්‍රවාහන සේවා, ක්‍රීඩා පිටි, ප්‍රජා ශාලා, කැළි කසළ බැහැර ගෙන යාමේ සේවාවන් ආදිය මේ වන විටත් ලබා දී නොමැති බවත්, එනිසා සමාජ ජීවිතයේ දී මෙන් ම පොදු කටයුතු ඉටුකර ගැනීමේදීත් නොයෙක් අපහසුතාවලට මුහුණ දෙන බව පවසමින්[16].

ඉහත කරුණු සම්බන්ධව වරාය ව්‍යාපෘති නිලධාරී පවසා සිටියේ ලබා දිය හැකි පහසුකම් උපරිම වශයෙන් වරාය ගම්මානය සඳහා ලබා දී ඇති බවත්, අනෙකුත් ආයතන විසින් සැපයිය යුතු සේවාවන් එනම්, නගර සභාව විසින් කළ යුතු කැළි කසළ බැහැර ගෙන යාම ආදිය සම්බන්ධයෙන් එකී ආයතන ක්‍රියාත්මක විය යුතු බවත් ය. කෙසේ වුව ද, එවන් ගැටලුවක් පැන නැඟී ඇත්නම් අදාළ ආයතන දැනුවත් කරන බව ඔහු සඳහන් කර සිටියේ ය.[17] මෙවන් තත්ත්වයක් තුළ අත්‍යවශ්‍ය අවස්ථාවක දී නුදුරුව ඇති සුනාමි නිවාස ව්‍යාපෘතියක පොදු පහසුකම් ලබා ගැනීමට සිදුවන බව ද වරාය ගම්මානයේ පදිංචිකරුවෝ ප්‍රකාශ කර සිටිය හ. මෙලෙස ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති ඉඩම් මෙන් ම සේවාලාභීන් අපේක්ෂා නො කළ ආකාරයේ අඩු පහසුකම් හා ඔවුන්ගේ ආදායම් මාර්ගවලට පිවිසීමට දුෂ්කර ආකාරයේ ඉඩම් ඔවුන්ට ලබා දීම නිසා ගැටලු මෙන් ම ගැටුම් ද මතු වී ඇති බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය.

වරාය ඉදිකිරීම නිසා සේවාලාභීන්ගේ අහිමි වූ ඉඩම් වෙනුවෙන් පදිංචියට හා වගා කටයුතු සඳහා වෙන් වෙන් වශයෙන් ඉඩම් ලබා දී ඇති අතර පදිංචිය සඳහා සිරිබෝපුර වරාය ගම්මානයෙන් ද වගා කටයුතු සඳහා ඉන් කිලෝ මීටර කිහිපයක් ඈතින් ද ඉඩම් ලබා දී ඇත[18]. ප්‍රදේශයේ පවතින ගමනාගමන දුෂ්කරතා නිසා බොහෝ දෙනෙකු එම ඉඩම් තවමත් වගාව සඳහා යොදවා නොමැත. මෙයට පෙර වගාබිම් ද, නිවස ද, නුදුරෙන් පිහිටා තිබීම නිසා ජීවිකාව කර ගැනීම ඔවුන්ට පහසු වී ඇති අතර පවුලේ සාමාජිකයන්ගේ ශ්‍රමය පහසුවෙන් වගා කටයුතු සඳහා යොදවා ගැනීමට හැකි විය. එසේ වුව ද, වර්තමානයේ පවතින තත්ත්වය අනුව ස්ත්‍රීන්, වයස්ගත වූවන් හා ළමුන් ඇතුළු පවුලේ සාමාජිකයන් සියලු දෙනාට ම වගා බිම්වලට යාමට නො හැක. වගා බිම්වලට ගිය ද, දුර පිළිබඳ ගැටලුව, ගමනාගමන දුෂ්කරතා හා මාර්ගයේ අලි ගැවසීම හේතුවෙන් වේලාසන ම නිවෙස් බලා ඒමට සිදුවන බව එම

[15] සම්මුඛ සාකච්ඡා, ප්‍රාදේශීය ලේකම්, වලස්මුල්ල, (2011.12.01)

[16] ක්ෂේත්‍ර අධ්‍යයනයේදී ලබා ගත් තොරතුරු, හම්බන්තොට සිරිබෝපුර වරාය ගම්මානයේ සේවාලාභීන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා.

[17] සම්මුඛ සාකච්ඡා, හම්බන්තොට වරාය ව්‍යාපෘති නිලධාරී, (2011.12.12).

[18] වරාය ඉඩම් පවරා ගැනීම තේරීම් කමිටුවකින් සිදුකළ අතර එයට වරාය අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ, තක්සේරු දෙපාර්තමේන්තු නිලධාරියෙක්, අතිරේක දිස්ත්‍රික් ලේකම් සහ පළාත් ඉඩම් කොමසාරිස් ඇතුළත් විය. ඉඩම් ලබා දීමේදී රජයේ අනවසර ඉඩමක් සඳහා පර්චස් 15ක පදිංචිය සඳහා ඉඩමක් ද, රජයේ බලපත්‍ර හෝ දීමනා පත්‍ර ඉඩම් සඳහා අක්කර 1/2 ඉඩමක් සඳහා අක්කර 1/2 වගා බිමක් සහ පදිංචිය සඳහා පර් 20 ද නිවාසයේ තත්ත්වය අනුව රුපියල් තක්සේරු මුදලක් ද ලබා දී ඇත. අක් 1/2ට වැඩි ද අක්කර 1 දක්වා වූ ද ඉඩම් සඳහා අක්කර 1ක වගා බිමක් සහ පදිංචිය සඳහා පර්චස් 20 ද ලබා දී ඇත (වරාය ව්‍යාපෘති නිලධාරී සමග පැවති සම්මුඛ සාකච්ඡා, 2011.12.12).

අත්දැකීම්වලට මුහුණ දුන් සේවාලාභීහු ප්‍රකාශ කර සිටිය හ. ඇතැම් අවස්ථාවල එම ඉඩම් වෙනත් පුද්ගලයන් විසින් බලයෙන් අත්පත් කර ගන්නා සිදුවීම් පවතින බවටත් අධ්‍යයන අවස්ථාව වන විට එම ඉඩම්වලට බලපත්‍රයක් හෝ ලබා දී නොමැති නිසා අයිතිය තහවුරු කර ගැනීමේ දී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදුවන බව එවන් සේවාලාභීහු පැවසූ හ.[19]

ඉඩම් සම්බන්ධ ගැටලු නිසාත්, එම ගැටලුවලට නිසි විසඳුම් ලැබීම නියමිත පරිදි සිදු නො වීම නිසාත් දරුවන් පාසැලට ඇතුළත් කර ගැනීමේ දී දුෂ්කරතාවන්ට ලක්වීමට අධ්‍යයන නියැදියෙන් 5% (24)ට සිදුව ඇත. මේ අනුව දරුවන් පාසැලට ඇතුළත් කිරීමේ දී ඉඩම් අයිතිය පිළිබඳ ගැටලු නිසා නියමිත ලකුණු ප්‍රමාණය නො ලැබීම හේතුවෙන් දරුවන් වඩා හොඳ පාසැල්වලට ඇතුළත් කිරීමේ අවස්ථාව අහිමි වූ සේවාලාභීන් මෙන් ම දරුවන් පදිංචි ස්ථානයට නුදුරු පාසැලට ඇතුළත් කිරීමේ අවස්ථාව ද අහිමි වූ සේවාලාභීන් ද ක්ෂේත්‍රයේ දී හමුවිය. මෙම තත්ත්වයට මුහුණ දුන් ඇතැම් සේවාලාභීන්ගේ අත්දැකීම් අනුව දරුවන්ට පාසැල් යාමට හා එම සඳහා වැඩි කාලයක් ගත වීම ද, එවන් අවස්ථාවල කුඩා දරුවන් පාසැල් වෙත රැගෙන යාමට සිදුවීමේ දී දෛනික වැඩකටයුතු මෙන් ම ආර්ථික කටයුතුවලට බාධා එල්ලවීම සිදුවන අතර වඩා ඉහළ මට්ටමේ පාසැලකට ඇතුල්වීම සඳහා ඇති අවස්ථාව අහිමි වීම ද දරුවගේ අධ්‍යාපන ඉදිරියට ගෙන යාමට බාධාකාරී වී තිබේ.

6.6 ආර්ථිකමය වශයෙන් අවාසි සහගත තත්ත්වයන් ඇති වීම

6.6.1 සේවා ලබා ගැනීමේ දී වැය වන පිරිවැය

ඉඩම් සම්බන්ධ සේවා ලබා ගැනීම සඳහා අදාළ ආයතන වෙත යන බහුතරය ප්‍රකාශ කර සිටියේ අදාළ සේවාව ලබා ගැනීමට දිගු කාලයක් ගතවන බවත්, එය ඔවුන්ගේ ආර්ථික කටයුතුවලට බාධාකාරි ලෙස ක්‍රියාත්මක වන බවත් ය. ඒ අනුව, සේවාලාභීන් සමස්තයක් ලෙස ඉඩම් ගැටලු විසඳා ගැනීම සඳහා නිලධාරීන් හමුවීමට ගිය වාර ගණනෙ හි සාමාන්‍ය වාර 6ක් සහ දීමනා පත්‍රවල මායිම්, නම් හා කැබලි අංක වෙනස්වීම වැනි නිත්‍යානුකූල ගැටලු සඳහා සේවා ලබා ගැනීමට එක් සේවාලාභියෙකු ගිය වාර ගණනෙහි සාමාන්‍ය වාර 19ක් තරම් ඉහළ අගයක් ගනී (වගුව 6.2).

[19] හම්බන්තොට වරාය ගම්මානයේ සේවාලාභීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා ඇසුරෙනි (2011.11.05).

වගුව 6.2: සේවාලාභීන් එක් එක් ඉඩම් ගැටලු විසදා ගැනීම සඳහා නිලධාරීන් හමු වූ වාර ගණන

ඉඩම් ගැටලුවේ ස්වභාවය	නිලධාරීන් හමු වීමට ගිය වාර ගණනෙහි සාමාන්‍යය	උපරිම වාර ගණන	අවම වාර ගණන
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම/ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචිය	7	100	1
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	3	30	1
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	8	270	1
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙන් අයෙකුගෙන් පවරා ගැනීම	4	50	1
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	7	40	1
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	5	200	1
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	19	100	1
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	4	300	1
දීර්ඝකාලීන බද්ද යටතේ ඉඩම් ලබා ගැනීම	6	50	1
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	1	2	1
සමස්තය	6	-	-

මූලශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ඉහත කරුණුවලට අමතරව ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා පුද්ගලයෙකු අදාළ ආයතන වෙත ගිය වාර ගණනෙ හි සාමාන්‍ය වාර 8ක් වන අතර ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/ අනවසර නියමානුකූල කිරීම සඳහා වාර 7ක සාමාන්‍යයක් එක් සේවාලාභියකු විසින් වැය කර ඇත.

ඉහත වගුව තුළින් පැහැදිලි වන ආකාරයට සේවාලාභියෙකු සේවා ලබා ගැනීම සඳහා වැඩි ම වාර ගණනක් ගොස් ඇත්තේ ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීමට වන අතර ඒ සඳහා වාර 300ක් අදාළ ආයතන වෙත සහ නිලධාරීන් වෙත යාමට වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි ජීවත් වන එම සේවාලාභියාට සිදුව ඇත. එමෙන් ම, ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා වාර 270ක් ද, ජයභූමි ඔප්පු යටතේ ලබා දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය, මායිම් හෝ අයිතිය පිළිබඳ ගැටලු විසදා ගැනීම සඳහා වාර 200ක් වශයෙන් එක් එක් ගැටලු සඳහා නිලධාරීන් හමුවීමට යාමට සේවාලාභීන්ට සිදුව ඇත. එසේ සේවා ලබා

ගැනීමට ගොස් ඇත්තේ පිළිවෙළින් තංගල්ල හා දුණුගම්වෙහෙර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සේවාලාභීන් ය. ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා වාර 270ක් නිලධාරීන් හමුවීමට ගොස් ඇත්තේ අවුරුදු 81 වයසැති පුද්ගලයෙකි. ඔහු පදිංචි ඉඩම සම්බන්ධ මාර්ගය පිළිබඳ ආරවුලක් මෙයට මුල් වී ඇත.

ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ නීත්‍යානුකූල ගැටලුවක් විසදා ගැනීම හා ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම වෙනුවෙන් සේවාලාභියෙකු අදාළ ආයතන වෙත ගොස් ඇති වැඩි ම කාලය වාර 100ක් ලෙසින් වාර්තා වන අතර අම්බලන්තොට, සූරියවැව හා තිස්සමහාරාම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනෙන් ම මෙම අත්දැකීමට මුහුණ දුන් සේවාලාභීන් පිළිබඳ වාර්තා විය. මෙහි දී ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ නීත්‍යානුකූල ගැටලුවට අදාළ සිද්ධිය වන්නේ, එම සේවාලාභියාගේ පියා මියගිය පසු මහවැලි ඉඩමේ පසු පැවරුම මවගේ නමට හරවා ඇතත් එහි මවගේ නම සඳහන් වන්නේ වැරදි ආකාරයට වීම ය.

රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩමක් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම සඳහා අවසර ගැනීමට සේවාලාභියෙකු අදාළ ආයතන වෙත ගිය වැඩි ම වාර ගණන ලෙස වාර්තා වූයේ වාර 2 ක් පමණි. සියලු සේවා සම්බන්ධව එක් සේවාලාභියෙකු අදාළ ආයතන වෙත ගිය අඩු ම වාර ගණන එක් වාරයකි. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව සේවාලාභීන් එක් වාරයක් ගිය පමණින් සේවා සැපයීම පිළිබඳ කලකිරීම, පැහැදීමක් නො වීම, රස්තියාදු වීමට අකමැති බව මෙන් ම ඇතැම් අවස්ථාවල සිය ඉල්ලීම නිලධාරීන් විසින් ඉටු කරනැයි යන විශ්වාසය ද මේ සඳහා යම් දුරකට හේතු සාධක වී ඇත.

එමෙන් ම, සේවාලාභීන් එක් එක් ඉඩම් ගැටලු විසඳා ගැනීම සඳහා නිලධාරීන් හමුවීමට ගොස් ඒ සඳහා වැය කරන ලද පැය ගණනෙ හි සාමාන්‍ය මිනිස් දින 3.4ක් වේ. දීමනා පත්‍රවල මායිම්, නම් හා කැබලි අංක වෙනස් වීම වැනි නීත්‍යානුකූල ගැටලු සඳහා සේවා ලබා ගැනීමට එක් සේවාලාභියෙකුට මිනිස් දින 7.1ක සාමාන්‍යයක් වැය වී ඇත (වගුව 6.3). මෙයට අමතරව ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා පුද්ගලයකු අදාළ ආයතන වෙත ගොස් ඒ සඳහා වැය කළ පැය ගණනෙ හි සාමාන්‍ය මිනිස් දින 5.7ක් වේ. ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම සඳහා මිනිස් දින 5.7ක සාමාන්‍යයක් එක් සේවාලාභියකු විසින් වැය කර ඇත.

වගුව 6.3: සේවාලාභීන් එක් එක් ඉඩම් ගැටලු විසඳා ගැනීම වෙනුවෙන් වැය කරන ලද උපරිම කාලය, අවම කාලය හා වැය කරන ලද කාලයේ සාමාන්‍යය

ඉඩම් ගැටලුවේ ස්වභාවය	නිලධාරීන් හමු වීමට වැය කළ කාලයෙහි සාමාන්‍ය (මිනිස් දින)	උපරිම කාලය (මිනිස් දින)	අවම කාලය (මිනිත්තු)
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම/ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචිය	5.7	100	5
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	1.5	20	15
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	5.7	135	30
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙන් අයෙකුගෙන් පවරා ගැනීම	1.7	50	15
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	3.0	15	30
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	2.8	40	60
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	7.1	100	10
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	2.7	225	15
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	2.1	25	30
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	0.3	1	60
එකතුව	3.4	-	-

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ඉඩම් සම්බන්ධ සේවාවන් ලබා ගැනීම සඳහා එක් සේවාලාභියෙකු වැය කළ වැඩි ම කාලය ලෙස වාර්තා වන්නේ ද ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම වෙනුවෙනි. ඒ සඳහා වැය කරන ලද මිනිස් දින ගණන 225 කි. එය වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා විය. මෙයට අමතරව, ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා මිනිස් දින 135ක් ද, ඉඩම් බලපත්‍ර ලබාගැනීම/අනවසර නියමානුකූල කිරීම හා ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු සඳහා මිනිස් දින 100ක් බැගින් ද, සේවාලාභීන් විසින් වැය කරන ලද උපරිම කාලය ලෙස වාර්තා විය. සේවා සපයා ගැනීමට වැය කරන ලද කාලය පිළිබඳ විමසීමේ දී, රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩමක් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම සඳහා අවසර ගැනීමට සේවාලාභියෙකු වැය කළ උපරිම කාලය මිනිස් දින 1ක් පමණක් වීම විශේෂිත වේ. එ මෙන් ම, ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු හා රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩමක් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම සඳහා අවසර ගැනීම සඳහා සේවාලාභීන් විසින් වැය කරන ලද අවම කාලය මිනිත්තු 60ක් වේ. ඉඩම් ආරවුල් නිරවුල් කිරීම, පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම හා දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම යන ගැටලු සඳහා වැය කරන ලද අවම කාලය ලෙස වාර්තා වූයේ මිනිත්තු 30ක කාලයකි. එමෙන් ම,

අනවසර නියමානුකූල කිරීම් සඳහා එක් පුද්ගලයෙකු වැය කරන ලද අවම කාලය විනාඩි 5ක් වන අතර එය එක් සේවාලාභියෙකු සේවා ලබාගැනීම වෙනුවෙන් වැය කරන ලද අවම කාලය ද වේ. බොහෝ විට, මෙසේ අවම කාලයක් වැය කර ඇති ඉල්ලීම්, විශේෂයෙන් ම අනවසර නියමානුකූල කිරීම් සඳහා වන ඉල්ලීම් ග්‍රාම නිලධාරි වෙත එක් වරක් පමණක් කරන ලද ඒවා වේ.

මෙම දත්ත අනුව, ඉඩම් රාජකාරි සම්බන්ධ සේවාවන් ලබා ගැනීමට ආයතන වෙත යන සේවාලාභීන්ට දිගු කාලයක් ඒ වෙනුවෙන් ගත කිරීමට සිදුවන බව පැහැදිලි ය. මෙවන් අවස්ථාවල එක් සේවා සපයන කාර්යාලයකින් පසුව තවත් කාර්යාලයකින් සේවා ලබාගැනීමට යාමට හා ඒමට සැලකිය යුතු කාලයක් වැය වේ. ඉඩම් සම්බන්ධිත සේවාවල දී ආයතන සහ නිලධාරීන් රාශියක් මැදිහත් වේ. ග්‍රාම නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් මිණුම් අධිකාරි කාර්යාලය, පළාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් හෝ පළාත් ඉඩම් කොමසාරිස්, දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් මෙන් ම දීර්ඝකාලීන බදු ඉඩම් ලබාගැනීමේ දී ප්‍රාදේශීය සභාව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ, වන සංරක්ෂණ, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව ආදී විවිධ ආයතන වෙතින් සේවා ලබාගැනීමට සේවාලාභීන්ට සිදු වේ.

මෙම කාර්යාල විවිධ ස්ථානවල ස්ථාපිතවීම නිසා සේවා ලබා ගැනීම දුෂ්කර වී ඇති අතර සේවා සපයන ස්ථාන කරා යාමට ගතවන කාලය ද වැඩි වී ඇත. (කෙසේ වුව ද, හම්බන්තොට නව පරිපාලන සංකීර්ණය තුළ මෙම ගැටලුව යම් ප්‍රමාණයකට ලිහිල්ව ඇත). ඉහත සඳහන් කළ දුෂ්කරතා හේතුවෙන් ගමනාගමන වියදම් ඇතුළු අනවශ්‍ය වියදම් දැරීමට සේවාලාභීන්ට සිදුවන බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි වූ අතර ඇතැම් සේවාලාභීන්ට එම වියදම් දැරිය නො හැකි බව ඔවුන් සඳහන් කර සිටි අතර මේ නිසා ම, සේවා ලබාගැනීමට පැමිණීම අත්හැර සිටි සේවාලාභීන් ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හමු විය. ඉඩම් සම්බන්ධ සේවා ලබාගැනීම සඳහා බොහෝ සේවාලාභීන් පැමිණෙන්නේ ඔවුන්ගේ එදිනෙදා ආර්ථික කටයුතුවලට පාඩු සිදු කරගෙන බව ඔවුනු ප්‍රකාශ කර සිටිය හ.

වගුව 6.4: සේවා ලබා ගැනීම වෙනුවෙන් සේවාලාභීන් වැය කළ කාලයෙහි සාමාන්‍ය වෙළෙඳපොළ වටිනාකම (ගැටලුව අනුව)

ඉඩම් ගැටලුවේ ස්වභාවය	සේවා ලබා ගැනීම වෙනුවෙන් වැය කළ කාලයෙහි සාමාන්‍ය වෙළෙඳපොළ වටිනාකම (රුපියල්වලින්)
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම/ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචිය	3,723.96
ඉඩම් සඳහා දීමනා පත්‍ර/ඔප්පු ලබා ගැනීම	1,183.18
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	5,498.02
ඉඩම් අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙන් අයෙකුගෙන් පවරා ගැනීම	1,393.07
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අලුතින් නමක් එක් කිරීම	1,572.59
ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලු	2,252.00
ඔප්පු හා දීමනා පත්‍ර සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	5,530.56
ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබා ගැනීම	1,959.37
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	2,019.44
රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩම් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම	300.00
සමස්තයක් ලෙස	2,845.13

සටහන: මෙම වෙළෙඳපොළ වටිනාකම ගණනය කරනු ලැබුවේ එක් එක් සේවාලාභීන් සේවා ලබා ගැනීමට වැය කළ කාලය (පැය ගණන අනුව) හා ඔහුගේ/ඇයගේ දෛනික වැටුප් හෝ වේතනය හා සසඳා බලා සිදු වූ ආර්ථික පාඩුව සැලකිල්ලට ගනිමිනි.

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

ඉහත වගුවෙන් පැහැදිලි වන අන්දමට විවිධ ගැටලු සඳහා සේවා ලබා ගැනීමට එක් සේවාලාභියෙකු වැය කරන ලද කාලයෙ හි වෙළෙඳපොළ වටිනාකම සැලකූ විට (වගුව 6.4) වැඩි ම වෙළෙඳපොළ වටිනාකම (රු. 5,530.56) වැය කිරීමට සිදුව ඇත්තේ ප්‍රදාන පත්‍ර හා දීමනා පත්‍ර සම්බන්ධ නීත්‍යානුකූල ගැටලු එනම්, එම ලේඛනවල හිමිකරුගේ නම්, මායිම් හා කට්ටි අංකය වැරදීම් නිවැරදි කිරීම් ආදී ගැටලු සඳහා සේවා ලබා ගැනීමට ය. ප්‍රධාන වශයෙන් ම, මෙම ගැටලු ඇතැම් නිලධාරීන්ගේ නො සැලකිලිමත්කම නිසා පැන නැගුන ද එය නිවැරදි කර ගැනීමේ ආර්ථික අවාසිය දරා ගත යුත්තේ සේවාලාභීන් වන අතර එම ගැටලුවලට මුහුණ දුන් සේවාලාභීහු මේ පිළිබඳ දැඩි අප්‍රසාදයකින් පසු වූහ. මෙයට අමතරව, ඉඩම් ආරවුලක් නිරවුල් කිරීම සඳහා වැය කරන ලද වෙළෙඳපොළ වටිනාකම රු. 5,498.02ක් ද, අනවසර නියමානුකූල කිරීමකට රු. 3,723.96ක් ද, ජයභූමි ඔප්පු යටතේ දී ඇති ඉඩම්වල භූමි ප්‍රමාණය/මායිම්/අයිතිය පිළිබඳ ගැටලුවක් විසඳා ගැනීම සඳහා රු. 2,252.00ක් ද, දීර්ඝ කාලීන බදු යටතේ ඉඩමක් ලබාගැනීම සඳහා රු. 2019.44ක් ද, ඉඩමක් රජයට පවරා ගැනී වෙනුවෙන්

වත්දි ලබාගැනීම සඳහා රු. 1959.37ක සාමාන්‍යයක් ද, සේවාලාභීන් විසින් වැය කර ඇත. සේවා සපයා ගැනීමට වැය කළ කාලයෙ හි වෙළෙඳපොළ වටිනාකම අනුව අඩු ම මුදලක් වැය වී ඇත්තේ රජයෙන් ප්‍රදානය කර ඇති ඉඩමක් බැංකු/අනුමත මූල්‍ය ආයතනවලට උකස් කිරීම (රු. 300.00) සඳහා ය.

සියළු ගැටලු පිළිබඳ සලකා බැලූ විට සාමාන්‍යයෙන් ගැටලුවක් සඳහා සේවා ලබා ගැනීමට එක් සේවාලාභියෙකු විසින් වෙන් කරන ලද කාලයෙහි වෙළෙඳපොළ වටිනාකම රු. 2,845.13ක් විය. මෙය සාමාන්‍යයෙන් ප්‍රදේශයේ දෛනික කුලී කම්කරුවෙකුගේ දින 3 හෝ 4ක වැටුපට සමාන වේ. අධ්‍යයනය කළ ගැටලු අති බහුතරය සම්පූර්ණයෙන් විසඳී නොමැති නිසා සේවා ලබා ගැනීම සඳහා වැය කරන කාලයෙහි වෙළෙඳපොළ වටිනාකම තවදුරටත් වැඩි අගයක් ගනු ඇත.

සේවා ලබා ගැනීම සඳහා දිගු කලක් ගත වන නිසා දිගින් දිගට ම සේවා ලබාදෙන ආයතනවලට පැමිණීමට සේවාලාභීන්ට සිදුවන බව ඔවුන්ගෙන් ඇතැම් සේවාලාභීහු ප්‍රකාශ කර සිටිය හ. බොහෝ විට ආයතනවල පැය ගණනාවක් රැඳී සිටීම මෙන් ම යළි යාමට හා එමට ගතවන කාලය සැලකූ කල් හි එදින ආදායම් උත්පාදන මාර්ගවල ඵලදායීව යෙදීමට අවකාශයක් නොමැති බව එවන් බහුතර සේවාලාභීන්ගේ අදහස විය. විශේෂයෙන් ම, දෛනික කුලී ශ්‍රමිකයින් ලෙස රැකියාවල නිරතව සිටින සේවාලාභීන් සඳහන් කරන ලද්දේ ඔවුන්ගේ රැකියාවේ ස්වරූපය අනුව දවසින් භාගයක් හෝ වැඩ කිරීමේ හැකියාව නොමැති හෙයින් සමස්ත දෛනික ඉපැයුම ඔවුන්ට අහිමි වන බව ය. තව ද, ඔවුන්ගේ අත්දැකීම්වලට අනුව සේවය ලබාගැනීම දිනෙන් දින ප්‍රමාදවීම හේතුවෙන් දින ගණනාවක ආදායමක් අහිමිවීමට සේවා සැපයීමේ අක්‍රමවත් බව හේතු වී ඇති අතර එවන් තත්ත්වයක් තුළ ගැටලුව විසඳා ගැනීමට රස්තියාදුවීම වෙනුවට සිය දෛනික ආදායම් උත්පාදන මාර්ගවල නිරතවීම වඩා ඵලදායී බවත්, එසේ නොමැති වුවහොත් එදිනෙදා වියදම් පියවා ගැනීම ද ගැටලුවක් බවත් එවන් සේවාලාභීන් බහුතරයකගේ අදහස වේ.

එමෙන් ම, කාලය අපතේ යාම හේතුවෙන් ආර්ථික කටයුතු මෙන් ම දෛනික ගෘහස්ථ හා වෙනත් වැඩකටයුතුවලට මඟ හැරීම හා පාඩු සිදුවන බව ද ඇතැම් සේවාලාභීන් ප්‍රකාශ කළ හ. ඇතැම් විට අසනීපයෙන් පසුවීම, වයස්ගත බව, ලිවීමට කියවීමට නො හැකිවීම ආදී කරුණු පදනම් කරගෙන තම ගැටලුව සඳහා සේවා ලබා ගැනීමට තනි පුද්ගලයෙකු නො පැමිණ පුද්ගලයන් දෙදෙනෙකු හෝ එයට වැඩි සංඛ්‍යාවක් කැටුව පැමිණීමට සිදුවන බව ද, එවිට කිහිප දෙනෙකුගේ ම කාලය අපතේ යාමක් සිදුවන බව ද ඔවුන්ගේ අදහස විය. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, සේවා සැපයීමේ දුර්වලතා නිසා ඉඩමේ ගොඩනැඟිලි ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට නො හැකිවීම මෙන් ම ඉදි කිරීම් කටයුතු පමාවීම හේතුවෙන් ඉඩම් වත්කමක් ලෙස භාවිතයට ඇති අවස්ථාවට බාධා සිදු කර ඇත. එම තත්ත්වය ඉඩමේ වටිනාකම වර්ධනය කිරීමට හා ඉඩම මනා ලෙස සැලසුම් කිරීමට ඇති හැකියාවට ද බාධාවක් සිදු කරන බව පැහැදිලි විය.

එක් එක් ගැටලු විසඳා ගැනීමේ අභිප්‍රායයෙන් සේවාලාභීන් විසින් වැය කරන ලද කාලයෙහි වටිනාකමත්, ප්‍රවාහන හා සේවා ගාස්තු ලිපි ද්‍රව්‍ය සඳහා වැය කළ මුදල්, තීතිඥ සහ මැනුම් ගාස්තු සහ අතරමැදියන්ට හෝ වෙනත් පුද්ගලයින්ට ලබා දී ඇති මුදල් ද, ඇතුළත්ව මුළු

මුදලෙහි සාමාන්‍ය වගු 6.5 වගුවෙන් දැක් වේ. සමස්තයක් වශයෙන් ගත් කළ ගැටලුවක් වෙනුවෙන් වැය කළ මුදලෙහි සාමාන්‍ය රු. 13,939.85ක් වුවත්, එය තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දී රු. 5,379.03 සිට සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දී රු. 34,160.80 දක්වා පරාසයක විසිර පවතී (වගු 6.6). ගැටලු අනුව සලකා බැලීමේ දී, සමස්ත නියැදියෙහි අඩු ම සාමාන්‍යයක් (රු. 3317.34) වාර්තා වන්නේ පසු උරුමකරු නම් කිරීම, අවලංගු කිරීම හෝ අලුතින් නමක් එකතු කිරීම වෙනුවෙනි. එමෙන් ම, සමස්ත නියැදියෙහි වැඩි ම මුදලක් (රු. 32,931.87)ක් වැය කර ඇත්තේ ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම වෙනුවෙනි (වගු 6.5). මෙහි දී, විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ මෙම මුදල් වැය කිරීම ප්‍රශ්නාවලිය ඇසුරින් තොරතුරු ලබා ගන්නා දිනට වූ අතර ඒ වන තෙක් සේවාලාභීන් විසින් ඉදිරිපත් කර තිබූ ගැටලු විසඳී නොමැති වීමයි. එම නිසා සේවාලාභීන් සඳහන් කර ඇති මුදලට වඩා වැඩි මුදලක් තම ගැටලුව විසඳා ගැනීම සඳහා වැය කිරීමට සිදුවනු ඇත.

වගුව 6.5: ගැටලු අනුව සේවාලාභීන් වැය කර ඇති මුදලෙහි සාමාන්‍යය

ගැටලුව	වැය කරන ලද මුදලෙහි (සාමාන්‍ය රු.)
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම	15,251.77
දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍ර ලබා ගැනීම	7,243.86
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	32,931.87
අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	5,947.37
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අළුතින් නමක් එක් කිරීම	3,317.34
ජයභූමි දීමනාපත්‍ර යටතේ ලබා දී ඇති ඉඩම්වල ගැටලු	9,249.18
දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍රවලට සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	14,139.64
ඉඩමක් රජයට පවර ගැනීම වෙනුවෙන් වන්දි ලබා ගැනීම	11,195.95
දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීම	10,835.00
මූල්‍ය ආයතන වෙත උකස් කිරීම	14,228.33
සමස්තය	**13,939.85**

මූලාශ්‍ර: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011 - හෙ.කො.ගො.ප.පු. ආයතනය

වගුව 6.6: එක් එක් ගැටලුව වෙනුවෙන් සේවාලාභීන් වැය කළ මුළු මුදලෙහි සාමාන්‍යය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව)

ගැටලුව	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය						
	අම්බලන්තොට	සූරියවැව	හම්බන්තොට	තිස්සමහාරාම	ලුණුගම්වෙහෙර	වලස්මුල්ල	තංගල්ල
ඉඩම් බලපත්‍ර ලබා ගැනීම/අනවසර නියමානුකූල කිරීම	48,277	16,561	5,327	5,433	17,361	11,339	4,143
දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍ර ලබා ගැනීම	9,335	-	14,362	6,494	6,135	4,294	6,541
ඉඩම් ආරවුල් නිරවුල් කිරීම	11,105	97,623	6,540	9,200	8,161	1,858	24,559
අයිතිය වෙනත් අයෙකුට පැවරීම/වෙනත් අයෙකුගෙන් පවරා ගැනීම	5,656	2,817	700	5,698	11,284	5,436	4,507
පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම/අළුතින් නමක් එක් කිරීම	4,135	18,100	3,385	1,117	1,921	1,486	3,933
ජයභූමි දීමනාපත්‍ර යටතේ ලබා දී ඇති ඉඩම්වල ගැටලු	5,030	-	5,275	7172	11,550	9,632	10,120
දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍රවලට සම්බන්ධ වෙනත් නීත්‍යානුකූල ගැටලු	-	-	19,170	695	575	36,000	36,425
ඉඩමක් රජයට පවරා ගැනීම වෙනුවෙන් වන්දි ලබාගැනීම	6,167	3,741	4,069	916	12,750	44,916	4,638
දීර්ඝ කාලීන බද්දු යටතේ ඉඩම් ලබා ගැනීම	-	17,270	1,625	7,584	4,825	4,025	36,250
මූල්‍ය ආයතන වෙත උකස් කිරීම	1,085	-	-	100	4,150	-	-
සමස්තය	21,270	34,161	6,433	5,379	10,993	9,932	10,814

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගො.ප.පු. ආයතනය

දිස්ත්‍රික්කයේ ඉඩම් සම්බන්ධ ගැටලු අතුරෙන් ප්‍රධාන ම ගැටලුව වූයේ ඉඩම් සම්බන්ධයෙන් බලපත්‍ර ලබා ගැනීම හෝ සේවාලාභීන් විසින් අනවසරයෙන් භුක්ති විඳිනු ලබන රජයේ ඉඩම් නියමානුකූල කර ගැනීම යි. ඒ සඳහා සේවාලාභීන් විසින් වැය කළ කාලයෙහි වෙළෙඳපොළ වටිනාකම ද ඇතුළත්ව මුළු මුදලෙහි අඩු ම සාමාන්‍ය වූ රු. 4,143 තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, වැඩි ම සාමාන්‍ය වූ රු. 48,277 ක මුදල අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාසයෙන් ද වාර්තා විය. දීමනා පත්‍ර ලබා ගැනීම වෙනුවෙන් වැය කළ මුදලෙහි සාමාන්‍යය රු. 6,135 (වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) සිට රු. 14,362 (හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය) දක්වා පරාසයක පැතිරිණි.

සේවාලාභීන් විසින් වැඩි ම සාමාන්‍යයක් වැය කර ඇත්තේ ඉඩම් ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා වන අතර එය රු. 97,623ක් ලෙස සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා විය. මයුරපුර මහවැලි කොට්ඨාසයේ ඉඩම් සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටලු සහගත තත්ත්වය මෙයට ප්‍රධාන හේතුවක් වන අතර මැණුම් ගාස්තු, දඩ මුදල් ගෙවීමට සිදුවීම, අනවසර ඉඩම් සම්බන්ධයෙන් මහවැලි අධිකාරිය විසින් ගොනු කරන නඩු සඳහා ඉදිරිපත්වීමට සිදුවීම හා ඒ වෙනුවෙන් නීතිඥ ගාස්තු ගෙවීමට සිදුවීම ඒ සඳහා බලපාන අනෙකුත් හේතු වේ. එමෙන් ම, බොහෝ විට පහළ අධ්‍යාපන මට්ටම නිසා අධිකරණ කටයුතු සම්බන්ධයෙන් දැනුවත් භාවයක් නොමැති ගැමියන් අධිකරණයට යාමේ දී වෙනත් කිසිවෙකු කැඳවාගෙන යාම නිසා ඔහුගේ/ඇයගේ ගමන් වියදම් හා වෙනත් වියදම් දැරීමට සිදු වීම මෙම ගැටලු වෙනුවෙන් වැය කරන මුදල ඉහළ අගයක පැවතීමට හේතු වේ. ඉඩම් ආරවුල් වෙනුවෙන් අඩු ම මුදලක් වැය කොට ඇත්තේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර අධ්‍යයනයට ලක් කළ ග්‍රාම නිලධාරී වසම් බොහෝමයක් කඳු සහිත දුෂ්කර ප්‍රදේශවීමත්, ගමනාගමන දුෂ්කරතා නිසා බොහෝවිට මෙවන් ගැටලු ග්‍රාම නිලධාරී හා පොලීසියට ඉදිරිපත් කිරීමත්, බොහෝ ප්‍රදේශවල ඉඩම් මැන වෙන් කර දීමනා පත්‍ර ලබා දී තිබීමත් නිසා එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් සාමාන්‍යයෙන් අඩු මුදලක් වැය වීම සිදු වේ.

ඉඩම් වෙනත් අයෙකුට පැවරීම සඳහා අඩු ම සාමාන්‍ය මුදලක් වැය කර ඇත්තේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. ඉඩම් වෙනත් අයෙකුට පැවරීම සඳහා අවශ්‍ය පත්‍රිකා සහ ඔප්පු පිටපත් ලබාගැනීම සඳහා වැය කළ යුතු කාලය හා ගමන් කළ යුතු දුර ප්‍රමාණය අනිත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට සාපේක්ෂව පහළ මට්ටමක පැවතීමත්, මෙම ප්‍රදේශයේ බොහෝ සේවාලාභීන්ට ඉඩම් පැවරීම සම්බන්ධයෙන් අත්දැකීම් බහුලවීම නිසා ප්‍රමාදයකින් තොරව තම කාර්යය ඉටු කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුමක් පැවතීමත් එයට හේතු වේ. මෙම ගැටලුව වෙනුවෙන් වැඩි ම සාමාන්‍යයක් වැය කර ඇත්තේ දුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙනි. දුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයේ පවතින අකාර්යක්ෂමතාව මෙයට මූලික වශයෙන් හේතු වී තිබේ.

පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම හෝ අලුතින් නමක් එක් කිරීම සඳහා සේවාලාභීන් විසින් වැය කර ඇති මුදලෙහි අඩු ම සාමාන්‍යය (රු. 1,117) තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, වැඩි ම සාමාන්‍යය (රු. 18,000) සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද වාර්තා විය. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය විශාල භූමි වපසරියක විසිරී පවතින අතර මහජන දිනය වන බදාදා දිනය ඉඩම් අංශයට ඉතා ම කාර්යබහුල දිනයකි. එම නිසා පසු උරුමකරු නම් කිරීම වැනි ඉතා හදිසියෙන් පසු විපරම් කළ යුතු යැයි සේවාලාභීන් විසින් නො සලකන කාර්යයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සිදු කරන ගමන්වාර ගණන සීමාවීම එම කොට්ඨාසයේ පසු උරුමකරු නම් කිරීම සඳහා වැය වන සාමාන්‍ය මුදල අඩුවීමට හේතුවක් වේ. අනෙක් අතට සූරියවැව ප්‍රදේශයේ මහවැලි ව්‍යාපාරය යටතේ අතිරේක භෝග සඳහා ලබා දී ඇති ඉඩම්වලට ඉහළ වටිනාකමක් පවතින හෙයින් දැඩි ඉල්ලුමක් පවතින අතර එම ඉඩම් පසු උරුමකරු වෙත නිවැරදිව පැවරීමට සේවාලාභීහු උත්සුක වෙති. මේ නිසා,

නිරන්තරයෙන් පසු විපරමක් කිරීමට පෙළඹෙන හෙයින් ඒ සඳහා වන වියදම අධිකවීමක් සිදු වේ. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ සූරියවැව මහවැලි කොට්ඨාස කළමනාකරු පෙන්වා දෙනු ලැබුවේ ප්‍රදේශයේ පසු උරුමකරුවන් නම් කර නොමැති ඉඩම්වල පසු උරුමකරුවන් නම් කිරීම සඳහා ඉඩම්ලාභීන් දැනුවත් කිරීමට විශේෂ පියවර ගෙන ඇති බවත්, ඒ අනුව බොහෝ ඉඩම්වල පසු උරුමකරු නම් කිරීමට කටයුතු යොදා ඇති බවත් ය. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පළාත් සභා සහ මධ්‍ය රජය මගින් පරිපාලනය කෙරෙන ඉඩම් සම්බන්ධයෙන් මෙම ගැටලුව පිළිබඳ ක්ෂේත්‍ර කටයුතුවල දී ජනතාව දැනුවත් කරන බව ජනපද නිලධාරීහු ප්‍රකාශ කළ හ. ඒ සඳහා ගමින් ගමට ගොස් ජනතාව දැනුවත් කිරීමේ සහ අදාළ කාර්යයන් සිදු කිරීමේ විශේෂ වැඩසටහනක් අරඹා ඇතත් අවශ්‍ය නිලධාරීන්ගේ හිඟය නිසා එය එතරම් සාර්ථක වී නොමැති වීම නිසා එය එතරම් සාර්ථක වී නොමැත. කෙසේ වුව ද, මෙවැනි සරල කාර්යයක් වෙනුවෙන් සේවා ලබා ගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදු වීම සඳහා අදාළ ආයතනවල අකාර්යක්ෂමතාව ප්‍රබල ලෙස බලපානු ලබයි.

ජයභූමි දීමනා පත්‍ර ලබා දී ඇති ඉඩම්වලට එකී දීමනා පත්‍ර ලබා දී ඇත්තේ කට්ටි සැලැස්මක් හෝ මිණුම් රේඛා නොමැතිව ස්වභාවික හතර මායිම් දීමනා පත්‍රයේ ඇතුළත් කිරීමෙනි. මේ නිසා බොහෝ විට භූමි ප්‍රමාණයේ මෙන් ම මායිම්වල වෙනස්වීම් ද සිදු වේ. එයට අමතරව, ඇතැම් අවස්ථාවල දී හතර මායිම් වැරදි ආකාරයෙන් දීමනා පත්‍රයේ සටහන් කිරීම, කැබලි අංක වැරදි ලෙස සටහන් කිරීම ආදිය සිදු වී ඇත. මෙවන් ගැටලු නිරාකරණය කර ගැනීමේ ක්‍රියාදාමයේ දී සේවාලාභීන් විසින් වැය කර ඇති අවම සාමාන්‍ය (රු. 5,030) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, උපරිමය (රු. 11,550) ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද වාර්තා විය. කෙසේ වුව ද, මහවැලි අධිකාරියේ වලව විශේෂ බල ප්‍රදේශයේ ඉඩම් සඳහා මේ ආකාරයෙන් ජයභූමි දීමනා පත්‍ර ලබා දී නොමැති හෙයින් ඒ සම්බන්ධයෙන් වන ගැටලු මහවැලි කොට්ඨාස කළමනාකරණ කාර්යාලය ඇතුළු අදාළ අනෙකුත් කාර්යාලවලට වාර්තා නො වන බව වලව විශේෂ බල ප්‍රදේශයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු සමඟ 2011.12.24 දින සිදු කළ සම්මුඛ සාකච්ඡාවේ දී අනාවරණය විය.

දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍ර සම්බන්ධයෙන් වෙනත් නීත්‍යානුකූල ගැටලු එනම්, කැබලි අංක වැරදි ලෙස සටහන් කිරීම, මායිම් හෝ කට්ටිකරුගේ නම වැරදි ලෙස සටහන් කිරීම, නිලධාරීන් විසින් කට්ටිකරුට පෙන්වා දුන් ඉඩම් කට්ටිය සහ දීමනා පත්‍රයේ සටහන් වන අංකය එක සමාන නොවීම, දිසාපතිවරයා විසින් 1970/1980 දශකවල බලපත්‍ර ලබා දී ඇති ඉඩම් සඳහා ම මහවැලි ව්‍යාපාරය විසින් පසු කලෙක වෙනත් පුද්ගලයින් සඳහා බලපත්‍/දීමනා පත්‍ර ලබාදීම ආදී ගැටලු රාශියක් ක්ෂේත්‍රයේ දී ඉදිරිපත් විණි. මේ සම්බන්ධයෙන් වැය කර ඇති මුදලෙහි අවම සාමාන්‍යය රු. 575ක් (ලුණුගම්වෙහෙර)ද, උපරිම සාමාන්‍යය රු. 36,425ක් (තංගල්ල) අතර පරාසයක විහිදී පැතිරිණි. තංගල්ල ප්‍රදේශයේ මෙම මුදල ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත්තේ එම ප්‍රදේශයේ අඳුපැලැන, ගෝඨයිම්බරගම ආදී ග්‍රාම නිලධාරී වසම්වල ඇතැම් ඉඩම් සඳහා දිසාපතිවරයා යටතේ එක් අයෙකුටත්, මහවැලි අධිකාරිය යටතේ තවත් අයෙකුටත් ඉඩම් බලපත්‍/දීමනා පත්‍ර ලබාදීම හේතුවෙන් වරින් වර ආයතන කිහිපයක් වෙත යාමට සේවාලාභීන්ට සිදුවීම, නීතිඥ ගාස්තු වැය කිරීමට සිදුවීම ආදියයි. එයට අමතරව ඇතැම් අවස්ථාවල දී දීමනා පත්‍රවල වැරදි නිවැරදි කර ගැනීම සඳහා ඉඩම් පෞද්ගලිකව මැනීමට වියදම් දැරීමට සිදුවීම ද මේ සඳහා හේතු වී ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩකටයුතුත් සමඟ ඒ සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමේ කටයුතු වේගවත් වී ඇත. මෙසේ ඉඩම් රජයට පවරා ගැනීම වෙනුවෙන් වන්දි ගැනීමේ කටයුතු සඳහා වැය කළ මුදලෙහි අවම සාමාන්‍යය රු. 916ක් වූ අතර එය තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා විය. උපරිම සාමාන්‍යය වාර්තා වූයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වන අතර එය රු. 44,916ක් විය. කැකිරිඔබඩ ජලාශය ඉදිකිරීම සඳහා පවරාගත් ඉඩම්වලට වන්දි ලබාගැනීම වෙනුවෙන් නිතර නිතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ අදාළ වෙනත් ආයතනවලට යාමට සිදු වීම මෙයට හේතු වී ඇත. කෙසේ වුව ද, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන කටයුතුවල දී ඉඩම් විශාල ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇති නමුත් බොහෝ සංවර්ධන ව්‍යාපෘතිවල ඉඩම් සඳහා වන්දි ගෙවීම කඩිනම්ව සහ ක්‍රමවත් සිදු වී ඇති බව හෙළි විය. විශේෂයෙන් ම, හම්බන්තොට වරාය සඳහා පවරාගෙන ඇති ඉඩම් සඳහා වන්දි ලබාදීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුවී ඇති අතර වරාය ඉදි කිරීමේ දී ඉඩම් හා නිවාස අහිමි වූ අධ්‍යයනයට ලක් කරනු ලැබූ දැනට හම්බන්තොට වරාය ගම්මානයේ පදිංචි සේවාලාභීන්ගෙන් 100%ක් ම ප්‍රකාශ කරනු ලැබුවේ තමන්ට වන්දි ලබාදීමේ දී ප්‍රමාදයකින් තොරව වන්දි මුදල් හා ඉඩම් ලබාදුන් බවත් ය. එහි දී අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය මේ සඳහා බලපා ඇත.

කෙසේ වුව ද, සූරියවැව මහින්ද රාජපක්ෂ ක්‍රිකට් ක්‍රීඩා පිටිය සඳහා පවරා ගනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් මෙම ක්‍රමවත් බව දැකිය නො හැකි වූ අතර එම ව්‍යාපෘතිය හේතුවෙන් ඉඩම් හා නිවාස අහිමි වූ පුද්ගලයින්ට ඉඩම් හා වන්දි මුදල් ලබා දී ඇති නමුත් ඔවුන්ට ලබා දී ඇති ඉඩම්වල ස්ථිර නිවාස තැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවක් පැන නැඟී තිබිණි. සැලසුම්වල පැවති දුර්වලතා හේතුවෙන් මෙම ගැටලු පැන නැඟී ඇත. ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු ලබාදුන් ඉඩම්වලින් නැවත ඔවුන් ඉවත් කිරීමේ අවදානමක් පවතින බවත්, ලබා දී ඇති ඉඩම් වසර ගණනාවකට පෙර වෙනත් පුද්ගලයින්ට උස්බිම් වගා ක්‍රමය යටතේ ලබා දී ඇති නමුත් එම ඉඩම් පවරා ගැනීමකින් තොරව ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේ ඉදි කිරීම් හේතුවෙන් ඉඩම් අහිමි වූ පුද්ගලයින්ට ලබා දී ඇති බවත් ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී අනාවරණය විය.

දීර්ඝ කාලීන බදු යටතේ ඉඩම් ලබා ගැනීමේ දී සේවාලාභීන් වැය කළ අවම සාමාන්‍ය රු. 1,625ක් වන අතර එය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා විය. උපරිම සාමාන්‍යය වූ රු. 36,250 තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා විය. මෙම මුදල ඉහළයාම සඳහා හේතු ගණනාවක් බලපා ඇත. එනම්, එක් එක් ආයතනවල තක්සේරු මුදල් සඳහා මුදල් වැය කිරීමට සිදුවීම, නිතර නිතර ඒ සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට සිදු වීම සහ ඇතැම් අවස්ථාවල දී තම කාර්යය කඩිනමින් ඉටු කර ගැනීමේ අභිලාෂයෙන් අතරමැදියන්ට මුදල් හෝ ද්‍රව්‍ය ලබාදීමට සිදුවීම ඒ අතර ප්‍රමුඛ වේ.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දත්ත අනුව, බැංකු හා අනුමත මූල්‍ය ආයතන වෙත ඉඩම් උකස් කිරීමේ ප්‍රවණතාවක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවතී. අධ්‍යයනය සඳහා මෙම ගැටලුවට අදාළව තොරතුරු ලබාදුන් සේවාලාභීන් සංඛ්‍යාව ඉතා සීමිත වූ අතර එයට හේතු වූයේ මෙම කාර්යය සඳහා එතරම් කාලයක් වැය නො කොට කඩිනමින් ඉටු කර ගැනීමට හැකියාව ඇති හෙයින් තම සේවා අවශ්‍යතාව සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කර සේවා සපයන තුරු බලා සිටින සේවාලාභීන් විශාල පිරිසක් නො වීමයි. බැංකුවක් හෝ අනුමත මූල්‍ය ආයතනයක් වෙත තම ඉඩම උකසට තැබීමට ප්‍රාදේශීය ලේකම් හෝ මහවැලි කොට්ඨාස කළමනාකරු වෙතින්

අනුමැතිය ලබා ගැනීම සඳහා වැය කළ අවම සාමාන්‍යය රු. 100/-ක් (තිස්සමහාරාම) වූ අතර උපරිම සාමාන්‍යය රු. 4,150 (ලුණුගම්වෙහෙර) විය.

6.6.2 කෘෂි ආර්ථිකයට සිදු කරන බලපෑම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බහුතර ප්‍රදේශවාසීන් කෘෂි ආර්ථිකය මුල් කරගෙන ජීවත් වන නිසා සේවා සැපයීමේ දුර්වලතා ගොවි පන්තියේ ජනතාව කෙරෙහි දැඩි බලපෑමක් සිදු කොට ඇත. 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත මඟින් ග්‍රාමීය ගොවි පන්තිය හා කෘෂි කාර්මික අංශයේ දියුණුව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත. මේ අනුව එහි ප්‍රධාන අරමුණු අතර,

- ගැමියන්ට හා සුළු ඉඩම් හිමියන්ට ඉඩම් ලබාදීම මඟින් ශ්‍රී ලංකාව තුළ ඉඩම් හිමි ගොවි පන්තියක් බිහි කිරීම
- ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික අංශය දියුණු කිරීම සඳහා ග්‍රාමීය ගොවි පන්තියේ දායකත්වය ඉහළ දැමීම
- ග්‍රාමීය රැකියා වියුක්තිය සඳහා පිළියම් යෙදීම
- ශ්‍රී ලංකාව ආහාරවලින් පෝෂණය කිරීම

යනාදි අරමුණු පවතී. එසේ වුව ද, එම අරමුණුවලට පරස්පර ලෙසින් රජයේ ඉඩම් පිළිබඳ සේවා සැපයීමේ දුර්වලතා මතුවීම හේතුවෙන් බහුතර ග්‍රාමීය ජනතාවට සහ ඔවුන්ගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන කෘෂිකර්මාන්තයට වන බලපෑම බැහැර කළ නො හැකි තරම් ප්‍රබල බව ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් පැහැදිලි විය. විශේෂයෙන් නාගරික ප්‍රදේශවල මෙන් නොව බහුතර ග්‍රාමීය ජනතාවක් වෙසෙන මෙම ප්‍රදේශයේ සේවා හා කර්මාන්ත ඉලක්ක කරගත් රැකියා අවම වන අතර ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය මත යැපීමට සිදුවීම නිසා ආදායම් උත්පාදනය සඳහා කෘෂිකර්මාන්තය හැර වෙනත් විකල්ප අවස්ථා අල්ප වේ. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව කෘෂි කර්මාන්තයට අවශ්‍ය ප්‍රමුඛතම ප්‍රාග්ධනයක් වන ඉඩම් සම්බන්ධ ගැටලු දිගින් දිගට ම පැවතීම හේතුවෙන් කෘෂි ආර්ථික රටාවට දැඩි බලපෑමක් සිදුව ඇත.

ප්‍රදේශයේ සිටින ඉඩම් හිමිකාරීත්වයක් නොමැති පුද්ගලයන්ට භුක්තිය සඳහා සුදුසු ඉඩම් කැබලි ලබාදීමේ ක්‍රමවේදයේ ගැටලු සහගත තත්ත්වයත්, ඉතිරිව පවතින ඉඩම් ප්‍රමාණයෙහි සීමාසහිත බවත් නිසා, ඉඩම් අහිමි හා වගා කටයුතු කරන ඉඩමේ අයිතිය තහවුරු කරගැනීමට නො හැකි ගොවි ජනතාවක් බිහි වී සිටිති. මේ තත්ත්වය යටතේ වගා බිම් නොමැතිකම, වගා බිම් අහිමිවීම හා වගා කටයුතුවල නියැලීම දුෂ්කරවීම යන ගැටලුවලට මුහුණ දීමට ඔවුන්ට සිදුව ඇති බව එවත් සේවාලාභීහු ප්‍රකාශ කර සිටිය හ. උදාහරණ වශයෙන් ගොවීන් විසින් දීර්ඝ කාලයක් තිස්සේ වගා කරමින් සිටි, ලුණුගම්වෙහෙර රක්ෂිතයට පවරා ගන්නා ලද බෝගහපිටිය ග්‍රාම නිලධාරී වසමට අයත් මහා මාර්ගය හා ලුණුගම්වෙහෙර ජලාශය අතර බිම් තීරුව පෙන්වා දිය හැකි ය. දැනට ලුණුගම්වෙහෙර රක්ෂිතයට අයත් මෙම බිමෙහි ප්‍රදේශයේ ජනතාව වගා කටයුතු කරන අතර බහුල වශයෙන් කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය පාරිසරික ගැටලුවක් වී ඇත.

එමෙන් ම, ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ඇතැම් ඉඩම් කච්චේරිවලට අවශ්‍ය පුළුල් ප්‍රචාරය නො දීම හේතුවෙන් ඉඩම් අහිමි ගොවි පන්තියේ පුද්ගලයන්ට සුදුසු ඉඩම් කට්ටි ලබා ගැනීමේ අවස්ථා මගහැරී ඇති අතර අදාළ ඇතැම් නිලධාරීන් පෞද්ගලික හිතවත්කම් අනුව ඉඩම් ලබා දීමට කටයුතු කිරීම නිසා ඉඩම් ලබාගැනීමේ නියම සුදුස්සන්ට ඉඩමක් ලබා ගැනීමේ හිමිකම අහිමි වන බව ද එවන් අත්දැකීම් ලැබූ ඇතැම් සේවාලාභීහු සඳහන් කර සිටිය හ. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, නීත්‍යානුකූලව ඉඩම් අයිතියක් නොමැති වීම නිසා රජයට අයත් හිස් ඉඩම්, ලඳු කැලෑ හා විවිධ රක්ෂිත ප්‍රදේශවල වගා කටයුතු කිරීමට ගොවි ජනතාව පෙළඹී ඇත. මෙය දීර්ඝකාලීනව සලකා බලන විට ගැටලු මතු කරවන්නක් වේ. එසේම, මෙසේ වගා කරමින් තිබෙන හිස් ඉඩම් හා ලඳු කැලෑ ප්‍රදේශ, විවිධ අවස්ථාවල දී රජය මඟින් අභයභූමි හා රක්ෂිත ලෙස නම් කිරීම නිසා එවන් ගොවීන්ට වගා කටයුතු නවතා දැමීමට සිදුව ඇත. ඇතැම් පුද්ගලයන් ප්‍රකාශ කර සිටියේ ඉඩම් භුක්තියට අදාළ ඇතැම් ක්‍රියාකාරකම් (උදා: රක්ෂිත ප්‍රදේශවල අනවසර වගාව) සඳහා මුල් අවස්ථාවේ දැනුවත් නො කර හා විධිමත් ක්‍රියාමාර්ග නො ගෙන, පසුව පුද්ගලයන්ට විරුද්ධව නඩු පවරන බවත්, එවිට කාලය හා මුදල් ද වැය වන අතර මුලින් ම නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් කාලයත් මුදලත් ඉතිරි කරගත හැකි බවත් ය. රජය විසින් ගැසට් පත්‍රයක් මඟින් අභයභූමියක් ලෙස නම් කරන ලද විල්මැත්තාව, ප්‍රදේශයේ ගොවීන් විසින් මෙලෙස අනවසරයෙන් වගා කටයුතු කරමින් සිටි ප්‍රදේශයකි. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, මේ ආකාරයට ඉඩම් අයිතිය හා භුක්තිය පිළිබඳ ගැටලුවලට නෛතික හා ආයතනික වශයෙන් නියමිත කලට නිසි විසඳුම් නො දීම ගොවි ජනතාව නීතියට පටහැනි ආකාරයෙන් කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමට පෙළඹවීමක් ඇති කරනු ලැබේ.

ඉඩම් අයිතියක් නොමැතිවීමත්, ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීමට නො හැකිවීම හා ප්‍රමාදවීමත් හේතුවෙන් කෘෂිකාර්මික කටයුතු වැඩි දියුණු කිරීමට අවශ්‍ය ණය ආධාර ලබා ගැනීම, රජයේ සහනාධාර ලබාගැනීම මෙන් ම කෘෂිකාර්මික කටයුතු සඳහා විවිධ වරප්‍රසාද ලබාගත හැකි සමිති සමාගම්වල සාමාජිකත්වය ලබාගැනීම වැනි කටයුතුවලට බාධා එල්ල වී ඇත. වගා ණය නො ලැබීම හේතුවෙන් නියමිත කන්නයට වගා කටයුතු කිරීමට නො හැකිවීම, අවිධිමත් මාර්ගවලින් ඉහළ පොලියට ණය ලබා ගැනීමට සිදුවීම නිසා ඵලදාවෙන් ලැබෙන ලාභය අවමවීම, කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නා යෙදවුම් ප්‍රමාණවත් පරිදි හා නියමිත වේලාවට ලබාගත නො හැකිවීම වැනි බාධක ඇති වේ. විශේෂයෙන් ම, කුරුඳු වගාව සඳහා රජයෙන් ලබාදෙන ලද පොහොර සහනාධාරය ලබාගැනීමේ දී මෙම ගැටලුව මතුවී ඇති බව සේවාලාභීහු සඳහන් කළ හ. එම නිසා, වගා කටයුතු ඵලාදයීව සිදු කරගෙන යාමට නො හැකි තත්ත්වයක් උද්ගතව පවතී. ඇතැම් සේවාලාභීන් විසින් සඳහන් කරන ලද අන්දමට, ඉඩම් ලබාදීමේ දී ඉඩම් සංවර්ධනය කළ පසු ඔප්පු ලබාදෙන බවට ප්‍රකාශිත බලපත්‍ර ලබා දුන්න ද ඉඩම් සංවර්ධනය කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට බැංකු ණය පහසුකම් හෝ මෙම බලපත්‍රය ඇපයට තබා ලබාගත නො හැක. මෙම හේතුවෙන් කෘෂිකාර්මික ඉඩම් නිසි ලෙස සංවර්ධනය කිරීමටත්, නිසි ලෙස සැලසුම් කිරීමත් දුෂ්කර වී ඇත.

සම්මුඛ සාකච්ඡා හා සේවාලාභීන්ගෙන් ලබා ගත් තොරතුරුවලට අනුව, ප්‍රදේශයේ කිරි ගොවිතැනට ඉඩම් නොමැතිවීම නිසා කිරි ගොවියන්ට සිය ජීවිකාව සිදු කර ගත නො හැකි මට්ටමක් උද්ගතව ඇත. රජය විසින් වරින් වර කිරි ගොවීන් සඳහා තෘණ භූමි වෙන් කළ ද ඒවා වෙනත් පුද්ගලයන් විසින් අනවසරයෙන් පදිංචිවීමත්, වගා කිරීමත් නිසා එම සැලසුම් නිසියාකාරව ක්‍රියාත්මක වී නොමැත. උදාහරණයක් ලෙස සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති අක්කර 2000ක වර්ග ප්‍රමාණයකින් යුත් අන්දරවැව තෘණ භූමියට අයත්

භූමි ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් මේ වන විට අනවසර පදිංචිකරුවන් හා වගා කරුවන් අතට පත්වී තිබේ. එමෙන් ම, විල්මැන්නාව අභයභූමිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව එම ප්‍රදේශයේ මී ගව පාලනය (තිස්සමහාරාම මී කිරි) කළ ගොවීන්ගෙන් ගවයන්ට තෘණ සපයා ගැනීම ගැටලුවක් වී ඇති බවත් එක් ගොවියෙකු විසින් පමණක් ඔහුට අයත් මී ගවයින් 200ක් පමණ මී ගව පට්ටියක් අම්පාර ප්‍රදේශයට ගෙන ගිය බවත්, ඒ නිසා තමාගේ ජීවනෝපාය ගැටලු පැන නැඟී ඇති බවත් අදාළ ගොවි මහතා විසින් පැවසීය.[20] සම්මුඛ සාකච්ඡාවලට අනුව ලුණුගම්වෙහෙර ප්‍රදේශයේ ද තෘණ භූමි ප්‍රමාණය අඩුවීම නිසා ප්‍රදේශයේ සත්ත්ව පාලනය දුර්වල මට්ටමක පැවතීමට ප්‍රධාන හේතුවක් ව තිබේ.

6.6.3 ණය ලබාගැනීමට නො හැකිවීම/අපහසුතා ඇතිවීම

කෘෂිකාර්මික ණය මෙන් ම වෙනත් අවශ්‍යතා සඳහා ණය ලබා ගැනීමේ දී සේවාලාභීන් මුහුණ දෙන දුෂ්කරතා සේවාලාභීන්ගේ සමාජ ආර්ථික ජීවිතයට දැඩි බලපෑමක් සිදු කරන ගැටලුවක් බව ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් පැහැදිලි විය. ඉඩම් වැදගත් ප්‍රාග්ධන සාධකයක්වීම හේතුවෙන් ඉඩම් ඔප්පු හා දීමනා පත්‍ර ඇපයට තබා ණය ලබාගැනීමේ හැකියාවක් පවතී. විශේෂයෙන්, රජය විසින් ලබාදුන් ඉඩම්වල අයිතිය හා ඒවා උකස් කිරීම සම්බන්ධව පැවති බාධක 1980 දශකයේ දී ලිහිල් කරන ලදී. ඒ අනුව, එකී ඉඩම් රාජ්‍ය අංශයේ බැංකු හා ආයතනවලට උකස් කිරීමේ අවකාශ ලැබීම තුළ ඒවා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගැනීමට හැකි විය (රත්නායක, 2002). එසේ වුව ද, ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමේ විවිධ දුර්වලතා හේතුවෙන් එහි ප්‍රාග්ධන වටිනාකම ගැටලුවකට තුඩු දී ඇති ආකාරය ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී පැහැදිලි විය (සිද්ධි අධ්‍යයනය 6.3). සිද්ධි අධ්‍යයනයෙන් පෙන්නුම් කරන ආකාරයට ඉඩම් කට්ටියේ මායිම් වැරදි ආකාරයට සටහන්වීම නිසා අදාළ සේවාලාභීන්ට ණය ලබාගැනීමට නො හැකි වූවා මෙන් ම නිලධාරීන් වෙතින් සිදු වූ වරද නිවැරදි කිරීමට තම වෘත්තීය කාලය ද, පෞද්ගලික ශ්‍රමය ද වැය කිරීමට සිදු විය. මහජන දිනය ලෙස සැලකෙන බදාදා දින කිහිපයක් ම අදාළ කාර්යාලවලට යාමට සිදුවීම නිසා ඔහුගේ වෘත්තීය කටයුතුවලට බාධා සිදු වූ අතර එය ඔහුගෙන් ඉගෙනුම ලබන සිසු දරුවන්ගේ ඉගෙනීමට ද බාධාවක් විය. මේ අනුව, ඉඩම් සම්බන්ධ සේවාවන් වගකීම් රහිත ව සිදු කිරීම හේතුවෙන් ඇතැම් විට සේවාලාභීන්ට තම අභිමතාර්ථ ඉටු කර ගැනීමට ඉවහල් වන වත්කමක් ලෙසින් භාවිතා කිරීමට බාධාවකි.

20 තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තිස්සපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වැලිගත්ත ප්‍රදේශයේ සේවාලාභීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් ලද තොරතුරු ඇසුරිනි. (2011.11.15)

සිද්ධි අධ්‍යයනය 6.3: ජයභූමි ඔප්පු සහිත ඉඩම්වල හතර මායිම් වැරදි ලෙස සටහන්වීම

වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රම්මල ග්‍රාම නිලධාරී වසමේ පදිංචි 34 හැවිරිදි ජී. මහිපාල මහතා වෘත්තියෙන් ගුරුවරයෙකි. අවුරුදු 37ක කාලයක පටන් ඔහුගේ පවුල භුක්ති විඳින ගොඩ ඉඩම පර්චස් 40ක භූමි ප්‍රමාණයකින් යුක්ත වේ: මෙය ඔහුගේ පියාට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කළ බලපත්‍රයක් මගින් ලැබුණු ඉඩමක් වූ අතර 1996 වසරේ දී ඒ සඳහා ජයභූමි දීමනා පත්‍රයක් නිකුත් කෙරිණි. තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හම්/7/ප්‍ර/49294 අංකය යටතේ එම ඉඩම ලියාපදිංචි කර ඇත. 2000 මාර්තු 31 වැනි දා ලියාපදිංචි කරන ලද ජයභූමි ඔප්පුවට අනුව මෙම ඉඩමේ හතර මායිම් ලෙස සඳහන් වූයේ උතුරින් ඕ. සෙදෝරිස්ගේ ඉඩම ද, නැගෙනහිරින් ප්‍රධාන මාර්ගය ද, දකුණින් පී.ජී. මාටින් අප්පුහාමිගේ ඉඩම හා බස්නාහිරින් කේ. උදෙනිස්ගේ ඉඩම ද ලෙසිනි.

මහිපාල මහතා මෙන් ම ඔහුගේ බිරිඳ ද ගුරු වෘත්තියේ නියැලෙන අතර ඔවුහු 2011 සැප්තැම්බර් මාසයේ දී මහජන බැංකුවෙන් රාජ්‍ය සේවක ණයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ හ. නිවසේ ඉදි කිරීම් කටයුතු සඳහා මෙම ණය ප්‍රයෝජනයට ගැනීම ඔවුන්ගේ අපේක්ෂාව විය. ඒ අනුව ඔවුන් පත්ඉරු, මිණුම් රේඛා ආදී ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය සියලු ලිපි ලේඛන බැංකුවට භාරදෙන ලදී. 2011 ඔක්තෝබර් 28 වැනි දින මහජන බැංකුවේ නීති නිලධාරිනිය මහිපාල මහතාට ලිපියකින් දන්වා එවා ඇත්තේ අදාළ ඉඩමේ හතර මායිම්, ඉඩමේ සැලැස්මේ දක්වන මායිම්වලට වඩා වෙනස් ආකාරයට ඔප්පුවේ සඳහන්වීම හේතු කොට ගෙන ඔවුන් ඉල්ලුම් කරන ලද ණය මුදල ලබාදිය නො හැකි බව ය.

ඉන් පසුව, මහිපාල මහතා වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත ගොස් මෙම කාරණය ඉදිරිපත් කරන ලදුව එහි දී ඉඩම පෞද්ගලිකව මැණීමට උපදෙස් දෙනු ලැබිණි. රු. 15,000/-ක් පමණ වැය කර මනිනු ලැබූ ඉඩමේ සැලැස්ම අදාළ ඉඩමේ මුල් සැලැස්මට සමාන විය. නව සැලැස්මට අනුව, ඉඩමේ හතර මායිම් ලෙස සඳහන් වූයේ උතුරින් ඉඩමේ ප්‍රවේශ මාර්ගය, නැගෙනහිරින් සෙදෝරිස්ගේ ඉඩම, දකුණින් මාර්ග රක්ෂිතය, බස්නාහිරින් පී.ජී මාටින් අප්පුහාමිගේ ඉඩම ය.

දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් සහතික කරන ලද නව පිඹුරත් සමඟ දීමනා පත්‍රයේ වැරදි ආකාරයෙන් දක්වා ඇති මායිම් නිවැරදි කර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිය මහිපාල මහතාට දැනගන්නට ලැබුනේ එය නිවැරදි කර ගැනීම සඳහා හම්බන්තොට නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් හරහා ඉඩම් කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුවට යැවිය යුතු බව ය. නමුත්, මේ සම්බන්ධව වෙනත් අයගෙන් විමසා බැලීමේ දී හෙළි වූයේ එය හම්බන්තොට නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් ඉටු කරවා ගත හැකි බව ය.

මෙයට අමතරව, බිම් සවිය වැඩසටහනින් නිකුත් කරන සහතික පත්‍රයෙහි හා මිණුම් රේඛාවෙහි ඉඩම්වල ප්‍රවේශ මාර්ගය නො තිබීම සහ එය තවත් බිම් කට්ටියක් වශයෙන් දැක්වීම නිසා ද සේවාලාභීහු දුෂ්කරතාවකට මුහුණ දෙති. එනම්, නාගරික සංවර්ධන අධිකාරී පනත අනුව වීථි රේඛා සහතික කිරීමේ දී ඉඩමේ බිම් කට්ටි සැලසුමෙහි ප්‍රවේශ මාර්ග අනිවාර්යයෙන් දක්වා තිබිය යුතු ය. නිවාස ණය ලබා ගැනීමේ දී බැංකු වෙත ඉඩම් ඔප්පු/දීමනා පත්‍ර උකස් තැබීමේ දී වීථි රේඛා සහතිකය අත්‍යවශ්‍ය වන අතර බිම් සවිය සහතික පත්‍රවලට එවන් සහතික පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රාදේශීය සභාවට හැකියාවක් නොමැති නිසා ගැටලු මතු වී තිබේ[21]. මේ ආකාරයට බිම් සවිය යටතේ තම ඉඩම සඳහා සහතික පත්‍ර ලැබූවෙක් වීථි රේඛා සඳහා නැවත ඉල්ලුම් කරන විට එම සේවාලාභියාගේ ඉඩම

---

21 සම්මුඛ සාකච්ඡා - සභාපති, හා කළමනාකරණ සහකාර, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව (2011.12.1)

නැවත පෞද්ගලිකව මැන දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් සහතික කිරීමට සිදු වේ. මේ සඳහා සේවා ලාභියාට සැලකිය යුතු අමතර මුදලක් සහ කාලයක් කැප කිරීමට සිදු වේ.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, ඉඩම් සම්බන්ධ ආරවුල් හා ඉඩම් අයිතිය සනාථ කිරීම සම්බන්ධව විවිධ ගැටලු නිසා නිවාස ණය ලබා ගැනීමට නො හැකි වූ ඇතැම් සේවාලාභීන්ට නිවාස අලුතින් ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම, වැඩි දියුණු කිරීම වැනි කටයුතු සිදු කිරීමේ දුෂ්කරතා මතුව ඇති අතර ඔවුන්ගෙන් ඇතැමෙකුට ඉඩම සම්බන්ධ කරගෙන ව්‍යාපාර කටයුතුවල නිරතවීමට අවශ්‍ය ණය මුදල් ලබාගැනීමට ද නො හැකි වී ඇත. එවන් සේවාලාභීන්ගේ අත්දැකීම්වලට අනුව එම තත්ත්වය ඔවුන්ගේ ජීවන තත්ත්වය හා ආර්ථික තත්ත්වය වර්ධනය කර ගැනීමට බාධාවක් ලෙස ක්‍රියාත්මක වන අතර ඇතැම් විට රාජ්‍ය නො වන සංවිධානවල ණය ආධාර වැඩසටහන්වල ප්‍රතිලාභ පවා නො ලැබී යාමට මේ තත්ත්වය හේතු වී ඇති නිසා සමාජ ආර්ථික දියුණුව අඩාලවීමට හේතු වී ඇත.

6.7 ඉඩම් සම්බන්ධ ආරවුල් පැන නැඟීම

ඉඩම් සම්බන්ධ නීතියේ ඇති විවිධ දුර්වලතා, ඉඩම් ගැටලුවලට ඇතැම් වගකිවයුතු නිලධාරීන්ගේ නිසි අවධානය යොමු නො වීම හා ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොමැතිවීම, බහුතර ඉඩම් ගැටලු මතුවීමට තුඩු දී ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව පුද්ගලයන් අතර ඇතිවන ආරවුල් හා පවුල් අතර ආරවුල් නිසා සමාජයේ සාමකාමීත්වයට බාධා සිදු වී ඇත. මේ තත්ත්වය අධ්‍යයන ප්‍රදේශයේ පොලිස් ස්ථානවල දත්ත හා ඔවුන්ගෙන් ලද තොරතුරුවලට අනුව පැහැදිලි විය. නිදසුන් ලෙස, වලස්මුල්ල පොලීසියේ දත්තවලට අනුව 2010 වසරේ පොලීසිය වෙත ලැබී ඇති සුළු පැමිණිලි සංඛ්‍යාව වන 3,024න් 703ක් (23%) ඉඩම් ආරවුල් විය. 2011 වසරේ වලස්මුල්ල පොලීසියට ලැබුණු සුළු පැමිණිලිවලින් 25%-30%ක් ප්‍රමාණයක් ඉඩම් ආරවුල් වූ අතර සූරියවැව පොලිස් ස්ථානයට ලැබුණු පැමිණිලි 2848න් 11%ක් ඉඩම් ආරවුල් විය.[22] නමුත් ඉඩම් ආරවුල් නිසා සිදුවන පුද්ගල ඝාතන, බරපතල පහරදීම් හා තුවාල සිදු කිරීම් ඉඩම් ආරවුල් යටතට නොව අපරාධ ගනයට ගැනෙන හෙයින් ඉඩම් සම්බන්ධ ආරවුල් වාර්තා වන ප්‍රමාණයට වඩා වැඩි අගයක් ගනු ඇත.

තව ද, රජයේ ඉඩම්වලට අදාළ ගැටලු සම්බන්ධව විසඳුම් ලබාදීමට පොලීසියට හැකියාවක් නොමැතිබව අදාළ පොලිස් බල ප්‍රදේශවල පොලිස් නිලධාරීහු පවසා සිටිය හ. රජය මඟින් ප්‍රදානය කර ඇති ඉඩමක් සම්බන්ධව ඇතිවන ගැටලු පොලීසියට ඉදිරිපත් කිරීමේ දී බොහෝ විට සිදුවන්නේ එම ගැටලු ප්‍රාදේශීය ලේකම්, මහවැලි කොට්ඨාස කළමනාකරු ආදී අදාළ ආයතනවලට යොමු කිරීම ය. අදාළ ආයතනවලින් සේවා ප්‍රමාදවීම් සිදුවීම නිසා ගැටලුවලට නිසි විසඳුම් නොමැති වීමෙන් ඉඩම් ආරවුල් වර්ධනය වී පුද්ගල ඝාතන පවා ප්‍රදේශයෙන් වාර්තා වී ඇත. උදාහරණයක් ලෙස ගොන්නොරුව ප්‍රදේශයේ මායිම් ආරවුලක් වර්ධනය වී අවු. 19ක පාසල් සිසුවෙක් ඝාතනයට ලක් කිරීම පෙන්වා දිය හැක.[23] කලක් තිස්සේ තිබූ ගැටුමට නිසි

---

[22] සම්මුඛ සාකච්ඡා - හම්බන්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන් හා තංගල්ල පොලිස් අධිකාරීතුමා (2011.12.12/2011.12.14)

[23] සම්මුඛ සාකච්ඡා - හම්බන්තොට පොලිස් ස්ථානයේ නිලධාරීන් හා ග්‍රාම නිලධාරී, ගොන්නොරුව (2011.12.12/2011.12.14)

විසඳුම් නො ලැබීම හේතුවෙන් මෙසේ ආරවුල් වර්ධනයවීම සමාජයේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල කර ඇත.

අධ්‍යයන ප්‍රදේශයේ පොලිස් ස්ථානවලින් ලද තොරතුරුවලට අනුව, ඉඩම් ආරවුල් සමථ මණ්ඩලයට යොමු නො කරන නිසා ඉඩම් ආරවුල් විසඳා ගැනීමට සිවිල් නඩු දැමීමට පොලීසිය විසින් උපදෙස් දෙනු ලැබේ. නමුත් මුද්දර ගාස්තු, නඩු ගාස්තු ඇතුළු වියදම් අධිකවීම හා දිගු කාලයක් වැය වීම නිසා සේවාලාභීන් ඒ සඳහා යොමුවීමට අකමැත්ත දක්වයි. මේ නිසා ඉඩම් ආරවුල් වර්ධනවීම, ඒවා විසඳීමට කල් ගතවීම හා ඉඩම් ආරවුල් වෙනත් ආරවුල් දක්වා වර්ධනයවීම සිදු වේ. පොලීසිය හරහා නඩු ගොනු කිරීම වාසිදායක නිසා එසේ සිදු කරන සේවාලාභීන් සිටිය ද, ඒ ආකාරයට ගැටලු විසඳීමේ දී අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමට සැලකිය යුතු කාලයක් ගතවන නිසා ඒ අතරතුර කාලයේ දී මෙලෙස ඉඩම් ආරවුල් වර්ධනයවීමේ හා ගැටුම්කාරී තත්ත්වයන් ඇතිවීමේ ප්‍රවණතාවක් පවතී. [24]

වගුව 6.7: අධ්‍යයන ප්‍රදේශයේ ඉඩම් ආරවුල් බහුලව වාර්තා වන ප්‍රදේශ

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ඉඩම් ආරවුල් වැඩි වශයෙන් වාර්තා වන ප්‍රදේශ
වලස්මුල්ල	බෝවල, හඳුගල, රම්මල, කන්දේබැද්ද, මැදගම්ගොඩ, මොදරවාන
හම්බන්තොට	ගන්නොරුව, කැටන්වල, එලල්ල, කැලියපුර
සූරියවැව	අන්දරවැව
ලුණුගම්වෙහෙර	මත්තල, මහඅලුත්ගම, කුඩා ගම්මාන 03 (මහානාගපුර)
අම්බලන්තොට	හැඩවින්න, මයුරපුර
තිස්සමහාරාමය	විරවිල

මූලශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, 2011, හෙ.කො.ගෝ.ප.පු. ආයතනය (අදාළ පොලිස් ස්ථානවලින් ලබාගත් තොරතුරු ඇසුරිනි)

පොලිස් ස්ථානවලින් ලද තොරතුරුවලට අනුව, තිස්සමහාරාම ප්‍රදේශයේ බහුතරයක් ඉඩම් ආරවුල් ඇති වී ඇත්තේ රජයේ ඉඩම් අත්පත් කරගෙන ජීවත්වන පවුල් අතර ය. මේ හේතුවෙන් මායිම් ගැටලු ද, ඒ නිසා වන පහරදීම් ද බොහෝමයක් ප්‍රදේශයෙන් වාර්තා වේ.[25] එ මෙන් ම, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කදිරගොඩ, අඳපැලැන, ගෝඨයිම්බරගම ආදී ග්‍රාම නිලධාරී වසම් කිහිපයක මහවැලි බල ප්‍රදේශ හා පළාත් සභා බල ප්‍රදේශ පිළිබඳ නිරවුල් සීමා මායිම් නො වීම ගැටලුවලට මුලපුරා ඇත.[26] වලව විශේෂ බල ප්‍රදේශය ගැසට් කිරීමේ දී, 1972 දී පමණ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය යටතට පත් කර ඇති ප්‍රදේශ ද, මහවැලි අධිකාරියට පවරා ඇත. මෙහි D4 S1 ඇලෙන් අක්කර දෙකක් ඔබ්බට ගිය විට මහවැලි බල ප්‍රදේශය සේ සැලකෙන අතර ඒ සඳහා ස්ථිර මායිම් නොමැත. මෙම ප්‍රදේශයේ හමු වූ ඇතැම් සේවාලාභීන්ට එම ඉඩම් සඳහා දිසාපතිවරයා 1972 දී බලපත්‍ර ලබා දී පසුව දීමනා පත්‍ර ද සකස් කර දී ඇත. නමුත් මහවැලි අධිකාරිය විසින් පසු කලෙක එම ඉඩම් සඳහා ම වෙනත්

24 සම්මුඛ සාකච්ඡා - පොලිස් ස්ථානාධිපති, වලස්මුල්ල (2011.12.01)
25 සම්මුඛ සාකච්ඡා - සුළු පැමිණිලි අංශයේ ස්ථානාධිපති, වලස්මුල්ල (2011.12.14)
26 සම්මුඛ සාකච්ඡා - පොලිස් නිලධාරීන්, අම්බලන්තොට පොලීසිය (2011.12.14)

පුද්ගලයන්ට බලපත්‍ර/දීමනා පත්‍ර ලබා දී ඇත. එම නිසා, වර්තමානය වන විට ඒවා ඉඩම් ආරවුල් දක්වා වර්ධනය වී ඇත.

ඉඩම් ගැටලුවලට පිළියමක් ලෙස රජය විසින් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන (බිම් සවිය) ක්‍රියාවට නංවා ඇති අතර හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එය ක්‍රියාත්මක විය. මේ අතර බිම් සවිය වැඩසටහන මඟින් ඉඩම් මැනීමේ දී පුද්ගලයන් භුක්ති විඳි ඉඩම්වල මායිම් හා ඉඩම් ප්‍රමාණය වෙනස්වීම හේතුවෙන් එම ප්‍රදේශවල ඉඩම් ආරවුල් වර්ධනය වී ඇත. ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහානාගපුර ප්‍රදේශයේ බිම් සවිය වැඩසටහනින් පසුව ඉඩම් ආරවුල්වල කැපී පෙනෙන වර්ධනයක් පවතී. එතෙක් සමඟියෙන් ජීවත් වූ අඅසල්වැසි පුද්ගලයන් යාබද ඉඩම්වල ජීවත්වන හා ගොවිතැන් කටයුතු සිදු කරන්නන් සමඟ ආරවුල් ඇති කර ගැනීම මෙම තත්ත්වයට හේතු වී ඇති අතර බිම් සවිය වැඩසටහන ආරම්භවීමත් සමඟ මෙම ප්‍රදේශයෙන් පොලීසිය වෙත ලැබෙන ඉඩම් ආරවුල් පිළිබඳ පැමිණිලි ප්‍රමාණය වර්ධනයවීම සිදු වී ඇත.[27]

සිද්ධි අධ්‍යයනය 6.4: නොතාරිස් ඔප්පු මඟින් රජයේ ඉඩම් පැවරීමේ දී මතුවන ගැටලු

වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිස්සු බැද්ද ග්‍රාම නිලධාරී වසමේ පදිංචි වික්‍රමනායක මහතා සතුව පැවති අක්කර 2ක මුඩු ඉඩම ස්වර්ණභූමි දීමනා පත්‍රයක් යටතේ රජයෙන් ප්‍රදානය කරන ලද්දකි. වසර 17ක් පමණ මුඩු ඉඩමක්ව පැවති එය මිලට ගැනීමට ප්‍රදේශයේ ම පදිංචි පත්මසිරි ගොඩගේ මහතා කැමැත්ත ප්‍රකාශ කරන ලදී. 2011 අප්‍රේල් මාසයේ දී පත්මසිරි මහතා විසින් මෙම ඉඩම වික්‍රමනායක මහතාගෙන් රුපියල් ලක්ෂ 8ක අත්පිට මුදලට මිලදී ගන්නා ලද්දේ ලක්ෂ 5ක බැංකු ණය මුදලක් ද ලබා ගනිමිනි. එම ඉඩම වික්‍රමනායක මහතා විසින් පත්මසිරි මහතා වෙත නොතාරිස් ඔප්පුවක් මඟින් පවරා දෙන ලදී.

ඉඩම් ලාභියෙකු විසින් වෙනත් අයෙකුට ඉඩම පැවරීමේ දී තමන් හෝ තම දරු පවුල එයින් අනාථභාවයට පත් නො වන බව තහවුරු කළ යුතු වේ. මෙම ඉඩම් ගණුදෙනුව සිදුවන අවස්ථාව වන විට වික්‍රමනායක මහතා තම බිරිඳගෙන් සහ පුතුගෙන් වෙන්ව ජීවත් වුව ද, වික්‍රමනායක මහත්මිය සහ පුතු ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් ඉඩම විකිණීම සම්බන්ධයෙන් තම කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

ඉඩම විකුණා මාස 6ට පමණ පසු ඉඩම විකිණීම සඳහා තම කැමැත්ත ලබා ගත්තේ බලහත්කාරයෙන් බව වික්‍රමනායක මහතාගේ පුතු ලිපියක් මඟින් ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දෙන ලදී. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් නැවත විමර්ශනයක් පැවැත්වීමට කටයුතු යොදා වික්‍රමනායක මහතාගේ පුතු කැඳවීමට කිහිප වතාවක් ම උත්සාහ දරණ ලද අතර පත්මසිරි මහතා ද ඔහු කැඳවා ගෙන ඒමට උත්සාහ දැරුව ද එය අසාර්ථක විය. මේ නිසා ඉඩම සංවර්ධනය කිරීම නතර කිරීමට පත්මසිරි මහතාට සිදු වූ අතර මාස කිහිපයකට පසුව පත්මසිරි මහතා තමන්ට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කරන ලදී. මේ අනුව වික්‍රමනායක මහතාගේ පුතු පොලීසියට කැඳවා පැමිණිල්ල විමර්ශනය කරන ලද අතර එහිදී වික්‍රමනායක මහතාගේ පුතු තම වරද පිළිගත් හෙයින් පත්මසිරි මහතාගේ ගැටලුව විසඳිණි

[27] සම්මුඛ සාකච්ඡා - පොලිස් ස්ථානාධිපති, ලුණුගම්වෙහෙර පොලීසිය (2011.12.13)

ඉඩමේ අයිතිය පවුලේ එක් පුද්ගලයෙකු වෙත පැවරුන විට ද, ඉඩමේ අයිතිය පැවරීමට පෙර හෝ ඉඩමේ අයිතිය නො පවරා ඉඩම් හිමියා මිය ගිය විට ද, පවුලේ සාමාජිකයන් අතර ඉඩමේ අයිතිය සම්බන්ධව විවිධ ගැටුම් හා මත භේද ඇතිවන ආකාරයේ සිද්ධීන් ක්ෂේත්‍රය තුළින් හමු විය. ඇතැම් විට, ඉඩම් හිමිකම නෛතිකව හිමි වූ පුද්ගලයා එම ඉඩම් භුක්තිය සඳහා ඉදිරිපත් නො වූ විටත් හවුල් ඉඩම්වලින් එක් පාර්ශවයක් ඉඩම් විකිණීමත් මෙම ආරවුල් උග්‍රවීමට හේතු වී ඇති බව ද පැහැදිලි ය. මෙයට අමතරව, නොතාරිස් ඔප්පු මඟින් ඉඩම් පැවරීම මෙන් ම නොතාරිස් ඔප්පුවක් භාවිතා නො කර ඉඩම් අයිතිය වෙනත් පුද්ගලයන්ට විකිණීම ද, ක්ෂේත්‍රය තුළ සිදුවන අතර එවැනි අවස්ථාවල දී ඉඩම් අයිතිය සම්බන්ධව පසුකාලීනව ආරවුල් ඇතිවීමේ ප්‍රවණතාවක් පවතී (සිද්ධි අධ්‍යයනය 6.4). විශේෂයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන මත්තල, තම්මැන්නාව ප්‍රදේශවල මෙලෙස කලකට පෙර ඉඩම් විකුණා හා අතහැර ගිය පුද්ගලයන් මේ වන විට ඉඩමට අයිතිවාසිකම් ඉල්ලීම එකී ප්‍රදේශවල ඉඩම් ආරවුල් මෑත කාලීනව වර්ධනය වීමට තුඩු දී ඇත.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අනුව, ඉඩම් පවරා දීමේ දී ඉඩම් භාර ගත්ත ද, පදිංචියට නො ගිය ඉඩම්වල වෙනත් පුද්ගලයන් අනවසරයෙන් පදිංචිවීම නිසා පසුකාලීනව ආරවුල් පැන නැඟී ඇත. එමෙන් ම, හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිවන මත්තල ප්‍රදේශයේ ඇතැම් පුද්ගලයන් එවන් ඉඩම්වල අයිතිකරුවන්ට රහසින්, ඉඩම් කැබලිවලට කඩා විකිණීම සිදු කිරීම නිසා ප්‍රදේශය තුළ ඉඩම් සම්බන්ධව ගැටලු ද ආරවුල් ද වර්ධනය වී ඇත.

6.8 ඉඩම්වලට වන්දි ලබාගැනීම සම්බන්ධව ගැටලු පැන නැඟීම

ඉඩම් සම්බන්ධ සේවා සැපයීම නිසි පරිදි සිදු නො වීමෙන් හා ප්‍රමාදවීම නිසා ඉඩම් හා දේපල සඳහා වන්දි ලබාගැනීමේ අවිනිශ්චිත තත්ත්වයන් පැන නඟින බැව් සේවාලාභීහු ප්‍රකාශ කර සිටිය හ. අධ්‍යයනයට ලක් කරන ලද සේවාලාභීන්ගෙන් සියයට 1.6 (8%) වන්දි ලබාගැනීම සම්බන්ධව ගැටලුවලට මුහුණ දී ඇති අතර ඔවුන්ගෙන් බහුතර සේවාලාභීහු නිසි කලට වන්දි නො ලැබීම පිළිබඳ චෝදනා කර සිටිය හ.

සිද්ධි අධ්‍යයනය 6.5ට අනුව, මෙම සේවාලාභියාට මේ වන තෙක් ඉඩම වෙනුවෙන් වන්දි ලැබී නොමැත. ඔහුගේ ඉඩම දිගින් දිගටම සේදී යාම නිසා ඉඩමේ වටිනාකම තවදුරටත් ක්ෂය වී ඇත. නියමිත කලට වෙනත් ඉඩමක් හෝ වන්දි මුදලක් මෙම සේවාලාභියා වෙත ලැබුණි නම් මේ වන විට ඔහුට එම ඉඩම සංවර්ධනය කරන්නට ඉඩකඩ තිබිණි. වර්තමානයේ ඔහුට වන්දි මුදල ලැබුණ ද, මුල දී තක්සේරු කරන ලද එම වන්දි ලබාගැනීමෙන් හා එම මුදල යෙදවීමෙන් මෙම සේවාලාභියාට වෙනත් ඉඩමක් මිලට ගැනීම ද, වෙනත් ඉඩමක් මෙම ඉඩම පැවති මට්ටමින් සංවර්ධනය කිරීම ද කළ නො හැක. මේ නිසා සේවාලාභියා ආර්ථික, සමාජීය හා මානසික වශයෙන් දැඩි පීඩනයකට හසුව ඇත.

සිද්ධි අධ්‍යයනය 6.5: රජයේ සංවර්ධන ව්‍යාපාර නිසා ඉඩම්වලට සිදු වූ හානි හා නිසි පරිදි වන්දි නො ලැබීම

42 හැවිරිදි වියේ පසුවන ඒ. එච්. පීරිස් මහතා අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් දූනම උතුර ග්‍රාම නිලධාරි වසමේ පදිංචිව සිටියි. ඔහු වෘත්තියෙන් ප්‍රදේශයේ රජයේ පාසලක මුරකරුවෙකි. පීරිස් මහතාගේ දෙමාපියන්ට ගම්උදාව ව්‍යාපාරය යටතේ ලැබුණු අක්කරයක භූමි ප්‍රමාණයක් සහිත ඉඩමේ 1982 වසරේ සිට ඔවුන් පදිංචිව සිටි අතර 1996 වසරේ දී එම ඉඩම සඳහා ජයභූමි දීමනා පත්‍රයක් පිරිනැමිණි. මෙම ඉඩමේ ඔවුන් ජීවත්වන නිවස හැර අවශේෂ ඉඩම් කොටසෙහි එළවළු, මුං ඇට ආදිය ඔවුන් විසින් වගා කොට තිබුණි.

2006 වසරේ දී පමණ දූනම ඇළ හා තෝනාගම ඇළ යා කරන කිලෝ මීටර් දෙකක් පමණ වාරි ඇළක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදි කිරීමට කටයුතු යොදන ලදී. දූනම උතුර ප්‍රදේශයෙන් එම වාරි ඇළෙහි ගමන් මාර්ගය විහිදී ගිය අතර ඇළ දෙපස වූ ප්‍රදේශවාසීන්ගේ ඉඩම් හරහා මෙම වාරි ඇළ ඉදි විය. පීරිස් මහතාගේ ඉඩම ද වාරි ඇළ ගමන් කරන මාර්ගයේ පිහිටි අතර ඒ හේතුවෙන් ඔහුගේ ඉඩම මැදින් වූ අක්කර භාගයක පමණ භූමි කොටසක් ඔහුට අහිමි විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පීරිස් මහතාටත්, වාරි ඇළ හේතුවෙන් ඉඩම් අහිමි වූ අනෙකුත් පුද්ගලයන්ටත් වෙනත් ඉඩම් ලබාදෙන බවට ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරීන් හට පිටපත් සහිතව ලිඛිතව දැනුම් දෙන ලදී.

පීරිස් මහතාගේ ඉඩම පිහිටීම අනුව, ඉඩම ආරම්භයේ දී භූමිය ඉතා පටු වූ අතර ඉඩමෙහි අවසාන කොටසෙහි භූමිය මීටර් 150ක් පමණ පළල විය. ඔහුගේ ඉඩම මැදින් ගලා යන වාරි ඇළ පීරිස් මහතාගේ ඉඩම තුළ දී අඩි 25ක් පමණ දිගින් ගලා යයි. එම වාරි ඇළ ඔහුගේ ඉඩමේ ආරම්භක කොටසේ දී අඩි 6ක් පමණ ගැඹුරට විහිදී යන අතර ඉඩම අවසානය වන විට එහි ගැඹුර අඩි 30ක් පමණ වේ.

වාරි ඇළෙහි ඉදි කිරීම් කටයුතු නිම කිරීමෙන් අනතුරුව පීරිස් මහතාගේ ඉඩම ක්‍රම ක්‍රමයෙන් වාරි ඇළට සෝදා යන්නට විය. මේ වන විට අක්කරයක් වූ මුළු ඉඩමින් අක්කර භාගයක් පමණ ඉතිරි වී පවතින අතර අවශේෂ ඉඩම් ප්‍රමාණය වාරි ඇළ නිසා අහිමි වී ඇත. පීරිස් මහතා පදිංචි නිවස සහිත කොටස පමණක් ඉතිරිවන ආකාරයට ඉඩම කැඩී ගොස් වාරි ඇළට එක්වී ඇති නිසා ඉඩම ප්‍රමාණයෙන් කුඩා වීම ද, අවදානම් සහගත වීම ද සිදු වී ඇත.

වාරි ඇළෙහි ඉදි කිරීම් කටයුතු නිම කිරීමෙන් අනතුරුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පොරොන්දු වූ පරිදි වෙනත් ඉඩමක් හෝ වන්දි මුදලක් මේ වන තෙක් ප්‍රදානය කර නොමැත. මේ පිළිබඳ සහනයක් බලාපොරොත්තුවෙන් වාරිමාර්ග ඉංජිනේරුවරයා වෙත ඉල්ලීම් යොමු කළ ද කිසිදු ඵලක් වී නොමැත. ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම් වෙත ගොස් මෙම ගැටලුව ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් ඔවුන් පැමිණ ඉඩම පරීක්ෂා කර ඇතත්, මෙතෙක් කිසිදු සහනයක් ලයනල් මහතාට ලැබී නොමැත.

මේ අතර වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් වාරි ඇළෙහි කටයුතු අරඹන විට මෙම ඉඩමේ ඔප්පුව පීරිස් මහතාගේ මවගේ නමින් තිබුණි. මේ අතරතුර කාලයේ දී පීරිස් මහතා හට දේපළ ණයක් ගැනීමේ අවශ්‍යතාව හේතුවෙන් එම ඉඩම, මව විසින් පීරිස් මහතාගේ නමට පවරන ලදී. එහෙත්, ණය අනුමත කිරීම උදෙසා ඉඩම තක්සේරු කිරීමට ඉඩම් පරීක්ෂණයට පැමිණි නිලධාරීන් ඉඩමේ තත්ත්වය දැක ණය අනුමත කිරීම ප්‍රතික්ෂේප කර ඇත.

සේවාලාභීන්ගේ අත්දැකීම්වලට අනුව, ප්‍රමාද වී වන්දි මුදල ලැබීම නිසා එය පවතින වෙළෙඳපොළ වටිනාකම හා නො ගැලපෙන හෙයින් නව ඉඩමක් මිල දී ගැනීමට, නව ගොඩනැගිල්ලක් හෝ නිවසක් ඉදි කිරීමට මෙන් ම නව වගාවක් හෝ ආදායම් උත්පාදන මාර්ගයක් ආරම්භ කිරීමට එම වන්දි මුදල ප්‍රමාණවත් නොවේ. එමෙන් ම, ඉඩම සඳහා ලැබෙන වන්දිය වෙළෙඳපොළ වටිනාකම හා නො ගැලපීම මෙන් ම වන්දි ලැබීම පමාවීම, වන්දිය නො ලැබීම ආදී ගැටලුකාරී තත්ත්වයන් පැන නැඟීම තුළ පුද්ගලයන් සමාජීය, ආර්ථික හා මානසික වශයෙන් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී ඇත.

6.9 සාරාංශය

ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීමේ දී යම් ප්‍රමාදයන් සිදුවීම හම්බන්තොට දිස්ත්‍රික්කයේ බහුලව දක්නට ලැබෙන තත්ත්වයක් වන අතර මේ නිසා එම සේවාවන් ලබා ගන්නා බහුතර සේවාලාභීන්ට සමාජ, ආර්ථික හා මානසික දුෂ්කරතාවන්ට මුහුණදීමට සිදුව ඇත. මානසික ප්‍රශ්නවලට ගොදුරුවීම, විවිධ නීත්‍යානුකූල ගැටලුවලට මුහුණදීමට සිදුවීම, ආර්ථික වශයෙන් අවාසි සහගත තත්ත්වයන් ඇතිවීම, ඉඩම් ආරවුල්වලට මැදිහත්වීම හා කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමේ දී මතුවන බහුවිධ ගැටලු මේ අතරින් ප්‍රධාන වේ. ඉඩම් සම්බන්ධ සේවා ලබා ගැනීමට ගතවන කාලය හා වැය වන පිරිවැය සේවාලාභීන්ට ආර්ථික වශයෙන් අවාසි සහගත තත්ත්වයක් නිර්මාණය කර ඇති අතර එය සමාජයීය ජීවිතයට ද බාධා එල්ල කර ඇත. විශේෂයෙන්, ප්‍රදේශයේ බහුතරය කෘෂිකර්මාන්තයේ නිරතවීමත්, ඉඩම් ඒ සඳහා ඍජුව ම සම්බන්ධවීමත් හේතුවෙන් සේවා සැපයීමේ ප්‍රමාදය නිසා කෘෂි ආර්ථික රටාවට ද, එයින් ජීවිකාව ගෙන යන ගොවියාගේ සමාජ ආර්ථික ජීවිතයටත් වන බලපෑම බැහැර කළ නො හැකි ය. එ මෙන් ම ඉඩම් සම්බන්ධ ආරවුල් ඇතිවීම වර්ධනය වීමට සේවා සැපයීමේ ක්‍රියාදාමය සැලකිය යුතු බලපෑමක් සිදු කර ඇත. ඉඩම්වලට වන්දි ලබා ගැනීමේ අපහසුතා, සමාජයීය වශයෙන් අසරණවීම, යටිතල පහසුකම්වලට ප්‍රවේශවීමේ අපහසුව හා ඉඩම් සංවර්ධනය කර ගැනීමේ දුෂ්කරතා සේවාලාභීන් මුහුණ දෙන අනෙකුත් ගැටලු අතර ප්‍රමුඛ වේ.

හත්වැනි පරිච්ඡේදය

රජයේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක අනෙකුත් ආයතන තම බලතල ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දෙන දුෂ්කරතා

7.1 හැඳින්වීම

ඉඩම් සම්බන්ධව සේවා සපයන ආයතන අතර ප්‍රජාව වෙත සෘජුව මෙන් ම වක්‍ර ව සේවා සපයන ආයතන ද වේ. මේවා අතුරෙන් ඇතැම් ආයතන පාරිසරික, සංස්කෘතික, පුරාවිද්‍යාත්මක සහ ජෛව විවිධත්වය ද වටිනාකම් ආරක්ෂා කිරීමට බැඳී සිටී. මෙම ආයතන විසින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවාලාභීන් වෙත සෘජුව සේවා නො සැපයුව ද, රජයේ ඉඩම් සම්බන්ධයෙන් විශාල වගකීමක් උසුලන අතර අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට රජයේ ඉඩම් සංරක්ෂණය, කළමනාකරණය මෙන් ම තිරසාර බව ආරක්ෂා කරමින් එම ඉඩම්වල සුරක්ෂිත බව තහවුරු කිරීම එකී ආයතනවල කාර්යභාරය අතර වේ. ඉහත කී කාණ්ඩයට අයත් වන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ඉඩම් නිරවුල් කිරීමේ කාර්යාලය (බිම් සවිය වැඩසටහන), නාගරික සංවර්ධන අධිකාරිය, සහ පළාත් පාලන ආයතන දිස්ත්‍රික්කය තුළ ඉඩම් විෂයය සම්බන්ධයෙන් ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී මෙන් ම ආයතනික වගකීම් ඉටු කිරීමේ දී මුහුණ දෙන ගැටලු සහ දුෂ්කරතා මෙම පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

7.2 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවතින ස්වභාවික සම්පත් අතර වනාන්තර සහ සත්ත්ව සම්පතට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. දැනට දිස්ත්‍රික්කයේ වනාන්තර ලෙස පවතින්නේ මුළු භූමි ප්‍රමාණයෙන් 14.5%ක් පමණක් වන අතර එයින් 4.36%ක් ඝන වනාන්තර ද, 8.70%ක් විවෘත වනාන්තර ද, 1.41%ක් වගා කරන ලද වනාන්තර ද වේ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය, 2010). හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩිවන ජනගහනය සහ කඩිනම් සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් වන සම්පතට එල්ල වන පීඩනය තුළ වන සම්පත සුරැකීමේ සහ කළමනාකරණය කිරීමේ වගකීම උසුලන ප්‍රධාන ආයතනය වන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යි. රටවැසියන්ගේ සහ ජාතික ආර්ථිකයෙහි හිතසුව පිණිස දැව හා වෙනත් වන ද්‍රව්‍ය සඳහා වන ඉල්ලුම සපුරාලීම මෙන් ම මනා පාරිසරික සේවාවන් පවත්වා ගෙන යාම සඳහා දේශීය වන හා වෘක්ෂ සම්පත් තිරසර අයුරින් කළමනාකරණය කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලික අරමුණු පහත සඳහන් පරිදි වේ.

1. රටේ වන සම්පත, ජාතික වන ප්‍රතිපත්තියට අනුකූලව සහ තිරසාර වන කළමනාකරණයේ මූලධර්මවලට අනුව කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම තහවුරු කිරීම

2. ප්‍රධාන වශයෙන් පස, ජලය සහ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීමේ අරමුණින් ස්වභාවික වනාන්තර පිහිටි ප්‍රදේශ සංරක්ෂණය කිරීම

3. සමාජ ආර්ථික ප්‍රතිලාභ තහවුරු කර ගැනීම සඳහා වන සම්පත තිරසාර අයුරින් ප්‍රයෝජනයට ගැනීම

4. වන සම්පත සුරැකීම සඳහා ක්‍රියාත්මක කළයුතු ක්‍රමෝපායන් සැකසීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම

5. වන සංරක්ෂණය සහ තිරසාර වන කළමනාකරණය පිළිබඳව මහජන අවබෝධය ඉහළ නැංවීම සහ ශාක වැවීම සහ වන වගා කළමනාකරණය පිළිබඳ මහජන සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම (http://www.forestdept.gov.lk).

දිස්ත්‍රික්කයේ පවතින රජයේ ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින අතර ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතුවල දී මෙන් ම සංවර්ධන කටයුතු වැනි වෙනත් අවශ්‍යතා සඳහා ද මෙකී ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රයෝජනයට ගැනීම සිදු වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ඇතැම් ඉඩම් ජනතාව විසින් දිගු කාලයක් තිස්සේ හේන් වගාව සඳහා යොදා ගෙන ඇති අතර මෙම ඉඩම් නිදහස් කර ගැනීමේ දී බොහෝ ගැටලුවලට මෙන් ම දුෂ්කරතාවන්ට ද මුහුණ දීමට නිලධාරීන්ට සිදුව ඇත. තාවකාලිකව හේන් වගා කර ගැනීම සඳහා ජනතාවට අවසර දී ඇති ඉඩම්වලින් ඔවුන් ඉවත් නො වීමත්, එම ඉඩම් නැවත අත්පත් කර ගැනීමට යාමේ දී ආරවුල්වලට මුහුණ දීමට සිදුවීමත් ඒ අතුරින් ප්‍රමුඛ වේ.

ඉඩම් සම්බන්ධ සේවා සපයන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නො වීම හේතුවෙන්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ රාජකාරියට අවහිරයක් මෙන් ම තම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා බාධාවක් ද වී ඇත. උදාහරණ වශයෙන් ඇතැම් ප්‍රදේශවල ජනතාවට හේන් වගාව සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු ඉඩම් එම දෙපාර්තමේන්තුවේ අවසරයක් නො ලබා වාර්ෂික බලපත්‍ර මත නිදහස් කර තිබීම දැක්විය හැක.

ප්‍රදේශයේ ඇළ, දොළ හා වැව් රක්ෂිත වෙන් කර මායිම් සලකුණු කර නො තිබීම හෝ මායිම් සලකුණු කරන ලද ස්ථානවල මායිම් ගල් ජනතාව විසින් ම කාලයක් යනවිට ඉවත් කිරීම නිසා පැහැදිලි මායිම් හඳුනාගත නො හැකිවීම හේතුවෙන් ද, රාජකාරි ඉටු කිරීමේ දී නිලධාරීන් අපහසුතාවට ලක් වේ. ඇතැම් අවස්ථාවල දී අදාළ ඉඩම් සීතියම් ගත කර තිබුණ ද, නිසි පරිදි හඳුනා ගත නො හැකිවීම නිසා මිනිසුන් විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති අවස්ථාවක දී වුව ඒ සඳහා කඩිනමින් කටයුතු කිරීමට හැකියාවක් නොමැත. එවන් කටයුත්තක දී සම්පූර්ණ ඉඩම මැන අදාළ කටයුතු ඉටු කිරීම සඳහා විශාල කාලයක් මෙන් ම මුදලක් ද වැය කිරීමට දෙපාර්තමේන්තුවට සිදු වේ.

ප්‍රදේශයේ ක්‍රියාත්මක වන කඩිනම් සංවර්ධන වැඩසටහන්වල දී ඒ සම්බන්ධයෙන් පුළුල් සහ සවිස්තරාත්මක දැනුවත් කිරීමක් සිදු නො කිරීම නිසා ඇතැම් අවස්ථාවලදී තීරණ ගැනීමේ දී මෙන් ම ක්‍රියාවට නැංවීමේ දී නිලධාරීන් අපහසුතාවට පත්වීම නිලධාරීන් මුහුණ දෙනු ලබන

තවත් දුෂ්කරතාවක් වශයෙන් සඳහන් කෙරිණි. දිස්ත්‍රික්කය තුළ අනවසරයෙන් රක්ෂිත භූමි අතපත් කරගැනීමේ දැඩි නැඹුරුවක් ඇති බවත්, ජනතාව විසින් ඒ සඳහා තම දේශපාලන සම්බන්ධතා උපයෝගී කර ගැනීමට උත්සාහ කිරීම දැකිය හැකි බවත්, ඒ තුළ නිලධාරීන්ට තම කාර්යයන් නිසි පරිදි කරගෙන යාමේ දුෂ්කරතා මතුවන බවත් නිලධාරීන් විසින් සඳහන් කරන ලදී.

මෙම ගැටලුවලට පිළියම් වශයෙන් නිලධාරීන් විසින් යෝජනා කරනු ලැබූ ක්‍රියා මාර්ග කිහිපයකි. එනම්, පාසැල් සිසුන්, ගොවීන් සහ අනෙකුත් වෘත්තිකයින් ඇතුළු විවිධ මට්ටමේ පිරිස් රක්ෂිත සහ ඒවායේ වැදගත්කම සම්බන්ධයෙන් දැනුවත් කිරීම, ඉඩම් සම්බන්ධයෙන් සිදු කෙරෙන සියලු ම කර්තව්‍යයන් සම්බන්ධයෙන් අදාළ වගකීම් උසුලන සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සියලු ම ආයතන නිසි පරිදි දැනුවත් කිරීම සහ යම් කටයුත්තක් සම්බන්ධයෙන් ඉඩම් භාවිතා කිරීමේ දී එය ක්‍රියාවට නැඟීමට පෙර ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ පූර්ව සාකච්ඡා පැවැත්වීම. මෙසේ පූර්ව සාකච්ඡා පැවැත්වීම තුළින් පවතින ගැටලු හඳුනාගෙන ඒ අනුව නිසි පිළියම් යෙදීමේ හැකියාව ලැබෙන අතර ආයතන නිසි පරිදි දැනුවත් කිරීමෙන් යම් යම් දේ සම්බන්ධයෙන් පවතින අපැහැදිලි සහ දුර්මත ඉවත් කිරීමට හැකියාව ලැබේ. එමෙන් ම, ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සියලු ම ආයතන අතර මනා සම්බන්ධීකරණයක් ගොඩ නැංවීමෙන් ඉඩම් කළමනාකරණය මෙන් ම එක් එක් ආයතනවල වගකීම් ක්‍රියාවට නැංවීම ද නිසි පරිදි සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

7.3 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ වනජීවී සම්පත සුරැකීම පිළිබඳ වගකීම උසුලන ප්‍රධාන ආයතනය වේ. හම්බන්තොට දිස්ත්‍රික්කය, දකුණු සහ ඌව යන වනජීවී කලාප දෙකට අයත් වේ. 1937 අංක 2 දරන වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනතේ දෙවන වගන්තිය යටතේ ස්වභාවික වෙන් කිරීමක් වශයෙන් හෝ ජාතික උද්‍යානයක් වශයෙන් හෝ අන්තර් කලාපයක් වශයෙන් හෝ ප්‍රකාශ කර ඇති ඉඩමක එසේ නැතහොත් ප්‍රකාශ කිරීමට නියමිතව ඇති ඉඩමක් අඩංගු ප්‍රදේශයක් වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂිතයක් ලෙස මැන සැලසුම් කළ යුතු වේ. මෙම කාර්යය ඉඩම් සංවර්ධන ආඥා පනතේ 8 (එ) වගන්තියට ඇතුළත් ව ඇත. පරිසරයට කිසියම් අයුරකින් හෝ බලපාන මොන ම අරමුණක් සඳහා හෝ ඉඩම් මැන සැලසුම් කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ නිරීක්ෂණ ලබා ගත යුතු වේ (ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, 1985: 73). ඒ අනුව, මැන සැලසුම් කරන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සහ ජාතික මෙන් ම අන්තර්ජාතික වශයෙන් ද වැදගත් කමක් උසුලන වන ජීවී රක්ෂිත සහ අභයභූමි රාශියක් පවතින අතර ඒ සම්බන්ධයෙන් විස්තර වගු 7.1න් දැක් වේ.

වගු 7.1: හම්බන්තොට දිස්ත්‍රික්කයේ වනජීවී රක්ෂිත

	රක්ෂිතයේ/අභය භූමියේ නම	රක්ෂිතයේ තත්ත්වය	භූමි ප්‍රමාණය (හෙක්.)	ප්‍රකාශයට පත්කළ දිනය සහ ගැසට් අංකය
1	යාල ජාතික උද්‍යානය	ජාතික උද්‍යානයකි	14,101.0 9,932.0	1938.02.25 දින 8356 1954.09.03 දින 10716
2	යාල දැඩි ස්වභාවික රක්ෂිතය	තහනම් ප්‍රදේශයකි	28,905.0	1931.03.01 දින 8356
3	කටගමුව අභය භූමිය	අභය භූමියකි	1,003.7	1938.05.27 දින 8370
4	තිමලව අභය භූමිය	අභය භූමියකි	1,065.86	1993.02.18 දින 754/12
5	වීරවිල අභය භූමිය	අභය භූමියකි	4,164.4	1938.05.27 දින 8370
6	විල්මැන්න අභය භූමිය	අභය භූමියකි	3,339.38	2006.06.30 දින 1451/25
7	ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය (කොටසක්)	ජාතික උද්‍යානයකි	23,498.77	1995.12.08 දින 900/19
8	බුන්දල ජාතික උද්‍යානය	ජාතික උද්‍යානයකි	3698.01	2004.07.28 දින 1351/18
9	පල්ලේමලල අභය භූමිය	අභය භූමියකි	13.8	1940.12.23 දින 9024
10	උස්සන්ගොඩ ජාතික උද්‍යානය	ජාතික උද්‍යානයකි	349.07	2010.05.06 දින 1652/49
11	කළමැටිය අභය භූමිය	අභය භූමියකි	712.3	1984.06.28 දින 303/7
12	මදුනාගල අභය භූමිය	අභය භූමියකි	995.20	1993.06.30 දින 773/7
13	ගොඩවාය අභය භූමිය	අභය භූමියකි	3.85 කි.මී. දුර වෙරළ තීරය. වඩදිය මට්ටමේ සිට මීටර් 100 වෙරළ තීරය වඩදිය සිට මුහුදට මීටර් 500 පළලට	2006.05.25 දින 1446/27

14	රැකව අභය භූමිය	අභය භූමියකි	3.85 කි.මී. දුර වෙරළ තීරය. වඩදිය මට්ටමේ සිට මීටර 100 වෙරළ තීරය වඩදිය සිට මුහුදට මීටර 500 පළලට	2006.05.25 දින 1446/27
15	කිරම ඔය අභය භූමිය	අභය භූමියකි	4.565	2004.10.06 දින 1361/25
16	බුන්දල/ලුණුගම්වෙහෙර අලි මංකඩ හරහා වන අලි කළමනාකරණ රක්ෂිතය (යෝජිත)	යෝජිත වන පිවිසුම	සැලසුම් සකස් කරමින් පවතී	-

මූලාශ්‍ර: දකුණු පළාත් වනජීවී අධ්‍යක්ෂ කාර්යාලය, 2011

කෙසේ වුව ද, අභය භූමි සහ රක්ෂිත ප්‍රදේශ රැක ගැනීමේ දී සහ අදාළ සේවාවන් සැපයීමේ දී යම් යම් අභියෝග සහ ගැටලුවලට මුහුණ දීමට වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට සිදුව ඇත. අනෙක් අතට ඇතැම් ප්‍රදේශ අභිනවයෙන් අභයභූමි වශයෙන් නම් කිරීම නිසා ජනතාව ද නොයෙක් ආකාරයේ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් සිටී.

අභයභූමි තුළ සින්නක්කර සහ රජයේ බලපත්‍ර හෝ දීමනාපත්‍ර ලාභී ඉඩම් ද පවතින අතර සතුන්ට, මිනිසුන්ට සහ පරිසරයට හානියක් නො වන පරිදි එවැනි ඉඩම්වල මිනිස් ක්‍රියාකාරකම්වල යෙදීමට හැකි වුව ද, එවැනි ඉඩම්වල නව ඉදිකිරීම් සිදු කිරීම සඳහා අවස්ථාව හිමි නො වේ. මේ තත්ත්වය තුළ විල්මැත්තාව අභය භූමිය නම් කිරීමත් සමඟ එයට අදාළ ග්‍රාම නිලධාරී වසම් කිහිපයක ජනතාව දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දී ඇති අතර අළුතින් නිවාස ඉදි කිරීම ආදී කටයුතු සඳහා තමන්ට අවසර නො ලැබෙන බවත් මෙයට ඉහත ජීවනෝපායයක් වශයෙන් යෙදුණු හේන් වගාවේ නියැලීමට හෝ සත්ත්ව පාලන කටයුතු කරගෙන යාමට හැකියාවක් නොමැති බවත්, ප්‍රදේශවාසීහු පවසති. මේ නිසා ම, තම එදිනෙදා ආර්ථිකය පවත්වා ගෙනයාමේ ගැටලුවකට ඔවුහු මුහුණ දී සිටිති. එමෙන් ම, වැලිගත්ත ප්‍රදේශයේ ජනතාව පෙන්වා දුන් අන්දමට ඔවුන්ගේ ඉඩම් 1987 දී පමණ ගම්උදා ව්‍යාපාරය යටතේ ලබාදී ඇති නමුත් මේ වන තෙක් බොහෝ ඉඩම් ලාභීන්ට ඉඩම් සඳහා බලපත්‍ර හෝ නිකුත් කර නොමැත. මෙම ඉඩම් ද විල්මැත්තාව අභයභූමියට අයත් වන හෙයින් ඔවුන්ට මේ වන විට ඉඩම් සඳහා බලපත්‍ර ලබා ගැනීමේ දී බොහෝ ගැටලුවලට මුහුණ දීමට සිදුව ඇති බවත් කිහිප දෙනෙකුට ඉඩම් සඳහා බලපත්‍ර ලැබී ඇති නමුත් විශාල පිරිසකට දැඩි අසාධාරණයක් සිදුව ඇති බවත් පැවසේ (සිද්ධි අධ්‍යයන 7.1). එමෙන් ම, ප්‍රදේශයේ පොදු සුසාන භූමියක් නොමැති හෙයින් ගම් වැසියන්ගේ ආදාහන කටයුතු දැනට විල්මැත්තාව අභය භූමියට පවරා ගෙන ඇති ඉඩම්වල සිදු කළ බවත් පවතින තත්ත්වය යටතේ එම භූමිය මේ වන විට ගම්වාසීන්ට භාවිතා කිරීමට නො හැකි බවත්, එම ප්‍රදේශයේ වලවල් කැණීමේ දී වනජීවී නිලධාරීන් විසින් ගැටලු මතු කරන බවත් පෙන්වා දෙනු ලැබිණ.

සිද්ධි අධ්‍යයන 7.1: විල්මැත්තාව අභය භූමිය ප්‍රකාශයට පත් කිරීමේ ගැටලු

සිරිපාල සිරිමෙවන් මහතා 1972 සිට තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිස්සපුර ග්‍රාම නිලධාරී වසමේ පර්චස් 20ක බිම් කඩක පදිංචිව සිටී. 1987 වසරේ දී ගම්උදාව වැඩසටහන යටතේ මෙම ඉඩම මිනුම්ගත කර ඔහුට ලබා දුන්න ද ඒ සඳහා බලපත්‍රයක් නිකුත් නො කෙරිණි. 2006 වසරේ දී ගැසට් නිවේදනයක් මගින් විල්මැත්තාව අභය භූමිය නම් කරන ලද අතර එයට සිරිමෙවන් මහතා ජීවත් වන ප්‍රදේශය ද ඇතුලත් වී ඇත. කෙසේ වුව ද, මේ වන තෙක් ම අදාළ නිලධාරීන් කිසිවෙක් විසින් එය වනජීවී අභය භූමියක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති බව නො පවසන නමුත් වනජීවී දෙපාර්තමේන්තුව විසින් ප්‍රදේශයේ මායිම් ගල් දමා තම සීමාව වෙත් කර ගෙන ඇත. මේ අනුව සිරිමෙවන් මහතා පදිංචි ඉඩම ද වනජීවී අභය භූමියට අයත් ව ඇත. මේ නිසා වනජීවී දෙපාර්තමේන්තුව විසින් අභිනවයෙන් සිදු කෙරෙන කිසිදු කාර්යයක් සඳහා ඉඩම යොදා ගැනීමට ඉඩ නො දෙන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙම ඉඩම් වනජීවී දෙපාර්තමේන්තුව යටතට පවරා ගෙන ඇති හෙයින් ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම ද නතර කර ඇත.

අනෙක් අතට, මිනිස් ක්‍රියාකාරකම් ද සීමාව ඉක්මවා සිදුවන හෙයින් අභය භූමි තුළ මිනිස් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වනජීවී නිලධාරීන් ද ගැටලුවලට මුහුණ දෙමින් සිටී. ජනතාව අභයභූමි සහ රක්ෂිත ප්‍රදේශවලට අනවසරයෙන් ඇතුල් වී වාසස්ථාන ඇරඹීමට සේ ම වගා කටයුතු සඳහා ද උත්සාහ දරති. ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සමග මෙම තත්ත්වය වඩාත් වර්ධනය වී ඇති අතර මත්තල ප්‍රදේශයේ මෙම තත්ත්වය පැහැදිලිව දැකගත හැක. මෙසේ වර්තමානය වනවිට අනවසර ඉඩම් අත්පත් කර ගැනීම නිසා වඩාත් ගැටලු මතු වෙමින් පවතින ප්‍රදේශ වන්නේ,

1. මලලආර දෙපස භූමි ප්‍රදේශය (මහ අලුත් ආර පහළ සිට මත්තල ඔස්සේ බඳගිරිය වැව දක්වා)
2. මත්තල ගුවන් තොටුපළ ආශ්‍රිත අවට ප්‍රදේශය සහ මලල ආර රක්ෂිත ප්‍රදේශය
3. මල් අස්න සාලිය වනය සහ වන රක්ෂිතය
4. බඳගිරිය වැව් රක්ෂිතය
5. නම්මැත්තාව වැව් රක්ෂිතය
6. කැලිගම සිට වැවේගම ප්‍රදේශයට විහිදෙන වන ප්‍රදේශය

මෙයට අමතරව, ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය ඇතුලත මහා මාර්ගය සහ ජලාශය අතර බෝගහවැව බිම් තීරුව පවුල් 40-50 පමණ පිරිසක් විසින් අනවසරයෙන් වගා කරන අතර මේ වන විට එහි පොල්, තැඹිලි, අඹ සහ කොස් වැනි ස්ථිර බෝග වගා කර ඇත. මෙසේ අනවසරයෙන් අල්ලාගෙන ඇති භූමි ප්‍රමාණය අක්කර 100ට ආසන්න වන අතර එම ස්ථිර වගාවන්ට අමතරව එළවළු නිෂ්පාදනය සිදුකරන අතර වගාවට යොදන කෘෂි රසායනික ජලාශයට මුසුවීමේ හැකියාව ඉහළ මට්ටමක පවතින බවත්, එයින් ජලජ ජීවීන්ට මෙන් ම ජලාශයේ දිය පානය කරන වෙනත් සත්ත්ව කොටස්වලට හානි සිදුවීමේ ප්‍රවණතාවක් පවතින බවත් හෙළි විය. විශේෂයෙන් සඳහන් කළයුතු කරුණක් වන්නේ ජාතික වනෝද්‍යානය මිනුම්ගත කරන අවස්ථාවේ දී එහි වගා කටයුතු කරමින් සිටි සියළු දෙනාට ලුණුගම්වෙහෙර ව්‍යාපාරය යටතේ වාරි ඉඩම් ලබාදී ඇති නමුත් ඔවුන් එම ඉඩම් තම දරුවන්ට ලබාදී හෝ වෙනත්

අන්දමින් අත්සන් කර තමන් මෙම ප්‍රදේශයේ ඉඩම් පාරම්පරිකව වගා කරමින් සිටි බව පවසා නැවත මෙම ස්ථානයේ වගා කටයුතු කිරීමට පටන් ගැනීම ය. 1947 දී, මෙම ප්‍රදේශයේ පවුල් 08ක් වගා කටයුතු කරමින් සිට ඇති අතර 2003.07.16 වන දින විට වගාකරුවන් 08ක් ඇතුළු පදිංචි පිරිස 24ක් විය. 2003.10.17 වන දින විට එයට නවත් 17 දෙනෙකු එකතු වූ අතර 2004 පරිසර අමාත්‍යවරයා ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවට පැමිණෙන විට එහි වගා කරන්නන් වශයෙන් 204ක නාම ලේඛනයක් ඉදිරිපත් කර ඇත (ලුණුගම්වෙහෙර වනජීවී කලාප අධ්‍යක්ෂ කාර්යාලය, 2011). කෙසේ වුව ද, සත්‍ය වශයෙන් එතරම් පිරිසක් එහි වගා කටයුතුවල නිරත වී නොමැති නමුත් නව ඉඩම් ලබා ගැනීමේ හෝ ඔවුන් වගා කරන වනෝද්‍යානයේ ඉඩම් නිදහස් කර ගැනීමේ අරමුණින් එය ලබා දී ඇත.

එයට අමතරව, වන උද්‍යානයේ සීමාව තුළ පවුල් කිහිපයක් පදිංචිව සිටින අතර නීති මාර්ගයෙන් කටයුතු කර ඔවුන් ඉන් ඉවත් කිරීමට කටයුතු කර ඇත. අනෙක් අතට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දියවර ගම්මානය, රුහුණු පුතා ඇපරල්ස් ආයතනය වැනි ගොඩනැගිලි ගණනාවක් මෙම සීමාව තුළ පිහිටුවා ඇති අතර මෑත කාලීනව එම ඉඩම් ජාතික වනෝද්‍යාන සීමාවෙන් ඉවත් කළ බවට ගැසට් නිවේදන නිකුත් කර ඇතත් සැලසුමකින් තොර සහ ආයතන අතර සම්බන්ධීකරණයකින් තොර එවන් ක්‍රියාමාර්ග ජනතාව තම වැරදි සාධාරණීකරණය කිරීමට අවස්ථාවක් කර ගෙන ඇත. ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානය තුළ පිහිටි ලුණුගම්වෙහෙර ජලාශයේ අවසරපත් නොමැතිව පුද්ගලයින් 30-40 පමණ මසුන් මැරීම සිදු කරන අතර ඇතැම් අවස්ථාවල දී අවසරපත් සහිත පුද්ගලයන් ඔස්සේ ද දඩයම්කරුවන් ජාතික වනෝද්‍යානයට පිවිසීමට අවස්ථාව උදාකර ගනී. මෙය වනෝද්‍යානය තුළ සිටින සත්ත්ව කොටස්වල පැවැත්මට තර්ජනයක් වී ඇත.

වගු සටහන් අංක 7.1 දක්වන ආකාරයට වීරවිල අභය භූමිය හෙක්ටයාර 4,146 යුතු සංචාරක පක්ෂීන්ගේ පැවැත්මට ඉතාමත් හිතකර වූ අභය භූමියක් වන නමුත් මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් එහි ඉතිරිව ඇත්තේ වීරවිල වැව පමණකි. මෙයට අමතරව, පල්ලේමලල අභය භූමියට අදාළ ගැසට් පත්‍රය අස්ථානගත වීම නිසා එහි මායිම් සොයා ගැනීමට නො හැකිවීම ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ දී විශාල ගැටලුවක් බවට පත්ව ඇත. උස්සන්ගොඩ ජාතික උද්‍යානයේ අනවසර ඉදිකිරීම් අතර ස්ථිරව ගොඩනැගූ වෙළඳසැලක් පවා ඇති බවත් එය ඉවත් කිරීම සඳහා නීතිමය කටයුතු සිදු කරමින් සිටින බවත්, නිලධාරීන් විසින් අනාවරණය කෙරිණි.

ප්‍රදේශයේ සිදුවන සංවර්ධන කටයුතු මෙන් ම එයට සාපේක්ෂව ජනතාව විසින් වනාන්තර එළි පෙහෙළි කරමින් අනවසර ඉඩම් අත්පත් කර ගැනීම නිසා වනාන්තරවල ජීවත්වන සත්ත්ව ගහනය සීමිත ප්‍රදේශයකට කොටු වීම ද, විශේෂයෙන් ම අලි ඇතුන්ට ඉතා සීමිත ප්‍රදේශයකට කොටු වීමට සිදුවීම ද, අලිමංකඩ විහිදෙන ස්වභාවික පරිසර පද්ධතිය අවධානමකට ලක්ව තිබීමත් නිසා අලි ඇතුන් ගම් වැදීම වැඩි වී ඇති අතර වගා ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ගොවීන් විසින් එම සතුන්ට සිදු කරන හානි බහුල වී ඇත. එම නිසා, වන සතුන් ආරක්ෂා කර ගැනීමේ දී දැඩි අරගලයක් කිරීමට වනජීවී නිලධාරීන්ට සිදුව ඇත. විශේෂයෙන් වන රක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින අලි ඇතුන් 400 පමණ ගහනයක් සිටිතැයි හඳුනාගෙන ඇති මත්තල අන්තර්ජාතික ගුවන් තොටුපළ අසල හැඩිල්ල ප්‍රදේශයේ මලල ආර ආශ්‍රිතව සිදුවන ඉඩම් ආක්‍රමණය නිසා අලිමංකඩ ඇහිරී යාමේ දැඩි අවධානමක් මතුව ඇත (වනජීවී දකුණු

කලාප අධ්‍යක්ෂ කාර්යාලය, 2011). මෙම ප්‍රදේශය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් නො වීම නිසා මේ සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුවට කටයුතු කිරීමේ හැකියාවක් නොමැත.

අභය භූමි සහ රක්ෂිත වෙන් කිරීමේ ප්‍රයෝජන පිළිබඳ මිනිසුන්ගේ දැනුවත්භාවය අඩුවීම එම සම්පත් ආරක්ෂා කරගැනීමට බලපාන ප්‍රධාන බාධාවක් බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හඳුනාගත හැකි විය. නිදසුනක් ලෙස 1969 දෙසැම්බර් මස 5 වැනි දින දී ගැසට් පත්‍රයක් මඟින් බුන්දල අභය භූමිය නම් කරනු ලැබුවේ ප්‍රධාන වශයෙන් රම්සා තෙත් බිම සහ ජල පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම උදෙසා ය. මේ අනුව, මේ තුළින් සතුන් සහ ශාක ආරක්ෂා කිරීම පමණක් නොව ජල සම්පත ආරක්ෂාවීම ද සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට ද ඒ මඟින් මිනිසුන්ගේ යහ පැවැත්ම හා ආදායම් උත්පාදන මාර්ගවලට යොමුවීමට ද හැකියාව ලැබේ. කෙසේ වුව ද, ඒ පිළිබඳව අවබෝධය අඩුවීම නිසා හෝ වර්තමානය ගැන පමණක් සිතීම නිසා හෝ මිනිසුන් විසින් රක්ෂිත සහ අභයභූමිවලට හානි සිදුකරන විට ජනතාව ඉවත් කිරීමේදී ඔවුන් සමග ආරවුල්වලට පැටලීමට සිදු වීම ද, ස්ථාන මායිම් සලකුණු කර ගල් දැමීමේ දී ඒ සඳහා ජනතාවගෙන් එල්ල වන බාධාවන්ට මුහුණ දීමට ද, වනජීවී නිලධාරීන්ට සිදුව ඇත.

රජයේ ඉඩම් සහ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් වගකීම උසුලන ඇතැම් ආයතන වනජීවී දෙපාර්තමේන්තුවට ද වගකීම් පැවරෙන ඉඩම් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමේ දී ඒ සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුවේ සහ එම විෂයයට අදාළ බුද්ධිමතුන්ගේ අදහස් යෝජනා සැලකිල්ලට නො ගැනීම නිසා විවිධ ගැටලු සහ ගැටුම්කාරී තත්ත්වයන් මතුවීම ගැටලුවක් බවට පත්ව තිබේ. නිදසුනක් වශයෙන් ලුණුගම්වෙහෙර ජලාශයෙන් පිටවන ජලය ඇඹිලිගල කලපුවට මුදා හැරීමෙන් කලපුවේ ජලයට මිරිදිය වැඩිපුර මිශ්‍රවීම නිසා බුන්දල ජලාශයේ ලවණ ගතිය වෙනස්වීම පෙන්වා දිය හැක. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක කුරුළු විශේෂයක් වන ප්ලෙමින්ගෝ පක්ෂීන්ට ජීවත්වීමට අවශ්‍ය පරිසරය වෙනස්වීම නිසා ප්ලෙමින්ගෝ පක්ෂීන්ගේ පැමිණීම අඩුවීම සහ එය නැරඹීමට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ අඩුවීම නිසා එයින් ඉපැයූ විදේශ විනිමය පහත වැටීම සිදුව ඇත. එමෙන් ම, ලුණුගම්වෙහෙර ජලාශයෙන් පිටවන ජලය මුහුදට වැටීමේ මාර්ගය බුන්දල වනෝද්‍යානය තුළින් වැටී ඇති අතර වනෝද්‍යානයේ තිබූ පළගස් මැරී යාමට එය හේතුවක් වශයෙන් හඳුනාගෙන ඇත. මෙය වනෝද්‍යානයේ පරිසර සමතුලිතතාව කෙරෙහි මේ වනවිට දැඩි බලපෑමක් සිදුකර ඇත.

7.4 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල තුනක් හම්බන්තොට, තිස්සමහාරාම සහ කටුවන ප්‍රදේශවල පිහිටුවා ඇත. රජයේ ඉඩම් සම්බන්ධ සේවා සැපයීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සම්බන්ධ නො වන නමුත් පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජයේ ඉඩම් සම්බන්ධයෙන් වගකීම දරනු ලබන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හෙයින් අධ්‍යයනයේ දී එයට අදාළ තොරතුරු ද ලබා ගන්නා ලදී. කෙසේ වුව ද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල තුන අතුරින් හම්බන්තොට කාර්යාලයෙන් පමණක් අධ්‍යයනය සඳහා තොරතුරු රැස්කෙරිණි. හම්බන්තොට පුරාවිද්‍යා කාර්යාලය මඟින් හම්බන්තොට, අම්බලන්තොට සහ සූරියවැව යන

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරාවිද්‍යා ස්ථානවලට අදාළ කටයුතු ඉටු කරනු ලබයි. වගු සටහන් 7.2න් හම්බන්තොට පුරාවිද්‍යා කාර්යාලයට අයත් පුරාවිද්‍යා රක්ෂිත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ.

වගු සටහන් 7.2: හම්බන්තොට කලාපයේ පුරාවිද්‍යා රක්ෂිත/වැදගත් ස්ථාන

පුරාවිද්‍යා රක්ෂිතය		භූමි ප්‍රමාණය (අක්කර)	විශේෂිත කරුණු
පුරාවිද්‍යා රක්ෂිතය	**පිහිටි ග්‍රා.නි.වසම/ගම**		
හම්බන්තොට			
තෙදුල්ල	සිරියාගම	07	අක්කර 03ක් අනවසර අල්ලා ගැනීම්
යහංගල	යහංගල බටහිර	10.5	
බඳගිරිය	බඳගිරිය	10	වෙන්කර ඇත
කෝවිල්ගොඩාන	කැලියපුර	28	
ගල්වැව	ගල්වැව	55	ගැසට් කිරීමට නියමිතය
කළුවරවැව	වැල්ලගස්වැව	37	
ගොඩවාය		02	ගැසට් කළ ප්‍රමාණය අක්.2ක් වුව ද, වෙන් කළ ප්‍රමාණය එයට වඩා වැඩි ය.
මාටලෝ කුළුණ		02	පවරා ගැනීමට අපේක්ෂිතය.
විල්ගම්වේතේ	බැරගම	10	
බැරගම පුණ්‍යවර්ධනාරාමය	බැරගම	40	
එලල්ල කන්ද	හම්බන්තොට	100ට වැඩි	
උස්ගල		50	
අම්බලන්තොට			
උච්ච චාරිකය	බෝලාන	10.5	ගැසට් නිවේදනය නිකුත් කර ඇත
වෙහෙර ගොඩැල්ල	කුඩා බෝලාන	0.5	
ලෙන් ආරාම සංකීර්ණය	මදුනාගල	50	
ලෙන් ආරාම සංකීර්ණය	කරඹගල	100ට වැඩි	
වෙහෙර ගොඩැල්ල	රිදියගම	0.5	ගැසට් නිවේදනය නිකුත් කර ඇත
ආරාම සංකීර්ණය	හබරත්වල	02	
උස්සන්ගොඩ	උස්සන්ගොඩ	-	
චේතියගිරිය	බටඅත	50ට වැඩි	
රම්බ විහාරය	බටඅත	170	
සූරියවැව			
තෙමහත		55	
පඩිහෙම්පල	පඩිහෙම්පල	75	
වෙහෙරගොඩැල්ල	මහගල්වැව	01	
මෙගලිතික සුසානය	මහගල්වැව	02	
වෙහෙරගොඩැල්ල	වෙහෙර පැලැස්ස	0.5	

මූලාශ්‍ර: පුරාවිද්‍යා කලාප කාර්යාලය, හම්බන්තොට, 2011

හම්බන්තොට පුරාවිද්‍යා කලාප කාර්යාලයේ නිලධාරීන් සමඟ සිදුකළ සාකච්ඡාවල දී අනාවරණය වූයේ පුරාවිද්‍යා රක්ෂිතවල වගා කිරීම්, රක්ෂිත මායිම් ජනතාව විසින් තමන්ට වාසි සහගත වන ආකාරයට වෙනස් කිරීම් ආදී ගැටලුවලට නිරන්තරයෙන් ඔවුන්ට මුහුණ දීමට

සිදුවන බව යි. පුරාවිද්‍යා ආඥා පනත යටතේ අනවසර වගාවක් සඳහා රු.3000ක දඩයක් නියම කරන බවත්, ඇතැම් අවස්ථාවලදී අනෙකුත් ආයතනවල නිලධාරින්ගේ සහාය නිසි පරිදි නො ලැබීමත්, ප්‍රාදේශීය දේශපාලන නායකයන්ගේ අනිසි මැදිහත්වීම ආදී නොමේරූ දේශපාලන සංස්කෘතිකාංග ක්‍රියාත්මකවීමත් හේතුවෙන් නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවස්ථාව නො ලැබෙන බවත් සාකච්ඡාවල දී හෙළි විය. උදාහරණ වශයෙන් තෙලුල්ල ප්‍රදේශයේ පුරාවිද්‍යා රක්ෂිත ප්‍රදේශයේ සිදු කෙරෙන අනවසර පත්තක්කා වගාව පෙන්වා දිය හැක.

7.5 පොලිස් දෙපාර්තමේන්තුව

රටේ නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ අරමුණින් පිහිටුවා ඇති ආයතනයක් වන ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඉඩම් සම්බන්ධ සේවා සැපයීමට වගකීමක් නො දරන නමුත් ඉඩම් සම්බන්ධයෙන් පැනනගින දුෂ්කර ම කාර්යයක් වන ආරවුල් සමථයකට පත් කිරීමේ දී මැදිහත් වන ආයතනයකි. නමුත් මෙම මැදිහත් වීම ද සිදු කරනු ලබන්නේ නීතිය සහ සාමය ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමයේ එක් කොටසක් වශයෙනි. රජයේ ඉඩම් පාලනය සම්බන්ධ කටයුතුවල දී කිසිවෙකු විසින් රජයේ ඉඩමක් බලහත්කාරයෙන් අත්පත් කරගැනීමක දී අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ හෝ ඉඩම් සම්බන්ධයෙන් වගකීම් සහ බලතල උසුලන වෙනත් නිලධාරියෙකුගේ ඉල්ලීම මත එම ඉඩම නිදහස් කරගැනීමේ කටයුත්තට පොලීසිය මැදිහත් වන අතර රජය මගින් ප්‍රදානය කර ඇති ඉඩමක් සම්බන්ධයෙන් ඇතිවන ගැටලු පොලීසියට ඉදිරිපත් වන විට බොහෝ දුරට සිදුවන්නේ එම ගැටලු ප්‍රාදේශීය ලේකම්, මහවැලි කොට්ඨාස කළමනාකරණ කාර්යාල හෝ දිස්ත්‍රික්කයේ සහකාර ගොවිජන සේවා කොමසාරිස් වෙත නැවත යොමු කිරීම ය.

වගුව 7.3: පොලිස් ස්ථානවලට ලැබී ඇති සුළු පැමිණිලිවලින් ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් වන පැමිණිලි

	2010		2011	
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය
සමස්ත සුළු පැමිණිලි සංඛ්‍යාව	34,831	100.0	33,726	100.0
ඉඩම් ආරවුල් සංඛ්‍යාව	5,189	14.9	4,884	14.5
ඉඩම් ආරවුල්වලින් පොලීසිය විසින් සමථකරණය කළ සංඛ්‍යාව	3,680	70.9	3,263	66.8
ඉල්ලා අස්කරගත් පැමිණිලි සංඛ්‍යාව	580	15.8	611	12.5
සමථ මණ්ඩලයට යොමුකළ සංඛ්‍යාව	533	14.5	522	10.7
ප්‍රාදේශීය ලේකම්/ මහවැලි/ගොවිජන සේවා කාර්යාලවලට යොමුකළ සංඛ්‍යාව	809	15.6	975	20.1
අධිකරණයට යොමුකළ සංඛ්‍යාව	178	4.8	159	3.2

මූලාශ්‍ර: පොලිස් අධිකාරී කාර්යාලය, තංගල්ල, 2012

කෙසේ වුව ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන දහහතරට[28] 2010 සහ 2011 වසරවල ලැබී ඇති සමස්ත සුළු පැමිණිලිවලින් 15% ආසන්න ප්‍රමාණයක් ඉඩම් ආරවුල්වලට සම්බන්ධ පැමිණිලි වේ (වගු සටහන් 7.3).

අධ්‍යයනයට ලක් කළ පොලිස් බල ප්‍රදේශවලින් හම්බන්තොට පොලිස් බල ප්‍රදේශයේ ගොන්තොරුව ග්‍රාම නිලධාරී වසමේ ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් සිදු වූ ගැටුමක දී වයස අවුරුදු 19ක පාසැල් ශිෂ්‍යයෙකු ඝාතනයට ලක්ව ඇත. ඒ හැරෙන්නට 2011 හෝ 2010 වර්ෂ තුළ ඉඩම් ආරවුල් හේතුවෙන් පුද්ගල ඝාතනය කිරීම් හෝ ඝාතනයට තැත් කිරීම් වාර්තා වී නොමැත (තංගල්ල පොලිස් අධිකාරී කාර්යාලයීය දත්ත, 2012). හම්බන්තොට පොලිස් ස්ථානයේ සුළු පැමිණිලි අංශයට 2010 සහ 2011 වර්ෂවල ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 2,827ක් සහ 2,836ක් වේ. ඉන් 2010 වර්ෂයේ 9.0% (245)ක් ද, 2011 වර්ෂයේ 11.0% (306) ඉඩම් ආරවුල්වලට සම්බන්ධ පැමිණිලි වන අතර ඉඩම් ආරවුල්වලට අදාළ පැමිණිලි බොහොමයක් ගොන්තොරුව ග්‍රාම නිලධාරී වසමෙන් ඉදිරිපත් වේ. මෙයට අමතරව කැටන්වැව, එලල්ල සහ කැලියපුර ග්‍රාම නිලධාරී වසම්වලින් වැඩි වශයෙන් ඉඩම් ආරවුල්වලට සම්බන්ධිත පැමිණිලි ඉදිරිපත් වේ.

සූරියවැව පොලිස් ස්ථානයට 2010 වර්ෂයේ ලැබුණු සුළු පැමිණිලි 2,848න් 11% (303)ක් ද 2011 වර්ෂයේ අගෝස්තු සිට නොවැම්බර් දක්වා ලැබී තිබූ සමස්ත සුළු පැමිණිලි 975න් 16% (153)ක් ද ඉඩම් ආරවුල් හා සම්බන්ධ ඒවා විය. ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට වැඩි වශයෙන් ම පැමිණිලි වාර්තා වන්නේ අන්දරවැව ප්‍රදේශයෙන් බව පොලිස් ස්ථානාධිපතිවරයා විසින් හෙළි කරන ලදී. එමෙන් ම, මහවැලි අධිකාරිය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අතර පවතින අන්තර් සහයෝගිතාවයේ අඩු දුහුඩුකම් නිසා බොහෝ විට ගැටලු මතුවන බව ද හෙළිවිය. එමෙන් ම, 2005 චක්‍රලේඛය මගින් එතෙක් ප්‍රාදේශීය ලේකම් සතුව තිබූ ලඳු කැලෑ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී ඇති නමුත් ඒවායේ මිනුම් කටයුතු සිදු නො කිරීම නිසා ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීමේ ගැටලුවකට මුහුණ දී ඇති අතර අනවසර අල්ලා ගැනීම් ඉහළ යාමට එය ද හේතුවක් වී ඇති බව අනාවරණය විය.

ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානයට 2010 සහ 2011 වර්ෂවල ඉදිරිපත් කළ සුළු පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 1,398ක් සහ 1,481කි. ඉන් 2010 වසරේ 22.3% (312)ක් ද, 2011 වසරේ 10.5% (156)ද, ඉඩම් ආරවුල්වලට සම්බන්ධ පැමිණිලි වේ. ලුණුගම්වෙහෙර පොලිස් ස්ථානයට උඩමත්තල, පහල මත්තල, මහඅලුත්ගම් ආර සහ කුඩා ගම්මාන 3 යන ග්‍රාම නිලධාරී වසම්වලින් ඉඩම් ආරවුල් සම්බන්ධ පැමිණිලි විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වේ. මත්තල ප්‍රදේශයේ ඉදිවන ජාත්‍යන්තර ගුවන් තොටුපළ සමඟ බැඳුණු සංවර්ධන ක්‍රියාවලිය නිසා ප්‍රදේශයේ ඉඩම්වල වෙළඳපොල වටිනාකම වැඩිවීම හේතුවෙන් උඩමත්තල සහ පහල මත්තල ප්‍රදේශවල ඉඩම් ආරවුල් සංඛ්‍යාව ඉහළ යාමට බලපා ඇති අතර වාරි ජල පහසුකම් නො තිබූ ප්‍රදේශයක් වන මහඅලුත්ගම් ආර ප්‍රදේශයට වාරි ජලසම්පාදන ව්‍යාපෘතියක් ලබාදීමත් සමඟ එම ප්‍රදේශයේ ඉඩම් ආරවුල් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත, බිම් සවිය වැඩසටහන යටතේ ඉඩම් මැන හිමිකම් සහතික ලබාදීමේ ක්‍රියාවලියත් සමඟ කුඩා ගම්මාන III ග්‍රාම නිලධාරී වසමේ ඉඩම් ආරවුල් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත.

[28] තංගල්ල, බෙලිඅත්ත, වලස්මුල්ල, වීරකැටිය, කටුවන, මිද්දෙනිය, හුංගම, අගුණුකොළපැලැස්ස, අම්බලන්තොට, හම්බන්තොට, සූරියවැව, ලුණුගම්වෙහෙර, තිස්සමහාරාම සහ කතරගම.

අම්බලන්තොට පොලිස් ස්ථානයට 2010 වර්ෂයේ ලැබුණු සමස්ත සුළු පැමිණිලි සංඛ්‍යාව වූ 4,060න් 12.2% (494) ද, 2011 වර්ෂයේ ලැබුණු සමස්ත සුළු පැමිණිලි 3,960න් 7.5% (299) ද ඉඩම් ආරවුල් වේ. රජයේ ඉඩම් සම්බන්ධයෙන් වැඩි ම ආරවුල් හෝ පැමිණිලි වාර්තා වන්නේ මයුරපුර සහ හැඩවිත්ත ප්‍රදේශවලිනි. මහවැලි බල ප්‍රදේශයේ මයුරපුර ඉඩම් සම්බන්ධයෙන් වැඩි වශයෙන් ම පැමිණිලි ඉදිරිපත් වන අතර මහවැලි සංවර්ධන අධිකාරියට ඉඩම් පවරා ගන්නා අවස්ථාවේ දී එම ප්‍රදේශයේ වගා කරමින් සිටි පිරිස් තවදුරටත් තම අයිතිය ප්‍රකාශ කරමින් එහි පදිංචිව සිටිම, ඉඩම් කච්චේරිවලින් ඉඩම් ලබාදුන් පුද්ගලයින්ට වෙනත් ප්‍රදේශවල ඉඩම් හිමිකම පැවතිම නිසා නව ඉඩම්වල පදිංචිය සඳහා නො පැමිණීම සහ එම ඉඩම් අනවසරකරුවන් විසින් අල්ලා ගැනීම ආදිය නිසා මතුවන ගැටලු ආරවුල්වලට මූලික හේතු වේ.

වලස්මුල්ල පොලිස් බල ප්‍රදේශයේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් සුලභව පැමිණිලි ඉදිරිපත් වන්නේ රම්මල, හඳුගල, බෝවල, කන්දෙබැද්ද, මොදරවාන, මැදගම්ගොඩ, කැකිරිඔබඩ සහ ඒ අවට කඳුකර ප්‍රදේශවලිනි. 2010 වර්ෂයේ පොලිස් ස්ථානයට ඉදිරිපත් වූ සමස්ත සුළු පැමිණිලි 3,024න් 23.2% (703)ක් ද, 2011 වර්ෂයේ 2011වූ සමස්ත සුළු පැමිණිලිවලින් 35.5% (713) ද ඉඩම් ආරවුල්වලට සම්බන්ධිත ඒවා වේ.

තිස්සමහාරාම පොලිස් ස්ථානයට 2010 වසරේ ලැබුණු සුළු පැමිණිලි 5,011න් 11.75% (589) ද, 2011 වසරේ ලැබුණු සුළු පැමිණිලි 4,811න් 12.2% (586)ද, ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් වන පැමිණිලි වේ. බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟ රජයේ ඉඩම් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයට වාර්තාවන පැමිණිලි සංඛ්‍යාව වර්ධනය වී ඇත. බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක විමේ දී මතුව තිබෙන සම්බන්ධීකරණ ගැටලු නිසා මෙවැනි තත්ත්වයක් උද්ගතව ඇත. නිලධාරීන්, මූලික තොරතුරු ලබා ගැනීම සඳහාත්, මැනුම් කටයුතු සඳහාත්, වෙන් වෙන් වශයෙන් යාමත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් වගකීම දරන ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වැඩසටහනට සම්බන්ධකර නො ගැනීමත්, නිසා මෙම ගැටලු මතුව ඇත. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරවිල ප්‍රදේශයේ පොලීසියට වැඩි වශයෙන් ම පැමිණිලි ඉදිරිපත් වේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහවැලි කොට්ඨාස කළමනාකරණ කාර්යාල, ගොවිජන සංවර්ධන කාර්යාල ආදී රජයේ ඉඩම් සම්බන්ධයෙන් සේවා සැපයීමට සහ කළමනාකරණයට මැදිහත් වන ආයතනවලින් නිසි පරිදි කටයුතු ඉටු නො වීමත්, එක් එක් ආයතන අතර මනා අන්තර් සම්බන්ධතාවක් නො වීමත්, නීතිමය ප්‍රතිපාදනවල පවතින යම් යම් දුර්වලතාත්, ජනතාවගේ ඉඩම් නිතිය සම්බන්ධයෙන් අඩු දැනුවත් භාවය සහ නීතිගරුක භාවය අඩුවීමත්, ඉඩම් සම්බන්ධයෙන් ගැටලු සහ ආරවුල් මතුවීමට බලපා ඇති සාධක වේ. බොහෝ පොලිස් ස්ථානාධිපතිවරුන් පෙන්වා දුන් අන්දමට පවුලේ සාමාජිකයින් අතර ඉඩම් සම්බන්ධයෙන් ආරවුල් ඇතිවීම කෙරෙහි තුන්වැනි උපලේඛනයේ ප්‍රතිපාදන බොහෝ විට ඉවහල් වේ. එනම්, ඉඩම් ලාභියා විසින් ඉඩමේ පසු අයිතිය නම් නො කර මියගිය විට පනතේ ප්‍රතිපාදන අනුව එහි අයිතිය වැඩිමහල් දරුවාට හිමිවන අතර බොහෝ අවස්ථාවල දී දෙමාපියන් රැක බලාගෙන නිවසේ සිටින බාල දරුවා නිවසින් ඉවත් කොට ඉඩම සම්පූර්ණයෙන් අයත් කර ගැනීමට වැඩිමහල් දරුවා උත්සාහ කිරීම හෝ අනෙක් දරුවන් තම උරුමය ඉල්ලා සිටීම නිසා මතුවන ගැටලු හේතුවෙන් ඉඩම් සම්බන්ධයෙන් සැලකිය යුතු පැමිණිලි ප්‍රමාණයක් පොලිස් ස්ථානවලට ඉදිරිපත් වේ.

පොලිස් ස්ථානාධිපතිවරුන් පෙන්වා දෙන අන්දමට ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ජනතාව කිසියම් දැනුවත්භාවයකින් යුක්ත ය. කෙසේ වුව ද, වියදම් (මුද්දර සහ නඩු ගාස්තු සඳහා) සහ කාලය අධිකව වැය වීම නිසා ඉඩම් ආරවුල් සම්බන්ධයෙන් පෞද්ගලිකව නඩු පැවරීමට එතරම් කැමැත්තක් නො දක්වන අතර 66 වැනි වගන්තිය යටතේ පොලීසිය මඟින් නඩු මාර්ගයට පිවිසීමට උත්සාහ දරයි. රජයේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට පොලීසියට බලයක් නොමැති හෙයින් ඒවා නැවත ප්‍රාදේශීය ලේකම්, මහවැලි අධිකාරිය හෝ ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානවලට යොමු කෙරෙන බවත් එසේ යොමු කෙරෙන ගැටලුවලට පවා අවසන් විසඳුමක් බොහෝ අවස්ථාවල දී නො ලැබෙන හෙයින් ඇතැම් විට පොලීසියට ඉදිරිපත් වන එක් ආරවුලක් නැවත නැවත පැමිණිල්ලට සම්බන්ධ විවිධ පාර්ශව වෙතින් ඉදිරිපත්වීම දැකිය හැක.

අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් අනාවරණය වූ එක් කරුණක් වන්නේ බොහෝ විට අනවසරකරුවන් ඉඩම් අල්ලා ගැනීම සංවිධානාත්මකව සිදුකරන්නක් බවයි. එනම්, බොහෝවිට රජයේ නිවාඩු දිනක මෙවැනි ඉඩම් අල්ලා ගැනීම සිදු කරන බවත්, පසුදින වනවිට නිවසකට හෝ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් සඳහා අත්තිවාරම් දැමීම සිදුකර අවසන් කරන බවත් ක්ෂේත්‍රයේදී හෙළිවිය.

7.6 දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය යනු රජයේ ඉඩම් සම්බන්ධ සේවා සැපයීමේ කාර්යයන්ට සෘජුව මැදිහත් වන ආයතනයක් වන අතර පරිපාලනය විමධ්‍යගතකරණය කිරීම යටතේ එහි කාර්යාල දෙකක් හම්බන්තොට සහ තංගල්ල ප්‍රදේශවල පිහිටුවා දිස්ත්‍රික්කයේ ජනතාවට සේවාවන් සපයනු ලබයි. මෙම කාර්යාලයෙන් ඉඩම් ඔප්පු ලියාපදිංචිය, ඔප්පුවල පිටපත් නිකුත් කිරීම සහ පත් ඉරු පිටපත් (ඉඩම් ලේඛන පිටපත්) නිකුත් කිරීම සිදු කරන අතර පුරවැසි ප්‍රඥප්තියේ සඳහන් පරිදි පත් ඉරු සහ ඔප්පු පිටපතක් නිකුත් කිරීම ඉල්ලීම් ඉදිරිපත් කර විනාඩි 20ක් තුළ ද, ඔප්පු ලියාපදිංචිය දින 01ක් තුළ ද සිදු කෙරේ. ඔප්පු ලියාපදිංචි කිරීමට සහ පිටපත් ලබා ගැනීමට අයදුම් පත් භාර ගැනීමත්, ඔප්පු සහ පත් ඉරු පරීක්ෂා කිරීමත් සතියේ දිනවල පෙරවරු 9.00 සිට පස්වරු 3.45 දක්වා කාලය තුළ සිදු කෙරේ. එමෙන් ම, පස්වරු 3.00න් පසුව ලියාපදිංචියට භාරගන්නා ඔප්පු සහ සහතික පිටපත් ලබා ගැනීම සඳහා භාර දෙන අයදුම්පත්වල කටයුතු ඉටු කෙරෙන්නේ එයට පසු දින ය. ඔප්පු (නොතාරිස් සහ වෙනත්) සෙවීම සඳහා රුපියල් 2.50ක් සහ පිටපත් කිරීම සඳහා රුපියල් 40.00 බැගින් ඔප්පු පිටපතක් නිකුත් කිරීම සඳහා රු.42.50ක් අය කරනු ලබ යි. එක් පත් ඉරුවක් සඳහා සෙවීමේ ගාස්තු වශයෙන් රුපියල් 2.50 ද පිටපත් කිරීම සඳහා රුපියල් 15.00 ද බැගින් රුපියල් 17.50ක් ගාස්තු වශයෙන් අය කරනු ලබ යි.

දිස්ත්‍රික්කය තුළ පවතින කාර්යාල දෙකින් තංගල්ල කාර්යාලය අධ්‍යයනය සඳහා සම්බන්ධ කර ගැනීමට නො හැකි වූ අතර හම්බන්තොට කාර්යාලයෙන් අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීමේ දී තෙ දිනක පමණ කාලයක් පර්යේෂණ කණ්ඩායමේ සාමාජිකාවකට එහි රැඳීමට සිදු වූ හෙයින් එහි කටයුතු සමීපව නිරීක්ෂණය කළ හැකි විය. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ මනා අධීක්ෂණය සහ සේවක මණ්ඩලය හැසිරවීමේ කළමනාකරණ දක්ෂතාව නිසා කාර්යාලයේ සේවක පුරප්පාඩු පැවතිය ද, සේවාලාභීන් වැඩි කාලයක් එම කාර්යාලයේ සේවා ඉටුවන තුරු ප්‍රමාද නො වන බව නිරීක්ෂණය කෙරිණි. බොහෝ දුරට පුරවැසි ප්‍රඥප්තියේ සඳහන් කාල

වේලාව තුළ හෝ එයට ආසන්න වේලාවක් තුළ ඔප්පු සහ පත්‍ඉරු පිටපත් නිකුත් කිරීමේ කටයුතු සිදු විය. 2011 ජනවාරි සිට දෙසැම්බර් 30 වැනිදා දක්වා කාලය තුළ හම්බන්තොට කාර්යාලයට පත් ඉරු පිටපත් ඉල්ලීම් 1,542ක් ද, ඔප්පු පිටපත් ඉල්ලීම් 16,388 ද ලැබී තිබිණි (වගු 7.4).

රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන දීමනා පත්‍ර, ප්‍රදාන පත්‍ර හෝ බලපත්‍ර ලියාපදිංචි කිරීමට අදාළ කාර්යයන් 3,634ක් 2011 වර්ෂය තුළ හම්බන්තොට කාර්යාලය විසින් සිදු කර තිබූ අතර ඉන් 234 (6.4%)ක් ඉඩම උකසට තබා ණය ගැනීම වෙනුවෙන් මූල්‍ය ආයතන හෝ බැංකු නමින් ඉඩම ලියාපදිංචි කිරීමට අදාළව සිදු කර තිබිණි. ඉතිරි 3,387 තෑගි ඔප්පු, අනුප්‍රාප්තිය, ජීවිත භුක්තිය, මුල් අයිතිය, පැවරීම්, සංශෝධන, ප්‍රකාශන, විකුණුම්, ඇටර්නි සහ වෙනත් අවලංගු කිරීම්, කෝවියට්, ලිස්පෙන්ඩන්[29], බෙදුම්, පූර්වතා[30], අන්තිම කැමති පත්‍ර, දීමනා පත්‍ර සහ ප්‍රදාන පත්‍ර ලියාපදිංචි කිරීම්වලට අදාළ විය (වගු 7.4).

දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ඉදිරිපත් වූ ඉල්ලීම්වලින් 191ක් ඉල්ලීම් බල ප්‍රදේශයට අයත් නො වීම (13), යම් යම් අඩුපාඩු පැවතීම (43), ප්‍රාදේශීය ලේකම් අනුමත කර නො තිබීම, පෙර ලියාපදිංචිය වැරදි සහගතවීම, මුද්දර ඉදිරිපත් නො කිරීම, අත්සන සටහන් කර නො තිබීම, බිම් ප්‍රමාණය නිවැරදිව සටහන් නො වීම, නිල මුද්‍රාව තබා නො තිබීම, අවසර ලිපි අමුණා නො තිබීම, ආකෘති පත්‍රය පිරවීමේ දී ඇති වී තිබෙන අඩුපාඩු සහ පෙර ලියාපදිංචි වී නො තිබීම සිදුව ඇත. එමෙන් ම, භාරදුන් අයගේ ඉල්ලීම ආදී කරුණු ගණනාවක් මත ආපසු යැවීම (76), හිමිකම් සහතික නිකුත් කර ඇති හෙයින් හිමිකම් අංශයට යොමු කිරීම (58) සහ ප්‍රොබේට් බලපත්‍රයක් බැවින් ගොනුකර තැබීම (1) ආදී හේතූන් මත ඉටු කර නොමැත.

හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවා සැපයීමට අදාළ දුෂ්කරතා කිහිපයකට එම නිලධාරීන්ට මුහුණ දීමට සිදු වී ඇත. මෙම කාර්යාලය පරිපාලන සංකීර්ණයේ අවසන් ගොඩනැගිල්ලක පිහිටුවා ඇති නමුත් අධ්‍යයනය සිදු කෙරෙන කාලය තුළ නිසි ප්‍රවාහන පහසුකම් එම ප්‍රදේශයට සපයා නො තිබිණි. මෙම තත්ත්වය තුළ දුර බැහැර සිට සේවයට වාර්තා කරන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට නියමිත වේලාවට සේවයට වාර්තා කිරීමට අපහසු වන හෙයින් කාර්යක්ෂමතාව අඩුවීම කෙරෙහි එය ද බලපානු ලබයි. එමෙන් ම, කාර්ය මණ්ඩලයට එක් එක් අංශයේ කටයුතු සම්බන්ධයෙන් නිසි පුහුණුවක් නො වීම ද සේවා ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව අඩුවීම කෙරෙහි බලපානු ලබයි. මෙයට අමතරව ලියාපදිංචි කිරීම් සිදු කිරීමට භාවිතා කරන කඩදාසිවල අඩු ගුණාත්මක තත්ත්වය නිසා දිගු කාලයක් තබා ගත නො හැකිවීම, ලියාපදිංචි කිරීමේ ලේඛන නිරන්තරව භාවිතා කිරීම නිසා ඒවා ඉක්මණින් විනාශ වීම, සංරක්ෂිතව තබා ගත යුතු ඔප්පු සහ වෙනත් ලේඛන ගබඩා කර තැබීමට අවශ්‍ය නියමිත ප්‍රමිතියෙන් යුතු ගොඩනැගිලි පද්ධතියක් නො වීම නිසා එම ලිපිලේඛනවලට හානි සිදුවීම ආදී අඩුපාඩු රසකට කාර්යාල කළමනාකරණය මුහුණ දී ඇති අතර වර්තමානය වන විට පවා ඒවා නවීන තාක්ෂණය යටතේ සංරක්ෂණය කොට පවත්වා ගෙන යාම සඳහා වැඩ පිළිවෙලක් සකසා නො තිබීම අඩුපාඩුවක් වේ. ඔප්පු සහ ඉඩම් ලේඛන

---

[29] ලිස්පෙන්ඩන් - ඉඩම සම්බන්ධයෙන් නඩුවක් පවතින බවට පූර්ව දැනුම්දීම

[30] පූර්වතා - ණය පහසුකම් ලබා ගන්නා නෙක් සති 06 තුළ බැංකු ණයකට පුද්ගලිකම් ලබා ඇති බව දැනුම් දීම. සති 06 තුළ මෙය අවලංගු වේ.

ස්කෑන් කොට පිටපත් පවත්වා ගෙන යාම මගින් මෙම ලිපි ලේඛන හානිය අවම කර ගැනීමට වර්තමානයේ යොදා ගත හැකි විසඳුමක් වේ.

වගුව 7.4: 2011 වර්ෂය තුළ ඉඩම් සම්බන්ධයෙන් හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සිදු කෙරුණු කාර්යයන්

මාසය	මුළු ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව	ණයවලට අදාළ ඔප්පු ලියාපදිංචිය (බැංකු/මූල්‍ය ආයතන නමින්)	අදාළ රාජ්‍ය නිලධාරීන් විසින් එවන ලද බලපත්/දීමනාපත් සහ ප්‍රදාන පත්	අනෙකුත් ලියාපදිංචි කිරීම්/ අවලංගු කිරීම් සංඛ්‍යාව	පත් ඉරු පිටපත් නිකුත් කිරීම	ඔප්පු පිටපත් නිකුත් කිරීම
ජනවාරි	825	14	707	104	1,206	89
පෙබරවාරි	255	9	67	179	1,126	106
මාර්තු	344	39	111	194	1,159	124
අප්‍රේල්	138	20	70	48	485	90
මැයි	323	20	85	218	1,500	130
ජූනි	465	12	263	190	1,892	141
ජූලි	213	16	73	124	1,570	172
අගෝස්තු	268	20	104	144	1,932	174
සැප්තැම්බර්	1,492	20	1,354	118	1,670	146
ඔක්තෝබර්	249	19	57	173	1,610	97
නොවැම්බර්	371	12	141	218	1,502	145
දෙසැම්බර්	211	33	121	24	736	128
එකතුව	3,634	234	3,153	1,734	16,388	1,542

මූලාශ්‍රය: හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලේඛන ඇසුරින් ගණනය කෙරිණි.

මෙයට අමතරව, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට පැමිණි සේවාලාභීන් අනාවරණය කළ පරිදි මෙම ස්ථානයේ සිදු කෙරෙන සියලු සේවා සැපයීම්වල දී අත්‍යවශ්‍ය වන මුද්දර ගාස්තුව එම ස්ථානයට පැමිණීමට පෙර කිසියම් ක්‍රමයකින් දැන නො ගත්තේ නම් මුද්දර ලබා ගැනීම සඳහා නැවත ආපසු ස්ථානයකට යෑමට සිදු වේ. මෙම කාර්යාල භූමිය තුළ උප තැපැල් කාර්යාලයක් හෝ නියෝජිත තැපැල් කාර්යාලයක් පිහිටුවීමෙන් එම දුෂ්කරතාව මග හරවා ගැනීමට හැකියාව ලැබේ.

7.7 මිනින්දෝරු දෙපාර්තමේන්තුව

රජයේ ඉඩම්වලට සම්බන්ධ සේවා සැපයීමේ දී සෘජුව ම සම්බන්ධ වන ආයතනයකි මිනින්දෝරු දෙපාර්තමේන්තුව. පරිපාලන විමධ්‍යගතකරණය යටතේ එහි දිස්ත්‍රික් කාර්යාලයක් හම්බන්තොට පිහිටුවා ඇති අතර එයට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය ඔස්සේ රජයේ ඉඩම් සම්බන්ධයෙන් මැනුම් කටයුතු සහ මැනුම් රේඛා චිත්‍ර පිටපත් සහ අනෙකුත් සිතියම් පිටපත් නිකුත් කිරීම මෙම කාර්යාලය මගින් සිදු කරනු ලබයි. මෙම කාර්යාලයෙන් කාණ්ඩ තුනක් සඳහා සේවාවන් සපයනු ලබයි. එනම්,

1. ජනතාව වෙතින් ඉදිරිපත් වන ඉල්ලීම් (මෙයට පෙර මැන මායිම් ගල් දමා ඇති ඉඩමක නැවත මායිම් සලකුණු කරගැනීමට, ඉඩමේ මායිම් ගල් අස්ථානගත වී ඇති අවස්ථාවක ඒවා නැවත දැමීමට, ඉඩමේ රේඛා චිත්‍ර ලබා ගැනීමට, නිරවුල් කිරීමේ ආඥා පත්‍රයක් ලබා ගැනීමට, දීමනා පත්‍රයක් යටතේ ලැබුණු ඉඩමක් දීමනා පත්‍රයේ සඳහන් කොන්දේසි අනුව නැවත කොටස් කර ගැනීමට අවශ්‍ය වූ විට අදාළ ප්‍රාදේශීය ලේකම් මගින් දිස්ත්‍රික් මිනින්දොරු කාර්යාලයට යොමු කරන ඉල්ලීම් අනුමත රජයේ ගාස්තු ගෙවීමෙන් ඉටු කර ගැනීම, ඉඩමේ පිඹුරේ සහතික පිටපතක් ලබා ගැනීම)

2. ප්‍රාදේශීය ලේකම් හෝ රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන බලධාරියෙක් විසින් යොමු කරන මැනුම් නියෝග (ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර ලබා දීම සඳහා අවශ්‍ය මැනුම් කටයුතු ඉටු කිරීම, රජයේ සංස්ථා සහ මණ්ඩල සඳහා ඉඩම් ලබා දීමට අවශ්‍ය මැනුම් කටයුතු සිදු කිරීම, රජයේ ඉඩම් ජනතාවට බෙදාදීම සඳහා අවශ්‍ය කට්ටි සැලසුම් සකස් කිරීම, සකස් කළ කට්ටි සැලසුම්වල ඇති ඉඩම් කැබලි කුඤ්ඤ ගසා මායම් පෙන්වීම, රජයේ ඉඩම් දිගු කාලීන බදු දීම සඳහා මැනුම් කරදීම, රජයේ ඉඩම් ජනතාව වෙත නිරවුල් කරදීමට අවශ්‍ය වෙන් කිරීමේ මැනුම් කටයුතු සිදු කිරීම, පොදු කටයුතු සඳහා මැන වෙන්කර ඇති ඉඩම්වල මායිම් ගැටලු නිසා නැවත මැනීම, රජයේ සංවර්ධන කටයුතුවලට ඉඩම් අත්පත් කර දීම සඳහා මැනුම් කටයුතු සිදු කිරීම සහ රජයේ හා පෞද්ගලික ඉඩම් වෙන්ව හඳුනා ගැනීම සඳහා අවශ්‍ය මැනුම් කටයුතු සිදු කිරීම)

3. අධිකරණ නියෝග මත සිදු කරන මැනුම් කටයුතු යනාදී වශයෙනි.

අධ්‍යයනයට ලක් කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් දීමනා පත්‍ර සහ දීර්ඝ කාලීන බදු බලපත්‍ර නිකුත් කිරීම, රක්ෂිත සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය කිරීම ආදි සේවාවන් සැපයීම අකාර්යක්ෂම වීමට බලපාන ප්‍රධාන සාධකයක් වශයෙන් සඳහන් කරනු ලැබුවේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අඩුපාඩු නැතහොත් මැනුම් නියෝග යවනු ලැබුවත් මැනුම් කටයුතු ප්‍රමාදවීම ය. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් සඳහන් කරනු ලැබූ අන්දමට එක් මැනුම් නියෝගයක් සඳහා සිහි කැඳවීම් කිහිපයක් යැවීමට සිදුවේ. මෙම කරුණ දිස්ත්‍රික් මැනුම් අධිකාරී කාර්යාලයේ දත්ත මගින් තහවුරු කරනු ලැබිණි (වගු සටහන් 7.5).

වගුව 7.5: මැනුම් සඳහා වන ඉල්ලීම් සහ අදාළ වසර අවසානයේ නිම කිරීමට ඉතිරිව ඇති සංඛ්‍යාව

වර්ෂය	මුළු ඉල්ලීම් සංඛ්‍යාව	ඉටු කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව	ඉටු නොකළ ඉල්ලීම් සංඛ්‍යාව සහ ප්‍රතිශතය
2007	820	741	79 (9.6%)
2008	812	688	124 (15.3%)
2009	654	508	146 (22.3%)
2010	634	413	221 (34.8%)
2011	587	218	369 (62.9%)

මූලාශ්‍රය: දිස්ත්‍රික් මැනුම් අධිකාරි කාර්යාලය, හම්බන්තොට, 2011.

රජයේ ඉඩම් සම්බන්ධයෙන් පවතින ඉහළ මට්ටමේ රාජකාරි ප්‍රමාණයට සාපේක්ෂව කාර්යාලයට අනුයුක්තව සේවය කරන නිලධාරීන්ගේ හිඟය සේවා ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් ම දායක වී ඇත. හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්තව මැණුම් නිලධාරීන් 29ක් සේවය කරන අතර දෙපාර්තමේන්තුවට වසරකට ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය ඉටු කිරීම සඳහා එම නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නො වේ. එමෙන් ම, සමස්තයක් ලෙස දිවයින පුරා මැණුම් නිලධාරීන්ගේ හිඟයක් වර්තමානයේ පවතින අතර සබරගමුව විශ්වවිද්‍යාලයේ අදාළ උපාධිය සමත්වන වසරකට 50ට සීමාවන පිරිසක් සේවයට බඳවා ගැනීම එයට හේතුව බවත් අනාවරණය විය. එමෙන් ම, පසුගිය කාලයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් විශ්‍රාම ගැනීමත් නිලධාරීන්ගේ හිඟයට තවත් හේතුවක් වී ඇත.

වාර්ෂිකව ඉහළ මට්ටමේ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාවක් ලැබීම සඳහා බලපාන එක් හේතුවක් වන්නේ වසර ගණනාවකට පෙර මැනුම් කටයුතු නිම කළ ඉඩම්වලට නිසි පරිදි දීමනා පත්‍ර ලබා නො දීම ය. උදාහරණ වශයෙන් ලුණුගම්වෙහෙර ව්‍යාපාරය යටතේ ලබාදුන් ඉඩම්වල මැනුම් කටයුතු නිම කර තිබුණ ද ඇතැම් ඉඩම් සඳහා දීමනා පත්‍ර ලබා නො දීමත්, ඇතැම් ඉඩම් සඳහා පෙර මිනුම් නො සලකා දීමනා පත්‍ර ලබා දීමත්, තුළින් මතුවන ගැටලු මැනුම් ඉල්ලීම් ඉහළ යාමට බලපා ඇත. නිදසුනක් ලෙස ජයභූමි ඔප්පු ලබා දී ඇති ඇතැම් ඉඩම්වල පෙර මැනුම් කටයුතු අවසන් කර ඇති අතර ඒවා නො සලකා මැනුම් සටහනක් නොමැතිව ස්වභාවික හතර මායිම් සටහන් කර නිකුත් කරන ලද දීමනා පත්‍රවලින් භූමියේ ප්‍රමාණය, මායිම් මෙන් ම ප්‍රවේශ මාර්ග පිළිබඳව ද ගැටලු මතුවී ඇත. එම නිසා, එම ඉඩම් නැවත නැවත මැනීමට සිදු වේ. එමෙන් ම, එක් ඉඩම් කොටසක් පමණක් මැනීමට ඉල්ලීම් ඉදිරිපත් වන අවස්ථාවල දී දෙපාර්තමේන්තුවට ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය සලකා ඉඩම් කොටස් කිහිපයක් එකතු වන තෙක් මැනීම් සිදු කිරීම ප්‍රමාද වීම ද සිදු වේ (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ඉතිරි වී ඇති මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව සහ කැබලි සංඛ්‍යාව සඳහා ඇමුණුම 01 බලන්න). බොහෝ විට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මැනුම් අවශ්‍යතාව පවතින ඉඩම් කට්ටි කිහිපයක් එක ම ප්‍රදේශයක තිබිය දී පවා එක් කට්ටියක් වෙනුවෙන් මැනුම් නියෝග නිකුත් කිරීම නිසා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවා ඉල්ලීම් ප්‍රමාද වීමට බලපා ඇත.මෙයට අමතරව, රජයේ ඉඩම් අනවසරයෙන් අත්පත් කරගෙන සිටින අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් මැණුම් කටයුතු කිරීමේදී අනවසර භුක්තිකරුවන් විසින් ඉඩම් මැනීමට සහ මායිම් ගල් දැමීම සම්බන්ධයෙන් එල්ල කරන විරෝධතාවන්ට සහ ගැටුම්කාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවීම ද ඔවුන් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවක් වශයෙන් සඳහන් කෙරිණි.

රජයේ සංවර්ධන ව්‍යාපාර සහ වෙනත් හදිසි අවශ්‍යතා මත සිදු කරන මැනුම් කටයුතු සඳහා ප්‍රමුඛතාව දීමට සිදුවන හෙයින් එවන් අවස්ථාවල ප්‍රාදේශීය ලේකම් මට්ටමේ ඉල්ලීම් ඉටු කිරීම සම්බන්ධයෙන් ප්‍රමාදයක් සිදුවේ. එවැනි මැනුම් නියෝග ඉටු කිරීම ප්‍රමාදවීම සඳහා එය ද බලපානු ලබයි. ඇතැම් අවස්ථාවල දී, මෑතක සිදු කරන ලද මැනුමක් නැවත සිදු කිරීම සඳහා මෙන් ම එක් කට්ටි සැලැස්මකට අයත් ඉඩම් වරින් වර මැනීම සඳහා කරන ඉල්ලීම් වැනි මනා අධීක්ෂණයකින් තොරව සිදු කරන ඉල්ලීම් හේතුවෙන් ද මැනුම් ඉල්ලීම් ඉටු කිරීම ප්‍රමාද වේ.

පෞද්ගලික මැනුම් සඳහා ඉල්ලීම් කරන විට තෙ දිනක් හෝ සතියක් ඇතුළත එය ඉටු කිරීමට හැකියාවක් පැවතියත්, ගම් සීතියම් නිසි පරිදි යාවත්කාලීන නො කිරීම සහ ඒවා නිසි පරිදි ආරක්ෂා නො කිරීම ආදී හේතු මත එවැනි ඉඩම් ද මැණීම ප්‍රමාද වේ.

7.8 ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන (බිම් සවිය)

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන බිම් සවිය වැඩසටහන හඳුන්වා දීමේ මූලික අරමුණ වූයේ 1863 අංක 08 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ සිදු කරන ඔප්පුවල පවතින දුර්වලතා මග හැරවීම ය (ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, 2007). මෙම වැඩසටහන 2002-2006 කාලය තුළ අත්හදා බැලීමේ ව්‍යාපෘතියක් වශයෙන් ලෝක බැංකු ආධාර මත ප්‍රදේශ කිහිපයක ක්‍රියාත්මක විය. 2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රජයේ අරමුදලින් අදියරෙන් අදියර දිවයින පුරා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මේ වන විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර සහ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ක්‍රියාත්මක කර ඇත. මෙම හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රමයට අනුව ඉඩමේ පිහිටීම, එහි සීමාවන්, ඉඩමේ ප්‍රමාණය, හිමිකමේ ස්වභාවය නිවැරදිව ලේඛන ගත කර ලියාපදිංචි සහතිකයක් ලෙසින් ජනතාව අතට පත් කරනු ලබයි. ක්‍රියාත්මක භාවයේදී විවිධාකාර ගැටලු පැන නැඟීම නිසා ජනතාව මෙන් ම නිලධාරීන් ද වැඩසටහන තුළින් අපහසුතාවන්ට මුහුණ දෙමින් සිටී.

'බිම් සවිය' වැඩසටහන යටතේ ඉඩම් මැනීමත් සමග මායිම් පිළිබඳ ගැටලු මතු වී ඇත. මෙයට පෙර මැන මායිම් ගල් දමා දීමනා පත්‍ර ලබා දී තිබූ ඉඩම් බිම් සවිය යටතේ මැනීමේ දී බොහෝ අවස්ථාවල මායිම් වෙනස් වීම් සිදු වී ඇත. ජයභූමි දීමනා පත්‍ර යටතේ වන ඉඩම් සම්බන්ධයෙන් මෙම ගැටලුව වඩාත් ඉස්මතු වී ඇත. සිද්ධි අධ්‍යයන 7.2, 7.3 සහ 7.4න් බිම් සවිය වැඩසටහන තුළින් මතු වී ඇති මායිම් සම්බන්ධ ගැටලු සහ ආරවුල් සහගත තත්ත්වයන් පෙන්නුම් කෙරේ. බිම් සවිය යටතේ මැනුම් ගත කිරීමේදී පවතින කට්ටි සැලසුම් සහ බී.ඕ.පී. අනුව මිනුම්ගත කරන්නේ ද? නැතහොත් ස්වභාවික සතර මායිම් අනුව මැනුම් කටයුතු සිදු කරන්නේ ද? යන ගැටලුව පැන නඟී. බී.ඕ.පී. අනුව මිනුම්ගත කරන්නේ නම් මතුවන ගැටලු අවම කර ගැනීමේ හැකියාව පවතින අතර ලුණුගම්වෙහෙර මැනුම් කටයුතු කිරීමේදී ස්වභාවික හතර මායිම් අනුව මැනුම් කටයුතු සිදු කිරීම නිසා ඇතැම් පුද්ගලයින්ට නියමිත ඉඩම් ප්‍රමාණයට වඩා වැඩියෙන් ද, ඇතැම් පුද්ගලයින්ට නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් ද, ඉඩම් ප්‍රමාණයක් හිමි වී ඇත. ඇතැම් අවස්ථාවල දී ඉඩම් යායේ කෙළවර ඉඩම් හිමියාට දැඩි අවාසියක් සිදුවීමේ ප්‍රවණතාවක් පවතී.

සිද්ධි අධ්‍යයන 7.2: බිම් සවිය යටතේ මතු වූ මායිම් ගැටලු

දූණුගම්වෙහෙර ජලාශය සෑදීමේ දී යට වූ තම කුඹුර වෙනුවට ජයපාල කොඩිතුවක්කු මහතාට දූණුගම්වෙහෙර මහානාගපුරින් ඉඩම් ලැබුණු අතර පසු කාලීනව ඒ සඳහා ජයභූමි ඔප්පුවක් ද ලැබිණි. අක්කර 2 1/2ක භූමි ප්‍රමාණයකින් යුත් එම කුඹුරේ මායිම් නිරවුල්ව පැවති අතර මෑතක එම ඉඩම බිම් සවිය යටතේ මැණුම් කටයුතු සිදු කරන ලදී.

බිම් සවියෙන් ඉඩම මැනීමේ දී කුඹුරට අදාළ අක්කර 2 1/2 ඉඩම මැන ඇත්තේ යාබද ඇළ රක්ෂිතය ද ඇතුළත් වන පරිදි ය. මෙහි දී ඔහුගේ සැබෑ භුක්තිය තිබූ භූමියෙන් අක්කර 1/2ක් යාබද ඉඩමට අයත් වන පරිදි මිනුම්ගත කර ඇත. එම ඉඩම් හිමියා මෙම ඉඩම් කැබැල්ල නැවත ලබා දීමට කැමැත්තක් නො දක්වන අතර මේ නිසා අසල්වැසි ගොවීන් වන මෙම දෙපාර්ශවය අතර නිරන්තර ආරවුල් ඇති වේ.

සිද්ධි අධ්‍යයන 7.3: බිම් සවිය යටතේ මතු වූ මායිම් ගැටලු

මහානාගපුර පදිංචි වර්ණසූරිය මහතාට ලැබී තිබූ අක්කර 2 1/2ක කුඹුර සඳහා ජයභූමි ඔප්පුවක් හිමි විය. බිම් සවිය වැඩසටහන යටතේ ඉඩම් මැනීමේ දී ඔහුගේ ඉඩමින් බිම් කොටසක් වෙනත් අයෙකුටත් වෙනත් අයෙකුගේ කුඹුරින් බිම් කොටසක් ඔහුටත් ලැබෙන පරිදි මැනුම් කටයුතු සිදු කර ඇත. මේ වන විට වර්ණසූරිය මහතාගේ කුඹුරෙන් අනෙක් පුද්ගලයාට හිමි විය යුතු යැයි මැනුම් නිලධාරීන් සලකුණු කළ කොටස වර්ණසූරිය මහතා විසින් ලබා දී ඇතත් වර්ණසූරිය මහතාට වෙනත් අයෙකුගේ කුඹුරෙන් ලැබිය යුතු කොටස මෙතෙක් ලබා දී නොමැත. එම නිසා වර්ණසූරිය මහතාට මේ වන විට තමාට රජයෙන් ලැබුණු ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක කුඹුරක් හිමිව ඇති අතර බිම් සවිය කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් වෙත ගැටලුව ඉදිරිපත් කළ ද මෙතෙක් විසඳුමක් ලැබී නොමැත.

සිද්ධි අධ්‍යයන 7.4: බිම් සවිය යටතේ මතු වූ මායිම් ගැටලු

දූණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහානාගපුර පදිංචි කරුණාරත්න මහතාට 1985 වසරේ දී අක්කර 3ක කුඹුරු ඉඩමක් හිමි විය. එම කුඹුර කෙත් ඇලට වඩා අඩි 2ක් උස් වූ අතර එය කෙත් ඇලට ගැලපෙන තත්ත්වයට පත් කිරීමට පස් කියුබ් 900ක් ඉවත් කිරීමට අවශ්‍ය විය. එම තත්ත්වය යටතේ එම ඉඩම අවලංගු කර වෙනත් ඉඩමක් කරුණාරත්න මහතාට ලබා දෙන බව රජය විසින් දැනුම් දුන්න ද, 1987 වන තෙක් එය ඉටු නො වූ හෙයින් කරුණාරත්න මහතා මහත් දුෂ්කරතා මධ්‍යයේ එම පස් ඉවත් කර තම කුඹුර සකස් කර ගත්තා ලදී.

මෑත කාලීනව බිම් සවියෙන් මෙම ඉඩම මැනීමේ දී යාබද ඉඩමට කරුණාරත්න මහතාගේ ඉඩමෙන් ප්‍රමාණයක් වෙන් වීම නිසා ඔහු භුක්ති විඳි ඉඩම් ප්‍රමාණය අඩු වී ඇත. මේ නිසා, කරුණාරත්න මහතා සහ ඔහුගේ අසල්වැසියා අතර මේ වන විට නිරතුරු ආරවුල් මතු වෙමින් පවතී.

දූණුගම්වෙහෙර මෙන් ම තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දී ද බිම් සවිය වැඩසටහනේ දී විශේෂයෙන් ම හඳුනාගත හැකි වූ කරුණක් වන්නේ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක ආයතන සහ වගකීම් දරණ නිලධාරීන් මෙම වැඩසටහනේ දී ඒකාබද්ධව ක්‍රියාත්මක නොවී වෙන් වෙන් වශයෙන් කටයුතු කිරීම නිසා කාලය සහ ශ්‍රමය නිරපරාදේ වියදම් කිරීමට

අමතරව නොයෙකුත් ගැටලු මතුවීම යි. මෙම ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නො වීම නිසා සරල විය යුතු ක්‍රමවේදය සංකීර්ණ සහ අවුල් සහගත ස්වභාවයකට පත්ව ඇත.

රජයේ ඉඩම් සම්බන්ධයෙන් දැකිය හැකි ලක්ෂණයක් වන්නේ එම ඉඩම් නීත්‍යානුකූල නො වන අන්දමින් පැවරීම් සහ විකිණීම් සිදු වීම ය. එම නිසා ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීම ගැටලුවක් වන අතර මේ නිසා ඉඩම් මැනීම සහ සහතික පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් ගැටලු මතුව ඇත.

ඉඩම් හිමිකම් ලියාපදිංචියේ පවතින දුර්වලතා මග හැරීම සඳහා බිම් සවිය වැඩසටහන හඳුන්වා දෙන බව පැවසුව ද, එහිදී සහතික පත්‍ර නිකුත් කරනු ලබන්නේ දැනට ඔප්පු සහිත ඉඩම් සඳහා පමණි. එම නිසා ආරවුල් පවතින හෝ දැනට ඉඩමේ හිමිකම නිශ්චිතව තහවුරු කළ නො හැකි ඉඩම් සඳහා සහතික පත් නිකුත් කිරීමක් සිදු නො වන හෙයින් එවන් ඉඩම් සඳහා නැවත වරක් මැන සහතික පත් නිකුත් කිරීමට සිදු වීම අනවශ්‍ය පරිදා මුදල් හා කාලය නාස්ති කිරීමක් වේ. ඉඩම් සම්බන්ධයෙන් සේවා සපයන ආයතන සියල්ල ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ නම් එක ම අවස්ථාවකදී ඉඩම් මැන, ස්ථානීය පරීක්ෂණ පවත්වා හිමිකම ලබාදිය හැකි ඉඩම් සඳහා හිමිකම ලබා දීමෙන් ඉඩම් සම්බන්ධයෙන් වන ගැටලු නිරාකරණය කර ගැනීමට හැකියාවක් පවතින නමුත් මෙම වැඩසටහන යටතේ එවන් ක්‍රියාවක් සිදු නො වේ.

බැංකු හෝ මූල්‍ය ආයතන වෙත ඉඩම වත්කමක් ලෙස ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීමට යාමේ දී අදාළ පළාත් පාලන ආයතනයෙන් නිකුත් කරන වීථි රේඛා සහතිකය අවශ්‍ය වේ. නමුත්, බිම් සවිය යටතේ නිකුත් කරන සහතිකයෙහි ඇතුළත් වන පිඹුරෙහි ප්‍රවේශ මාර්ග ඉඩම් කට්ටියක් වශයෙන් දැක්වීම නිසා පළාත් පාලන ආයතන වෙත එසේ වීථි රේඛා නිකුත් කිරීමේ හැකියාවක් නොමැත. මේ නිසා ඉඩම් හිමියාට නැවත තම පෞද්ගලික මුදලින් ඉඩම මැන මිනුම් රේඛා ඉදිරිපත් කිරීමට සිදුවේ. මෙය සේවාලාභීන්ට අනවශ්‍ය වැය බරක් වන්නා සේ ම අතිරේක කාර්යයක් ද වේ (ඇමුණුම 02).

ඇතැම් අවස්ථාවල දී බිම් සවිය යටතේ ඉඩම් මනින අවස්ථාවේදී ඉඩම් කට්ටිකරුවන්ට දැනුම් නො දීම නිසා ඉඩම් හිමිකරුවන් මැනීමේ අවස්ථාවට සහභාගී නො වන බවත් එවිට මැනුම් සහතිකයේ හිමිකම් නිරවුල් නො වූ ඉඩම් වශයෙන් එම ඉඩම් සඳහන් කිරීම නිසා ගැටලු මතුවන බවත් සේවාලාභීහු පැවසූ හ. උදාහරණ වශයෙන් කැඩැස්තර සිතියම් අංක 830067 යටතේ වන ඉඩම් කට්ටි අංක 34, 37, 41, 42, 39, 43, 115, 116, 114, 118, 120, 121 යන බිම් කොටස් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් ඒවා වන නමුත් මේවායින් බොහොමයක් රජයට අයත් නිරවුල් නො වූ ඉඩම් වශයෙන් සඳහන් කර ඇත.

7.9 නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික වැසියන්ගේ සහ එහි සේවය කරන්නන්ගේ ජීවිතවල ගුණාත්මක තත්ත්වය සහ ඵලදායිත්වය වර්ධනය කිරීම සඳහා තිරසාර නාගරික මධ්‍යස්ථානවල ප්‍රධාන සැලසුම්කරු හා සංවර්ධනකරු වෙමින් රටේ ජාතික සංවර්ධන උපාය ප්‍රවර්ධනය කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය පරමාර්ථය වේ (www.uda.lk). විශේෂයෙන්, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ

ක්‍රියාත්මක වන කඩිනම් සංවර්ධනය හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට විශාල කාර්යභාරයක් පැවරී ඇත. ඒ අනුව, දැනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාවට නංවන ප්‍රමුඛතා ව්‍යාපෘති වන්නේ විසල් හම්බන්තොට වැඩසටහන, පරිපාලන සංකීර්ණයේ වැඩකටයුතු සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කටයුතු වේ. මේ වන විට දිස්ත්‍රික්කය පුරා ග්‍රාම නිලධාරී වසම් 46ක් නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශ වශයෙන් නම් කර ඇති අතර එය වගු සටහන් 7.6න් දැක් වේ.

වගුව 7.6: හම්බන්තොට දිස්ත්‍රික්කයේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රකාශිත ප්‍රදේශ

ප්‍රකාශිත බල ප්‍රදේශය	ගැසට් අංකය	ගැසට් කළ දිනය	වෙනත් කරුණු
වෙරළබඩ කලාපය	223/16	1982.12.17	
මාතර-කතරගම දුම්රිය මාර්ගය	747/7	1992.12.29	
රුහුණුපුර	1090/5	1999.07.26	
හම්බන්තොට නගර සභාව	38/16 223/16 747/7 1090/5	1979.06.01 1982.12.17 1992.12.29 1999.07.26	නාගරික බල ප්‍රදේශය
හම්බන්තොට මහ නගර සභාව	1639/12	2010.02.02	
හම්බන්තොට ප්‍රාදේශීය සභාව	223/16 747/7 1090/5	1982.12.17 1992.12.29 1999.07.26	
තංගල්ල නගර සභාව	223/16 100/4	1982.12.17 1992.12.29	
තංගල්ල ප්‍රාදේශීය සභාව	223/16 747/7	1982.12.17 1992.12.29	
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව	223/16 392/20 - 747/7 1090/5 1605/41	1982.12.17 1986.03.14 1987.07.24 1992.12.29 1999.07.26 2009.06.11	 නාගරික බල ප්‍රදේශය ගම් උදාව - කතරගම සංශෝධිත රුහුණුපුර ගැසට් පත්‍රය
අම්බලන්තොට ප්‍රාදේශීය සභාව	223/16 747/7 1090/5 1605/41	1982.12.17 1992.12.29 1999.07.26 2009.06.11	
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව	747/7 405/6 1604/29	1992.12.29 1996.01.08 2009.01.05	

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව	747/7 1090/5 1605/41	1992.12.29 1999.07.26 2009.06.11	
සූරියවැව ප්‍රාදේශීය සභාව	1090/5	1999.07.26	
වීරකැටිය නාගරික බල ප්‍රදේශය	1472/5	2006.11.20	
වලස්මුල්ල නාගරික බල ප්‍රදේශය	1346/9	2004.06.23	
කටුවන නාගරික බල ප්‍රදේශය	1346/9	2004.06.23	
මිද්දෙණිය නාගරික බල ප්‍රදේශය	1346/9	2004.06.23	
අඟුණුකොලපැලැස්ස	1395/2	2005.05.30	

මූලාශ්‍රයː නාගරික සංවර්ධන අධිකාරිය, හම්බන්තොට, 2012.

ඉහත 7.6 වගුවෙන් දැක්වෙන අන්දමට දිස්ත්‍රික්කයේ සියළු ම පළාත් පාලන ආයතන බල ප්‍රදේශ ආවරණය වන පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශ නම් කර ඇති අතර විශාල භූමි ප්‍රමාණයක් එයින් ආවරණය වේ. නාගරික සංවර්ධන අධිකාරිය විසින් තමන්ට අදාළ කාර්යයන් ඉටු කිරීමේ දී ඉඩම් විෂයය සම්බන්ධයෙන් යම් යම් දුෂ්කරතාවන්ට සහ ගැටලුවලට මුහුණ දෙනු ලබයි. ඉන් ප්‍රධාන ගැටලුවක් වන්නේ එක් එක් ආයතනවලට අදාළ ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු පද්ධතියක් නො වීම ය. එම නිසා සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී මෙන් ම ඒ සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කර ගැනීමේ දී ද දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වේ.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන සංවර්ධන කටයුතුවල දී ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය වූ විට ඉඩම් පරිහරණ කමිටුවේ නිර්දේශ ඒ සඳහා ලබා ගැනීමට සිදු වේ. ඇතැම් අවස්ථාවල දී එක් එක් ආයතනවලට අදාළ නිර්දේශ ලබා ගැනීමේ දී අගනුවර පිහිටි ප්‍රධාන කාර්යාලයට යෝජනාව යොමු කළ යුතු වේ. එවන් අවස්ථාවක දීර්ඝ කාර්ය පටිපාටියක් අනුගමනය කිරීමට සිදුවන අතර එම නිර්දේශ ලැබීම ප්‍රමාද වීම නිසා අදාළ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම ප්‍රමාද වීම සිදු වේ.

7.10 පළාත් පාලන ආයතන

හම්බන්තොට මහ නගර සභාව, තංගල්ල නගර සභාව ඇතුළුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 12ක් පවතී. පළාත් පාලන ආයතන යනු රජයේ ඉඩම් සම්බන්ධයෙන් සෘජුව සම්බන්ධ නො වන නමුත් වීථි රේඛා නිකුත් කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, ඉඩම් සඳහා දීර්ඝ කාලීන බදු බලපත් නිකුත් කිරීමේ දී ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම ආදී කාර්යයන් තුළින් ඉඩම් සම්බන්ධ සේවාවන් සැපයීම සඳහා අනෙකුත් ආයතන වෙත සහාය වන ආයතන පද්ධතියකි. විශේෂයෙන් ම, ප්‍රජා ශාලා, සායන මධ්‍යස්ථාන, පොදු සුසාන භූමි, වෙළඳපොළවල් වැනි පොදු ස්ථාන සඳහා වෙන් කළ ඉඩම් සහ ගොඩනැගිලි නඩත්තුව පළාත් පාලන ආයතනවලින් ඉටු කෙරෙන හෙයින් ඒ තුළින් ද පළාත් පාලන ආයතන රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන සේවා සැපයීමට වක්‍රව දායක වේ. කෙසේ වුව ද, අනෙකුත් ආයතන මෙන්

ම පළාත් පාලන ආයතන ද තම සේවා සැපයීමේ දී යම් යම් දුෂ්කරතාවන්ට මෙන් ම ගැටලුවලට මුහුණ දෙනු ලබයි.

පළාත් පාලන ආයතන මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ පොදු පහසුකම් සඳහා වෙන් කළ ඉඩම් ප්‍රාදේශීය සභාවෙන් නඩත්තු කළ යුතු වුවත්, බොහෝ පළාත් පාලන ආයතනවලට ඒවා මැන වෙන්කර භාර දී නො තිබීම ය. එම නිසා පළාත් පාලන ආයතන තම මුදල් යොදවා නඩත්තු කරනු ලබන්නේ තමන්ට නීත්‍යානුකූල හිමිකමක් නොමැති දේපලක් වෙනුවෙන් වන අතර ඇතැම් අවස්ථාවල දී පළාත් පාලන නියෝජිතයින්ගෙන් ඒ සම්බන්ධයෙන් චෝදනා එල්ල වන බවත් අනාවරණය විය. අනෙක් අතට ඇතැම් අවස්ථාවල දී, පළාත් පාලන ආයතන සඳහා වෙන් කර ඇති ඉඩම් වෙනත් පොදු කටයුතු සඳහා පවරා ගැනීමක් සිදුවන අතර එසේ පවරා ගෙන අදාළ ආයතනයේ කාර්යය අවසන් වූ පසුව පළාත් පාලන ආයතනය වෙත නැවත භාර නො දී වෙනත් ආයතන වෙත ලබා දීම සිදුවන බවත්, මේ නිසා නැවත ඒවා ලබා ගැනීමේ නො හැකියාවක් පවතින බවත් හෙළි විය.

දිස්ත්‍රික් සභා අහෝසි කොට ප්‍රාදේශීය සභා පිහිටුවීමේ දී දිස්ත්‍රික් සභා යටතේ පැවති ඉඩම් පළාත් පාලන ආයතන වෙත පැවරෙන බවට ප්‍රාදේශීය සභා පනතේ සඳහන් වුව ද එම ඉඩම් නිසි පරිදි මෙතෙක් ප්‍රාදේශීය සභා වෙත පවරා දී නොමැත. උදාහරණ වශයෙන් අම්බලන්තොට ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරන පොදු සුසාන භූමි 60ක අයිතිය 2011 වසර අවසාන වන විට ද ප්‍රාදේශීය සභා වෙත පවරා දී නො තිබූ අතර 2002-08-09 දින සිට එම ඉඩම් ප්‍රාදේශීය සභාවට පවරා දෙන මෙන් ඉල්ලීම් කරනු ලබ යි. එවන් ඉල්ලීමක් සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය වේ. ඒ සඳහා පියවර කිහිපයක් අනුගමනය කිරීමට සිදුවන අතර පළමුවෙන් ම හම්බන්තොට දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් ද, පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් (ගාල්ල) ද අනුමත කර කොළඹ රේඛීය අමාත්‍යාංශයට යොමු කළ යුතු වේ. මෙම පියවර කිහිපය පසු කර එම ලිපිය සඳහා අනුමැතිය ප්‍රාදේශීය සභාව වෙත ලැබීමට අවම වශයෙන් මාස 6ක පමණ කාලයක් ගත වේ. කෙසේ වුව ද, මෙසේ අනුමැතිය ලබා ගත් ඉල්ලීම් සඳහා ද මේ වන තෙක් ප්‍රාදේශීය සභාව වෙත ඉඩම් නිදහස් කිරීම සිදුව නොමැත.

එසේ යවන ලිපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී අස්ථානගත වීම නිසා නැවත නැවත ලිපි ඉදිරිපත් කිරීමට සිදු වීම, ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ දී ප්‍රාදේශීය සභාවේ ලිඛිත අවසරයක් ඒ සඳහා නිරන්තරයෙන් රැගෙන යාමට සිදු වීම, නිරන්තරයෙන් පසු විපරම් කිරීමට සිදු වීම ආදිය ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී පළාත් පාලන නිලධාරීන් මුහුණ දෙන ගැටලු වශයෙන් සඳහන් කරනු ලැබිණි. එමෙන් ම, දීර්ඝ කාලීන බදු බලපත්‍ර නිකුත් කිරීම සඳහා පළාත් පාලන ආයතනවල නිර්දේශ ලබා ගැනීමට ඉදිරිපත් කරන ලිපිවල අඩුපාඩු එනම් ඇතැම් අවස්ථාවල දී ඉඩමේ ප්‍රමාණය, ලිපිනය හෝ ඉඩම පිහිටි ස්ථානය සඳහන් නො කර පුද්ගලයාගේ නම පමණක් සඳහන් කර එවීම ආදිය නිසා අදාළ නිර්දේශ ලබා දීම අපහසු වන බව ද ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය විසින් සඳහන් කරනු ලැබී ය

7.11 සාරාංශය

ඉඩම් විෂයයෙහි සේවා සැපයීමට ඍජුවම සම්බන්ධ නො වූව ද, ඉඩම් විෂයය සමග බැඳුණු කාර්යයන් ඉටු කරන ආයතන රාශියක් පවතී. එකී එක් එක් ආයතන තම විෂයය පථය තුළ ක්‍රියාත්මක වීමේ දී යම් යම් ගැටලු සහ දුෂ්කරතාවන්ට මුහුණ දෙන අතර පොදුවේ හඳුනාගත හැකි ගැටලුවක් වන්නේ ආයතන අතර මනා සම්බන්ධීකරණයක් සහ එක් එක් ආයතන විසින් ඉටු කරන කාර්යභාරය සම්බන්ධයෙන් පවතින අඩු දැනුවත් භාවය නිසා බොහෝ ගැටලු මතුවන බව යි. එයට අමතරව, ජනතාව අතර එක් එක් ආයතන සහ ඒවායින් සිදු කෙරෙන කාර්යභාරය පිළිබඳ පවතින අඩු දැනුවත් භාවය නිසා තම කාර්යයන් ඉටු කිරීමට නිලධාරීන්ට අපහසුතා මතු කරන අවස්ථා ද වේ. රක්ෂිතවල මායිම් සලකුණු නිසි පරිදි වෙන් කර නො තිබීම, මැණීම් කොට ගල් දමා ඇති මායිම් ජනතාව විසින් වෙනස් කිරීම, රක්ෂිත අනවසරයෙන් අත්පත් කර ගැනීම, එකී කටයුතු සඳහා දේශපාලන මැදිහත්වීමක් සිදු කරවීමට මහජනතාව උත්සාහ කිරීම ආදි කටයුතු ද නිලධාරීන්ට තම කාර්යය ඉටු කිරීමේ දී ගැටලු මතු කරවීමට සමත් ව ඇත.

අට වැනි පරිච්ඡේදය

සාරාංශ සහ යෝජනා

8.1 සාරාංශය

රජයේ ඉඩම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ විමධ්‍යගතකරණයේ සියලු ම ආකාරයන් දැනට ක්‍රියාත්මක වේ. කෙසේ වුව ද, අධ්‍යයනයේ දී විශේෂ අවධානය දේශපාලන බල විමධ්‍යගතකරණය ඔස්සේ පළාත් මගින් ක්‍රියාත්මක කෙරෙන කාර්යයන්, විභේදනය යටතේ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රියාවට නංවන කාර්යයන් මෙන් ම අර්ධ ස්වායත්ත ආයතනවලට බලතල පැවරීම යටතේ මහවැලි අධිකාරිය විසින් ක්‍රියාවට නංවන කාර්යයන් පිළිබඳව අවධානය යොමු කෙරිණි. අධ්‍යයනයේ ප්‍රශ්නාවලි ඇසුරින් තොරතුරු ලබාගත් සමස්ත නියැදිය සේවාලාභීන් 486ක් සහ නිලධාරීන් 185ක් ඇතුළත්ව 671කින් සමන්විත විය. එයට අමතරව, ඉඩම් සම්බන්ධිත සේවාවන් සැපයීමේ නියුතු කාර්යාලවල නිලධාරීන්ගෙන් සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු සහ දත්ත සපයා ගැණිනි. අධ්‍යයනය හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට, අම්බලන්තොට, සූරියවැව, තංගල්ල, වලස්මුල්ල, ලුණුගම්වෙහෙර සහ තිස්සමහාරාම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හත ආශ්‍රිතව සිදු කෙරිණි.

සේවාලාභීන්ගෙන් 1.4%ක් අවුරුදු 25ට අඩු වූ අතර 86.7% ක් අවුරුදු 25-65 අතර විය. සේවාලාභීන්ගෙන් 43.8%ක්, අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය හදාරා ඇති අතර උපාධි හෝ පශ්චාත් උපාධි හදාරා ඇති ප්‍රමාණය සේවාලාභීන්ගෙන් 1.6%ක් පමණක් විය. සේවාලාභීන්ගෙන් 86%ක් තම නිවාස සඳහා ජල පහසුකම් ද, 88% විදුලි බලය ද සපයාගෙන තිබිණි. කෙසේ වුව ද, අනවසර ඉඩම් විශාල ප්‍රමාණයක් පවතින මහවැලි බල ප්‍රදේශයක් වන මයුරපුර කොට්ඨාසය අයත් වන සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවාලාභීන්ගෙන් ජල පහසුකම් සපයා ගෙන තිබූ පිරිස 78.4%ක් වූ අතර විදුලිය පහසුකම් සපයා ගෙන තිබූ ගෘහ ඒකක ප්‍රතිශතය 71.6%කි. අධ්‍යයනයට ලක් කළ සේවාලාභීන්ගෙන් 32%ක් කිසියම් හෝ ස්වේච්ඡා සංවිධානයක නිලතල ඉසිලූ හ. සේවාලාභීන්ගෙන් 59.7%ගේ ප්‍රධාන ආදායම් මාර්ගය කෘෂිකර්මාන්තය වූ අතර 5.5% රජයේ රැකියාවල නියුක්ත වූහ. එමෙන් ම, ප්‍රතිචාරීන්ගෙන් 12%ගේ පවුල්වල වෙනත් කිසියම් සාමාජිකයෙක් රජයේ රැකියාවල නියුක්ත ව සිටිය හ. සේවාලාභීන්ගෙන් 94% ගොඩ ඉඩම්වල ද, 33%ක් මඩ ඉඩම්වල ද 12%ක් හේන්වල ද භුක්තිය දරති. ඔවුන් භුක්ති විඳින ඉඩම්වලින් 30% අනවසර ඉඩම් වූ අතර සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එය 59%ක් තරම් ඉහළ අගයක් ගනු ලැබිණි. සමස්තයක් වශයෙන් ගත් කළ සේවාලාභීන් භුක්ති විඳින ඉඩම්වලින් 33%ක් අක්කර 2ට වැඩි ප්‍රමාණයක ඒවා වූ අතර එය කුඹුරු ඉඩම්වල දී 67% ද, හේන් ඉඩම්වල දී 55% ද වූ නමුත් ගොඩ ඉඩම්වල දී 19%ක් විය.

එමෙන් ම, ගැටලු අනුව විග්‍රහ කිරීමේ දී සේවාලාභීන්ගෙන් 33%ක් ඉඩම් බලපත්‍ර ලබා ගැනීම හෝ අනවසර නියමානුකූල කිරීම සම්බන්ධයෙන් ගැටලු ඉදිරිපත් කර තිබිණි. ඉඩම් ආරවුල් නිරවුල් කිරීම හා දීමනා පත්‍ර/ප්‍රදාන පත්‍ර ලබාගැනීම සඳහා වූ ඉල්ලීම් ප්‍රමාණය 13% බැගින් වූ අතර ඉඩමක් රජයට පවරා ගැනීම සඳහා වන්දි ලබාගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ඉල්ලීම්

ප්‍රමාණය 10%ක් විය. රජයෙන් ප්‍රදානය කරන ලද ඉඩමක් අනුමත මූල්‍ය ආයතනයකට හෝ බැංකුවකට ඉදිරිපත් කිරීම සඳහා වූ ඉල්ලීම් සංඛ්‍යාව 1%ක් පමණක් වූ අතර එම සේවාව සැපයීම සඳහා වන ක්‍රියාවලිය සරල හා කෙටි වීමත්, සේවාලාභීන් ඒ සම්බන්ධයෙන් දැඩි කැපවීමකින් ක්‍රියා කිරීමත් එයට හේතු වේ. නියැදියට අයත් වූ නිලධාරීන්ගෙන් 37.3%ක් රාජ්‍ය සේවාවේ වසර 20ට වැඩි අත්දැකීම් සහිත පුද්ගලයන් වූ අතර 30.3%ක් වසර 10ට අඩු කාලයක් අත්දැකීම් සහිත නිලධාරීහු වූහ. එමෙන් ම, නිලධාරීන්ගෙන් 28.6%ක් වසර 20-30 ක කාලයක් අදාළ වෘත්තියේ සේවා නියුක්තිකයන් වූ අතර 38.4% වසර 10ට අඩු සේවා කාලයක් සහිත වූවෝ වූහ. නිලධාරීන්ගෙන් 46.4% ක් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වසර 10ට වැඩි කාලයක් සේවය කර ඇති අතර ඉතිරි පිරිසේ අදාළ ප්‍රා.ලේ. කොට්ඨසය තුළ සේවා කාලය අවුරුදු 10 අඩු විය. ග්‍රාම නිලධාරීන්ගෙන් 26.6%ක් අවුරුදු 5ට වඩා වැඩි කාලයක් අදාළ ග්‍රාම නිලධාරී වසම්වල සේවා නියුක්තව ඇත.

නිලධාරීන්ගෙන් 27.6%ක් තමන් සපයන සේවාව සම්බන්ධයෙන් ඉතා තෘප්තිමත් බව ද, 57.3%ක් තෘප්තිමත් බව ද, පැවසූ අතර 15.1%ක් අතෘප්තිමත් හෝ ඉතා අතෘප්තිමත් බව ප්‍රකාශ කළ හ. සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 60%ක් තමන් සපයන සේවාව සම්බන්ධයෙන් අතෘප්තිමත් බව පැවසූ හ. නිලධාරීන්ගෙන් තෘප්තිමත්භාවයට බලපෑ ප්‍රධාන සාධක වූයේ ජනතාවට බලපාන ප්‍රධාන ගැටලුවක් නිරාකරණයට දායකවීමට ලැබීම, ගැටලු විසඳීම තුළින් ජනතාව අතර ජනප්‍රියතාවට හා ගෞරවයට පාත්‍රවීමට හැකිවීම අවංකව සේවය කිරීමෙන් ලැබෙන ආත්ම තෘප්තිය, ඉහළ නිලධාරීන් සමඟ සබඳතා පවත්වා ගැනීමට හැකිවීම, ඉඩම් නීතිය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට හැකිවීම, රැකියාව තුළ පවතින නිදහස සහ විවිධත්වය, විෂයය සම්බන්ධයෙන් තම දැනුම වර්ධනය කර ගැනීමට අවස්ථාව ලැබීම ය. අතෘප්තිමත්භාවයට හේතු සාධක වශයෙන් සේවාව සැපයීමට නිසි පහසුකම් හා ක්‍රමවේදයක් නො තිබීම, ඉහළ පරිපාලන අංශ වෙත යොමු කරන ගැටලු නො විසඳීම නිසා ජනතාව අතර අප්‍රසාදයට පත්වීම, කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් දැනුමක් නො වීම, උසස්වීම් ලැබීමේ ප්‍රමාදය, ජනතාවට නිකරුනේ කාලය වැය කිරීමට සිදුවීම, ගැටලුවලට සවන්දීමෙන් ඇතිවන කළකිරීම, ඇතැම් ඉහළ නිලධාරීන් විනිවිදභාවයකින් තොරව කටයුතු කිරීම සඳහන් කරනු ලැබිණි.

නිලධාරීන්ගෙන් 65%ක් සේවාලාභීන්, ඉහළ නිලධාරීන්, මහජන සංවිධාන හෝ දේශපාලනඥයින් යන කවුරුන් විසින් හෝ තම සේවාව ඇගයීමට ලක් කළ බව පැවසූ හ. තමන් ඇගයීමට ලක් වූ බව පවසන නිලධාරීන්ගෙන් 94.2%ක් ඇගයීමට ලක්ව ඇත්තේ සේවාලාභීන් වෙතින් වීම විශේෂත්වයකි. සමස්තයක් වශයෙන් ගත් කළ සේවා සැපයීමේ ක්‍රියාවලිය සාමාන්‍ය බව සේවාලාභීන්ගෙන් 50.6% ද, සතුටුදායක බව 3.1% ද, ඉතා සතුටුදායක බව 1.0% ද සඳහන් කරනු ලැබිණි. සේවාලාභීන්ගෙන් 29.2%ක් සේවා සැපීමේ ක්‍රියාවලිය දුර්වල බවත් 9.9%ක් ඉතා දුර්වල බවත් ප්‍රකාශ කළ අතර 5.8%ක් ඒ සම්බන්ධයෙන් ඇගයීමක් කිරීමට තමන්ට හැකියාවක් නොමැති බව ප්‍රකාශ කළ හ. එක් එක් ආයතන වශයෙන් වෙන් වෙන්ව ගත් කළ මහවැලි අධිකාරියෙන් සැපයෙන සේවාව දුර්වල හෝ ඉතා දුර්වල බව සේවාලාභීන්ගෙන් 53.6%ක් පැවසූ අතර 42.1%ක් මධ්‍ය රජයෙන් සැපයෙන සේවාව ද 35.4%ක් පළාත් සභාවෙන් සැපයෙන සේවාව ද දුර්වල හෝ ඉතා දුර්වල බව ප්‍රකාශ කළ හ.

අධ්‍යයනයට ලක් කරන ලද නිලධාරීන්ගෙන් 95%ක් තමන් ඉඩම් විෂය සම්බන්ධයෙන් කිසියම් හෝ පුහුණුවක් ලබා ඇති බව සඳහන් කරනු ලැබුවත්, තමන්ට විෂය සම්බන්ධයෙන් තවදුරටත් පුහුණුවීම් අවශ්‍ය බව නිලධාරීන්ගෙන් 92%ක් සඳහන් කළහ. ඉඩම් විෂයයේ පවතින සංකීර්ණ ස්වභාවයත් පුහුණුවීම් ක්‍රමවේදය වැඩිහිටි අධ්‍යාපනයට අදාළව සකස් වී නො තිබීමත් මෙයට හේතු වේ. නිලධාරීන් සඳහා පවත්වන පුහුණුවීම්වල දී විෂයය පිළිබඳව දැනුවත් කරන අතර ම එය ප්‍රායෝගික තත්ත්වයට ගළපා ගැනීමට හැකි වන අන්දමින් සහභාගීත්ව ප්‍රවේශයක් ඔස්සේ සිදු කෙරෙන පුහුණුවීම්වල අවශ්‍යතාව නිලධාරීන් විසින් අවධාරණය කරනු ලැබිණි. නව චක්‍රලේඛ සහ නීති සංශෝධන සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් 72.4%ක් දැනුවත් වීමේ මාර්ගය කොට්ඨාස දින රැස්වීම වන අතර ග්‍රාම නිලධාරීන්ගෙන් 90.2% දැනුවත් වීමේ මාර්ගය එය වේ. එහිදී කරුණු ඉදිරිපත් කෙරෙන ආකාරය අනුව එය මතකයේ රඳවා ගැනීමට අපහසු බව සඳහන් කරනු ලැබිණි. එමෙන් ම, ඇතැම් අවස්ථාවල දී එවන් නීති සංශෝධන සම්බන්ධයෙන් තමන් දැනුවත් නොකෙරෙන බව නිලධාරීන් විසින් සඳහන් කළ අතර නව නීති සංශෝධන සම්බන්ධයෙන් තමන් දැනුවත් බව පැවසූ නිලධාරීන්ගෙන් දැනුවත් වීමේ කාල සීමාව සති 1 සිට මාස 6 දක්වා කාල පරාසයක විසිර පැවතිණි.

ඉඩම් රාජකාරි සම්බන්ධයෙන් තමන්ට ගැටලු පැන නැගුණු විට ඒවා නිරාකරණය කර ගැනීමට ඉහළ නිලධාරීන්ගෙන් සහාය ලැබෙන බව නිලධාරීන්ගෙන් 97.3%ක් සඳහන් කළ අතර නිලධාරීන්ගෙන් 62%ක් පෙන්වා දෙන අන්දමට එම සහාය ලැබෙන්නේ උපදෙස් දීම තුළිනි. නිලධාරීන්ගෙන් තවත් 19%ක් පෙන්වා දුන් අන්දමට තමන්ට ගැටලු මතු වූ විට ඉහළ නිලධාරීන් ක්ෂේත්‍රයට ගොස් විමසා බලා අවශ්‍ය සහාය ලබා දේ. කොට්ඨාස දින පැවැත්වීම, අවශ්‍ය අවස්ථාවල දී පොලීසිය සහ අනෙක් ආයතන සම්බන්ධීකරණය කර දීම, අවශ්‍ය අවස්ථාවල දී තීරණ ලබා දීම ආදිය තුළින් ඉහළ නිලධාරීන් තවදුරටත් තමන්ට සහාය ලබා දෙන බව නිලධාරීහු සඳහන් කළ හ. තමන්ට ඉහළ නිලධාරීන්ගේ සහාය නො ලැබෙන බව ප්‍රකාශ කළ නිලධාරීන් එයට හේතු වශයෙන් සඳහන් කරනු ලැබුවේ නිලධාරීන්ගේ පවතින අකාර්යක්ෂමතාව, විනිවිදභාවයෙන් තොර තීරණ ගැනීම, ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන්ට ඇහුම්කන් නො දී තීරණ ගැනීම, අදාළ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීමට ඇති නො හැකියාව ආදියයි.

නිලධාරීන්ගේ පහසුකම් සම්බන්ධයෙන් ගත් කළ තමන්ට සැපයී ඇති ප්‍රවාහන පහසුකම් සහ එයට අදාළ දීමනා සම්බන්ධයෙන් නිලධාරීන් දැඩි අතෘප්තිමත් භාවයක පසු වූ අතර ග්‍රාම නිලධාරීන්ගෙන් 83.6% ද, ජනපද නිලධාරීන්ගෙන් 50% ද මෙයට ඇතුළත් විය. දුරකථන පහසුකම් සම්බන්ධයෙන් ද දැකිය හැකිවූයේ ඉහත තත්ත්වයට සමාන තත්ත්වයකි. කෙසේ වුව ද බොහෝ නිලධාරීන් මොබිටෙල් ආයතනය විසින් ලබාදුන් උපහාර පැකේජය මෙන් ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත් වී ලබා දී ඇති භාවිතා කරන ජාලය තුළ ඇමතුම් ගාස්තුවලින් නිදහස් පැකේජ භාවිතා කරන හෙයින් එය සැලකිය යුතු අඩුපාඩුවක් වන බවක් නො පෙනේ. ග්‍රාම නිලධාරීන්ගෙන් 30%ට ආසන්න ප්‍රමාණයක් කාර්යාල පහසුකම් සම්බන්ධයෙන් අතෘප්තිමත් බව පැවසූ අතර එයට හේතු වූයේ තමන්ට සේවා පියසක් නො තිබීම, කාර්යාල දීමනාව වශයෙන් ලැබෙන මුදල ප්‍රමාණවත් නො වීම සහ පෞද්ගලික ස්ථානයක කාර්යාලය පවත්වා ගෙන යාමේ දී ස්වාධීනව කටයුතු කිරීමට බාධා පැමිණීම ආදිය යි. ලිපිලේඛන ගබඩා කර ගැනීමේ අපහසුකම් ඇතැම් ග්‍රාම නිලධාරීන්ගේ සිට සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන් දක්වා වූ නිලධාරීන් විසින් සඳහන් කරනු ලැබූ අතර ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මේ නිසා අත්‍යවශ්‍ය ලිපි ලේඛන සතුන් විසින් විනාශ කිරීම ද සිදු වන බව අනාවරණය විය.

ඉඩම් සම්බන්ධයෙන් නිසි දත්ත ගබඩාවක් නො වීම සේවා සැපයීම ප්‍රමාදවීමට මෙන් ම විවිධාකාරයේ ගැටලු මතු කිරීමට ද හේතු වී ඇත. එමෙන් ම, ග්‍රාම නිලධාරීන් වෙතින් නිර්දේශ කොට ඉදිරිපත් කෙරෙන සේවා අවශ්‍යතා ඉටුවූවාද? නැද්ද? යන්න සම්බන්ධයෙන් නැවත ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමක් නො කරන හෙයින් නොතාරිස් ඔප්පු මඟින් ඉඩම් පැවරීම, පසු උරුමකරුවන් නම් කිරීම ආදියේ දී ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී සතුව පවතින දත්ත යාවත්කාලීන නො වීම නිසා ඇතැම් අවස්ථාවල දී ගැටලු මතුවීමත් දැකිය හැක. තිස්සමහාරාම වැනි ඉඩම් රාජකාරි බහුලව පවතින ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීමනා පත්‍ර සකස් කිරීම සඳහා යෝග්‍ය යතුරු ලියන නොමැති වීම සහ ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඒ සඳහා නිසි පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් නො වීම සේවා ප්‍රමාදයට හේතු වී ඇත. එමෙන් ම, තුන්වැනි උපලේඛනයේ සීමා, අවම බෙදුම් සීමාවේ පවතින ගැටලු ආදිය නිසා සේවා ප්‍රමාදයට මෙන් ම ආරවුල් ඇතිවීමට ද නිලධාරීන් දැඩි අපහසුතාවන්ට මුහුණු පෑමට සිදු වීම ද වේ. ග්‍රාම නිලධාරීන්ගෙන් 76%ක් සහ ජනපද නිලධාරීන්ගෙන් 25%ක් තම ස්ථාන මාරුවීමක දී අනුප්‍රාප්තිකයා වෙත රක්ෂිත සහ වෙනත් පොදු ස්ථානවල මායිම් ප්‍රායෝගිකව පෙන්වා දීම සිදු කරන බව පැවසූ නමුත් නිලධාරීන් සමඟ දීර්ඝව සාකච්ඡා කිරීමේ දී පැහැදිලි වූයේ සත්‍ය වශයෙන් ම, එසේ පෙන්වා දීමේ අවස්ථා ඉතා ම විරල බව යි. විශේෂයෙන් ම, ග්‍රාම නිලධාරීන් වෙතින් මෙම කාර්යය බැහැර වීම අනවසර අත්පත් කරගැනීම් ඉහළ යාමට එක් හේතුවක් වේ.

අධ්‍යයනයට ලක් කෙරුණු සේවාලාභීන් 486 ඉල්ලීම් අතරෙන් 3.7%ක් පමණක් අවසන් අදියරට පැමිණ තිබිණි. එසේ අවසන් අදියරට පැමිණ තිබූ ගැටලුවලින් 39%ක් අවසන් අදියරට පැමිණීම සඳහා වසර 1-5 අතර කාලයක් ගත වී තිබූ අතර ගැටලුවලින් 28%ක් අවසන් අදියරට පැමිණීමට වසර 10ට වඩා වැඩි කාලයක් ගතව තිබිණි. නිලධාරීන්ගෙන් 79%ක් කිනම් හෝ හේතුවක් නිසා තමන් සපයන සේවාව ප්‍රමාද වන බව සඳහන් කර තිබිණි. තමන්ට අමතර රාජකාරි පැවරීම, සේවාලාභීන් විසින් අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් නො කිරීම, ඔවුන්ගේ අල්ප උනන්දුව හෝ උනන්දුවක් නො වීම, මිනින්දොරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාද, ආයතන සහ නිලධාරීන් අතර සම්බන්ධීකරණ දුර්වලතා, සිතියම් සහ මිණුම් රේඛා නො වීම, ඇතැම් ග්‍රාම නිලධාරීන්ට වසම් දෙකක රාජකාරි කටයුතු කිරීමට සිදුවීම, ඉහළ නිලධාරීන්ගේ අධීක්ෂණ දුර්වලතා සහ වැඩ පැවරීමේ දුර්වලතා මෙන් ම ඇගයීමේ ක්‍රමවේදයක් නො වීම ආදි කළමනාකරණ දුර්වලතා ද එම ප්‍රමාදයට හේතු වශයෙන් සඳහන් කරනු ලැබිණි. බොහෝ විට සේවාලාභීන් තම ගැටලුව නිලධාරීන් කිහිප දෙනෙකුට හෝ ආයතන කිහිපයකට ඉදිරිපත් කිරීම සාමාන්‍ය ලක්ෂණයක් ව පැවති අතර අදාළ නිලධාරීන්ට අමතරව දේශපාලනඥයින්, පෙත්සම් කාරක සභාව ආදී විවිධ අංශ වෙත ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය සේවාව කෙරෙහි පවතින විශ්වාසය අඩුවීමක් මේ තුළින් පෙන්නුම් කරනු ලබ යි. එමෙන් ම. එක ම නිලධාරියා හෝ ආයතනය වෙත එක ම ඉල්ලීම වරින් වර ඉදිරිපත් කිරීම අතිබහුතරයක් සේවාලාභීන් විසින් සිදු කර තිබිණි. සේවා සැපයීම ප්‍රමාද වීම කෙරෙහි බලපා ඇති හේතු සාධක වශයෙන් නිලධාරීන්ගේ නො සැලකිල්ල, ලිපිලේඛන ඉදිරිපත් කිරීමේ දී තමන් වෙතින් සිදුවන ප්‍රමාදය, සේවා සැපයීමේ ක්‍රියාවලියේ සංකීර්ණ ස්වභාවය සහ දීර්ඝ බව, සේවාලාභීන්ගේ අනවබෝධය සහ නො දැනුවත්කම, අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම, තුන්වැනි උපලේඛනයේ සීමා සහ අවම බෙදුම් සීමාව සම්බන්ධයෙන් වන ගැටලු, රජයේ කාර්යාලවලින් ලිපිලේඛන අස්ථානගතවීම ප්‍රමුඛ විය.

පසුගිය වසර තුළ අධ්‍යයනය සඳහා තොරතුරු ලබාදුන් ග්‍රාම නිලධාරීන් වෙත ඉදිරිපත් කර තිබූ දල ඉල්ලීම් සංඛ්‍යාව වූ 18,856න් 78.5%ක කටයුතු අවසන් කර අදාල ආයතන වෙත ඉදිරිපත් කර තිබිණි. ඉල්ලීම්වලින් 16%ක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නො තිබූ අතර අඩුපාඩු නිසා 5.5%ක් නැවත හරවා යවා තිබිණි. ජනපද නිලධාරීන් වෙත ඉදිරිපත් ව ඇතැ යි ඔවුන් විසින් සඳහන් කළ 13,931ක් වූ ගැටලුවලින් 37.5%ක කටයුතු නිමකර අදාල ආයතන/නිලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති අතර අඩුපාඩු නිසා 3%ක් නැවත හරවා යවා ඇත. ඉතිරිය නො විසඳුණු ගැටලු වශයෙන් ඉඩම් අංශයේ පවතී. ප්‍රාදේශීය ලේකම් වෙත සේවාලාභීන් විසින් ඉදිරිපත් කරනු ලැබූ ගැටලුවලින් 6%ක් විවිධ අඩුපාඩු නිසා නැවත හරවා යවා ඇති අතර කිසිවක් මෙතෙක් සිදු නො කළ බවට සේවාලාභීන් විසින් සඳහන් කරනු ලැබූ ප්‍රමාණය 1/3ට ආසන්න වේ.

නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්/පළාත් ඉඩම් කොමසාරිස් හෝ සහකාර ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරනු ලැබූ තම ඉල්ලීම්වලින් 39.4%ක් සඳහා අධ්‍යයනය සිදුවන අවස්ථාව වනවිට ද කිසිදු පියවරක් ගෙන නො තිබූ බව සේවාලාභීහු සඳහන් කළ හ. 2011 වසරේ දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථානවලට ඉදිරිපත් ව තිබූ සුළු පැමිණිලිවලින් 14.5%ක් ඉඩම් සම්බන්ධයෙන් වූ ආරවුල් විය. ඒවායින් 66.8%ක් පොලිසිය විසින් සමථකරණයකට ලක්කර තිබූ අතර 20.1%ක් අධිකරණය වෙත යොමු කර තිබිණි.

2011 වසර තුළ හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට පත්ඉරු පිටපත් ඉල්ලීම් 1,542 ද, ඔප්පු පිටපත් ඉල්ලීම් 16,388 ද ලැබී තිබිණි. මෙම කාර්යාලය මගින් පුරවැසි ප්‍රඥප්තියේ සඳහන් වේලාව තුළ සේවා ඉල්ලීම ඉටු කිරීමට උපරිම උත්සාහයක් දරන බව නිරීක්ෂණය කෙරිණි. මෙමගින් ඉල්ලුම් කරන සේවා ඉල්ලීම් සඳහා නිරන්තරයෙන් මුද්දර අවශ්‍යතාවක් පවතින නමුත් ගොඩනැගිලි පරිශ්‍රය තුළ තැපැල් කාර්යාලයක් නො වීම නිසා එම අවශ්‍යතාව සපුරා ගැනීමට පරිපාලන සංකීර්ණය වෙත යාමට සිදුවීම සේවාලාභීන් විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවකි.

ලිපිගොනු නිසි පරිදි නඩත්තු නො කිරීම, මැනුම් කටයුතුවල ප්‍රමාදය, නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව, නීති සම්බන්ධයෙන් නිසි පරිදි දැනුවත් නො වීම, කාර්යාලවල නිලධාරී සහ භෞතික සම්පත් හිඟය ආදී විවිධ හේතු නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සැපයෙන සේවා ප්‍රමාද වන බව සමස්ත නිලධාරීන්ගෙන් 70.3%ක් සඳහන් කළ හ. පර්යේෂණ කණ්ඩායමේ නිරීක්ෂණ අනුව ඉහත කරුණුවලට අමතරව ප්‍රධාන හේතු වශයෙන් වැඩ පැවරීම, අධීක්ෂණය වැනි කළමනාකරණ දුර්වලතා සහ අන්තර් ආයතන සම්බන්ධීකරණ ගැටලු මේ සඳහා දායක වේ. එමෙන් ම, සේවා ඉල්ලීම් සම්බන්ධයෙන් සේවාලාභීන්ට වගවන ආකාරයේ කිසිදු වැඩපිළිවෙලක් අධ්‍යයනයට ලක් කරනු ලැබූ කිසිදු රජයේ ආයතනයක ක්‍රියාත්මක නො විණි. අවම වශයෙන් පසු විපරම සඳහා අවශ්‍ය වන තම ලිපිගොනු අංකය හෝ සේවා ලාභියා වෙත ලබාදීමට විධිමත් වැඩපිළිවෙලක් කිසිදු කාර්යාලයක නො තිබිණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් සිදුවන ප්‍රමාදයට පිළියම් වශයෙන් නිලධාරී හිඟය පියවීම, ඉහළ නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයක් පවත්වා ගෙන යාම, ඉඩම් නීති සහ සේවා සැපයීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම, නිලධාරීන් සඳහා ක්‍රමවත් පුහුණුවක් ලබාදීම, නිලධාරීන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම, නවීන තාක්ෂණික ක්‍රම භාවිතය, නීති සංශෝධනය සහ

ජනතාවට වගවන ආකාරයේ ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීම ආදී යෝජනා නිලධාරීන් මෙන් ම සේවාලාභීන් වෙතින් ඉදිරිපත් විය.

නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාව, සේවාලාභීන්ගේ ලිපි ලේඛන අස්ථානගත වීම, ආයතන අතර සම්බන්ධීකරණ දුර්වලතා ඉදිරිපත් වන ඉල්ලීම් සැපිරීම සඳහා පළාත් සභාව විසින් නිසි ක්‍රමවේදයක් සකස් කර නො තිබීම, අත්දැකීම් සහිත නිලධාරීන්ගේ හිඟය, දේශපාලන බලපෑම්, ක්ෂේත්‍ර මට්ටමේ දී ග්‍රාම නිලධාරි සහ ජනපද නිලධාරි විසින් එකිනෙකට පරස්පර වාර්තා ඉදිරිපත් කිරීම ආදී හේතු සාධක මත පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලවලින් සේවා සැපයීම ප්‍රමාදවන බව නිලධාරීන්ගෙන් 84%ක් සඳහන් කළ හ.

නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය සඳහා ක්‍රමවේදයක් සැකසීම, සේවා ඉල්ලීම් සහ ඒවායේ ප්‍රගතිය සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් පවත්වාගෙන යෑම, තොරතුරු සහ දත්ත පරිඝනක ගතකිරීම, ජනතාව දැනුවත් කිරීම, ප්‍රාදේශීය ලේකම් වෙත පළාත් නියෝජ්‍ය කොමසාරිස්ගේ බලතල විමධ්‍යගත කිරීම, සේවා සැපයීම සඳහා පළාතට උචිත ක්‍රමවේදයක් සැකසීම මේ සඳහා නිලධාරීන් වෙතින් ඉදිරිපත් වූ යෝජනා විය. කෙසේ වුව ද, දැනට ද ප්‍රාදේශීය ලේකම් වෙත ඉඩම් සම්බන්ධයෙන් විශාල බලතල ප්‍රමාණයක් මෙන් ම මධ්‍ය රජයේ අනෙකුත් විෂයයන් විශාල ප්‍රමාණයක් විමධ්‍යගත කර ඇති අතර විෂයයන් රාශියක අතිවිශාල බලතල ප්‍රමාණයක් එක් පුද්ගලයෙකු වටා කේන්ද්‍රගතවීම තුළ සේවා සැපයීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් ගැටලු මතු කර ඇත. විශේෂයෙන් ම, ඉඩම් විෂයය සම්බන්ධයෙන් සලකා බලන කළ එය කෙතරම් සුවිශේෂී විෂයයක් වුව ද ප්‍රාදේශීය ලේකම් හට එය තවත් එක් විෂයයක් පමණක් වන හෙයින් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කිරීමේ හැකියාවක් හෝ කාලයක් නොමැත.

සේවා සැපයීම ප්‍රමාදවීම නිසා හෝ ක්‍රියාවලියේ පවතින සංකීර්ණතා නිසා සේවාලාභීන්ගෙන් 83%ක් සමාජ, ආර්ථික, සංස්කෘතික දුෂ්කරතාවන්ට/අවාසි සහගත තත්ත්වයන්ට හෝ මානසික පීඩාවන්ට මුහුණ දී සිටිති. සේවාලාභීන්ගෙන් 32%ක් තමන් විවිධ මානසික පීඩාවන්ට ගොදුරු වී ඇති බව සඳහන් කරන අතර කෘෂිකාර්මික කටයුතු සිදු කිරීමේ දී යම් යම් ගැටලුවලට මුහුණ දී ඇති බව 17% ආසන්න ප්‍රමාණයක් සඳහන් කර ඇත. තවත් 20%ක් සෘජු සහ වක්‍ර අන්දමින් ආර්ථික වශයෙන් දුෂ්කරතාවන්ට මුහුණ දී සිටිති. එමෙන් ම, සේවා සැපයීම ප්‍රමාදවීම නිසා හෝ නීතිමය ප්‍රතිපාදනවල පවතින සීමාකම් නිසා සේවාලාභීන් 5% පමණ නොයෙක් අන්දමේ ආරවුල්වලට මුහුණ දී සිටින අතර තවත් 5%ක් තම දරුවන් පාසැල්වලට ඇතුළත් කරගැනීමේ දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. තවත් 11%ට ආසන්න ප්‍රමාණයක් තම ඉඩම වත්කමක් සේ ඇපයට තබා මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමේ අපහසුතාවට මුහුණ දී සිටිති. එමෙන් ම, සේවා ප්‍රමාදයේ ප්‍රතිඵලයක් වශයෙන් යටිතල පහසුකම් ලබා ගැනීමේදි මෙන් ම ඒවාට ප්‍රවේශ වීමේ දී ද නොයෙක් අපහසුතාවන්ට මුහුණ දීමට සේවාලාභීන්ට සිදු ව ඇත.

සේවා සපයා ගැනීම වෙනුවෙන් සැලකිය යුතු කාලයක් වැය කිරීමට සේවා ලාභීන්ට සිදුව ඇති අතර සේවාලාභීන් නිලධාරීන් හමුවට ගිය වාර ගණන 1-300 අතර වේ. සේවා සපයා ගැනීම

වෙනුවෙන් වැය කරන ලද කාලය මිනිත්තු 5 සිට මිනිස් දින 225ක් තරම් ඉහළ අගයක් ගනු ලබ යි. තමන් ඉල්ලුම් කර ඇති සේවාව අධ්‍යයනය සිදුවන අවස්ථාව වනවිටත් අවසන් වශයෙන් ඉටුව නො තිබූ අතර සමස්තයක් වශයෙන් ගත්කළ සේවා සපයා ගැනීම වෙනුවෙන් එතෙක් වැය කරන ලද කාලයෙ හි වෙළඳපොල වටිනාකම රුපියල් 2,845.13ක සාමාන්‍යයක් විය. සියලු වියදම් සහිතව සේවාලාභීන් විසින් වැය කළ මුදල සලකා බලන විට රුපියල් 13,939.85ක සාමාන්‍යයක් ගැටලුවක් විසඳා ගැනීම වෙනුවෙන් සේවාලාභීන් වියදම් කර තිබූ අතර සේවාලාභීන් දරන ලද වැඩි ම සාමාන්‍යය වූ රුපියල් 32.931.87 ඉඩම් ආරවුල් නිරවුල් කිරීම වෙනුවෙන් ද, රුපියල් 3,317.34ක අවම සාමාන්‍යය පසු උරුමකරු නම් කිරීම/අවලංගු කිරීම වෙනුවෙන් ද වැය කර තිබිණි.

8.2 යෝජනා

අධ්‍යයනයෙන් පෙන්නුම් කරන පරිදි කරුණු රාශියක සම්මිශ්‍රණයක් හේතුවෙන් සේවා සැපයීම ප්‍රමාදවීම මෙන් ම අවුල් සහගතවීම සිදු වේ. ඒ අනුව කාර්යක්ෂම සේවාවක් සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කෙරේ.

1. ඉඩම් විෂයයෙහි සේවා සැපයීම අවුල් සහගත සහ කාර්යක්ෂම නො වීමට බලපා ඇති එක් ප්‍රබල සාධකයක් වන්නේ ඉඩම් සම්බන්ධයෙන් නිවැරදි දත්ත හා තොරතුරු නො තිබීම සහ පවතින දත්ත යාවත්කාලීන නො වීම ය. රජයේ ඉඩම්, දැනට දීමනා පත්‍ර සහ බලපත්‍ර ලබා දී ඇති ඉඩම්, වාරි සහ අනෙකුත් රක්ෂිත සහ නොතාරිස් ඔප්පු මඟින් පැවරීම් කර ඇති ඉඩම් ඇතුළත් රජයේ ඉඩම්වල ප්‍රමාණ මායිම් සහ කට්ටිකරු ඇතුළත් සවිස්තර සමීක්ෂණයක් ඉතා කඩිනමින් කළ යුතු අතර ග්‍රාම නිලධාරීන්, ගම්මානවල ස්වේච්ඡා සමිති නියෝජිතයින්, රජය විසින් මෑතක බඳවා ගනු ලැබූ උපාධිධාරී අභ්‍යාසලාභීන් සම්බන්ධ කරගනිමින් මෙම සමීක්ෂණය සිදු කිරීම වඩාත් යෝග්‍ය වේ. එමෙන් ම, අදාළ දත්ත සහ තොරතුරු හැකි ඉක්මණින් පරිඝනක ගත කිරීම යෝග්‍ය වේ. එමෙන් ම, ඉඩම්වල හිමිකාරිත්වය හෝ භුක්තිය වෙනස්වන අවස්ථාවල එම වෙනස්වීම් උපරිම වශයෙන් මාසයක් ඇතුළත යාවත්කාලීන වන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය සහ ග්‍රාම නිලධාරීන් අතර සම්බන්ධීකරණ වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ.

2. ඉඩම් සම්බන්ධ තොරතුරු පරිඝනක ගත කොට දිස්ත්‍රික්කය තුළ ජාලගත කිරීමෙන් පුද්ගල හැඳුනුම්පත් අංකය ඔස්සේ ඉඩම් සම්බන්ධ සියලු තොරතුරු ලබාගැනීමේ හැකියාව පවතින අතර බල රහිත පුද්ගලයන්ට සමාජ අසාධාරණයක් සිදුවීම වළක්වා ගැනීමට ද එමඟින් හැකියාව ලැබෙනු ඇත. ග්‍රාම නිලධාරීන්ට මේ සඳහා අවශ්‍ය පරිඝනක සහ අන්තර්ජාල පහසුකම් සහත මිලක් යටතේ ලබාදීමට යෝජනා කෙරේ. අදාළ නිලධාරීන්ට ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දිය යුතු ය.

3. සේවා සැපයීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් මෙන් ම රජයේ ඉඩම් කළමනාකරණය සම්බන්ධයෙන් මතුවන ගැටලුවලට බලපා ඇති එක් ප්‍රධාන හේතුවක් වන්නේ ඉඩම් විෂයයට සම්බන්ධ ආයතන අතර සම්බන්ධීකරණයේ පවතින දුර්වලතා වේ. එම නිසා, රජයේ ඉඩම් සම්බන්ධයෙන් අදාළ වන සියලු ආයතනවල සහභාගිත්වයෙන් කමිටුවක් පිහිටුවීමත්, එම කමිටුව මසකට වරක් දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්ව, පවතින ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කර තීන්දු තීරණ ගැනීමටත් යෝජනා කෙරේ. දැනට පවතින දිස්ත්‍රික් සංවර්ධන කමිටුව මේ සඳහා යොදා ගත හැකි විකල්පයක් සේ

පෙනී ගිය ද, එම කමිටුව හමුවේ සාකච්ඡා කිරීමට යෙදෙන කරුණු කාරණා සම්බන්ධයෙන් සලකා බලන කළ එය කිසිදු අයුරකින් ප්‍රායෝගික නොවේ. එම කමිටුවේ සභාපතිත්වය දිස්ත්‍රික් ලේකම්වරයාට ද, සම සභාපතිත්වය පළාත් සභා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත ද හිමි වීම වැදගත් වන අතර අවශ්‍ය තීන්දු තීරණ ගැනීම සඳහා කමිටුවට බලය ලබා දිය යුතු වේ.

4. ඉඩම් විෂයය සම්බන්ධයෙන් සලකා බලන කල පෙනී යන කරුණක් වන්නේ පළාත් සභා කාර්ය මණ්ඩලය ඔස්සේ මධ්‍ය ආණ්ඩුවේ වගකීම් සහ කාර්යභාරය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු ඉටු කර ගැනීම සිදු වන බව යි. මධ්‍ය ආණ්ඩුවෙන් සහ පළාත් සභා මගින් පරිපාලන කටයුතු සිදුකෙරෙන ඉඩම් සඳහා ජනපද නිලධාරීන් සහ ඉඩම් නිලධාරීන් ඒ ඒ ආයතන මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇත. නමුත්, එම නිලධාරීන් අනුයුක්ත කිරීම සමානුපාතික සහ සාධාරණ ක්‍රමවේදයක් ඔස්සේ සිදුව ඇති බවක් නො පෙනේ. දිස්ත්‍රික්කයේ වැඩි ඉඩම් ප්‍රමාණයක් පළාත් සභා මගින් පරිපාලනය වුව ද, පළාත් සභාවට හිමිව ඇත්තේ එක් ඉඩම් නිලධාරියෙකු පමණි. එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පළාත් සභාවේ එක් ජනපද නිලධාරියෙකු බැගින් සිටිය ද ඔවුන් වෙත ඉදිරිපත් වන සේවා ඉල්ලීම් ප්‍රමාණය සමග සසඳා බැලීමේ දී එම ඉල්ලීම් ප්‍රමාණය ඉටු කිරීමට එම නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නො වේ. මේ නිසා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ සේවා නියුක්තව සිටින මධ්‍ය රජයේ නිලධාරීන් සේවා අවශ්‍යතා අනුව පළාත් සභාවේ සේවා සැපයිය යුතු ස්ථාන වෙත අනුයුක්ත කොට ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ සේවා සැපයීමට කටයුතු යෙදීම යෝග්‍ය වේ.

5. ඉඩම් නීතිය සහ සේවා සපයා ගැනීමේ දී රැගෙන යා යුතු ලිපි ලේඛන, සේවාලාභීන් විසින් සැපිරිය යුතු කොන්දේසි සහ එක් එක් සේවාවන් වෙනුවෙන් හමුවිය යුතු නිලධාරීන් හෝ යොමුවිය යුතු ආයතන සම්බන්ධයෙන් සේවාලාභීන් ප්‍රමාණවත් අන්දමින් දැනුවත් නොමැති හෙයින් ඒ සම්බන්ධයෙන් සේවාලාභීන් දැනුවත් කිරීමට පියවර ගත යුතු වේ. දැනට ද ග්‍රාම නිලධාරී කාර්යාලවල ප්‍රදර්ශනය කෙරෙන ග්‍රාම නිලධාරී ප්‍රඥප්තිය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කෙරෙන පුරවැසි ප්‍රඥප්තිය තුළින් මේ සඳහා යම් පියවරක් ගෙන ඇති නමුත් ග්‍රාම නිලධාරී කාර්යාලවල ප්‍රදර්ශනය කෙරෙන ප්‍රඥප්තිය වෙත එතරම් ජනතා ආකර්ශනයක් නො වීමත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරවැසි ප්‍රඥප්තියේ තොරතුරු දැන ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යාමට සිදුවීමත් නිසා එය සාමාන්‍ය සේවාලාභීන්ට එතරම් ප්‍රයෝජනවත් වී නොමැත. සේවාලාභීන් දැනුවත් කිරීම සඳහා පියවර කිහිපයක් අනුගමනය කළ යුතු වේ. ප්‍රථම සහ අත්‍යවශ්‍ය පියවරක් වශයෙන් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සේවාලාභීන් දැනුවත් කිරීමට පියවර ගත යුතු අතර රාත්‍රී කාලයේ ටෙලි නාට්‍ය ප්‍රදර්ශනය වන කාල සීමාව ඒ සඳහා වඩාත් ම යෝග්‍ය කාල සීමාව වේ. මේ අනුව දිස්ත්‍රික්කයේ පමණක් නොව දිවයිනෙහි ම ජනතාව දැනුවත් කිරීමට හැකියාව ලැබේ. දෙ වනුව, අත් පත්‍රිකා සහ පොත් පිංචක් මාර්ගයෙන් ජනතාව දැනුවත් කිරීමට පියවර ගැනීම යෝග්‍ය වන අතර තෙ වනුව ග්‍රාමීය මට්ටමේ පුහුණු වැඩසටහන් මගින් ජනතාව දැනුවත් කිරීමට පියවර ගැනීම යෝග්‍ය වේ.

6. නිලධාරීන් විසින් තවදුරටත් පුහුණුවීම් අපේක්ෂා කරන හෙයින් ද, ඔවුන් විසින් ලබාගෙන ඇති පුහුණුවීම් තුළින් ප්‍රායෝගිකව රාජකාරී ඉටු කිරීමේ දී ලැබෙන පිටිවහල එතරම් ප්‍රයෝජනවත් නො වන හෙයින් ද, ඉඩම් විෂයය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ

වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක විය යුතු අතර එම වැඩසටහන් වැඩිහිටි අධ්‍යාපනයට සරිලන අන්දමින් ක්‍රියාත්මක විය යුතු වේ. විශේෂයෙන් ම සහභාගීත්ව ප්‍රවේශයක් ඔස්සේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට හැකියාව ලැබේ. එමෙන් ම, සමථකරණය සම්බන්ධයෙන් වැඩිදුර පුහුණුවීම් නිලධාරීන්ට ලබාදීම තුළින් ගම් මට්ටමේ දී ම ඉඩම් ආරවුල්වලට සම්බන්ධ ගැටලු විසඳා ගැනීමට හැකියාව ලැබේ.

7. ප්‍රාදේශීය ලේකම්වරුන් පරිපාලන සේවයට බඳවා ගැනීමේ දී, පරිපාලන සංවර්ධන අභ්‍යාස ආයතනය මඟින් ඉඩම් විෂයය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කළ ද, එයට ඉඩම් විෂයයෙ හි ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් නො වන හෙයින් එම පුහුණුවෙන් රාජකාරී ඉටු කිරීමට ලැබෙන පිටිවහල අල්ප බව හෙළි විය. පුහුණු පාඨමාලාවේ ප්‍රයෝජනවත් බව වර්ධනය කිරීම සඳහා පුහුණු පාඨමාලාව පැවැත්වෙන කාල සීමාව තුළ ම ඉඩම් රාජකාරී බහුල ප්‍රදේශයන් හි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට පුහුණුලාභීන්ට අවස්ථාව සැලැස්වීම වැදගත් වේ.

8. නව නීති සහ සංශෝධන සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදය සහ ඒ වෙනුවෙන් ගත වන කාලය වෙනසකට ලක් කළ යුතු අතර එවන් නීති සංශෝධනයක් හෝ චක්‍රලේඛ නිකුතුවකින් සති 2 වැනි උපරිම කාලයක් තුළ මුද්‍රිත හෝ විද්‍යුත් පිටපත් අදාළ නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

9. ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලතල පැවරීමේ පනත යටතේ ඉඩම් බලතල ඇතුළු එවකට දිසාපතිවරයා සතුව පැවති බලතල රාශියක් ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ඇත. ප්‍රාදේශීය ලේකම් තනතුර කාර්ය බහුල සහ විෂයයන් විශාල ප්‍රමාණයක රාජකාරී පැවරී ඇති තනතුරක් වන හෙයින් සුවිශේෂී විෂයයක් වන 'ඉඩම්' විෂයය සම්බන්ධයෙන් පුළුල් අවධානයක් යොමු කිරීමට හැකියාව නො ලැබේ. එම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය සඳහා වෙනම ම සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරක් ඇති කිරීමට ද, විෂයයෙහි මනා අත්දැකීම් සහිත නිලධාරීන්ගෙන් එම තනතුර පිරවීමට ද යෝජනා කෙරේ. එයට අමතරව, ප්‍රාදේශීය මට්ටමේ නො විසඳුණු ගැටලු සේවාලාභීන් විසින් අවසන් වශයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කිරීමේ ප්‍රවණතාවක් පවතින හෙයින් එම කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්ගේ බලය පැවරෙන අතිරේක/සහකාර දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) තනතුරක් ස්ථාපිත කිරීම යෝග්‍ය වේ.

10. දිස්ත්‍රික්කය තුළ දැනට විවිධ නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වේ. එමෙන් ම, ඉඩම් නොමැති පුද්ගලයන් හට කච්චේරි ක්‍රමය ඔස්සේ ඉඩම් ලබාදීමේ කටයුතු ද, දිස්ත්‍රික්කයේ සිදුවන සංවර්ධන කටයුතු හේතුවෙන් අවතැන් වන ජනතාව සඳහා ඉඩම් ලබාදීමේ කටයුතු ද සිදු වේ. බලපත් සහ දීමනා පත් ලබාදීමේ දී මේ සියලු ක්‍රම සඳහා එක ම ක්‍රමවේදයක් අනුගමනය කරන අතර එම නිසා ම කල් පමාවක් ද සිදු වේ. මෙකී කාර්යයන් ඉටු කිරීම උදෙසා පළාත් සභාව හෝ වෙනත් අදාළ ආයතන විසින් නිශ්චිත ක්‍රමවේදයක් සකසා ඇති බවක් අනාවරණය නො විණි. විශේෂයෙන් ම, සුනාමි නිවාස ව්‍යාපෘතිවල සහ ධීවර ගම්මාන ව්‍යාපෘතිවල නිවාසලාභීන්ට තම නිවාසවල අයිතිය තහවුරු කරදීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකස් විය යුතු ය. ඒ සඳහා එක් එක් ගැටලුවේ ස්වභාවය අනුව වෙන් වෙන් ක්‍රමවේද අනුගමනය කිරීමට යෝජනා කෙරේ. සුනාමි නිවාසවල තත්ත්වය සාමාන්‍ය තත්ත්වයෙන් වෙනස්වන හෙයින් එම නිවාසලාභීන්ට ඉඩමේ අයිතිය ලබාදීම සඳහා පළාත් සභා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරී, එම ගම්මානවල දැනට ක්‍රියාත්මක වන ස්වේච්ඡා සංවිධාන නායකයින් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් ගැටලු සමාලෝචනය

කර ඉදිරිපත් කරන නිර්දේශ අනුව ක්‍රියාත්මක වී කඩිනමින් බලපත්‍ර සහ දීමනා පත්‍ර ලබාදීමට කටයුතු කළ යුතු වේ. මූලික විමර්ශනවලින් පසුව කමිටු යෝජනා සහිතව රැස්වන කමිටු රැස්වීමට, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරියෙක් දිස්ත්‍රික්කය වෙත පැමිණ එයට සහභාගී වී අදාළ කටයුතු ඉටු කර ලිපි ගොනු කොළඹට රැගෙන ඒමෙන් කාල ප්‍රමාදය වළක්වා ගැනීමට හැකිවනු ඇත. එමෙන් ම, සියලු තොරා ගැනීම් සහ ප්‍රමුඛතා ලේඛන, ලකුනු ලබාදීමේ ක්‍රමවේදය සමඟින් ඉඩම් කච්චේරි ක්‍රමයේ මෙන් ම ප්‍රසිද්ධ ස්ථානවල පළ කිරීමත් ක්‍රියාවලියේ විනිවිදභාවය ආරක්ෂා කර ගැනීමට ද යෝජනා කෙරේ.

11. අධ්‍යයනය අනුව දිස්ත්‍රික්කයේ ඉඩම්වලින් 1/3ට ආසන්න ප්‍රමාණයක් අනවසර ඉඩම් වන අතර රජයේ ඉඩම්, විශේෂයෙන් ම රක්ෂිත සහ රක්ෂිත වශයෙන් නම් නො කරන ලද මුත් පුරාවිද්‍යා, පාරිසරික හෝ වෙනයම් අන්දමින් වැදගත් බිම් ප්‍රදේශ අනවසරයෙන් අත්පත් කර ගැනීම වළක්වාලීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ගත යුතු ය. කෙටිකාලීන වශයෙන් මේ සම්බන්ධයෙන් අනුගමනය කළ හැකි ක්‍රමවේද කිහිපයක් ඉදිරිපත් කෙරේ. එනම්, ප්‍රදේශයේ ජනතාව අදාළ නිලධාරීන් සහ දේශපාලනඥයින් නිසි පරිදි දැනුවත් කිරීම, ඒ ඒ රක්ෂිත භාරව කටයුතු කරන ආයතන සහ ඉඩම් සම්බන්ධ සේවාවන් සපයන ආයතනයන්, පොලීසිය සහ සිවිල් ආරක්ෂක කමිටු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැඟීමට කටයුතු කිරීම, අනවසරයෙන් ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පවතින නීතිමය ප්‍රතිපාදන සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් ලබාදීම සහ අනවසර ඉවත් කිරීම සම්බන්ධයෙන් පළාත් සභාවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කඩිනම් කිරීම (පිස්කල් ගාස්තු ප්‍රමාදයකින් තොරව ගෙවීම) කෙටිකාලීන යෝජනා වශයෙන් ඉදිරිපත් කෙරේ. පොදු දේපල සහ ඒවා ආරක්ෂා කර ගැනීමේත්, එම දේපල අනිසි භාවිතයෙන් උද්ගත වන අහිතකර ප්‍රතිඵලත් පිළිබඳ ප්‍රාථමික අධ්‍යාපනයේ සිට අනාගත පරපුර දැනුවත් කිරීම දිගුකාලීන යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කෙරේ. එමෙන් ම, විද්‍යුත් මාධ්‍යයන්ට මෙහි දී විශාල කාර්යභාරයක් ඉටු කිරීමට හැකියාව ඇති අතර ළමා මනසට ගෝචර වන අන්දමින් මෙම ගැටලුවට අදාළ කාටූන් වැඩසටහන් සහ කෙටි නාට්‍ය වැනි ක්‍රම මඟින් ළමුන් දැනුවත් කිරීමට පියවර ගැනීම යෝග්‍ය ය.

12. ඉඩම් ආරවුල් සහ ගැටුම් ඇතිවීමටත්, ලැබෙන සේවා ඉල්ලීම් ප්‍රමාණය ඉහළ යාමටත් බලපා ඇති එක් හේතුවක් වන්නේ තුන්වැනි උප ලේඛනයේ නීතිමය ප්‍රතිපාදන සහ අවම බෙදුම් ඒකකය සම්බන්ධයෙන් වන සීමාවන් ය. මෙම තත්ත්වයට පිළියමක් වශයෙන් තුන්වැනි උපලේඛන සංශෝධන කිරීමට යෝජනා කරන අතර දරුවන් අතරේ ඉඩම් සමසේ බෙදී යන අන්දමට ගොඩ ඉඩම් සඳහා හෝ නීතිමය සංශෝධනයක් කළ යුතු වේ. ඉඩම් කුඩා කැබලි බවට පත්වීම මඩ ඉඩම්වල ඵලදායීතාවට බලපාන හෙයින් කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් මෙම යෝජනාව ඉදිරිපත් නො කෙරේ. කෙසේ වුවද මඩ ඉඩම් සඳහා තට්ටු මාරු හෝ කට්ටිමාරු ක්‍රමයට හිමිවන භුක්තියකට යාමේ හැකියාව පවතී.

13. නොතාරිස් ඔප්පු මඟින් ඉඩම් පැවරීමේ දී අක්‍රමිකතා සිදු වීමේ වැඩි ඉඩකඩක් පවතින බව ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී හෙළි විය. මේ නිසා, නොතාරිස් ඔප්පු මඟින් ඉඩම් පැවරීමේ කටයුතු නිසි අධීක්ෂණයක් යටතේ සිදු විය යුතු ය. දැනට දිස්ත්‍රික්කයේ සිටින ලියාපදිංචි නොතාරිස්වරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් කළ යුතු අතර නොතාරිස් ඔප්පුවකින් ඉඩම් පැවරීමේ දී පෞද්ගලික ඉඩම් ඔප්පුවල සිදුවන අන්දමේ ඉඩම් කට්ටි සැලසුම එයට ඇතුළත් කිරීමට ක්‍රියා කිරීමෙත් නොතාරිස් ඔප්පු මඟින් රජයේ ඉඩම් කැබලි කොට විකිණීමේ හෝ අනවසර ඉඩම් විකිණීමේ කටයුතු යම්තාක් දුරට අඩු කර

ගැනීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන් ම නොතාරිස් ඔප්පුවකින් ඉඩමක් පැවරූ පසු ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී දැනුවත් කිරීම තුළින් රජයේ ඉඩම් සම්බන්ධයෙන් වන අක්‍රමිකතා යම් ප්‍රමාණයකට අඩු කරගත හැකි වනු ඇත.

14. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා, දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඇතුළු රජයේ ඉඩම් සම්බන්ධයෙන් වැදගත් සහ අත්‍යවශ්‍ය ලිපි ලේඛන පවතින ආයතනවල එම ලිපි ලේඛන සංරක්ෂණය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම කළ යුතු වේ. මෙම ආයතනවල පවතින ලිපි ලේඛන ස්කෑන් කොට විද්‍යුත් දත්ත ගබඩාවක් ආකාරයෙන් සංරක්ෂණය කොට පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමෙන් හදිසි තත්ත්වයන් යටතේ හෝ කාලයාගේ ඇවෑමෙන් එකී ලේඛන විනාශ වීමෙන් සිදුවන හානිය වළක්වා ගත හැක.

15. සේවා සැපයීම ප්‍රමාදවීමට බලපාන ප්‍රධාන සාධකයක් වශයෙන් මැනුම් අවශ්‍යතා ඉටු කිරීමට පවතින බාධා හඳුනා ගැණිනි. මෙයට පිළියමක් ලෙස කටයුතු කඩිනම් කිරීම සඳහා කෙටි කාලීන පියවරක් වශයෙන් රජයේ අනුමත මිනින්දෝරු නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් සේවයට යොදවා ගැනීමට යෝජනා කරන අතර දැනට මැනුම් කටයුතු සිදු කර ඇති ඉඩම් සඳහා කඩිනමින් බලපත් සහ දීමනා පත් ලබාදීමට කටයුතු කිරීම තුළින් තවදුරටත් දිගින් දිගට එක ම ඉඩම් සඳහා මැනුම් ඉල්ලීම් ඉදිරිපත්වීම අඩු කර ගත හැක. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මැනුම් නියෝග නිකුත් කිරීමේ දී විධිමත් සහ ක්‍රමවත් භාවයකින් යුතුව එය සිදු කිරීමෙන් පිරිවැය අවම කරගනිමින් මැනුම් කටයුතු කඩිනමින් ඉටු කිරීමට හැකියාව ලැබේ.

16. පුරවැසි ප්‍රඥප්තියේ සඳහන් කාල පරාසය තුළ අදාළ සේවාවන් සැපයීම ප්‍රායෝගිකව සිදු කිරීමේ අපහසුවක් පවතින හෙයින් එහි සඳහන් කාල වේලාවන් තුළ බොහෝ කාර්යාලවලින් සේවා සැපයීම සිදු වෙතැයි අපේක්ෂා කළ නො හැක. පුරවැසි ප්‍රඥප්තිය සම්බන්ධයෙන් අදහස් දැක්වූ බොහෝ නිලධාරීන් පෙන්වා දෙනු ලැබූවේ එය ක්ෂේත්‍රයේ හැකියාවන් සහ අත්දැකීම් සැලකිල්ලට භාජනය නො කොට කොළඹ සිට සැලසුම් කළ දෙයක් බවත් එහි සඳහන් කර ඇති කාලවේලාවන්ට සේවාවන් සැපයීමේ අපහසුතාවක් පවතින බවත් ය. එම නිසා පුරවැසි ප්‍රඥප්තිය වැනි ලේඛන සකස් කිරීමේ දී ප්‍රායෝගික තත්ත්වය සැලකිල්ලට ගත යුතු අතර ඒ මඟින් නිලධාරීන් අපහසුතාවට පත්වීම වැළැක්විය හැක.

17. මහවැලි සංවර්ධන අධිකාරියේ ප්‍රමුඛතම අරමුණ සංවර්ධන නියමුවෙක් වශයෙන් ක්‍රියාකිරීම වුවත් වලව විශේෂ බල ප්‍රදේශයේ දී මහවැලි සංවර්ධන අධිකාරිය බොහෝදුරට ඉඩම් රාජකාරී සඳහා සීමා වී ඇති බව පෙනේ. එමෙන් ම, මයුරපුර කොට්ඨාසයේ ඉඩම් බෙදා දීමේ දී මුල්කාලීන දුර්වලතා හේතුවෙන් දැනට ද සංකීර්ණ ගැටලු රාශියක් පැන නැඟී ඇත. ඉඩම් සම්බන්ධයෙන් සේවා සැපයීමට ආයතන රාශියක් පවතින අතර ම මහවැලියේ මුඛ්‍ය අරමුණ ඉඩම් බෙදා දීම නොව සංවර්ධන කටයුතුවලට දායකවීම වේ. ඒ සඳහා අවශ්‍ය මානව සහ භෞතික සම්පත් අධිකාරිය සතුව පවතිද්දී වුව ද, ඉඩම් රාජකාරීවලට සීමාවීමට සිදුවීම නිසා එම සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීටම අධිකාරියට හැකියාවක් ලැබී නොමැත. ප්‍රදේශයේ ඉඩම් රාජකාරී සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ ක්‍රියාකාරකම් සීමා කොට අධිකාරිය සංවර්ධන කටයුතුවලට වඩාත් නැඹුරුවීම වඩාත් යෝග්‍ය වේ.

18. ඉඩම් හිමිකම ලියාපදිංචි කිරීමේ වැඩසටහන යහපත් අරමුණකින් හඳුන්වා දෙන ලද්දක් වූවත් බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමඟින් ගැටලු රාශියක් පැන නැඟී ඇති අතර ජනතාව අතර ආරවුල් වර්ධනය වී ඇත. මෙයට හේතු වී ඇත්තේ ආයතන සහ නිලධාරීන් අතර සම්බන්ධීකරණයක් නො වීම ය. මේ නිසා බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක වීමේ දී එයට අදාළ සියලු ආයතනවල නිලධාරීන් අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමටත්, ක්ෂේත්‍රය වෙත යාමේ දී නිලධාරීන් වෙන් වෙන් වශයෙන් යාම වෙනුවට අදාළ සියලු නිලධාරීන් සහ ග්‍රාමීය නියෝජිතයින් (ග්‍රාම නිලධාරී, ජනපද නිලධාරී, ඉඩම් නිලධාරී, බිම් සවිය වැඩසටහනෙහි නිලධාරීන්, මැනුම් නිලධාරීන් මෙන් ම ග්‍රාමීය ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත කමිටුවක්) එකවර ගමට ගොස් කටයුතු කිරීම වඩා යෝග්‍ය වේ.

19. බිම් සවිය වැඩසටහන යටතේ නිකුත් කළ සහතිකයෙ හි ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉඩම් කැබලි අංකයකින් දැක්වීම නිසා එවැනි ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කරන වීථි රේඛා නිකුත් කිරීමට නො හැකි තත්ත්වයක් මතුව ඇත්තේ එය නාගරික සංවර්ධන අධිකාරියේ පනතෙහි වගන්තිවලට පටහැනි වන හෙයිනි. එබැවින්, එම සහතිකවල සහ මැනුම් රේඛාවල පැරණි කට්ටි සැලසුම්වල මෙන් ප්‍රවේශ මාර්ග දැක්වීමට කටයුතු කළ යුතු වේ.

20. සේවා සැපයීමේ ක්‍රමවේදය තුළ වගවීම සම්බන්ධයෙන් බොහෝ විට දැකිය හැක්කේ ඍණාත්මක තත්ත්වයකි. එම නිසා ඉඩම් විෂයය සම්බන්ධයෙන් සේවා ඉල්ලීම්වල මුල් පියවරේ සිට අවසාන පියවර දක්වා සේවාලාභීන්ට වගවීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුව ඇත. මේ සඳහා සේවාලාභීන් ග්‍රාම නිලධාරී හෝ අදාළ වෙනත් නිලධාරියෙකු වෙත තම සේවා ඉල්ලීම ඉදිරිපත් කළ අවස්ථාවේ දී ම තමන් ඉල්ලීම බාරගත් දිනය හා වේලාව, ඉල්ලුම්පත සමඟ භාරගත් අනෙක් ලිය කියවිලි සහ තමන් වෙතින් ඉටු විය යුතු රාජකාරිය ඉටු වූවාද? නැද්ද? එහි ප්‍රගතිය, රාජකාරිය ඉටු කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය නම් කොපමණ කාලයක් ගත වන්නේ ද? සේවාලාභියා නැවත පැමිණිය යුතු දිනය හා අවශ්‍ය රාජකාරිය ඉටු වී නැත්නම් යොමු විය යුතු නිලධාරියා ආදිය සඳහන් පත්‍රිකාවක් ලබාදීමෙන් සේවාලාභීන් එක් එක් ආයතනවල රස්තියාදුවීම වළක්වා ගැනීමටත් වගවීමක් ඇති කිරීමටත් යම් ප්‍රමාණයක හැකියාවක් ලැබෙනු ඇත (ඇමුණුම 03 හි මේ සම්බන්ධ දළ ආකෘතියක් ඉදිරිපත් කර ඇත). ඉන්දියාවේ ඇතැම් ප්‍රාන්තවල ක්‍රියාත්මක වන අන්දමින් සේවා සැපයීම නියමිත දිනට වඩා ප්‍රමාද වන අවස්ථාවල දී ඒ සඳහා අදාළ නිලධාරියාගෙන් ප්‍රමාද ගාස්තුවක් සේවාලාභියාට ගෙවීමට නීතිමය ප්‍රතිපාදන ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක නො වන හෙයින් ඉඩම් විෂයෙහි තෝරා ගත් සේවාවන් කිහිපයක් සඳහා හෝ එවන් නීති සම්පාදනය කිරීමට කටයුතු කිරීම දිගුකාලීන යෝජනවක් ලෙස ඉදිරිපත් කෙරේ.

21. නිලධාරීන් හා සේවාවන් සැපයීම සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට සේවාලාභීන්ට අවස්ථාව සැලසීම සහ ඉහළ නිලධාරීන් විසින් එම යෝජනාවලින් පිළිගත හැකි යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

22. ග්‍රාම නිලධාරීන් ඇතුළු ඉඩම් රාජකාරිවල නියුක්ත නිලධාරීන්ගේ ඇගයීම්/උසස්වීම ලබාදීමේ දී ඉඩම් විෂයය සම්බන්ධයෙන් දැනුම ඇගයීමට ලක් කිරීම.

23. ස්ථාන මාරුවීම් නො ලබා එක ම ස්ථානයක දිගු කාලයක් සේවය කරන නිලධාරීන් ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී හමු වූ අතර එය ඇතැම් අවස්ථාවල දී නිෂේධනාත්මක නිලබලතාන්ත්‍රික සංස්කෘතියක් ගොඩනැගීමට ඉවහල් වී ඇත. මේ නිසා වසර පහකට

වඩා වැඩි කාලයක් එක ම සේවා ස්ථානයක සේවය කරන නිලධාරීන් සඳහා කඩිනමින් සහ සැලසුම් සහගතව ස්ථාන මාරුවීම් ලබාදිය යුතු වේ.

24. ඉඩම් සංවර්ධන ආඥා පනත සහ ඉඩම් විෂයෙහි බලාත්මක අනෙකුත් නීති රීති අනුව ඉඩම් කොමසාරිස්වරයා වෙතින් පැවරෙන කාර්යයන් (ඉඩම් කච්චේරි සඳහා සහභාගීවීම, ප්‍රකාශ සටහන් කර ගැනීම ආදී) ඉටු කිරීමේ බලය හිමි වනුයේ ඉඩම් නිලධාරීන්ට ය. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ අධ්‍යයනයට ලක් කළ කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පළාත් සභාවේ ඉඩම් නිලධාරීන් නො වූ අතර ජනපද නිලධාරීන් විසින් ඉඩම් නිලධාරීන්ගේ කාර්යභාරය ඉටු කරනු ලබයි. මෙම නිලධාරීන්ට එයට ඉහළ නිලයක නිලධාරීන්ගේ වැඩකටයුතු ඉටු කිරීමට වගකීම් පවරා ඇත්තේ කුමන ආකාරයෙන් ද යන්න පැහැදිලි නොමැති අතර ලිඛිතව නො පැවරුණු වගකීම් ඉටු කිරීමේ දී එය බලාත්මක ද යන්න ගැටලු සහගත ය. පළාත් සභාවේ දැනට සිටින ජනපද නිලධාරීන්ගෙන් සුදුසුකම් සපුරා ඇති පිරිස් ඉඩම් නිලධාරීන් සේ අන්තර්ග්‍රහනය කිරීමට හෝ සීමිත තරඟ විභාගයකින් එම තනතුරට බඳවා ගැනීමට යෝජනා කෙරේ.

25. මහජන දිනයෙහි හෝ නගරයෙහි සතිපොළ පැවැත්වෙන දිනයෙ හි බොහෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැකිය හැකි තදබදය වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැකිය නො හැකි අතර එහි එක් එක් අංශ සඳහා හඳුන්වා දී ඇති සේවා කවුළු (කවුන්ටර්) ක්‍රමය මේ සඳහා එක් ප්‍රධාන හේතුවක් වී ඇත. එමෙන් ම, එය ජනතාව අතර දැඩි ප්‍රසාදයක් දිනා ගෙන ඇත. සියලූ ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන අතර වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉදිරිපස දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇති ආකාරයට එක් එක් ග්‍රාම නිලධාරී වසම්වලට අදාළ නිලධාරීන්ගේ ඡායාරූපය සහිතව අදාළ නිලධාරියාගේ කවුන්ටරය සඳහන් කිරීමෙන් අනවශ්‍ය තදබදය වළක්වා ගැනිමටත්, සේවා සැපයීම කඩිනම් කිරීමටත් හැකියාව ලැබේ.

26. නාගරික සංවර්ධන අධිකාරියේ ඉලක්ක අනුව වසර 2020 වන විට හම්බන්තොට මහ නගර සහා බල ප්‍රදේශයෙ හි ජනගහනය 45,568 දක්වා ද, වසර 2025 වන විට 61,011 දක්වා ද, ජනගහන වර්ධනයක් සිදු වනු ඇත. ජනගහන වර්ධනයත් සමඟ නිවාස අවශ්‍යතාව වර්ධනය වන අතර 2015 වන විට නිවාස 2,311 ද 2025 වන විට නිවාස 3,653 ද හිඟයක් මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඇති වන බවට පුරෝකථනය කර ඇත. මේ අනුව, එම නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට භූමිය අවශ්‍ය වන අතර ඒ සඳහා ඉඩම් බෙදා දීමේ දී හෝ වෙනත් සංවර්ධන කටයුතුවල දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට සිදුවන අතර ඉඩම් සඳහා විවෘත වෙළෙඳපොළක් ඇති කිරීමේ අවශ්‍යතාව ඉටු කිරීමට පියවර ගත යුතු වේ. එමෙන් ම, පවතින සීමිත භූමියෙන් ප්‍රයෝජන ගනිමින් දිස්ත්‍රික්කය පුරා අවම වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ බල ප්‍රදේශ වශයෙන් නම් කළ ස්ථානවල හෝ මහල් නිවාස ක්‍රමයට යාම වඩාත් යෝග්‍ය වනු ඇත.

27. මුල් කට්ටිකරුවන් ගේ පසු පරම්පරාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම්වල වර්තමාන හිමිකරුවන්ගේ පසු පැවරීම් වැනි කටයුතුවල දී පවා රජය සමඟ නවදුරටත් කටයුතු කිරීමට සිදුවීම සේවා ඉල්ලීම් වර්ධනයවීමට ප්‍රබල හේතුවක් වී ඇත. අවම සහ අන්හදා බැලීමේ පියවරක් වශයෙන් එසේ මුල් කට්ටිකරුවන්ගේ දෙ වැනි, තෙ වැනි පරම්පරාවන් විසින් භුක්ති විඳින සහ අයිතිය දරන ඉඩම්වල වර්තමාන අයිතිකරුවන් හට ස්ථිර ආදායම් මාර්ග ඇත්නම් ඉඩමේ තක්සේරු වටිනාකම ගෙවා ඉඩම රජයේ බැඳීම්වලින්

නිදහස් කිරීමෙන් තවදුරටත් සේවා සඳහා වන ඉල්ලීම් වර්ධනයවීම වළක්වා ගත හැකි අතර ඉඩම් සඳහා විවෘත වෙළෙඳපොළක් ඇති කළ හැකි වනු ඇත.

28. ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්ත නිලධාරීන්ගේ කටයුතු කඩිනම් කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්, ජනපද නිලධාරීන් සහ ඉඩම් නිලධාරීන් හට තීරු බදු රහිත ක්‍රමයකට හෝ සහනදායී තීරු බදු ක්‍රමයකට යතුරුපැදි ලබාදීමට යෝජනා කෙරේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේ අපහසුතා මතු වන්නේ නම්, පොලී රහිත ගෙවීමේ ක්‍රමයකට අදාල නිලධාරීන් වෙත යතුරුපැදි ලබාදීමට යෝජනා කෙරේ.

29. මාස 2කට වරක් නියෝජ්‍ය සහකාර ඉඩම් කොමසාරිස්වරයා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ අදාළ ලිපිගොනු සඳහා අනුමැතිය දීම සහ වෙනත් අදාළ කටයුතු ඉටු කිරීමත් අවශ්‍ය ලිපි ගොනු වෙතොත් පළාත් කාර්යාලය වෙත රැගෙන යාමෙන් එක් එක් ආයතන වෙත සේවා ඉල්ලීම් යැවීමේ දී සහ නැවත ආපසු එවීමේ දී සිදුවන ප්‍රමාදය වළක්වා ගැනීමට යෝජනා කෙරේ.

30. අදාළ ආයතනවලට ලැබෙන සේවා ඉල්ලීම් සහ එවායේ ප්‍රගතිය පිළිබඳ ඉහළ අධීක්ෂණ නිලධාරීන් විසින් නිරන්තරයෙන් ඇගයීම් සිදු කිරීමත්, කාර්යයන් නිසි පරිදි පැවරීමත් සිදු කරන ලද කාර්යයන් ඇගයීමත් තුළින් ඉඩම් අංශවල සේවා කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව වර්ධනය කිරීමට හැකියාව ලැබේ.

31. ඉඩම් රාජකාරිවලට සම්බන්ධ වන නිලධාරීන් හට සහභාගීවී තම දැනුම වර්ධනය කරගත හැකි අන්දමේ විෂයය සම්බන්ධයෙන් වන විශ්වවිද්‍යාල මට්ටමේ පාඨමාලා ඉතා ම විරල ය. මෙම නිසා, ඉඩම් විෂයය සම්බන්ධයෙන් අදාළ සියළු නිලධාරීන්ට සහභාගී විය හැකි අන්දමින් විශ්වවිද්‍යාල මට්ටමේ ඉඩම් පාලනය, කළමනාකරණය සහ සේවා සැපයීමට අදාළ ව සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා සහ උපාධි පාඨමාලා ආරම්භ කිරීමට යෝජනා කෙරේ. 1972 අංක 5 දරන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනතේ 3.1 (ඊ) වගන්තිය යටතේ, වෙනත් ආයතන සමඟ හෝ තනිව ඩිප්ලෝමා සහ උපාධි පිරිනැමීමේ බලය හෙ.කො.ගො.ප.පු. ආයතනයට හිමිවන හෙයින් මූලික පියවරක් වශයෙන් ඉහත කී විෂයයන්ට අදාළව සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා හෙ.කො.කො.ගො.ප.පු ආයතනය මගින් ඇරඹීමටත් විෂයය සම්බන්ධිත දැනුමින් පොහොසත් බාහිර පුද්ගලයින්ද සහභාගී කරවා ගනිමින් එම පාඨමාලා ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කෙරේ.

32. ඉහත කී පාඨමාලාවන්ට සහභාගී වන නිලධාරීන්ගේ දැනුම සෘජුව ම රටේ සංවර්ධනයට සහ අදාළ ක්ෂේත්‍රය කෙරෙහි යොමු වන හෙයින් තෝරාගත් නිලධාරීන් පිරිසකට එම පාඨමාලාව සඳහා ශිෂ්‍යත්ව ලබා දීමට යෝජනා කෙරේ.

33. සේවාලාභීන්ට තම ඉඩම් ගැටලු සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ සහ තමන් ඉදිරිපත් කළ ගැටලුවට අදාළ ප්‍රගතිය සම්බන්ධයෙන් පසුවිපරම් කළ හැකි දුරකථන අංකයක් අදාළ කාර්යාලවල ක්‍රියාත්මක කිරීම. එම දුරකථන පද්ධතිය මනාව සංවිධානය කළ සහ යාවත්කාලීන කළ තොරතුරු පද්ධතියක් සමඟ සම්බන්ධ කරමින් සේවාලාභියාට වඩා කාර්යක්ෂම සේවාවක් ලබාදීම

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, (1985), *ඉඩම් ප්‍රතිපත්තියේ පිය සටහන්*, කොළඹ: ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය, (2007), *බිම් සවිය ඉඩමේ හිමිකම සවිමත් කරයි*, කොළඹ: ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, (1985), *රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහය*, කොළඹ: ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව.

කළුආරච්චි, කේ.ඒ.එස්.පී., (2000), සංවිධාන චර්යාව, *න්‍යාය, සංකල්ප සහ යෙදීම*, කැළණිය: ආසිරි ලංකා මුද්‍රණ සහ ප්‍රකාශන සමාගම.

ගමගේ ඩී. සහ නදීකා දමයන්ති, එම්.කේ., (2008), "*කෘෂි ඉඩම් සම්බන්ධව කොබ්බෑකඩුව දර්ශනය සහ මෙහෙවර*", හෙක්ටර් කොබ්බෑකඩුව අනුස්මරණ සම්මන්ත්‍රණය, 2008 සැප්තැම්බර් 18, කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

ජයතිලක, ඩබ්.එම්., (2007), "*පළාත් සභා ක්‍රමය යටතේ ඉඩම් විෂයය සම්බන්ධව ජාතික රජයේ සහ පළාත් මට්ටමේ ආයතනික ව්‍යුහය, සම්පත් බෙදී යාම සහ ක්‍රියාකාරීත්වය*", පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව, 2007 පෙබරවාරි 19, (සංස්.) නදීකා දමයන්ති, එම්.කේ. සහ සුසිලා ලූර්දු, එම්.ඩී., වාර ප්‍රකාශන අංක 21, කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

නදීකා දමයන්ති, එම්.කේ., සහ නානායක්කාර, වී.කේ., (2008), *දේශීය ආහාර වගා අංශය කෙරෙහි පළාත් සභා ක්‍රමයේ බලපෑම*, පර්යේෂණ වාර්තා පරිවර්තන අංක 01, කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

බොරලැස්ස, එස්.ඩී.ඒ.බී., (2007), "*පළාත් සභා ක්‍රමය තුළ රජයේ ඉඩම් සම්බන්ධව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය*", පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව, 2007 පෙබරවාරි 19, (සංස්.) නදීකා දමයන්ති, එම්.කේ. සහ සුසිලා ලූර්දු, එම්.ඩී., වාර ප්‍රකාශන අංක 21, කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

මිහිඳුකුලසූරිය, යූ.කේ.එස්., (2000), "*ශ්‍රී ලංකාවේ ඉඩම් භුක්තිය සහ හිමිකම් ලියාපදිංචි කිරීම*", ගොවිකටයුතු අධ්‍යයන, 4 වෙළුම, 1 කලාපය, කොළඹ: හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

රත්නායක, ආර්.එම්.කේ. (2002), *දිළිඳුකම අවම කිරීමේ උපාය මාර්ග: ශ්‍රී ලංකා සිද්ධි අධ්‍යයනය*, කොළඹ: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

හේරත්, කේ., (2010), *රජයේ ඉඩම් පිළිබඳ නීතිය*, අනුරාධපුරය, විජායි ප්‍රකාශකයෝ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, (1972), *හැන්සාඩ් වාර්තාව*, 1972 අගෝස්තු 18, තීරු අංක 2050-2058.

Aminuzzaman, S.M., (1999), *"Decentralization in Bangladesh: What Went Wrong?"*, Research Note, Dhaka: Centre for Administrative Studies, University of Dhaka.

Chandrasiri, J.K.M.D. (1988), *The Youth Uprising in 1971 and the Land Reform in 1972 and 1975 in Sri Lanka*: A Dissertation submitted as part of fulfillment of Master in Agrarian Studies, University of Sussex.

CIRDAP, (2009), *A CIRDAP Country Study, Sri Lanka: Assessing Rural Development Initiatives Exploring Future Opportunities*, Bangladesh: Centre on Integrated Rural Development for Asia and the Pacific.

Damayanthi, M.K.N., (2011), *Devolution versus Deconcentration: A Study on Land Service Delivery System in Sri Lanka,* A Dissertation submitted as part fulfillment of Master in Public Policy and Governance, North South University, Bangladesh.

Department of Census and Statistics, (2004), *Census of Population and Housing-2001*, Hambantota District Report, Colombo: Department of Census and Statistics

Department of Census and Statistics, (2012), *Census of Population and Housing-2011*, Colombo: Department of Census and Statistics

Department of Census and Statistics, (2007), *Census of Agriculture-2002*, Colombo: Department of Census and Statistics

Department of Government Printing (1992), *Transfer of Power (Divisional Secretariats) Act*, No.58 of 1992, Sri Lanka.

Devas, N., (2005), *"The Challenges of Decentralization"*, Paper presented at Global Forum in Fighting Corruption, Brasilia, June 2005. Available at www. Cgu.gov.br [Accessed 10 January 2012].

Government of Sri Lanka, (1990), *Report of the Land Commission-1987*, Sessional Paper No III-1990, Sri Lanka.

Jogaratnam, T., (2001), *Allocation of State Land for Peasant Agriculture in Sri Lanka*, Background paper for workshop, Towards and Employment strategy framework in Sri Lanka, 13th November 2001, Colombo.

Navaratna-Bandara, A.M., (2010), *Provincial Public Administration and the Public Service in Twenty Two Years of Devolution: An Evaluation of the Working of Provincial Councils in Sri Lanka,* Rajagiriya: Institute for Constitutional Studies, p.163-192.

Rondinelli, D.A., (1980), *"Government Decentralization in comparative Perspective: Theory and Practice in Developing Countries"*, International Review of Administrative Science, Vol. 47, 1980, Sage Publication, p.133-145. Available at http://www.sagepublications.com [Accessed 15 January 2012].

Rondinelli, D.A., (N.D.), *"What is Decentralization"?* in Litvack, J and Seddon, J. ed. Decentralization Briefing Notes, Washington D.C.: The World Bank.

Scott, I., (1996), *"Changing concepts of Decentralization: Old Public Administration and New Public Management in the Asian Context"*, Asian Journal of Public Administration, Vol.18, No.1, p.3-21.

Seneviratne, M.C.P. (1993), *"Land Reform in Sri Lanka: A Preliminary Review"*, Sri Lanka Journal of Agrarian Studies, Vol. VIII, No.3&4, Colombo: HARTI.

Snodgrass, D.R., (1996), *Ceylon-An export economy in transition*, Illinois: Irwin.

Wijedasa, K.H.G., (N.D.), *"Impact of Rural Landlessness and Land Tenure on domestic Agriculture"* in Smarasinghe, H.G. (ed) , Hector Kobbekaduwa Felicitation Volume, Colombo, HARTI.

Work, R., (2002), *"Overview of the Decentralization Worldwide: A Stepping Stone to improved Governance and Human Development"*, Paper presented at 2nd international conference on decentralization, federalism: the future of decentralizating states? 25-27 July 2002, Manila, Philippine, Available at http://bibloteca.unmsm.edu.pe/pdf [accessed on 12 January 2012].

www.uda.lk

www.forestdept.gov.lk

ඇමුණුම 01: ඉටු නො කළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන්)

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	2006	2007	2008	2009	2010	2011	2012	එකතුව	සමස්ත බිම් ප්‍රමාණය (හෙක්.)	අවශ්‍ය මිනින්දෝරු මාස සංඛ්‍යාව
කටුවන	-	05	07	21	14	67	43	157	80.777	40.875
වීරකැටිය	01	09	06	08	44	18	21	107	966.35	123.5
බෙලිඅත්ත	-	02	02	01	08	02	08	23	17.68	7.5
තංගල්ල	-	05	-	03	01	06	13	28	88.876	17.5
සූරියවැව	-	02	05	01	08	07	08	31	1784.6	38
අඟුණුකොල-පැලැස්ස		18	34	04	14	07	13	90	96.759	24.75
තිස්සමහාරාම	-	-	-	-	03	04	16	23	732.45	10
හම්බන්තොට	02	18	08	26	10	24	64	144	2301.1	90.375
අම්බලන්තොට	01	08	25	11	12	14	28	98	239.38	31.375
වලස්මුල්ල	01	02	09	09	13	15	06	55	71.887	15.75
ලුණුගම්වෙහෙර	-	-	-	01	01	04	11	17	497.53	12.625
ඕකේවෙල	-	02	02	02	04	01	02	13	6.383	3.25
මහවැලි	-	2	1	-	5	3	-	11	57.537	12

මූලාශ්‍ර: දිස්ත්‍රික් මැනුම් අධිකාරී කාර්යාලය, හම්බන්තොට, 2012

ඉටු කිරීමට ඇති මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය සහ මැනුම් නියෝගයේ සදහන් කැබලි සංඛ්‍යාව අනුව

ප්‍රා.ලේ. කොට්ඨාසය	සමස්ත ඉතිරිය	කැබලි සංඛ්‍යාව අනුව ඉල්ලීම්											
		1	2	3	4	5	6	7	8	9	10	10ට වැඩි	සදහන් නොවූ
කටුවන	157	136	3	-	4	-	-	-	-	1	2	1	10
මහවැලි	11	4	2	-	-	-	-	1	-	-	-	2	2
අගුනුකොල පැලැස්ස	90	65	1	1	2	-	-	1	1	1	-	8	9
බෙලිඅත්ත	23	15	-	-	-	1	-	1	-	-	-	2	-
වීරකැටිය	107	43	3	-	5	1	-	-	3	1	1	40	8
අම්බලන්තොට	98	39	17	5	6	1	3	1	2	-	2	10	11
වලස්මුල්ල	55	40	4	1	2	-	-	-	-	-	1	1	6
තිස්සමහාරාම	23	13	3	-	-	1	-	-	-	-	2	1	2
තංගල්ල	28	13	2	-	-	1	-	-	-	-	1	4	7
සූරියවැව	31	9	5	1	-	-	-	-	-	-	-	1	-
ලුණුගම්වෙහෙර	17	12	-	-	-	-	-	-	-	-	-	4	1
ඕකේවෙල	13	11	1	-	-	-	-	-	-	-	-	-	1
හම්බන්තොට	144	64	20	3	3	2	1	2	2	1	3	35	4

මූලාශ්‍ර: දිස්ත්‍රික් මැනුම් අධිකාරී කාර්යාලය, හම්බන්තොට, 2012

ඉහත සදහන් කර ඇති මැනුම් නියෝගවලින් 378ක් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ලබාදුන් ඉඩම් සඳහා ද, 297ක් මායිම් සහ මැනුම් ගල් නොමැති වනාන්තරවලට අදාළ ඒවා ද වේ.

ඇමුණුම 02: බිම් සවිය හිමිකම් සහතික පත්‍රය සහ නැවත මැන ඉදිරිපත් කළ පිඹුරු සටහන

බිම් සවිය හිමිකම් සහතික පත්‍රය



අදාළ ඉඩම නැවත මැන ඉදිරිපත් කළ පිඹුර



ඇමුණුම 03: අවම වගවීමක් සඳහා යොදාගත හැකි පත්‍රිකාවෙහි දළ ආකෘතිය

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:

සේවාලාභියාගේ නම: ග්‍රාම නිලධාරි වසම:

සේවා ඉල්ලීම: ලිපිගොනු අංකය:

ඉල්ලීම ඉදිරිපත් කළ දිනය:

නිලධාරියා (නම සහ තනතුර)	ලිපිලේඛන						ප්‍රගතිය	පසුවිපරම් කළ යුතු/ නැවත පැමිණිය යුතු දිනය	ඉල්ලීම ඉටු නොවුවහොත් යොමු විය යුතු නිලධාරියා	අත්සන සහ දිනය
	ඉල්ලීම ලැබුණු									
ග්‍රාම නිලධාරී										